36. දකුණු පළාත් සභාවේ 2008 අංක 06 දරන අනාථ, අත්හල හා අසරණ ළමුන්ගේ සංවර්ධනය සඳහා අරමුදලක් පිහිටුවීමේ ප්‍රඥප්තිය.

දකුණු පළාත තුළ අනාථ, අත්හල, අසරණ ළමයින් සඳහා රැකවරණය සැලසීම, විවිධ අපචාරයන්ට චෝදනාවට ලක් වන්නා වූ, විවිධ ලිංගික අපයෝජනයන්ට ලක් වන්නා වූ ගැහැණු හා පිරිමි ළමුන් සඳහා පුනරුත්ථාපනය හා රැකවරණය සැලසීම, වීදිවල සැරිසරන විවිධ සමාජ උපද්‍රවවලට ගොදුරුවන දරුවන්ට රැකවරණය හා පෝෂණය සැලසීම, භාරය හා රැකවරණය අවශ්‍ය වන්නා වූ දරුවන් සඳහා සුරක්ෂිතභාවයක් ඇති කිරීම, කායික මානසික හා චිත්තවේගාත්මක පීඩාවන්ට ලක් වූ ළමුන් සඳහා උපදේශනයන් සැලසීම රජයේ ළමා නිවාස පමණක් නොව ස්වේච්ඡා ළමා නිවාසවල සහ ළමුන්ගේ සුභ සිද්ධිය හා සමාජ රැකවරණය, ස්ථාපනය කිරීම, ජීවනෝපායන් සකස් කිරීම හා ඒ හා සම්බන්ධ අනුශංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම සඳහා පහසුකම් සැලසීම අරමුණු කර ගත් අරමුදලක් පිහිටුවීම සඳහා පනවනු ලබන ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය "දකුණු පළාත් සභාවේ අංක 06 දරන අනාථ, අත්හල හා අසරණ ළමුන්ගේ සංවර්ධනය සඳහා අරමුදලක් පිහිටුවීමේ ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට එය ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

2. මේ ප්‍රඥප්තියේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතුය.

(අ) අනාථ, අත්හල, අසරණ ළමයින් සඳහා රැකවරණය සැලසීම හා ඔවුන්ගේ අවශ්‍යතා සපයමින් අධ්‍යාපනය හා වෘත්තීය සංවර්ධනයක් ඇති කිරීම.

(ආ) ලිංගික අපයෝජනයට ලක් වන්නාවූ ළමුන් සඳහා රැකවරණය සැලසීම, ළමා මව්වරුන්ගේ ළමුන් සඳහා උපත් අවශ්‍යතා සැලසීම.

(ඇ) වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥා පනත යටතේ වරදකාර අවුරුදු 18ට අඩු ළමයින් සඳහා අධිකරණයේ පනවන්නාවූ පරිවාස නියෝග කාලසීමාව තුළ ළමුන් පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය වන්නාවූ සංවර්ධනාත්මක ප්‍රවේශයන් සැලසීම.

(ඈ) අවධානම් සහිත පවුල්වල දරුවන්ගේ අවශ්‍යතා ඉටු කිරීම හා වීදිවල සැරි සරමින් විවිධ සමාජමය උපද්‍රව වලට භාජනය වන දරුවන්ගේ ජීවිත යහපත් මාර්ගයට ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

ලැබෙන සියළු මුදල්.

(ඉ) භාර ගැනීමේ ළමා නිවාසයේ පෝෂණ ඌනතා සහිත දරුවන් හා විශේෂ ආබාධ සහිත වූ දරුවන් සඳහා අවශ්‍යතා සැපයීම හා කායික, මානසික, සමාජීය හා චිත්තවේගාත්මක අපයෝජනයට ලක් වූ ළමුන්ගේ උපදේශන කටයුතු සැලසීම.

(ඊ) නිසි භාරය හා රැකවරණය සැලසීම හා පෝෂණ ඌණතා වලක්වා ගැනීම සඳහා ආධාර ලබා දීම.

(උ) රජයේ හා ස්වේච්ඡා ළමා නිවාසවල ආයතනගතව සිටින ළමුන් කඩිනමින් සමාජගත කිරීම.

(ඌ) ආයතනගත ළමුන්ගේ අධ්‍යාපන තත්ත්වය, වෘත්තිමය හැකියාවන් සංවර්ධනය සඳහා ද, සමාජගත කිරීමේදී නිශ්චිත රැකියාවක් වෙත යොමු කිරීම.

(එ) ළමුන්ගේ නිෂ්පාදන දිරි ගැන්වීම හා අලෙවි කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

3. මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන පරිවාස හා ළමාරක්ෂක විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ලේකම්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද මෙහි මින් මතු බලය ලත් නිලධාරියා යනුවෙන් සඳහන් කරනු ලබන යම් නිලධාරියෙකු මෙම ප්‍රඥප්තියේ පරිපාලන කටයුතු භාරව සිටිය යුතුය.

පරිපාලනය

4. ළමාරක්ෂක අරමුදල හා එයට ගෙවීම්.

(අ) ආණ්ඩුවේ ප්‍රදාන වශයෙන් කලින් කළ සම්මත කරනු ලබන අරමුදල සඳහා වන සියළු මුදල්.

(ආ) මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා දකුණු පළාත් සභාව විසින් කලින් කළ සම්මත කරනු ලැබිය හැකි සියළු මුදල්.

(ඇ) විදේශ රටවලින්, විදේශ සංවිධානවලින්, විදේශ නියෝජිතයන්ගෙන්, රාජ්‍ය නොවන සංවිධානවලින්

අරමුදල් රැස් කර ගැනීම

(ඇ) යම් තැනැත්තෙකු විසින් අරමුදලට පරිත්‍යාග ලෙසින් ලබා දෙන සියළු මුදල්.

(ඉ) ළමා රක්ෂණ ප්‍රඥප්තියේ නියමයන් කඩවන අවස්ථාවලදී ළමා සුරක්ෂිතය සඳහා ද, ළමා හිමිකම් ප්‍රවර්ධනය සඳහා ද ජාතික ළමාරක්ෂක අධිකාරිය මගින් ප්‍රදානය කළ හැකි වන්නා වූ සියළුම මුදල්.

(ඊ) අධිකරණවලින් යොමු කළ හැකි දඩ මුදල්.

(උ) වෙනත් කවර හෝ ප්‍රභවයකින් ලැබෙන මුදල් මෙම අරමුදලට ගෙවනු ලැබිය හැකිය.

4.1 මේ ප්‍රඥප්තිය යටතේ ළමාරක්ෂක සංවර්ධන අරමුදලට බැරව ඇති මුදලින් ලේකම්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා බලය දෙනු ලැබ තිබෙන නිලධාරියා විසින් ළමා සංවර්ධන කටයුතු වලට අවශ්‍ය විය හැකි මුදල් කලින් කල ගෙවනු ලැබිය හැකිය.

චංචල හා නිශ්චල දේපළ භාර ගැනීම

5. ළමා සංවර්ධන අරමුදලට කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපල ඇතුළත් කවර හෝ පරිත්‍යාගයක් මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන්ට අනුකූලව උපයෝගී කර ගනු පිණිස ළමා සංවර්ධන අරමුදල වෙනුවෙන් අමාත්‍යවරයා විසින් හෝ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධාරියෙකු විසින් භාර ගනු ලැබිය හැකිය.

එවැනි කවර හෝ දේපළක් අමාත්‍යවරයාගේ අභිමතය පරිදි පවතින මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව විකිණිය ලැබිය හැකි අතර, එම විකිණීමෙන් ලැබෙන මුදල් ළමා සංවර්ධන අරමුදල වෙත බැර කරනු ලැබිය යුතුය.

6. මූල්‍ය පාලනය හා අරමුදලේ පරිපාලනය.

(අ) ළමා සංවර්ධන අරමුදල අමාත්‍යවරයාගේ පාලනය හා අධීක්ෂණය යටතේ විය යුතු අතර, අමාත්‍යවරයගේ උපදෙස් වලට යටත්ව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් බලය පවරනු ලබන පරිවාස කොමසාරිස්වරයා විසින් සිදු කළ හැකිය.

(ආ) ළමා රක්ෂණ සංවර්ධන අරමුදල වෙනුවෙන් ගිණුමක් පවත්වාගෙන යායුතු අතර, එක් එක් ලිත් වර්ෂයක් අවසානයේදී අරමුදලේ මූල්‍ය පාලනය පිළිබඳ වාර්තාවක් ලේකම්වරයා විසින් හෝ බලය ලත් නිලධාරියා විසින් සකස් කළ යුතුය.

(ඇ) අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතුය.

(ඈ) අරමුදලේ පරිපාලනය පිළිබඳව එක් එක් වර්ෂය සඳහා වූ වාර්තාවන් ඒ ඒ වර්ෂය සම්බන්ධව විගණනය කළ ගිණුම්වල පිටපතක්ද, ඒ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවක් ද සමග අමාත්‍යවරයා විසින් සෑම වර්ෂයකම මාර්තු 31 දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතුය.

7. අරමුදලේ මුදල් පරිහරණය සඳහා පහත සඳහන් අයගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් වෙත මෙයින් පැවරේ.

භාරකාර මණ්ඩලය පිහිටුවීම හා සංයුතිය

(i) සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සහ කම්කරු අමාත්‍යාංශ ලේකම්
(ii) දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්)
(iii) පළාත් පරිවාස කොමසාරිස්
(iv) පළාත් පරිවාස දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (මුදල්)
(v) මූලස්ථාන පරිවාස නිලධාරී

8. පොදු විධිවිධාන

(i) දකුණු පළාත් සභාවේ පරිපාලන සීමා ඇතුලත පිහිටා ඇත්තා වූද, මේ ප්‍රඥප්තිය බලාත්මක වීමේදී හෝ ඊට පූර්වයෙන් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා විසින් පාලනය කරන ලද්දා වූ රජයේ සියළු ආයතනවල වෙසෙන අධිකරණ නියෝග මත ආයතනවලට යොමු වන අවුරුදු 18 ට අඩු අවශ්‍යතා හඳුනාගනු ලැබූ ළමුන් වෙසෙන ආයතන, මෙම ප්‍රඥප්තිය යටතේ ආධාර ලැබිය යුතු, ප්‍රතිලාභ ලැබිය යුතු ආයතනයන් ලෙස සැලකිය යුතුය.

(ii) මෙම ප්‍රඥප්තියේ දෙවන වගන්තිය යටතේ පරමාර්ථ වශයෙන් දක්වා ඇති කරුණු යටතට වැටෙන ළමුන් සංවර්ධන අවශ්‍යතා ඇති ළමුන් ලෙස සැලකිය යුතුය.

(iii) දකුණු පළාත් සභා සීමාව ඇතුළත පිහිටියා වූ මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දිනයේ දී හෝ ඊට ප්‍රථම වෙනත් යම් නීතියක් යටතේ පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්වරයා විසින් පරිපාලනය කර ඇති හා ලියාපදිංචි කරන ලද්දා වූ සියලු ස්වේච්ඡා ආයතනවල වෙසෙන ළමුන් මේ ප්‍රඥප්තිය බලාත්මක වන අවස්ථාවේ පටන් මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතුය.

(iv) මෙම ප්‍රඥප්තිය යටතේ දකුණු පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේ පරිපාලනයට යටත් වන්නා වූ සියලුම පරිවාස ඒකක මට්ටමින් පරිවාස නිලධාරීන් මගින් අධිකරණ අමාත්‍යාංශය විසින් පිහිටුවනු ලැබ ඇත්තා වූ සියළුම අධිකරණ වලට යොමුවන වරදකරු නොවන ළමුන් සඳහාත් පරිවාස නිලධාරී අධීක්ෂණය යටතේ සිටිය යුතු යැයි හඳුනාගනු ලබන වරදකාරී ළමුන් සඳහාත්, ආධාර දිය යුතු බවට පරිවාස නිලධාරීගේ නිර්දේශය යොමු වන්නා වූ ඕනෑම අධිකරණ නියෝගයකට යටත් වන්නා වූ අවශ්‍යතා ඇති ළමුන් මෙම ප්‍රඥප්තිය යටතේ ප්‍රතිලාභ ලැබිය යුතු ළමුන් වන්නේය.

9. (i) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(ii) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව හැකි තාක් ඉක්මනින් පළාත් සභාවේ අනුමැතිය සඳහා යොමු කළ යුතුය. නියෝග

(iii) පළාත් සභාව විසින් එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් එය අනුමත කිරීම ප්‍රතික්ෂේප වූ දින පටන් පරිච්ඡින්න කරන ලද සේ සැලකිය යුතු අතර, එතෙක් ක්‍රියාත්මක කරන ලද කිසිවක් අවලංගු නොවිය යුතු සේ සැලකිය යුතුය.

10. (i) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන කඩ කරමින් ක්‍රියා කිරීම, ප්‍රඥප්තියේ පරමාර්ථවලට පටහැනි ලෙසින් මුදල් යෙදවීම, මුදල් අයථා පරිහරණය කරනු ලබන යම් තැනැත්තෙකු නිසි අධිකරණ බලය සහිත අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ විට මුදල් වංචා කිරීම, අයථා පරිහරණය කිරීමේ වරදට යම් ලිඛිත නීතියකින් යම් දඬුවමක් කරන ලද මුදල් වංචාවට සරිලන දඩයකින් හෝ මාස හයකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීම හෝ යන දෙයාකාරයෙන්ම දඬුවමට යටත් කළ හැකි වන්නේය. වැරදි

11. (i) වෙනත් යම් ලිඛිත නීතියකට පටහැනිව කවර විධිවිධානයක් තිබුණද ඒ පිළිබඳව නොසලකා මේ ප්‍රඥප්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර,මේ ප්‍රඥප්තියේ සහ එම වෙනත් නීති විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූල බවක් පැවතුණහොත් මේ ප්‍රඥප්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු වන්නේය. වෙනත් ලිඛිත නීති අභිබවා බල පවත්වන බව

(ii) මේ ප්‍රඥප්තියේ සිංහල භාෂා හා වෙනත් භාෂා පාඨ අතර අනනුකූලතාවයක් තිබුණහොත් සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතු වන්නේය.

12. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, — අර්ථ නිරූපණය

01. "අත්හල ළමයා" යන්න නීත්‍යානුකූල දරුවෙකු සම්බන්ධව යොදන විට දෙමාපිය දෙදෙනා විසින් අත්හැර දමන ලද හෝ දෙමාපිය දෙදෙනාගෙන් කෙනෙකු මිය ගොස් හෝ දෙමාපිය දෙදෙනාගෙන් එක් අයෙකු එලෙස ක්‍රියා කිරීමට අපොහොසත්ව සිටින්නේ නම්, එහිදී දෙමාපිය දෙදෙනාගෙන් අනෙක් තැනැත්තා විසින් අත්හැර දමන ලද ළමයෙකු අදහස් වේ. නීත්‍යානුකූල නොවන දරුවකු සම්බන්ධව යෙදෙන විට මව විසින් අත්හැර දමන ලද ළමයෙකු අදහස් වන අතර, මව, දෙමාපිය කෙනෙකු ලෙස ක්‍රියා කිරීමට අපොහොසත්ව සිටින්නාවූ ළමයෙකු අදහස් වේ.

02. "අනාථ ළමයා" යන්න නීත්‍යානුකූල දරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට දෙමාපිය දෙදෙනාම මිය ගොස් හෝ දෙමාපිය දෙදෙනාගෙන් කෙනෙකු මිය ගොස් සහ අනෙක් තැනැත්තා දෙමාපිය කෙනෙකු ලෙස ක්‍රියා කිරීමට අපොහොසත් ව සිටින, ළමයෙකු අදහස් වන අතර, නීත්‍යානුකූල නොවන දරුවකු සම්බන්ධයෙන් යොදන විට මව මිය ගොස් සිටින ළමයෙකු අදහස් වේ.

03. "අසරණ ළමයා" යනුවෙන් අදහස් කරනුයේ,

I. රජයේ දෙපාර්තමේන්තුවක් මගින් හෝ පළාත් පාලන ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලබන මහජන සහනාධාරයක් ලබන දෙමාපියන්ගේ දරුවෙක්.

II. රජය මගින් ප්‍රදානය කරනු ලබන සහන මත යැපෙන දරුවෙක්.

III. එක් සාමාජිකයෙකු වෛද්‍ය සහතිකයක් අනුව ආදායම් මාර්ගයක් ලබා ගත නොහැකි රෝගී තත්ත්වයක සිටින හා අනෙක් තැනැත්තා, තැනැත්තිය (මව හෝ පියා) ප්‍රමාණවත් ආදායමක් නොලබන පවුලක දරුවෙක්.

iv. එක් මාපියෙකු බන්ධනාගාර ගතව සිටින හා අනෙක් තැනැත්තිය හා තැනැත්තා (මව හෝ පියා) ප්‍රමාණවත් ආදායමක් නොලබන පවුලක දරුවෙක්.

v. එක් මාපියෙකු වෛද්‍ය සහතිකයක් මත මානසික රෝගියෙකු යැයි නිශ්චිත කර ඇති හා අනෙක් තැනැත්තාව, තැනැත්තියව (මව හෝ පියා) ප්‍රමාණවත් ආදායමක් නැති පවුලක දරුවෙක්.

vi. නිසි භාරය හා ආරක්ෂාව අවශ්‍ය වන්නා වූ ළමයින් යනු 1939 ළමයින්, යෞවනයන් පිළිබඳ ආඥා පනතේ 27 වන වගන්තිය, 31 වගන්තිය, 34 වගන්තිය, 35 වගන්තිය, 36 වගන්තිය හා 77 වන වගන්තිය හෝ උපලේඛන ගත වරදක් සම්බන්ධව ළමයෙකු හෝ යෞවනයකු අධිකරණයට ඉදිරිපත් වූ අවස්ථාවන්ට අදාළ වන කරුණු වේ.

vii. උපලේඛනගත වැරදි දණ්ඩ නීති සංග්‍රහයේ 308, 296, 297, 343, 345, 360 (ආ), 364, 364 (ආ), 365, 365 (ආ) ළමා හා යෞවන ආඥා පනතේ 71 වන වගන්තිය, 72 වගන්තිය, 73 වගන්තිය සහ 74 වගන්තිය වනාහි අදාළ වේ.

viii. පරිවාස නියෝග යටතේ සිටින ළමයින් යනු 1944 වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥා පනත යටතේ අධිකරණය මගින් පරිවාස ආඥාවට යටත් කරන ලද ළමුන්ය.

ix. ආයතනගත ළමුන් යනු අදාළ ආඥා පනත අනුව නිවර්තන නිවාස ගත කරන ළමුන් ළමා හා යෞවනයින් පිළිබඳ ආඥා පනත අනුව සහතික කළ පාසල්ගත කරන ළමුන්ය. අනාථ නිවාස ආඥා පනත යටතේ පිහිට වූ ස්වේච්ඡා ළමා නිවාසවල රැකවරණය ලබන ළමුන්ය.

x. රජයේ භාර ගැනීමේ ළමා නිවාසයේ ළමුන් යනු දින 01 සිට අවුරුදු 05 ට අඩු ළමයින් සිටින නේවාසික ආයතනයක සිටින ළමුන්ය. (ළමා හා යෞවනයන් පිළිබඳ ආඥා පනත අනුව)

xi. ස්වේච්ඡා ළමා නිවාසය යනු අනාථ හා අත්හල ළමුන් භාර ගැනීම, ඔවුන් නේවාසිකව තබා ගැනීම, ආරක්ෂාව සැලසීම මගින් ඔවුන්ගේ නඩත්තුව පිණිස පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ස්වේච්ඡා ආධාර මත පවත්වා ගෙන යනු ලබන සෑම නිවාසයක්ම හෝ අවශේෂ ආයතනයකි.

"අනුමත පාසල" යනු ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනතේ 50 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන පාසලක සිටින ළමුන්ය.

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය හෝ කර්තව්‍ය පවරනු ලැබ සිටින අමාත්‍යවරයා අදහස් වේ.

"ලේකම්" යන්නෙන් දකුණු පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක විෂය හෝ කර්තව්‍ය පවරනු ලැබ සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙහි ලේකම්වරයා අදහස් වේ.

"පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්" යනු වරදකරුවන් පරිවාස භාරයට පත් කිරීමේ ආඥා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තත් කාලයේ පත් කර සිටින තැනැත්තා හෝ තැනැත්තිය අදහස් වේ.

"ළමයා" යන්නෙන් වයස අවුරුදු 18ට අඩු ගැහැණු හෝ පිරිමි ළමයෙකු අදහස් වේ.

"සහතික කළ පාසල" යනු ළමා හා යෞවනයන් පිළිබඳ ආඥා පනතේ 31 වගන්තිය යටතේ ළමයින් අධිකරණ නියෝග මත ඇතුළත් කිරීමට පිහිට වූ ආයතන වේ.

37. 2009 අංක 01 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (සංශෝධිත) ප්‍රඥප්තිය.

දකුණු පළාත් සභාවේ 1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

01. මෙම ප්‍රඥප්තිය 2009 අංක 1 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර, දකුණ පළාත් ආණ්ඩුකාරවරියගේ අනුමැතිය ලත් දින සිට ක්‍රියාත්මක වන්නේය.

02. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තියේ පහත සඳහන් වගන්ති හා ඡේද මෙයින් සංශෝධනය කරනු ලැබේ.

03. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ ආරම්භක ඡේදයේ පළමු පේලියේ "දකුණු පළාත ඇතුලත මූලාරම්භ වන" යන වචනවලින් ඉක්බිතිව හා "දකුණු පළාත තුළට පැමිණෙන හෝ හරහා යන" යන වචන අදාල පේලියට එකතු කිරීම.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාවේ "ඇ" ඡේදය ඉවත් කර පහත සඳහන් "ඇ" සහ "ඇ" ඡේද ආදේශ කිරීම:-

(ඇ) මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවයන් ආරක්ෂා සහිතව සුවපහසුව හා කාර්යක්ෂමව ඉටු කිරීමට නියැලී සිටින රාජ්‍ය හා පෞද්ගලික යන දෙපාර්ශවයේම ප්‍රවාහන සේවාවන් විධිමත් කිරීම.

(ඇ) විධිමත් කරනු ලබන සියලුම මගී හා අනෙකුත් ප්‍රවාහන සේවාවන් සඳහා යටිතල පහසුකම් සැලසීම.

04. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන වගන්තියේ (1) (අ) ඡේදයේ "නිල බලයෙන් සාමාජිකයින් තිදෙනෙක් වේ" යන්න වෙනුවට "නිල බලයෙන් සාමාජිකයින් පස් දෙනෙක් වේ" යන වචන ආදේශ කිරීම.

05. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 (1) (අ) වගන්තියේ (III) ඡේදයට ඉක්බිතිව පහත දැක්වෙන නව ඡේදය (IV) වශයෙන් එකතු කිරීම:-

(IV) අදාල විෂයභාර අමාත්‍යවරයාගෙන් විමසා පළාත් පාලන කොමසාරිස් හා පළාත් මෝටර් රථ කොමසාරිස් සහ

06. "ප්‍රධාන ප්‍රඥප්තියේ" (3) (1) (ආ) "ඡේදය" (ආ) (11) වශයෙන් නම් කරන අතර, ඊට පෙරාතුව (ආ) (1) වශයෙන් පහත සඳහන් ඡේදය ආදේශ කිරීම.

(ආ) (1) අමාත්‍යතුමාගේ අභිමතය පරිදි පෞද්ගලික බස්රථ ආයෝජන සමාගම් සහ ශ්‍රී ලංගම හෝ, ජාතික ගමනාගමන කොමිෂන් සභාව හෝ නියෝජනය වන පරිදි අධ්‍යක්ෂ හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවකුගේ මට්ටමේ පුද්ගලයන් දෙදෙනෙක් හා

07. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වැනි වගන්තියේ 1 වැනි කොටසේ (අ) (ආ) (ඇ) (ඊ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් ඡේද ආදේශ කිරීම:-

(අ) (i) පළාත ඇතුලත ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත්, පිළිගත හැකි, ගුණාත්මක තත්ත්වයක මගී හා භාණ්ඩ සේවා පවතින්නේ ද යන්න පිළිබඳව පරීක්ෂා කිරීම, සමීක්ෂණ පැවැත්වීම හා එම සේවා විධිමත් කිරීමට අවශ්‍ය ප්‍රමිතීන් නියම කිරීම;

(ii) මගී ප්‍රවාහන සේවා සඳහා විද්‍යාත්මකව තීරණය කරනු ලබන පොදු කාලසටහන් සැලසුම් කිරීම, පිළියෙල කිරීම, එම කාලසටහන් පරිදි ධාවනය කළ යුතු බවට සියලුම ධාවන පාර්ශ්වයන්ට නියෝග කිරීම හා ක්‍රියාත්මක කිරීම;

(iii) දකුණු පළාත් සභාව හා අනිකුත් පළාත් සභා අතර, අදාළ පාර්ශවයන්ගේ එකඟතාවය මත ගමනාගමන අවශ්‍යතා සපුරාලීම සඳහා ඒකාබද්ධ සේවා, සම්බන්ධ සේවා හෝ පළාත් අතර සේවා සැලසුම් කිරීම, බලාත්මක කිරීම සහ රෙගුලාසි පැනවීම ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ ද එකඟතාවය මත කළ යුතුය.

(ආ) මගී ප්‍රවාහනය සඳහා බස්රථ පාවිච්චි කිරීමට හෝ අනුමත වෙනත් මෝටර් වාහන යෙදවීමට බලය දෙන මගී සේවා අවසරපත් නිකුත් කිරීම, ලියාපදිංචි කිරීම හෝ වෙනත් අධිකාරී බලයක් ලබා දීම.

(ඇ) 7 (ආ) වගන්තියේ සඳහන් අවසරපත්‍ර හෝ ලියාපදිංචි කිරීමට අදාළ කොන්දේසි නියම කිරීම, මගීන්ගේ ආරක්ෂාව හා ගුණාත්මක සේවාවක් ලබාදීමට අදාළ කොන්දේසි නියම කිරීම, සියලු පාර්ශ්වයන් එම කොන්දේසි පිළිපදින බවට වගබලා ගැනීම.

(ඈ) (i) මගී හා අනෙකුත් ප්‍රවාහන සේවාවල ආයෝජකයන් දැනුවත් කිරීම, මාර්ගෝපදේශකත්වය සැපයීම, පහසුකම් සැලසීම හා සියලුම ප්‍රවාහන වෘත්තිකයින් පුහුණු කිරීම, සහතික නිකුත් කිරීම හා එම සේවා ප්‍රයෝජනයට ගනු ලබන පිරිස් දැනුවත් කිරීම හා සංවිධානය කිරීම.

(ii) ගුණාත්මක සේවා අවශ්‍යතා සපුරා ගැනීමට හැකිවන පරිදි අධිකාරිය විසින් හෝ අධිකාරිය හා සම්බන්ධ සමාගමක් වශයෙන් හෝ වෙනත් ආයතනයක් සමග ඒකාබද්ධව හෝ පුහුණු මධ්‍යස්ථාන ඇති කිරීම හා අවශ්‍ය සංවර්ධන කටයුතු කිරීම.

08. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වැනි වගන්තියේ (1) ඡේදයේ "කිසිම තැනැත්තකු" යන වචනවලින් ඉක්බිතිව "හෝ පුද්ගල මණ්ඩලයක්" යන වචන ද එම ඡේදයට එකතු කිරීම.

09. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වැනි වගන්තියේ (3) ඡේදයේ "නිත්‍ය සේවා සඳහා බස්රථයක්" යන වචනවලින් ඉක්බිතිව "හෝ මගී ප්‍රවාහනයට අනුමත" යන වචන ද එම ඡේදයට එකතු කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වැනි වගන්තියේ (5) (1) වශයෙන් නම් කරන අතර, එම 1 ඡේදය ඉක්බිතිව පහත දැක්වෙන අංක 5 (11)දරන අලුත් ඡේදය එකතු කිරීම.

(5) (11) නැතහොත් මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වැරදිකරු කරනු ලැබුවහොත් ඔහු රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ සුලු වැඩ සහිත අවුරුදු දෙකකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමට හෝ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් කිරීමට හෝ හැකිය.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 (7) ඡේදයට ඉක්බිතිව (8) ඡේදය වශයෙන් පහත සඳහන් අලුත් ඡේදය එකතු කිරීමෙන්:

"(8) ත්‍රීරෝද රථ හෝ පාසල් වෑන් රථ හෝ කුලී වෑන් රථ හෝ මගී ප්‍රවාහනයට සම්බන්ධ අනුමත වාහන ලෙස අධිකාරිය විසින් නියම කරන වාහන නියම කරන දිනයක සිට අධිකාරියේ අවසර පත්‍රයක් ලබා හෝ ලියාපදිංචි වීමක් නොමැතිව වෙන් වෙන් වශයෙන් ගාස්තු අයකිරීමකින් හෝ කුලී පදනම මත

ගාස්තු අය කිරීමකින් හෝ මගී ප්‍රවාහන සේවයේ නොයෙදිය යුතුය. බස්රථ නොවන අනෙකුත් මගී ප්‍රවාහන වාහන ලියාපදිංචි කිරීම විධිමත් කිරීම හා ඊට අදාළ අනෙකුත් කරුණු සම්බන්ධව අධිකාරියට රෙගුලාසි පැනවිය හැකිය".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වගන්තිය (1) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන්:

"15 (1) අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා සුදුසු පුද්ගලයෙකු තේරීම සඳහා ටෙන්ඩර් පටිපාටිය හෝ වෙනත් සාධාරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට හැකි අතර, ඒ සඳහා අධිකාරිය නියම කරන හෝ එකඟවන ගාස්තු නොගෙවා කිසි පුද්ගලයෙකුට අවසරපත්‍ර නිකුත් නොකළ යුතුය. එහෙත් ශ්‍රී ලංගම හෝ වෙනත් රාජ්‍ය ප්‍රවාහන ආයතනයක ඉල්ලීමකට මෙම ඡේදය ඒ ආකාරයෙන් බල පැවැත්වෙන ලෙස නොසැලකිය යුතුය".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 (3) ඡේදය "ජනතා සන්තක මගී ප්‍රවාහන සේවා සමාගම" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය" යන වචන ආදේශ කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වැනි වගන්තියේ (VI) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් ඡේදය එකතු කිරීමෙන්:

"VI අවසර පත්‍ර ධාරියා විසින් බස් රථයේ සේවයේ යොදන කොන්දොස්තරවරයා මගින් නැතහොත් කොන්දොස්තරවයාගේ කාර්ය ඉටු කරන පුද්ගලයා මගින් අයකළ ගාස්තුව, මගියාගේ ගමනාරම්භය හා ගමනාන්තය, (නමින් හෝ ගාස්තු අවස්ථා අංකයෙන්) එකී බස්රථයේ ලියාපදිංචි අංකය හෝ සමාගමේ හෝ ආයතනයේ හෝ නම, අනුක්‍රමික අංකය සහිත "ප්‍රවේශ පත්‍රයක්" සෑම මගියෙකුටම නිකුත් කරවීමට ක්‍රියා කළ යුතුය. අනු පිටපත් සහිත ප්‍රවේශ පත්‍ර පොත්, මිල මුද්‍රිත ප්‍රවේශපත්‍ර හෝ යන්ත්‍රානුසාරයෙන් නිකුත් කරන ප්‍රවේශපත්‍ර මේ සඳහා භාවිතා කළ හැකිය. යන්ත්‍රානුසාරයෙන් ප්‍රවේශපත්‍ර නිකුත් නොකරන අවස්ථාවල නිකුත් කරන ප්‍රවේශපත්‍රවල වලංගුභාවය තහවුරු කිරීම සඳහා ගමන්වාර අනුක්‍රමික අංක සටහන් කළ හැකි සටහනක් (මගී ලේඛනයක්) සෑම කොන්දොස්තරවරයෙකු විසින්ම පිරවිය යුතුය."

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වැනි වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"18 (1) දකුණු පළාත් සභාව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව හෝ වෙනත් යම් පළාත් සභාවක් විසින් අවසර පත්‍රයක් ප්‍රදානය කර ඇති කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල මණ්ඩලයකට අධිකාරිය විසින් නියෝග නිකුත් කළ හැකි අතර, එම නියෝග දකුණු පළාත් බල ප්‍රදේශයේදී පිළිපැදිය යුතුය."

"18 (11) මෙම අධිකාරියේ එකඟතාවයකින් තොරව නිකුත් කර ඇති අවසර පත්‍රයක් නිසා පළාත ඇතුලත විධිමත් සේවා වලට බාධා හෝ හානි වන්නේ නම් එම අවසර පත්‍රය යටතේ ධාවනය වන බස්රථය නතර කරවීම, තාවකාලිකව නතර කරවීම, පහසුකම් ලබා නොදීම හෝ වෙනත් ක්‍රියාමාර්ග ගැනීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව දැනුවත් කර අවශ්‍ය පරිදි කටයුතු කිරීමට අධිකාරියට බලය ඇත".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වැනි වගන්තිය ඉවත් කර පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-
"19 යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර
පත්‍රයක් ඔහුගේ කැමැත්ත පරිදි වෙනත් තැනැත්තෙකු වෙත පැවරිය නොහැක. එවැනි පැවරීමක් ශූන්‍ය හා බලරහිත වේ. එවැනි අවස්ථාවක් අනාවරණය වුවහොත් එම බලපත්‍රය අවලංගු කළ යුතුය. එසේ වුවද අධිකාරියේ ප්‍රතිපත්තියට හානි නොවන්නා වූද, ගුණාත්මක බස් සේවාවක් සඳහා අධිකාරිය අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවලදී බලපත්‍රවල අයිතිය සංශෝධනය කිරීමේ ක්‍රියාමාර්ග ගත හැකිය. ඒ සඳහා අධිකාරියට රෙගුලාසි පැනවිය හැකිය".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වගන්තියේ (1) ඡේදය ඉවත් කර පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ:-
"21.1 බලපත්‍ර අයිතිය සංශෝධනය කිරීමක දී තිබූ බලපත්‍රයේ සියලුම හිමිකම් ලබාදීමට අධිකාරිය බැඳී නැත. මෙවැනි සංශෝධනයක දී අදාල මාර්ගයේ පොරොත්තු බස්රථ හිමියන්ට එහි කාලසටහන් ඉල්ලා සිටීමට අතිවාසිකමක්ද නොමැත".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වගන්තියේ (III) ඡේදයේ "අවසර පත්‍රය අලුත් කිරීම සඳහා නියම කර ඇති ගාස්තු" යන වචන ඉවත් කර "අධිකාරියට ගෙවිය යුතු බවට නියම කර ඇති සියලුම ගාස්තු" යනුවෙන් ආදේශ කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වැනි වගන්තියේ (IV) ඡේදයට පසුව එන ඡේදයේ 5 වන පේලියේ "මාස 3 කට වැඩි කාලයකට අත්හිටුවීම"

යන්න අවලංගු කර "මාස තුනකට නොවැඩි කාලයක් අත්හිටුවීම" වශයෙන් සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වැනි වගන්තියේ (2) ඡේදය ඉවත් කර ඒ වෙනුවට 2 (I), 2 (II), 2(III) වශයෙන් පහත සඳහන් ඡේද තුන ආදේශ කිරීම.

28 (2) (i) ඒ ඒ මාර්ග සඳහා මගී අවශ්‍යතාවයට අනුව පොදු කාලසටහන් සකස් කිරීම, එම කාලසටහන් ධාවකයින් අතර සාධාරණ ලෙස බෙදා දීම, බස්නැවතුම්පොල වල හෝ බස්ගාල්වල හෝ අතරමග ස්ථානවලින් හෝ එම සේවාවන් ක්‍රියාත්මක කිරීම, කාලසටහන්වලට අනුව ධාවනය වන්නේදැයි පරීක්ෂා කිරීම, බස් සේවා කළමනාකරණ කටයුතු සඳහා කාර්ය මණ්ඩලය යෙදවීම හා අධීක්ෂණය අධිකාරිය මගින් ඉටුකළ යුතුය. ඒ සඳහා අධිකාරියට නියෝග හා රෙගුලාසි පැනවිය හැකිය.

(ii) බස්නැවතුම්පොලක සේවා පරිපාලනය හෝ කළමනාකරණය හෝ වෙනත් ආකාරයකින් මගී ප්‍රවාහන කටයුතු වලට සම්බන්ධ වීමට අධිකාරියේ අනුමැතිය තිබිය යුතුය.

(iii) අනවසරයෙන් බස්නැවතුම්පොලවලින් මගීන් ගැනීම හෝ පැටවීම, ඊට සහායවීමට මගීන් එක්රැස් කිරීමේ අරමුණින් ශබ්ද නඟා කෑගැසීම, අධිකාරියේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතුවලට බාධා හෝ අවහිර වන ලෙස කටයුතු කිරීම, දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි අවස්ථාවක පොලිස් නිලධාරීන්ට හෝ අධිකාරියේ නිලධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර, නඩු විභාගයකින් වැරදිකරු වුවහොත් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතුය.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වගන්තියේ 2 වන උප වගන්තියේ XV ඡේදය ඉවත් කර පහත සඳහන් ඡේදය ආදේශ කිරීම.
XV ඉහත සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන් හා මාර්ග අනතුරු අඩුකර ගැනීමටත්, මාර්ගය පාවිච්චි කරන සියලු දෙනාගේ ආරක්ෂාව තහවුරු වන පරිදි මාර්ග විනය නංවාලීමටත්, ඊට අදාළ ආනුශාංගික කරුණු සම්බන්ධයෙන් නියෝග පැනවීම හා බලාත්මක කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය ඉවත් කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ "බස්රථයක" හෝ "බස්රථයක්" වශයෙන් සඳහන් වන සෑම ස්ථානයකම ඊට ඉක්බිතිව "හෝ බස් මගී ප්‍රවාහනයට අනුමත වාහනයක්" යන වචන එකතු කිරීම.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම සංශෝධිත ප්‍රඥප්තියේ "පොදු කාලසටහන" යන්නෙන් කිසියම් මාර්ගයක හෝ මාර්ග කිහිපයක මගී අවශ්‍යතාවය අනුව දිනය පුරා බස් රථ ධාවනය වන ගමන්වාර හා එම ගමන්වාර සාධාරණ ලෙස ධාවකයන් අතර, බෙදා දීමට හැකි හා මහජනයාට ප්‍රදර්ශනය කළ හැකි විධිමත් කාලසටහනක් අදහස් වේ.

"ප්‍රධාන ප්‍රඥප්තිය" යන්නෙන් "1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය - ප්‍රඥප්තිය" අදහස් වේ.

මෙම ප්‍රඥප්තියේ සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

38. 2013 අංක 01 දරන දකුණු පළාත් සභාවේ බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය.

බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය විධිමත් කිරීම සඳහා ද ඊට අනුශංගික හෝ සම්බන්ධ වෙනත් කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තියේ විධිවිධාන 1942 අංක 13 දරන බඩු උකස් ගන්නන්ගේ ආඥා පනතේ විධිවිධානවලට අනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. 2013 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනක සිට එය ක්‍රියාත්මක වන්නේය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1 වැනි කොටස
බඩු උකස් ගන්නන්ගේ කාර්යය

2. කිසියම් තැනැත්තෙකු:-

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන ප්‍රද්ගලයෙකු වන්නේ නම්; හෝ

(ii) විදේශීය සමාගමක් වන්නේ නම්; හෝ

(iii) විදේශීය ව්‍යාපාර ආයතනයක් වන්නේ නම්,

නියමිත දිනයේදී හෝ ඉන්පසු ඒ තැනැත්තා විසින් උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන නොයා යුතුය. ඒ අනුව ඒ ව්‍යාපාරය කරගෙන යාමට යම් පුද්ගලයෙකුට, විදේශීය සමාගමට හෝ විදේශීය ව්‍යාපාර ආයතනයකට නිකුත් කර තිබුණා වූ ද එකී නියමිත දිනට පෙරාතුවම වූ දිනයෙහි වලංගුව පැවතියා වූ ද යම් බලපත්‍රයක් එකී දිනයේ දී සහ ඉන් පසු අවලංගු ලෙසත් බල රහිත ලෙසත් සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතුය.

බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යෑම ඇතැම් තැනැත්තන්ට තහනම් බව

3. (1) කිසිදු බඩු උකස් ගනග්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන සෑම සාප්පුවක් හෝ ශාඛාවක් වෙනුවෙන්ම ඒ එක් එක් සාප්පුව හෝ ශාඛාව සඳහා ප්‍රධාන ලේකම්වරයා විසින් වෙන් වෙන් වශයෙන් නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නේ නම් මිස, තැනැත්තෙකු විසින් බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන නොයා යුතුය.

බඩු උකස් ගන්නෙකුගේ බලපත්‍රය

(2) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතිය අනුව විය යුතුය.

(3) සෑම බලපත්‍රයකම දිනය වශයෙන් එය නිකුත් කරන ලද දිනය යෙදිය යුතු අතර, ඉන් පසුව එළඹෙන දෙසැම්බර් මාසයේ තිස් එක්වන දින එහි වලංගු භාවය අවසාන වන්නේය.

4. 3 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යම් ව්‍යාපාරයකට අදාළ වේ ද ඒ ව්‍යාපාරය ප්‍රධාන ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොලබා එම බලපත්‍රය දරන්නා විසින් වෙන යම් තැනැත්තෙකුට පවරා නොදිය යුතුය.

ප්‍රධාන ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව ව්‍යාපාරය පවරා දීම නොකළ යුතු බව

5. ප්‍රධාන ලේකම්වරයා විසින් 3 වැනි වගන්තිය යටතේ නිකුත් කරනු ලබන එකී බලපත්‍රයේ පිටපතක් ඒ බලපත්‍රය අදාළ වන ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ යම් ප්‍රදේශයක් තුළ ද ඒ ප්‍රදේශය භාරව සිටින පොලිස් අධිකාරීවරයා විසින් අදාළ කොට්ඨාශයේ පොලිස් ස්ථානාධිපතිවරයා වෙත පිටපතක් යැවිය යුතුය.

බලපත්‍රයේ පිටපතක් පොලිස් අධිකාරීවරයා වෙත යැවිය යුතු බව

6. (1) බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තෙකුම විසින් ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් පළාතේ ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. කිසියම් බඩු උකස් ගන්නෙකු විසින් එකකට වැඩි සාප්පු ප්‍රමාණයක් හෝ ශාඛාවන් ප්‍රමාණයක බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය පවත්වාගෙන යන විටක ඒ එක් එක් සාප්පුව හෝ ශාඛාව සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම

(2) බලපත්‍රයක් වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත ලියාපදිංචි ගාස්තු ගෙවා ලියාපදිංචි කරවා ගත යුතුය.

(3) තවද, මෙම බලපත්‍ර ගාස්තුව මුදල් විෂය භාර ඇමතිවරයා විසින් රජයේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මඟින් කලින් කලට වෙනස් කරනු ලැබිය හැක.

(4) වාර්ෂික බලපත්‍රය නියමිත දිනට අලුත් කිරීම පැහැර හැර බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබූ උකස් ගන්නකු වෙත වාර්ෂික බලපත්‍රය නිකුත් කරන්නේ නම් බලපත්‍රයක් නොමැතිව බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය පවත්වාගෙන ගිය සෑම වර්ෂයක් සඳහා ම අදාළ බලපත්‍ර ගාස්තුව ද බලපත්‍ර රහිතව ව්‍යාපාරය පවත්වාගෙන ගිය සෑම මාසයක් සඳහාම 10% බැගින් වූ ප්‍රමාද ගාස්තුවක් ද අයකළ යුතුය.

(5) ඉල්ලුම්කරු විසින් තමා බලපත්‍රය නිකුත් කිරීමට පෙර යම් නීති විරෝධී හෝ අනීතික ක්‍රියාවක් සිදු කර නැති බවට දිවුරුම් ප්‍රකාශයක් මගින් තහවුරු කළ යුතුය.

ඇතැම් තැනැත්තන්ට බලපත්‍ර නිකුත් කිරීම තහනම් කිරීම

7. 2 වැනි වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතු කොටගෙන උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යාම තහනම් වන යම් තැනැත්තකුට බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා වූ බලපත්‍රයක් නියමිත දිනයේ දී හෝ ඉන්පසු නිකුත් නොකළ යුතු අතර, නොඑසේම එයින් යම් තැනැත්තකු වෙත නිකුත් කරන ලද යම් බලපත්‍රයක් ඒ අනුව ශුන්‍ය හා බල රහිත ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතුය.

බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම

8. (1) (අ) යම් තැනැත්තකු බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරන ලෙසට ඉල්ලීමක් කරන දිනයට පෙරාතුවම වූ අවුරුදු පහ තුළ කවර හෝ අවස්ථාවක දී දණ්ඩ නීති සංග්‍රහයේ XI, XIII, XVII, හෝ XVIII වන පරිච්ඡේද යටතේ හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ හෝ දඬුවම් පැමිණවිය හැකි යම් වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම්; හෝ

(ආ) 46 (2) වගන්තියේ ප්‍රකාර වාර්ෂික ගිණුම් ප්‍රකාශය ඉදිරිපත් නොකරනු ලබන තැනැත්තෙකුට බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා වූ බලපත්‍රයක් එම තැනැත්තා වෙත නිකුත් නොකළ යුතුය.

බලපත්‍රය අලුත් කිරීම

9. 3 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන යම් තැනැත්තෙකු එම බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ අවස්ථාවක, ඒ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීමට පෙරාතුව යම් කාලසීමාවක් තුළ බලපත්‍රධාරියා විසින් බඩු උකස් ගන්නකු වශයෙන් ස්වකීය ව්‍යාපාරය සම්බන්ධව මේ ප්‍රඥප්තියේ විධිවිධානවල අරමුණු වලට පටහැනි ක්‍රියාවන්හි යෙදී ඇති බවට ප්‍රධාන ලේකම්වරයා සෑහීමකට පත්වන්නේ නම් ඒ බලපත්‍රය අලුත් කිරීම ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. එසේ කරන අවස්ථාවක දී ඊට හේතු දින 30 ක් ඇතුළත එම තැනැත්තාට ලිඛිතව දැනුම් දිය යුතුය.

10. (1) බලපත්‍රයක් අවලංගු කිරීම නිසා හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා අතෘප්තියට පත් යම් පාර්ශවයක් විසින් එම තීරණයට විරුද්ධව දින තිහක් තුළ අභියාචනා මණ්ඩලයට අභියාචනා කළ හැක.

(2) එම අභියාචනා මණ්ඩලය ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන විශ්‍රාමලත් විනිසුරුවරයන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

අභියාචනා

11. ප්‍රධාන ලේකම් විසින් නියම කරනු ලබන රුපියල් ලක්ෂයක මුදලකට මුදලින් ඇප නොතබන කිසිදු තැනැත්තෙකු වෙත බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා වූ බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර ඇප තැබිය යුතු බව

12. මාස (03) තුනකට වැඩි යම් කාලයක් ශ්‍රී ලංකාවෙන් පිටත සිටීමට අදහස් කරන සෑම බඩු උකස් ගන්නකුම විසින්:-

(අ) ඒ බව ප්‍රධාන ලේකම්වරයාට ලිඛිතව දැනුම් දිය යුතුය.

තවද,

(ආ) තමා ශ්‍රී ලංකාවෙන් පිටත සිටින කාලය තුළ තමා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා (බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යෑම සහා මේ ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් ඇති තැනැත්තෙකු වන) තැනැත්තකු පත් කළ යුතු අතර, එසේ පත්කරන ලද තැනැත්තාගේ නම ප්‍රධාන ලේකම්වරයාට ලිඛිතව දැනුම් දිය යුතුය.

බලපත්‍රලාභී ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින විට ඒ බව දැන්වීම

13. කවර දිනක වුවද පෙරවරු 8 ට පෙර හෝ පස්වරු 8 ට පසු හෝ කිසිම බඩුවක් උකසට ගැනීම කිසිම බඩු උකස් ගන්නකු විසින් නොකළ යුතුය.

ව්‍යාපාර කළ යුතු වේලාව

14. වෙන්දේසිකරුවකු වශයෙන් ක්‍රියා කිරීම හෝ වෙන්දේසිකරුවකුගේ ව්‍යාපාරය කරගෙන යාම හෝ කිසිම බඩු උකස් ගන්නකු විසින් නොකළ යුතුය.

බඩු උකස් ගන්නකු වෙන්දේසිකරුවකු වශයෙන් ක්‍රියා නොකළ යුතු බව

15. සෑම බඩු උකස් ගන්නකු විසින්ම,

(අ) තම ව්‍යාපාර ස්ථානයේ හෝ පිවිසෙන දොරටුව අසල පැහැදිලිව පෙනෙන අකුරෙන් තම නම සහ "බඩු උකස් ගන්නා" යන වචන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ලියා සෑම වේලාවකදීම ප්‍රදර්ශනය කර තැබිය යුතුය. තවද,

බඩු උකස් ගන්නන් විසින් දැන්වීම් ආදිය ප්‍රදර්ශනය කර තැබිය යුතු බව

(ආ) ව්‍යාපාර ස්ථානයට පැමිණෙන සෑම තැනැත්තෙකුටම පැහැදිලිව පෙනෙන පරිදි හා ඒ සෑම තැනැත්තෙකුම විසින් කියවිය හැකි වන පරිදි, මෙහි තුන්වන උපලේඛනයේ දක්වා ඇති විස්තර අඩංගු දැන්වීමක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ඒ ව්‍යාපාර ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක සෑම වේලේම ප්‍රදර්ශනය කර තැබිය යුතුය.

16. යම් පොතක, ආකෘති පත්‍රයක හෝ ලේඛනයක යම් විස්තර ඇතුළත් කිරීමට මේ ප්‍රඥප්තියෙන් නියම කර ඇති අවස්ථාවක, ඒ විස්තර සිංහලෙන් හෝ දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් ඇතුළත් කළ යුතුය.

විස්තර ඇතුළත් කිරීම සඳහා භාවිතා කළ යුතු භාෂාව

17. මෙහි දෙවන උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතිය අනුව වූ උකස්කර පොතක් හා "ආ" ආකෘතිය අනුව වූ උකස් භාණ්ඩ විකුණුම් පොතක් සෑම බඩු උකස් ගන්නකුම විසින් පවත්වාගෙන යා යුතු වේ. තවද ඇතුළත් කිරීමට ඒ ආකෘතිවල විධිවිධාන සලස්වා ඇති සියළු විස්තර මනා ලෙසත්, පැහැදිලි ලෙසත් ඇතුළත් කළ යුතු අතර, ඒ කාර්ය සඳහා අවශ්‍ය සියළු විමසීම් ද ඔහු විසින් කළ යුතුය.

බඩු උකස්ගන්නන් විසින් පවත්වාගෙන යා යුතු පොත්

18. (1) සෑම උකස් තුණ්ඩුවක්ම මෙහි දෙවෙන උපලේඛනයේ "ඇ" ආකෘතියෙහි දක්වා ඇති පරිදි මුල් පත්‍රිකාවකින් හා උප පත්‍රිකාවකින් යුත්තව ද එම ආකෘතියෙහි ඇතුළත් නියමයන්ට අනුකූලව ද ලියා අත්සන් කරනු ලැබිය යුතුය.

උකස් තුණ්ඩු

(2) දෙවන උපලේඛනයේ සඳහන් විස්තර සෑම උකස් තුණ්ඩුවකම මුල් පිටපතේ පසු පිටෙහි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් කියවිය හැකි සේ මුද්‍රණය කර තිබිය යුතුය.

(3) උකස් භාණ්ඩයක් රුපියල් දහසකට හෝ ඊට වැඩි මුදලකට හෝ උකස් කරනු ලබන අවස්ථාවක ඒ භාණ්ඩයට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාවට මුදලේ වටිනාකමට නියමිත මුද්දර ඇලවිය යුතුය. ඒ මුද්දරය සැපයීම සඳහා වන වියදම බඩු උකස් ගන්නා විසින් දැරිය යුතුය.

(4) (අ) බඩු උකස් කරන්නා විසින් උකස් තුණ්ඩුවේ උප පත්‍රිකාව අත්සන් කළහොත් මිස, සහ අත්සන් කරන තෙක් ද,

(ආ) බඩු උකස් ගන්නා විසින් උකස් තුණ්ඩුවේ උප පත්‍රිකාව අත්සන් කොට එය බඩු උකස් කරන්නාට දුනහොත් සහ දෙන තෙක් ද,

(ඇ) බඩු උකස් ගන්නා විසින් උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව බඩු උකස් ගන්නාගෙන් ලබාගෙන ඔහු එය පිළිගතහොත් මිස සහ පිළිගන්නා තෙක් ද,

කිසිම බඩුවක් උකස් නොගත යුතු අතර, උකසට ගත්තාක් මෙන් නොසැළකිය යුතුය.

19. කිසිම බඩු උකස් ගන්නකු විසින් උකස්කරුවන් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් තුන්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණය ඉක්මවන පොළියක් අය නොකළ යුතුය. පොළී ප්‍රමාණය

එසේ වුවද, යම් භාණ්ඩයක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් අදාළ බද්දක් ගෙවිය යුතු වන අවස්ථාවක බඩු උකස් ගන්නා විසින් එම බද්ද බඩු උකස් කරන්නාගෙන් අයකර ගැනීම, මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල ඇතුළත් කිසිවකින් තහනම් කෙරෙන ලෙස නොසැළකිය යුතුය.

මෙම වගන්තියේ "උකස් භාණ්ඩය" යන්නට උකස් කරන ලද්දා වූ ද , නියමිත දිනයට පෙර නිදහස් නොකරන ලද්දා වූ ද භාණ්ඩයක් ඇතුළත් වේ.

II වැනි කොටස
උකසට යටත් භාණ්ඩ

20. සෑම භාණ්ඩයක්ම එය උකස් දරන ලද දින සිට එළඹෙන දොළොස් මාසයක (මේ ප්‍රඥප්තියේ මින් මතු "නිදහස් කර ගැනීමේ කාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කාලය තුළ දී නිදහස් කරගනු ලැබිය යුතු වන්නේ ය. උකස් කළ දිනය අතහැර මේ කාලය ගණන් බලනු ලැබිය යුතුය. වර්ෂයක් තුළදී උකසට යටත් භාණ්ඩ නිදහස් කළ යුතු බව

21. මේ ප්‍රඥප්තියේ අන් තැනක මේ සම්බන්ධයෙන් කුමක් සඳහන්ව ඇත්ද, සෑම උකසට යටත් භාණ්ඩයක්ම, එය නිදහස් කළ යුතු කාලසීමාව ඉකුත්ව ගොස් තිබුණේ වුවද, මේ ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එය බැහැර කරනු ලබන තෙක් නිදහස් කර ගනු ලැබිය හැකි වන්නේය. උකසට යටත් භාණ්ඩ නිදහස් කරගනු ලැබිය හැකි බව

22. (1) යම් උකස් භාණ්ඩයකට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව බඩු උකස් කරන්නා විසින් බඩු උකස් ගන්නාට භාරදී, බඩු උකස් ගන්නා හෝ ඔහුගේ නියෝජිතයා හෝ සේවකයා ඉදිරියේ දී එම මුල් පත්‍රිකාව අත්සන් කොට, තම අනන්‍යතාවය ඔප්පු කළහොත් එම භාණ්ඩය නිදහස් කර ගැනීමේ හිමිකම එම උකස්කරුට ඇත්තේය.

උකස් භාණ්ඩ නිදහස් කර ගැනීමේ ක්‍රියාමාර්ග

(2) බඩු උකස් කරන්නා නොවන යම් තැනැත්තකු විසින් යම් උකස් භාණ්ඩයකට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව ඒ උකස් බඩුව උකස් කළ තැනැත්තාගේ අත්සනින් යථා පරිදි පිටසන් කරවා ගෙන එම මුල් පත්‍රිකාව බඩු උගස් ගන්නා වෙත ඉදිරිපත් කළහොත් සහ ඒ තැනැත්තා විසින් බඩු උකස් ගන්නා ඔහුගේ නියෝජිතයා හෝ සේවකයා ඉදිරියේ දී එම මුල් පත්‍රිකාව අත්සන් කළහොත් සහ තම අනන්‍යතාවය ඔප්පු කර සිටියහොත් එම උකස් බඩුව නිදහස් කර ගැනීමේ හිමිකම ඒ තැනැත්තාට ඇත්තේය.

(3) බඩු උකස් කරන්නාගේ මරණය නිසා හෝ ඔහුගේ නෛතික නොහැකියාව නිසා හෝ එම භාණ්ඩය නිදහස් කර ගැනීමේ හිමිකම තමාට ඇතැයි එම භාණ්ඩය අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව දරන (මේ වගන්තියේ මින් මතු "දරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තා විසින් කියා සිටින්නා වූ ද එහෙත් බඩු උකස් කරන්නාගේ අත්සනින් යථා පරිදි පිටසන් කරවා ගෙන උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව උකස් ගන්නා වෙත ඉදිරිපත් කිරීමට ඔහුට නොහැකි වන්නා වූද, අවස්ථාවක එකී දරන්නා විසින් මෙහි දෙවන උපලේඛනයේ "ඇ" ආකෘතිය අනුව සාමදාන විනිශ්චයකාරවයෙකු ඉදිරියේදී යථා පරිදි කරන ලද ප්‍රකාශයක්ද, සමග උකස් භාණ්ඩයට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව එකී දරන්නා විසින් බඩු උකස් ගන්නා වෙත ඉදිරිපත් කළහොත් ඒ උකස් භාණ්ඩ නිදහස් කර ගැනීමට බඩු උකස් ගන්නා විසින් ඉඩදිය යුතුය.

(4) (1) වන (2) වන සහ (3) වන උප වගන්තිවල විධිවිධානවලට යටත්ව උකස් භාණ්ඩය මත ගෙවිය යුතු ණය සහ ඊට ගෙවිය යුතු පොළියද, ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු යම් බද්දක් හෝ උකස් තුණ්ඩුව ඉදිරිපත් කරන බඩු උකස්කරුවන් වෙත හෝ එම තුණ්ඩුව දරන්නා වෙත එම භාණ්ඩය භාරදිය යුතුය.

(5) එසේ වුවද උකස් තුණ්ඩුව දරන්නා එය සොරකම් කර හෝ අන්‍යාකාරයකින් නීති විරෝධීව එහි සන්තකය ලබා ගෙන ගොස් ඇති බව සැක කිරීමට බඩු උකස් ගන්නාට හේතු ඇත්නම් බඩු උකස් ගන්නා විසින් හැකිතාක් ඉක්මනින් පොලිස් නිලධරයකුට හෝ ග්‍රාම නිලධාරියෙකුට දැන්විය යුතුය.

23. උකස් භාණ්ඩයක් බේරා ගැනීමට හිමිකම ඇත්තා වූද, එය බේරා ගැනීමට ඉදිරිපත් වන්නා වූ තැනැත්තකු විසින් එම භාණ්ඩය උකස් කරනු ලැබූ අවස්ථාවේදී එහි පැවති අගය බඩු උකස් ගන්නාගේ වරදක්, නොසැළකිළිමත් කමක් හෝ තමන්ට කළ විෂම චර්යාවක් මගින් අඩු වී තිබෙන බව නැතහොත් අඩුවීමට සලස්වා තිබෙන බව පෙනී ගියොත් නිසි අධිකරණ බලය ඇති අධිකරයණකට යොමු කිරීමෙන් වන්දි ලබා ගැනීමට බඩු උකස් කරන්නාට හැකියාවක් ඇත.

උකස් භාණ්ඩයේ අගය සෙවීම සම්බන්ධයෙන් වන්දි

24. (1) තමා යම් භාණ්ඩයක අයිතිකරුවෙක් බව කියා සිටින, එහෙත් උකස් තුණ්ඩුවේ මුල් ප්‍රතිකාව නොදරන යම් තැනැත්තෙකු විසින් හෝ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව දැරීමට තමාට හිමිකම තිබේ යැයි ද, එනමුත් එම තුණ්ඩුවේ මුල් පත්‍රිකාව නැතිවී, සොකරම් කර, අස්ථානගතවී, විනාශ වී හෝ කිසිවකු වංචනික ලෙස තමාගෙන් ලබාගෙන ඇතැයි ද කියා සිටින යම් තැනැත්තකු විසින් මෙහි දෙවන උපලේඛනයේ "ඉ" ආකෘතියට අනුව සාමදාන විනිශ්චයකාරවරයකු ඉදිරියේදී තමාද, තමාගේ අනන්‍යතාවය සාක්ෂි දරන තැනැත්තා ද විසින් යථා පරිදි කරනු ලැබූ ප්‍රකාශයක් බඩු උකස් ගන්නා වෙත භාරදෙනු ලැබූ විට, ඒ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව ඒ තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබූ කල්හි හිමිවන සියළු අයිතිවාසිකම් හා ප්‍රතිකර්ම ඔහු හා බඩු උකස් ගන්නා ද අතර ඇති වන්නේ ය.

එසේ වුවද, භාණ්ඩයක් බේරා ගැනීමේ කාර්යය සඳහා ඔහු විසින් උකස් තුණ්ඩුවේ අත්සන් කළ යුතුය.

(2) ඉහත සඳහන් ප්‍රකාශය, එහි අඩංගු යම් වැදගත් තොරතුරක් සම්බන්ධයෙන් වංචනික හෝ ව්‍යාජ බවට අනුමිත දැන්වීමක් බඩු උකස් ගන්නාට ලැබී නැත්නම්, භාණ්ඩය භාරදීම හෝ එම ප්‍රකාශය අනුව වෙනත් ආකාරයකින් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් වගකීමෙන් බඩු උකස් ගන්නා මෙන් ආරක්ෂා කරනු ලැබේ.

උකස් තුණ්ඩු නොමැති බඩු අයිතිකරුවන්ට සහ උකස් කරන්නන්ට ආරක්ෂාව සැලසීම

25. (1) භාණ්ඩයක් නිදහස් කර ගැනීමේ කාර්යය සඳහා උකස් තුණ්ඩුවක මුල් පත්‍රිකාව බඩු උකස් ගන්නා වෙත භාරදෙනු ලැබූ අවස්ථාවක ඒ භාණ්ඩය නිදහස් කර ගත් දින සිට ගණන් ගනු ලබන මාස 24 ක කාලයක් ඉකුත්වන තෙක් බඩු උකස් ගන්නා විසින් ඒ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව හා උප පත්‍රිකාව තමා සන්තකයේ තබා ගත යුතුය.

භාණ්ඩය නිදහස් කර ගැනීමෙන් හෝ විකිණීමෙන් පසු උකස් තුණ්ඩු බඩු උකස් ගන්නා විසින් තබාගත යුතු බව

(2) භාණ්ඩයට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව භාර නොදී භාණ්ඩය නිදහස් කරගනු ලැබූ අවස්ථාවක, එසේ ඒ භාණ්ඩය නිදහස් කළ දින සිට ගණන් ගනු ලබන මාස 24 ක කාලයක් ඉකුත්වන තෙක් ඒ භාණ්ඩයට අදාළ උකස් තුණ්ඩුවේ උපපත්‍රිකාව සහ ඒ නිදහස් කර ගැනීමේ කාර්යය සඳහා 24 වැනි වගන්තිය යටතේ තමා වෙත භාරදෙන ලද ප්‍රකාශය බඩු උකස්ගන්නා විසින් තම සන්තකයේ තබාගත යුතුය.

(3) යම් තැනැත්තකු විසින් බඩු උකස්ගන්නෙකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාම අත්හරින ලද අවස්ථාවකදී ඔහු විසින් තබා ඇති ඇප මුදලින් (1) වැනි උප වගන්තියේ සඳහන් වන්දි ගෙවීම සඳහා යෙදිය යුතු යම් මුදලක් අඩුකර ගෙන ඉතුරු මුදල ඒ බඩු උකස් ගන්නාට ගෙවනු ලැබිය යුතුය.

26. (1) යම් භාණ්ඩයක් යම් බඩු උකස් ගන්නකු වෙත උකස් කර තිබියදී නිශ්චිතවම නියමිත යම් තත්ත්වයක් යටතේ ඒ භාණ්ඩය නැති වූ අවස්ථාවක දී ඒ බඩු උකස් ගන්නා විසින් තබා ඇති ඇපය, බඩු උකස් කරන්නාට හෝ ඒ භාණ්ඩය නිදහස් කර ගැනීමට හිමිකම ඇති වෙනත් යම් තැනැත්තකුට හෝ වන්දි ගෙවීම සඳහා, නියමිත ආකාරයට යෙදවිය යුතුය.

බඩු උකස්ගන්නන් විසින් තබා ඇති ඇප මුදල් යෙදවීම හා ආපසු ගෙවීම

(2) ඉහත (1) උපවගන්තිය යටතේ ගෙවනු ලබන වන්දි මුදල නිසා තබා ඇති ඇප මුදලින් අඩුවන ප්‍රමාණය උකස් ගන්නා විසින් ඇපයක් වශයෙන් නැවත ගෙවිය යුතුය. එම උපවගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි මුදල තබා ඇති ඇප මුදල ඉක්මවා යන්නේ නම්, එවිට වන්දි ලැබීමට හිමිකම ලබන අය වෙත ගෙවීම පිණිස එසේ ඉක්මවන මුදල් ප්‍රමාණය සහ නියමිත ඇප මුදල් ප්‍රමාණය යන දෙකම ගෙවිය යුතුය. (3) යම් තැනැත්තකු විසින් බඩු උකස් ගන්නකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යෑම අත්හරින ලද අවස්ථාවකදී ඔහු විසින් තබා ඇති ඇප මුදලින් (1) වැනි උප වගන්තියේ සඳහන් වන්දි ගෙවීම සඳහා යෙදිය යුතු යම් මුදලක් අඩු කරගෙන ඉතුරු මුදල් ඒ බඩු උකස් ගන්නාට ගෙවනු ලැබිය යුතුය.

27. (1) ගින්නෙන් හෝ ගින්නක් හේතුකොට හෝ ගෙන උකස් භාණ්ඩයක විනාශ වූ හෝ උකස් භාණ්ඩයකට හානි සිදු වූ අවස්ථාවක, උකස නිදහස් කළ හැකි කාලසීමාව ඇතුළත ඉල්ලා සිටිනු ලැබුවහොත් ණය මුදල සහ පොළිය ද ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දක් හෝ අදාළ වෙනත් බද්දක් වේ නම් එම බද්ද අඩුකර, භාණ්ඩයේ වටිනාකම ගෙවීමට බඩු උකස් ගන්නා බැඳී සිටී.

ගින්නක් ඇති වුවහොත් එවිට උකස් ගන්නාගේ බැඳීම

(2) සෑම බඩු උකස් ගන්නකුම, තමා වෙත උකස් කරනු ලැබ ඇති භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම ආවරණය වන පරිදි තම ව්‍යාපාරය රක්ෂණය කරවා ගත යුතුය.

28. උකස් භාණ්ඩයක් නිදහස් කර වේලාවේ දී, බඩු උකස් ගන්නකු වෙත ආපසු ගෙවන ලද ණය මුදල සහ පොළී මුදල ද ඔහු විසින් යම් බද්දක් හෝ අයකර ගන්නා ලද්දේ නම් ඒ බද්ද සඳහා දෙවන උපලේඛනයේ "ඊ" ආකෘතිය අනුව වූ ලදුපතක් සෑම බඩු උකස් ගන්නකු විසින්ම නිකුත් කළයුතු අතර, එම ලදුපතේ පිටපතක් උකස් පොතෙහි සුරක්ෂිතව තබාගත යුතුය.

බඩු උකස් ගන්නාගේ ලදුපත

29. (1) උකස නිදහස් කළ හැකි කාලසීමාව ඇතුළත නිදහස් කර ගනු නොලබන සෑම භාණ්ඩයක්ම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් බැහැර කරනු ලැබිය හැකි නමුත්, වෙනත් ආකාරයකින් බැහැර කරනු නොලැබිය යුතුය. තවද හතරවන උපලේඛනයේ සඳහන් නියෝග ඒ විකිණීමේදී පිළිපැදිය යුතුය.

භාණ්ඩය වෙන්දේසියේ විකිණිය හැකි බව

(2) (1) උප වගන්තියේ විධිවිධාන යටතේ භාණ්ඩයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට යනවිට ඒ සම්බන්ධයෙන් මාස දෙකකට කලින් ලිඛිතව උකස්කරු දැනුවත් විය යුතුය. එම භාණ්ඩය උකස්කර ඇත්තේ යම් බඩු උකස් ගන්නකු වෙතද, ඒ බඩු උකස් ගන්නා විසින් එම විකිණීම පැවැත්වීමට නියමිත ස්ථානය ද පිළිබඳ ලිඛිත දැන්වීමක් යටත් පිරිසෙයින් දින විසි දෙකකට කලින් ප්‍රධාන ලේකම්වරයා වෙත දැනුම් දී ඊට අවසර ලබාගත යුතුය.

30. මේ ප්‍රඥප්තිය යටතේ යම් බඩු උකස් කරන්නෙකුගේ භාණ්ඩයක් විකිණීමට ඇති අවස්ථාවකදී ඒ භාණ්ඩය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා ප්‍රධාන ලේකම්වරයා හෝ බලය පවරන ලද නිලධාරියෙකුගේ අවසරය ඇතුව වෙන්දේසි පවත්වන දිනය සහ ස්ථානය පිළිබඳව දැන්වීමක් එදිනට යටත් පිරිසෙයින් දින දහ හතරකට පෙර බඩු උකස් ගන්නා විසින් ඒ භාණ්ඩය උකස් කළ තැනැත්තාට දිය යුතුය

විකිණීම පිළිබඳ දැන්වීම

31. මේ ප්‍රඥප්තිය යටතේ භාණ්ඩයක් විකුණනු ලැබූ සෑම අවස්ථාවදීම, එම භාණ්ඩය මත දෙන ලද ණය මුදල හා එම භාණ්ඩය විකුණූ දිනය දක්වා එම ණය මුදල වෙනුවෙන් අයවිය යුතු පොළියද, ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු බද්දක් වේ නම් එම බද්දද ඉක්මවවන මුදලකට එම භාණ්ඩය විකුණනු ලැබූ විට බඩු උකස් ගන්නා විසින්,

අයවිය යුතු පොළිය සහ යම් බද්දක් ඉක්මවන මුදලකටඑම භාන්ඩනය විකිණීමේදී කාර්ය පටිපාටිය

(අ) භාණ්ඩය විකුණනු ලැබූ මුදල, විකිණීම සඳහා දරන ලද වියදම් සහ හිඟ පොලී ගාස්තු අඩු කිරීමෙන් පසු බඩු උකස් කරන්නාගේ බැරට ඇති මුදල් ප්‍රමාණය සහ එම භාණ්ඩය උකස් කළ තැනැත්තාට නොපමාව දැනුම් දිය යුතුය.

තවද,

(ආ) විකිණීමේ දින සිට එක් අවුරුද්දක් ඇතුළත ඉල්ලා සිටිනු ලැබුවහොත්, බඩු උකස් කරන්නාගේ බැරට ඇති මුදල එම භාණ්ඩයේ අදාළ උකස් තුණ්ඩුව දරන තැනැත්තාට ගෙවිය යුතුය. තව ද,

(ඇ) එකී එක් අවුරුද්දක කාලසීමාව තුළ එවැනි ඉල්ලීමක් කරනු නොලැබුවහොත් ඒ කාලසීමාව ඉකුත් වූ වහාම බඩු උකස් කරන්නාගේ බැරට ඇති මුදල බඩු උකස් කරන්නාගේ බැරට පළාත් සභා අරමුදලෙහි තැන්පත් කළ යුතුය.

32. රුපියල් දහසකට වඩා වැඩි මුදලකට උකස් තබා තිබුණු භාණ්ඩයක් ඒ සඳහා දී තිබුණු ණය මුදල හා විකුණන දිනය දක්වා ඊට අයවිය යුතු පොළියද ඉක්මවන මුදලට, තත්කාලයේ බලපවත්නා නීති යටතේ නියමිත දිනට පෙර විකුණා ඇත්තා වූද, බඩු උකස් කරන්නාගේ බැරට ඇති මුදල සඳහා ඉල්ලීමක් ඒ භාණ්ඩයට අදාළ උකස් තුණ්ඩුව දරන්නා විසින් එකී විකිණීමේ දිනයෙන් පසු අවුරුද්දක් තුළ දී බඩු උකස් ගන්නා වෙත ඉදිරිපත් කර තැනැත්තා වූද, විටක සහ නියමිත දිනයේදී හෝ ඉන්පසුව හෝ එකී අවුරුද්දක කාලය ඉකුත්වීම සිදුවන සෑම අවස්ථාවකදීම ඒ කාලය ඉකුත් වූ වහාම බඩු උකස් ගන්නා විසින් එම මුදල එකී බඩු උකස් කරන්නාගේ බැරට පළාත් සභා අරමුදලෙහි තැන්පත් කළ යුතුවේ.

නියමිත දිනයට පෙර අයවිය යුතු මුදල හා පොළිය ඉක්මවන මුදලකට විකිණීමක දී කාර්ය පටිපාටිය

33. 29, 30 හෝ 31 වැනි වගන්ති යටතේ යවනු ලබන සෑම දැන්වීමක්ම, භාණ්ඩ පොතෙහි ඇතුළත් කර තිබෙන ලිපිනයට බඩු උකස් කරන්නා වෙත ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතු අතර, ලියාපදිංචි කිරීමේ ගාස්තුව බඩු උකස් කරන්නා විසින් දැරිය යුතුය.

29, 30, 31 වැනි වගන්ති යටතේ දැනුම් දීමේ පිළිවෙල

34. බඩු උකස් ගන්නකු වෙත උකස් කර තිබූ භාණ්ඩයක් මේ ප්‍රඥප්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියකදී ඒ උකස් ගන්නා විසින් ලංසු තබා මිලට ගනු ලැබූ පසු ඔහු ඒ මිලට ගන්නා ලද භාණ්ඩයෙහි අයිතිකරු ලෙස සලකනු ලැබේ. බඩු උකස් ගන්නා විසින් භාණ්ඩ මිලට ගැනීම

III වැනි කොටස

පරීක්ෂාව, පරීක්ෂණය සහ තහනමට අල්ලා ගැනීම.

35. භාණ්ඩයක් මේ ප්‍රඥප්තිය යටතේ විකුණන ලද දින සිට අවුරුදු දෙකක් ඇතුළත කවර විටක වුවද, බඩු උකස් ගන්නාගේ පොතෙහි අත්සන යොදා සහතික කරන ලද ඒ වෙන්දේසිය පිළිබඳ තොරතුරු ඇතුළත් කළ නාමාවලියෙහි සටහන් උකස් තුණ්ඩුව දරන්නා විසින් පරීක්ෂා කළ හැකි අතර, ඒ විකිණීම සම්බන්ධයෙන් ඒ පොතෙහි හෝ නාමාවලියෙහි සටහන් පරීක්ෂා කිරීමට බඩු උකස්ගන්නා විසින් ඒ උකස් තුණ්ඩුව දරන්නාට අවසර දිය යුතුය. විකුණුම් පොත් පරීක්ෂා කිරීමේ බලය

36. යම් තැනැත්තකු විසින්, උකස් තැබීමට භාණ්ඩ ඉදිරිපත් කරන තැනැත්තන් තමන් ගැන අදාළ විස්තරයක් ඉදිරිපත් කරන විට ගත යුතු ක්‍රියා මාර්ග

(අ) උකස් තැබීම සඳහා යම් බඩුවක් උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරයිද, එහෙත් තමාට ඒ බඩුව ලැබුණේ කෙසේද යන්න පිළිබඳව සතුටුදායක විස්තරයක් කිරීම ප්‍රතික්ෂේප කරයිද නැතහොත් එවැනි විස්තරයක් කිරීමට අපොහොසත් වේද නැතහොත්

(ආ) උකස් තැබීම සඳහා බඩු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරන භාණ්ඩයක් තමා අයිතිකරු නම් ඔහුගේ නම හා ලිපිනය පිළබඳව හෝ වෙනත් තැනැත්තෙකු නම් එම තැනැත්තාගේ අයිතිකරු නම හා ලිපිනය පිළිබඳ ඕනෑකමින්ම අසත්‍ය තොරතුරු සපයාදුන් නැතහොත්

(ඇ) නිදහස් කර ගැනීමට හිමිකමක් නැති භාණ්ඩයක් නිදහස් කර ගැනීමට උත්සාහ කරන නැතහොත්

(ඈ) යම් බඩුවක් උකස් තැබීම සඳහා බඩු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කළ විට එම භාණ්ඩය සොරකම් කරන ලද හෝ වෙනත් ආකාරයකින් නීති විරෝධී ලෙස ලබා ගන්නා ලද හෝ භාණ්ඩයක් බව සැක කිරීමට හේතු ඒ භාණ්ඩ උකස් ගන්නාට තිබේද,

එවිට ඒ බඩු උකස් ගන්නා විසින් ඒ පිළිබඳව හැකිතාක් ඉක්මණින් පොලිස් නිලධාරයකුට හෝ සාම නිලධරයකුට දැනුම් දිය යුතුය. ඒ තැනැත්තා සහ ඒ භාණ්ඩය සම්බන්ධයෙන් නිසි පරිදි ක්‍රියා කිරීම සඳහා එම පොලිස් නිලධරයා හෝ සාම නිලධාරියා විසින් අදාළ

පොලිස් ස්ථානාධිපතිවරයා මගින් ඒ තැනැත්තා සහ ඒ භාණ්ඩය නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියට නොපමාව ගෙන යා යුතුය.

බඩු උකස් ගන්නාගේ පොත පරීක්ෂා කරනු ලැබීමට යටත් වග

37. යම් බඩු උකස් ගන්නෙකු වෙත භාරදෙනු ලබන නියමයක් මගින් පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ඒ නියමයේ නිශ්චිතව සඳහන් කර ඇති දිනයකදී සහ වේලාවකදී තමා ඉදිරියෙන් පෙනී සිටින ලෙසත්, ඒ බඩු උකස් කරන්නාගේ ව්‍යාපාරයට අදාළ සියළු පොත් සහ ලේඛන පරීක්ෂා කිරීම සඳහ ඉදිරිපත් කරන ලෙසත්, ඒ බඩු උකස් ගන්නාට නියම කිරීම නිත්‍යානුකූල වන්නේය.

බඩු උකස් ගන්නෙකුගේ සාප්පු හෝ වාසස්ථාන සෝදිසි කිරීමේ බලය.

38. උප පොලිස් පරීක්ෂකයෙකුගේ නිලයට වඩා පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධරයකු හෝ ප්‍රධාන ලේකම්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ විසින් යම් බඩු උකස් ගන්නෙකුගේ හෝ ව්‍යාපාර ස්ථානයකට දිවා කාලයේ යම් වේලාවකදී ඇතුළු වී උකසට යටත්, යම් භාණ්ඩයක් හෝ ඔහු පවත්වාගෙන යන පොත්පත් හෝ ලියවිලි හෝ පරීක්ෂා කර අවශ්‍ය සටහන් ලියා ගැනීම නීත්‍යානුකූල වන්නේය. එවැනි යම් නිලධරයකු විසින් එම කාර්ය ඉටු කිරීමේදී කිසිදු තැනැත්තෙකු විසින් ඒ නිලධරයාට බාධාවක් නොකළ යුතුය.

IV වැනි කොටස.

වැරදි හා දණ්ඩන

උකස් කරන්නන් සහ වෙනත් තැනැත්තන් විසින් කරනු ලබන වැරදි

39. (අ) උකස් කිරීම සඳහා යම් බඩුවක් උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරන එහෙත් තමාට එහි සන්තකය ලැබුණේ කෙසේද යන්න පිළිබඳව සතුටුදායක විස්තරයක් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ අපොහොසත් වන; හෝ

(ආ) උකස් තැබීම සඳහා බඩු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරන බඩුවක් තමාගේම දේපලක්ද නැද්ද යන්න සම්බන්ධයෙන් හෝ තමාගේ නම් හා ලිපිනය සම්බන්ධයෙන් හෝ ඕනෑකමින්ම අසත්‍ය තොරතුරු ඒ බඩු උකස්ගන්නා වෙත සපයන; හෝ

(ඇ) යම් භාණ්ඩයක් නිදහස් කර ගැනීමට හිමිකම ඇති තැනැත්තෙකු නොවී එම භාණ්ඩය නිදහස් කර ගැනීමට උත්සාහ කරන හෝ වැයම් කරන; හෝ

(ඈ) වෙනත් තැනැත්තෙකුගේ දේපලක් නිත්‍යානුකූලව නිදහසට කරුණක් නොමැතිව බඩු උකස් ගන්නෙකු වෙත උකස් කරන; හෝ

(ඉ) තමා සම්බන්ධයෙන් හෝ වෙනත් තැනැත්තෙකුගේ
අනන්‍යතාවය සම්බන්ධයෙන් හෝ මේ ප්‍රඥප්තිය යටතේ යම් ප්‍රකාශයක් එහි ඇතුළත් යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය බව දැන දැනම ප්‍රකාශ කරන; හෝ

(ඊ) මෙම ප්‍රඥප්තියේ යම් විධිවාධානයක් කඩ කරන හෝ කළ
යුතු යැයි මේ ප්‍රඥප්තියෙන් තමන්ට නියමිත යම් දෙයක් කිරීම පැහැර හරින,

සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු වන්නේය.

බඩු උකස් ගන්නන් විසින් කරනු ලබන වැරදි

40. (අ) වයස අවුරුදු දහ අටට අඩු හෝ බීමත්ව සිටින යම් තැනැත්තෙකු යම් බඩුවක් උකස් ගන්නා;

(ආ) උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව උකස්කරුට භාර නොදී බඩුවක් උකස් ගන්නා; හෝ

(ඇ) වෙනත් බඩු උකස් ගන්නෙකු විසින් නිකුත් කරන ලද උකස් තුණ්ඩුවක මුල් පත්‍රිකාව මිලට ගන්නා හෝ උකස් ගන්නා හෝ හුවමාරු කරන; හෝ

(ඈ) වයස අවුරුදු 18 ට අඩු තැනැත්තකු බඩු උකස් කිරීම සඳහා සේවයෙහි යොදවන; හෝ

(ඉ) තමා වෙත උකස් කර තිබෙන උකස් බඩුවක් මේ ප්‍රඥප්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියකදී හැර මිලට ගන්නා; හෝ

(ඊ) තමා වෙත උකස් කර ඇති භාණ්ඩයක් තමා විසින් මිලදී ගැනීමේ අදහසින් නිදහස් කර ගැනීමට ඉඩ සලස්වන; හෝ

(උ) තමා වෙත උකස් කරන හෝ උකස් කිරීමට ඉදිරිපත් කරන ලද යම් බඩුවක් එය නිදහස් කර ගැනීමේ කාලය තුළ දී මිලයට ගැනීමට, විකිණීමට හෝ බැහැර කිරීමට ඒ බඩු උකස් කරන නැතහොත් උකස් කිරීමට ඉදිරිපත් කර තැනැත්තා සමග එකඟ වන; හෝ

(ඌ) තමා වෙත උකස් කරනු ලබන හෝ උකස් කිරීමට ඉදිරිපත් කරන යම් භාණ්ඩයක් එය නිදහස් කරගනු ලැබීමට ඉඩ දී ඇති කාලය තුළදී මිලට ගැනීමට, විකිණීමට හෝ බැහැර කිරීමට යම් තැනැත්තෙකු සමඟ එකඟත්වයට පැමිණෙන; හෝ

(එ) තමා වෙත උකස් කොට ඇති යම් භාණ්ඩයක් මේ ප්‍රඥප්තියේ බලය දී ඇති ආකාරයට හැර විකුණන හෝ වෙනත් ආකාරයකින් බැහැර කරන; හෝ

(ඒ) මේ ප්‍රඥප්තියෙන් නියමිත යම් පොතක අසත්‍ය සටහන් කරන හෝ නියමිත යම් සටහනක් ඇතුළත් කිරීම පැහැර හරින; හෝ

(ඔ) තමා වෙත උකස් කර ඇති සියළුම භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම දක්වා තම ව්‍යාපාරය රක්ෂණයකින් ආවරණය කර ගැනීම පැහැර හරින; හෝ

(ඕ) යම් විධිවිධානයක් කඩ කරන හෝ කළ යුතු යැයි මේ ප්‍රඥප්තියෙන් තමාට නියමිත යම් දෙයක් කිරීම පැහැර හරින; හෝ

(ක) ප්‍රධාන ලේකම්වරයාගෙන් විධිමත් ලෙස බලපත්‍රයක් ලබා නොගෙන උකස් බඩු ගන්නා ව්‍යාපාරයක් පවත්වාගෙන යන,

සෑම බඩු උකස් ගන්නෙක්ම වරදකට වරදරු වන්නේය.

රෙදිපිළි, ඇඳුම් සහ නොනිමි භාණ්ඩ ආදිය උකස් ගැනීම තහනම් බව

41. රෙදිපිළි, ඇඳුම් හෝ නොනිමි භාණ්ඩ හෝ ද්‍රව්‍ය කිසිවක් දැන දැනම උකස් ගන්නා සෑම බඩු උකස් ගන්නෙක්ම වරදකට වරදකරු වන්නේය. යම් අධිකරණයක් විසින් යම් බඩු උකස් ගන්නෙකු මේ වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ විට එම වරද සඳහා ඒ අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවකමකට අමතරව, ඒ භාණ්ඩය අධිකරණයේදී හෝ අධිකරණය විසින් විධානය කරනු ලබන වෙනත් ආකාරයකට හෝ එහි අයිතිකරුට භාර දීම කළ යුතුය.

උකස් කරන්නෙකුගේ බැරට ඇති මුදල්, පළාත් සභාවේ තැනැපත් කිරීම බඩු උකස් ගන්නකු විසින් පැහැර හරිනු ලැබූ විට

42. යම් උකස් කරුවෙකුගේ බැරට ඇති මුදල 31 වැනි වගන්තියෙන් හෝ 32 වැනි වගන්තියෙන් හෝ නියම කර ඇති ආකාරයට පළාත් සභා අරමුදලට තැන්පත් කිරීම පැහැර හරින සෑම බඩු උකස් ගන්නකුම යම් අධිකරණයක් විසින් එම වරදට වරදකරු කරනු ලැබූ විට, ඒ වරද සඳහා අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව, එකී මුදලට සමාන මුදලක් දඩයක් අයකර ගන්නා ආකාරයෙන් ඒ බඩු උකස් ගන්නාගෙන් අයකර ගැනීමට ඒ අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිය. ඒ සෑම මුදලක්ම අධිකරණය විසින් අයකර ගනු ලැබූ කල්හි, එම මුදල උකස් කරන්නාගේ බැරට පළාත් සභා අරමුදලෙහි තැන්පත් කරනු ලැබිය යුතුය.

43. බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යාමේදී ඒ බඩු උකස් ගන්නාගේ සේවකයා හෝ නියෝජිතයා විසින් කරනු ලැබූ හෝ කිරීම පැහැර හරිනු ලැබූ හෝ යම් ක්‍රියාවක් අවස්ථාවෝචිත පරිදි ඒ බඩු උකස් ගන්නා විසින් කරනු ලැබූ හෝ කිරීම පැහැර හරිනු ලැබූ දෙයක් ලෙස සලකනු ලැබිය යුතුය.

බඩු උකස් ගන්නෙකුගේ සේවකයෙකු හෝ නියෝජිතයෙකු විසින් කරනු ලබන වැරදි

එසේ වුවද බඩු උකස් ගන්නෙකු ව්‍යාපාර ස්ථානයේ නොසිටිය දී ඒ බඩු උකස් ගන්නාගේ යම් සේවකයෙකු හෝ නියෝජිතයෙකු විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධානයන් කඩවන පරිදි යම් ක්‍රියාවක් කරන ලද්දේ නම් හෝ යම් ක්‍රියාවක් කිරීම පැහැර හරිනු ලද්දේ නම්, ඒ සේවකයා හෝ නියෝජිතයා වරදකට වැරදිකරුවෙකු වන අතර, ඒ වරද සඳහා මේ ප්‍රඥප්තියෙන් නියම කර ඇති දණ්ඩනයකට ඔහු යටත් වන්නේය.

44. මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙකුම රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකටම යටත් විය යුතුය.

දණ්ඩන

45. බඩු උකස් ගන්නෙකු හෝ ඔහු නොසිටි අවස්ථාවකදී ඔහුගේ යම් සේවකයෙකු හෝ නියෝජිතයෙකු මේ ප්‍රඥප්තිය යටතේ හෝ, ඔහුගේ ව්‍යාපාරයේදී කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් සොර බඩු බව දැන දැනම සොර බඩු සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, ප්‍රධාන ලේකම්වරයා විසින් ඒ බඩු උකස් ගන්නාගේ බලපත්‍රය අවලංගු කළ යුතුය.

බඩු උකස් ගන්නෙකුගේ බලපත්‍රය අවලංගු කිරීම

46. (1) යම් භාණ්ඩයක් යම් බඩු උකස් ගන්නෙකුගේ සන්තකයේ නීති විරෝධීව තබාගෙන ඇති බව මේ ප්‍රඥප්තිය යටතේ පවත්වාගෙන යනු ලබන යම් නඩු කටයුත්තකදී, යම් අධිකරණයකට පෙන්වා දෙනු ලබන කවර හෝ අවස්ථාවකදී ඒ භාණ්ඩය අධිකරණයට ඉදිරිපත් කරන ලෙසද සුදුසු යැයි ඒ අධිකරණය විසින් සලකනු ලබන නියමයන් යටතේ කටයුතු සලස්වනු ලැබිය යුත්තේය.

බඩු උකස් ගන්නෙකුගේ සන්තකයෙහි නීති විරෝධීව තබාගෙන ඇති බඩු

47. සෑම බඩු උකස් කරවකු විසින්ම ස්වකීය ව්‍යාපාරය පිළිබඳව වාර්ෂික ගිණුම් වාර්තාවක් ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

වාර්ෂික ගිණුම් වාර්තාව

V වැනි කොටස

පරිපූරක විධිවිධාන

48. 31 වැනි වගන්තියේ සහ 32 වැනි වගන්තියේ විධිවිධාන අනුව යම් මුදලක් යම් උකස් කරන්නෙකුගේ බැරට ඇති අවස්ථාවකදී ඒ පිළිබඳව උකස්කරු දැනුවත් කළ යුතුය. ඒ මුදල එසේ තැන්පත් කරනු ලැබූ දින සිට අවුරුද්දක් ඇතුළතදී ප්‍රධාන ලේකම්වරයාගෙන් ඉල්ලූ විට ඒ මුදල ලබා ගැනීමේ හිමිකම ඒ තැනැත්තාට ඇත. තවද අවුරුද්දක කාලය තුළදී එවැනි ඉල්ලීමක් කරනු නොලැබුවහොත් ඒ මුදල පළාත් සභා අරමුදලට බැර කරනු ඇත.

උකස් කරන්නාගේ බැරට පළාත් සභාවේ තැන්පත් කර ඇති මුදල්

49. බඩු උකස් ගන්නෙකු විසින් කළයුතු යැයි මේ පඥප්තියෙන් නියම කර ඇති හෝ කිරීමට මේ ප්‍රඥප්තියෙන් බලය දී ඇති යම් ක්‍රියාවක් ඔහුගේ සේවකයා හෝ නියෝජිතයා විසින් කරනු ලැබිය හැකිය.

බඩු උගස් ගන්නෙකුගේ නියෝජිතයන් සේවකයන් ආදීහු

50. යම් භාණ්ඩ යම් කොන්දේසි මත පසුව නිදහස් කර ගන්නා බවට හෝ ආපසු මිලදී ගන්නා බවට වූ ප්‍රාකාශිත හෝ ව්‍යංගව එකඟවීමක් හෝ පිළිගැනීමක් නැතහොත් ගණුදෙනුවේ ස්වරූපය හා ලක්ෂණ අනුව එවැනි එකඟවීමක් හෝ පිළිගැනීමක් ඇතැයි යුක්ති සහගතව සලකන විට, ඒ අනුව භාණ්ඩ මිලට ගැනීම හෝ විකිණීම සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදල් වලට ඇප වශයෙන් භාණ්ඩ තබා ගැනීම සඳහා ව්‍යාපාරයක් පවත්වාගෙන යමින් භාණ්ඩ මිලට ගෙන, භාරගෙන හෝ තබාගෙන ඒ වෙනුවෙන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවන්නා වූ හෝ අත්තිකාරම් වශයෙන් දෙන්නා වූ හෝ ණයට දෙන්නා වූ සෑම තැනැත්තෙකුම බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය කරන්නෙකු ලෙස මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතුය. තවද ඒ හැම ගනුදෙනුවක්, භාණ්ඩයක්, ගෙවීමක් අත්තිකාරමක් සහ ණයක්ම මේ ප්‍රඥප්තිය ඇතුළත පිළිවෙලින් උකසක් හෝ ණයක් ලෙස සලකනු ලැබිය යුතුය.

ඇතැම් ව්‍යාපාරිකයන් බඩු උකස් ගන්නන් වශයෙන් සලකනු ලැබිය යුතු බව

51. (1) නියෝග සෑදීමට මේ ප්‍රඥප්තියෙන් බලය දී ඇති හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ කාරණා සම්බන්ධයෙන් නියෝග හෝ අමාත්‍යවරයා විසින් කලින් කලට සෑදිය හැකිය.

නියෝග

(2) විශේෂයෙන්ම සහ (1) වැනි උප වගන්තිය මගින් පවරන ලද බලතල වල ව්‍යාප්තියට හානියක් නොමැතිව -

(අ) නියම කළයුතු බවට මේ ප්‍රඥප්තියෙන් නියමිත යම් කරුණක් නියම කරමින්; සහ

(ආ) බඩු උකස් ගන්නන් විසින් ඇප තබනු ලැබීමට අනුෂංගික වන යම් කරුණක් සඳහා විධිවිධාන සලස්වමින්,

අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පලකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් දිනයක සිට හෝ එහි නියෝග ක්‍රියාත්මක වන්නේය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පළාත් සභාවේ අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ ඉදිරිපත් කොට අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතියේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැළකිය යුතු වන නමුත් ඒ නියෝගය යටතේ ඊට කලින් කරනු ලැබූ යම් දෙයකට ඉන් අගතියක් සිදු නොවන්නේය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි දන්වනු ලබන්නේ කවර දිනක සිට ද ඒ දිනය ගැසට් පත්‍ර මඟින් නිවේදනය කරනු ලැබිය යුතුය.

මේ ප්‍රඥප්තිය යටතේ බලතල ආදිය පැවරීම

52. මේ ප්‍රඥප්තියේ සඳහන් බලතල කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් ප්‍රධාන ලේකම්වරයාගේ අත්සන යටතේ ලිඛිතව බලය දෙනු ලැබූ යම් රජයේ නිලධරයකු විසින් ක්‍රියාත්මක කරනු හෝ ඉටු කරනු ලැබිය හැකිය.

අන්තර්කාලීන විධිවිධාන

53. මේ ප්‍රඥප්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද

(අ) (99 වන අධිකාරය වූ) උකස් ආඥාපනත යටතේ දකුණු පළාත තුළ නිකුත් කර ඇති යම් බලපත්‍රයක් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ලෙස සැළකිය යුතුය.

(ආ) එම ආඥාපනත යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් ඉවත් කොට මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ නියෝග ඒ වෙනුවට ආදේශ කරනු ලබන තෙක් එකී නියෝග මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ නියෝග ලෙස සැලකිය යුතුය. තවද,

(ඇ) ආඥාපනත යටතේ පවරනු ලැබ නියමිත දිනයට පෙරාතුව වූ දිනය වනවිට විභාගයට පාත්‍රව පැවතියා වූ යම් නඩුවක් සහ එවැනි නඩුවකදී අධිකරණයක් විසින් දෙනු ලැබූ යම් තීරණයක් අවස්ථාවෝචිත පරිදි, මේ ප්‍රඥප්තිය යටතේ පවරන ලද නඩුවක් ලෙසද, මේ ප්‍රඥප්තිය යටතේ පවරනු ලැබූ නඩුවකදී දෙන ලද තීරණයක් ලෙස සලකනු ලැබිය යුතුය.

54. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස , මේ ප්‍රඥප්තියෙහි - අර්ථ නිරූපණය

"නියමිත දිනය" යන්නෙන්, මේ ප්‍රඥප්තිය බලාත්මක වන දිනය අදහස් වේ.

"ව්‍යාපාර ස්ථානය" යන්නට වාසස්ථානයක් හෝ ගුදමක්, ව්‍යාපාරික කටයුතු කරනු ලබන කවර හෝ ස්ථානයක් ඇතුළත් වේ.

"ප්‍රධාන ලේකම්වරයා" යන්නෙන් දකුණ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා හෝ ඔහු විසින් විධිමත්ව බලය පවරන ලද නිලධාරියෙකු හෝ නිලධාරින් අදහස් වේ.

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් දකුණු පළාත් ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"විදේශීය සමාගම" යන්නෙන් 2007 අංක 7 දරන සමාගම් පනතේ XL වන කොටස අදාළ වන සමාගමක් අදහස් වේ.

"විදේශීය ව්‍යාපාර ආයතනය" යන්නෙන් -

(අ) හවුල්කරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත වූ ව්‍යාපාරයක් වන විට ඉන් එක් හවුල්කරුවකු හෝ හවුල්කරුවන් දෙදෙනාම හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන්නා වූ ව්‍යාපාර ආයතනයක්; හෝ

(ආ) හවුල්කරුවන් දෙදෙනෙකුට වැඩි ගණනකින් සමන්විත වූ ව්‍යාපාරයක් වන විට, ඔවුන් යටත් පිරිසෙයින් එක් හවුල්කරුවකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ව්‍යාපාර ආයතනයක්,

අදහස් වේ.

"මාසය" යන්නෙන්, ලාභ හෝ පොළී හෝ අය කිරීමේ කාර්යය සඳහා වූ විට, දින තිහක (30) කාලපරිච්ඡේදයක් අදහස් වේ.

"බඩු උකස්ගන්නා" යන්නට, භාණ්ඩ උකසට ගැනීමේ ව්‍යාපාරය පවත්වාගෙන යන නමුත් එම ව්‍යාපාරය කරන බැංකුවක් නොවන සෑම තැනැත්තෙකුම ඇතුළත් වේ.

"උකස් කරන්නා" යන්නෙන් උකස් කිරීම සඳහා යම් බඩුවක් බඩු උකස් ගන්නෙකු වෙත භාරදෙන තැනැත්තෙක් අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

"පළාත් සභා අරමුදල" යන්නෙන්, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වැනි වගන්තිය යටතේ ඇති කරන ලද දකුණු පළාත් සභා අරමුදල අදහස් වේ.

"නොනිමි භාණ්ඩ හෝ ද්‍රව්‍ය" යන්නට, භාණ්ඩ නැතහොත් ද්‍රව්‍ය කිසිවක් යම් නිෂ්පාදන ක්‍රියාවලියකට භාජනය කරනු ලැබීමෙන් පසු හෝ භාණ්ඩ නැතහොත් ද්‍රව්‍ය විෂයයෙහි ඒවා යොදා ගනිමින් යම් නිෂ්පාදනමය ක්‍රියාවලියකට භාජනය කිරීමෙන් පසු ඇදීම හෝ පරිභෝජනය උදෙසා නිම කිරීමට ඒ භාණ්ඩ හෝ ද්‍රව්‍ය මිශ්‍ර හෝ වෙන වෙනම යම් නිෂ්පාදන තත්ත්වයක පවතී ද නැතහොත් යම් නිෂ්පාදනයක කොටසක හෝ අංශයක නිෂ්පාදන වෙමින් පවතීද, එවැනි භාණ්ඩ කිසිවක් ද භාණ්ඩ සැකසීම නැතහොත් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය කිසිවක් ද ඇතුළත් වේ.

(3 වගන්තිය)

පළමුවන උපලේඛනය

බලපත්‍රය

දකුණු පළාතේ ප්‍රධාන ලේකම්වන .... නමැති මම, දකුණු පළාත් සභා සීමා තුළ ....යන ස්ථානයෙහි බඩු උකස් ගත්තෙකුගේ ව්‍යාපාරය කරගෙන යාමට .... පදිංචි ....ට, දකුණු පළාත් සභාවේ අංක .... දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ, මෙයින් බලය දී බලපත්‍ර දෙමි.

මේ බලපත්‍රයේ කාලය .... වන දින අවසන් වන්නේ ය.

....
ප්‍රධාන ලේකම්

(17 වන වගන්තිය)

දෙවන උපලේඛනය

"අ" ආකෘතිය

උකස් බඩු පොත

.... හි බඩු උකස් ගන්නා වන .... ගේ උකස් භාණ්ඩ පොත

උකස් තුණ්ඩුවේ අංකය හා එය නිකුත් කළ දිනය	මාසයේ උකස් බඩු අංකය	එක් එක් භාණ්ඩය සඳහා දුන් ණය මුදල	එක් එක් භාණ්ඩය සඳහා අය කල ලාභ හෝ පොළී	උකස් කරන්නාගේ නම	උකස් කරන්නාගේ ලිපිනය	උකස් කරන්නා අයිතිකරු නොවන විට අයිතිකරුගේ නම	උකස් කල එක් එක් භාණ්ඩයේ විස්තර	උකස් කල භාණ්ඩය ස්වර්ණාභරණයක් නම්, එහි බර	උකස් කල එක් එක් භාණ්ඩයේ වටිනාකම	නිදහස් කර ගැනීමේ දිනය
		රු. ශ.	රු. ශ.						රු. ශ.	

(17 වන වගන්තිය)

"අ" ආකෘතිය

උකස් භාණ්ඩ විකුණුම් පොත

විකිණීම කළ දිනය හා ස්ථානය:...

වෙන්දේසිකරුගේ නම හා ලිපිනය:..

උකස් භාණ්ඩ පොතේ දැක්වෙන අන්දමට උකස් බඩුවේ අංකය	උකස් කළ දිනය	උකස් කරන්නාගේ නම	ණය මුදලේ ප්‍රමාණය	අයවිය යුතු පොලී පුමාණය	වෙන්දේසිකරු විසින් එක් එක් උකස් භාණ්ඩය විකුණන ලද මුදල	මිලටගත් තැනැත්තාගේ නම හා ලිපිනය
			රු. ශ.	රු. ශ	රු. ශ	

(18 වන වගන්තිය)

"ඇ" ආකෘතිය

උකස් තුණ්ඩුව

උප පත්‍රිකාව, අංකය..............බඩු උකස් ගන්නා වෙත තබා ගත යුතුය. දිනය .... බඩු උකස් ගන්නාගේ නම හා ලිපිනය .... අංක .... දරන ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය දරන මෙහි අත්සන් කරන (උකස් ගන්නාගේ ලිපිනය) .... පදිංචි වන මම ඉහත නම් සඳහන් බඩු උකස් ගන්නා වෙත රු. ....ක් වටිනා................ රු. .... කට අද දින උකස් කළෙමි. උකස් කරන්නාගේ අත්සන හෝ, නම ලිවීමට නොහැකි නම් ඔහුගේ වම් මාපට ඇඟිලි සළකුණ		මුදල් පත්‍රිකා අංකය....................... දිනය........................... .... (උකස් කරන්නාගේ නම හා ලිපිනය) විසින්, මෙහි පහත අත්සන් කරන .... (බඩු උකස් ගන්නාගේ නම සහ ලිපිනය) වෙත රු. .... ක් වටිනා ....රු............................ කට අද දින උකස් කරන ලදී. බඩු උකස් ගන්නාගේ හෝ ඔහුගේ සේවකයාගේ නැතහොත් නියෝජිතයාගේ අත්සන

"ඈ" ආකෘතිය

උකස් කරන්නාගේ අත්සනින් පිටසන් නොකරන ලද උකස් තුණ්ඩුවක මුල් පත්‍රිකාව 22 වැනි වගන්තිය යටතේ භාරදෙනු ලබන විට කළ යුතු ප්‍රකාශය

පහත විස්තර කොට ඇති භාණ්ඩ/භාණ්ඩය .... විසින් බඩු උකස් ගන්නකු වන .... ගේ ව්‍යාපාර ස්ථානයේ දී උකස් තබන ලද බවත්, ඒ සඳහා වූ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව ලබාගෙන ඇති බවත්, එකී............................ (උකස් කරන්නා) මිය ගොස් ඇති නිසා/............................ හේතු කොට ගෙන සිදුවී ඇති නෛතික අශක්නුතාවය යටතේ සිටින නිසා ඒ උකස් භාණ්ඩ බේරා ගැනීම සඳහා එකී .... (උකස් කරන්නාගේ) අත්සනින් එම උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව පිටසන් කරවා ගෙන ඉදිරිපත් කල නොහැකි බවත් අංක .... දරන ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය දරන .... (ඒ.බී.) .... වන මම බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ගම්භීරතා පූර්වකවත් අවංකවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ඉහත සඳහන් භාණ්ඩ/භාණ්ඩය .... වේ.

මෙහි ඉහත සඳහන් ප්‍රකාශය කරන තැනැත්තා .... පදිංචි (ඒ.බී.) නමැති තැනැත්තා යැයි මා දන්නා බව ....(සී.ඩී.) වන මම එකී ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ගම්භීරතා පූර්වකවත් අවංකවත් මෙයින් ප්‍රකාශ කරමි.

20......... ක් වූ ....මස ....දින මා ඉදිරියේ දි ප්‍රකාශ කොට අත්සන් කරන ලදී.

("ඒ.බී." ගේ) අත්සන................................
("සී.ඩී." ගේ) අත්සන................................

....
සාමදාන විනිශ්චයකාරවරයා

"ඉ" ආකෘතිය

උකස් තුණ්ඩුවේ මුල් ආකෘතිය නැතිවීම ආදියක දී කළ යුතු ප්‍රකාශය

මෙම ප්‍රකාශය අසත්‍ය එකක් වුවහොත් මෙම ප්‍රකාශය කරන තැනැත්තාට දඬුවම් විදීමට සිදුවන බව දැන ගත යුතුය.

බඩු උකස් ගන්නකු වන .... ගේ ව්‍යාපාරික ස්ථානයේ දී පහත විස්තර කරන භාණ්ඩය/භාණ්ඩ .... විසින් උකස් කරන ලද බවත් ඒ සඳහා වූ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව ලබා ගන්නා ලද බවත් එම මුල් පත්‍රිකාව ඉන් පසු .... අතින් .... බවත් මුල් පත්‍රිකාව .... විසින් හෝ .... හෝ දැනුම හා විශ්වාසය අනුව කිසිවෙකුට විකුණා හෝ පවරා හෝ නැති බවත් අංක .... දරන ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය දරන්නා වූ .... පදිංචි (ඒ.බී.) .... වන මම බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ගම්භීරතා පූර්වකවත් අවංකවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ඉහත සඳහන් භාණ්ඩය/භාණ්ඩ පිළිබඳ විස්තර පහත දැක්වේ.

....

....

මෙහි ඉහත සඳහන් ප්‍රකාශය කරන තැනැත්තා .... හි පදිංචි (ඒ.බී.) ....නමැති තැනැත්තා යැයි මා දන්නා බව (සී.ඩී.) .... වන මම එකී ආඥාපනතේ විධිවිධාන අනුව ගම්භීරතා පූර්වකවත් අවංකවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

20...................... ක් වූ .... මස .... වන දින මා ඉදිරියේ දී ප්‍රකාශ කොට අත්සන් කරන ලදී.

("ඒ.බී." ගේ) අත්සන................................

("සී.ඩී." ගේ) අත්සන.............................

....

සාමාදාන විනිශ්චයකාරවරයා

(28 වන වගන්තිය)

"ඊ" ආකෘතිය

ලදුපත

දිනය:...........................

අංක .... දරන උකස් භාණ්ඩය නිදහස් කිරීමෙන් ලැබුණ

		රු.	ශ.
ණය මුදල	....	....	
ලාභය හෝ පොළිය	....	....	
ව්‍යාපාර පිරිවැටුම් බද්ද	....	....	
එකතුව		....	
		....	

(28 වන වගන්තිය)

තුන්වන උපලේඛණය

1. පොළී අනු ප්‍රමාණ

ණය දෙනු ලබන සෑම රුපියල් දහසක් සඳහා පොළී අනු ප්‍රමාණය සෑම මාසයක් හෝ මාසයකින් කොටසක් සඳහා සීයයට අටක් (8%) විය යුතුය.

2. අදාල බද්දක් ගෙවීම

උකස් භාණ්ඩයක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් බඩු උකස් ගන්නන් යම් ලිඛිත නීතියක් යටතේ වූ බද්දක් ගෙවිය යුතු හෙයින්, ඒ අවස්ථාවක, එම බද්ද උකස් කරන්නාගෙන් අයකර ගත හැකිය.

3. වැඩිපුර පොලි අය කිරීම සීමා කිරීම

යම් දිනක සිට වැඩිපුර පොලියක් අයකර ගැනීමට බඩු උකස් ගන්නකුට හිමිකම් ඇති අවස්ථාවක දී, එදිනට පෙර උකස් බඩුව නිදහස් කර ගැනීමට තමාට නොහැකි වූයේ එදිනට පෙර දිනයෙහි පෙරවරු 8 සිට පස්වරු 8 දක්වා වූ කාලය තුළ ඒ බඩු උකස් ගන්නාගේ සාප්පුව වසා තිබුන නිසා බව නිසි අධිකරණ බලය ඇති සිවිල් අධිකරණයක් සෑහීමට පත් වන අයුරු උකස් කරන්නා විසින් ඔප්පු කරනු ලැබුවහොත්, එවැනි වැඩිපුර පොලියක් අයකර ගැනීමට බඩු උකස් ගන්නාට හිමිකම් නැත.

ඒ උකස් තුණ්ඩුවට අදාල උකස් භාණ්ඩය, එය උකස් කල දින සිට මාස 12 ක කාලයක් තුල දී බේරා ගනු නොලැබුවහොත් ඒ උකස් භාණ්ඩය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය හැකි ය.

එසේ විකිණීමේ දි ලැබුණු යම් අතිරික්ත ලාබයක් වේ නම්, එය එකී විකිණීමේ දින සිට එක් අවුරුදු කාලයක් තුළ දී උකස් කරන්නා විසින් ඉල්ලා නොසිටියහොත්, ඒ අතිරික්ත ලාබය ඒ උකස් කරන්නාගේ බැරට එක් අවුරුදු කාලයකට පළාත් සභාවේ තැන්පත් කරනු ලැබිය යුතුය.

(29 වන වගන්තිය)

හතරවන උපලේඛනය

උකස් භාණ්ඩ වෙන්දේසි කිරීමට අදාල නියෝග

1. වෙන්දේසි කරනු ලබන සියලුම උකස් භාණ්ඩ මහජනයා විසින් දැක බලා ගනු පිණිස වෙන්දේසිකරු විසින් විවෘතව තැබිය යුතුය.

2. උකස් භාණ්ඩ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු ප්‍රකාශ කෙරෙන නාමාවලියක් වෙන්දේසිකරු විසින් ප්‍රසිද්ධ කළ යුතුය.

(අ) බඩු උකස් කරන්නාගේ නම සහ ව්‍යාපාරික ස්ථානය

(ආ) ඒ උකස් භාණ්ඩය උකස් කළ මාසය

(ඇ) එක් එක් උකස් භාණ්ඩය උකස් කරනු ලැබූ අවස්ථාවේ දී උකස් භාණ්ඩය පොතෙහි ඇතුළත් කරන ලද අකාරයට ඒ එක් එක් උකස් භාණ්ඩ අංකය

3. එක් එක් බඩු උකස් ගන්නා වෙත ඇති උකස් භාණ්ඩය, ඒ නාමාවලියෙහි වෙනත් යම් බඩු උකස් ගන්නකුගේ උකස් භාණ්ඩ වලින් වෙන් කොට දැක්විය යුතුය.

4. විකිණීම පිළිබඳ දැන්වීම වෙන්දේසිකරු විසින් යටත් පිරිසෙයින් එක් සිංහල, එක් දෙමළ සහ එක් ඉංග්‍රීසි පුවත්පතක බැගින් ප්‍රසිද්ධ කර යුතු අතර විකිණීම කරනු ලබන ප්‍රදේශයේ මහජනයා ගැවෙසෙන ස්ථාන වල ඒ දැන්වීම් ප්‍රදර්ශනය කල යුතුය. තවද, ඒ දැන්වීම්වල පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතුය.

(අ) බඩු උකස් ගන්නාගේ නම සහ ව්‍යාපාරික ස්ථානය, සහ

(ඇ) ඒ උකස් භාණ්ඩය උකස් කරනු ලැබූ මාස

5. ඒ දැන්වීම් එකම පුවත්පතේ දින දෙකක් බැගින් පළ කළ යුතු අතර, දෙවන දින දැන්වීම් පළ කළ යුත්තේ විකිණීම කරන පළමුවන දිනයට යටත් පිරිසෙයින් පැහිදිලි දින දහයකට පෙරය.

6. යම් විකිණීමක දි බඩු උකස් ගන්නා ලන්සු තබන විට ඒ විකිනීමේ දි වෙනත් යම් තැනැත්තන් විසින් කරනු ලබන ලන්සු වලට වඩා වෙනත් අන්දමකින් වෙන්දේසිකරු විසින් ඒ ලන්සු ගැන සැළකිල්ලක් නොදැක්විය යුතු අතර, යම් භාණ්ඩයක් බඩු උකස් ගන්නා විසින් මිල දී ගනු ලැබූ විට, ඒ භාණ්ඩය මිලට ගත් තැනැත්තා වශයෙන් ඒ බඩු උකස් ගන්නාගේ නම වෙන්දේසිකරු විසින් නොපමාව හඬනගා ප්‍රකාශ කර යුතුය.

7. ඒ විකිණීමෙන් පසු දින දහහතරක් තුළ දි, ඒ නාමාවලියේ පිටපතක් හෝ බඩු උකස් ගන්නාගේ උකස් භාණ්ඩ වලට අදාල ඒ නාමාවලියේ කොටසේ පිටපතක්, ඒ බඩු උකස් ගන්නාගේ උකස් භාණ්ඩ විකිණූ මුදල් ප්‍රමාණය ඇතුළත් කොට වෙන්දේසිකරුගේ අත්සන යොදා සත්‍යායනය කොට ඒ බඩු උකස් කරන්නාට වෙන්දේසිකරු විසින් භාරදිය යුතුය.

8. බඩු උකස් ගන්නා විසින් ඒ වෙන්දේසියෙන් පසු යටත් අවුරුදු දෙකක කාලයක්, එවැනි සෑම නාමාවලියක්ම සුරක්ෂිතව තබාගත යුතුය.

.

39. දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය 2016 අංක 01 දරන දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයා විසින් එයට 2016.06.03 දින සිය අනුමැතිය ලබා දී ඇති බැවින් 2016.06.03 දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

2. මෙම ප්‍රඥප්තියේ මින්මතු "ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියේ 4 වැනි වගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුලත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(ඌ) කර්මාන්තකරුවන් විසින් සිය කර්මාන්තවල නිශ්පාදන ප්‍රවර්ධනය සහ දියුණු කිරීම සඳහා පළාත තුල එම කර්මාන්ත කරුවන් විසින් සමිති සහ සංගම් පිහිටුවා ගැනීම දිරිමත් කිරීම;"

2002 අංක 1 දරන දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය පනතේ 4 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රඥප්තියේ 6 වැනි වගන්තිය, එහි (17) වැනි ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(18) කර්මාන්තකරුවන් විසින් සිය කර්මාන්තවල නිශ්පාදන ප්‍රවර්ධනය සහ දියුණු කිරීම සඳහා පළාත තුළ පිහිටුවනු ලබන යම් සමිතියක් හෝ සංගමයක් ලියාපදිංචි කිරීම සහ ඒ සඳහා ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කිරීම"

ප්‍රඥප්තියේ 6 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

4. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවය ක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

දෙනගම විතාරණගේ රෝහණ ප්‍රිය උපුල් අමාත්‍ය, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය, දකුණු පළාත් සභාව

2016 ජූලි මස 06 වැනි දින,
ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය, 2වන මහළ, දක්ෂිණ පාය, ලබුදූව, ගාල්ල.

40. දකුණු පළාතේ පළාත් සභාවේ 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ, පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ 2018 අංක ... දරන දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

02. (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන) 1992 අංක 02 දරන දකුණු පළාත් සභාවේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත වූ 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 104 අ වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — දකුණු පළාතේ 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 104 අ වගන්තිය සංශෝධනය කිරීම.

104 අ (1) මේ වගන්තියේ මින්මතු "ගිණුම" යනුවෙන් සඳහන් කරනු ලබන "පළාත් දිරි ගැන්වීමේ අරමුදල් ගිණුම" යනුවෙන් හැඳින්වෙන ගිණුමක් පිහිටුවා පවත්වා ගත යුතුය. — පළාත් දිරි ගැන්වීමේ අරමුදල් ගිණුම පිහිටුවීම

(2) ගිණුම පවත්වා ගෙන යාමේ අරමුණ පහත ආකාරයට වන්නේය. — අරමුණ

(අ) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන ප්‍රඥප්ති කාර්යක්ෂම ලෙස පරිපාලනය කරනු ලැබීම සහතික කිරීම අරභයා පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් උදෙසා දිරිගැන්වීමේ දීමනා ලබා දීම.

(ආ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් අවශ්‍ය සුභ සාධන කටයුතු සඳහා අවශ්‍ය වන මුදල් ලබා දීම.

(3) මෙම ගිණුම පරිපාලනය සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් සිදු විය යුතු අතර එහි සංයුතිය පහත ආකාරයෙන් විය යුතුය. — ගිණුමේ පරිපාලනය

(අ) දකුණු පළාත් ප්‍රධාන ලේකම්,
(ආ) දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්,
(ඇ) දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය),
(ඈ) ගාල්ල දිස්ත්‍රික් ලේකම්,
(ඉ) පළාත් ආදායම් කොමසාරිස්වරයා සහ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය ලබා දෙන පළාත් ආදායම් සේවයේ නියෝජ්‍ය කොමසාරිස්වරුන් දෙදෙනෙකු.

(4) ගිණුමේ කටයුතු හා පරිපාලනය සම්බන්ධව තීරණ ගැනීමේදී කමිටුවේ සාමාජිකයින් පස් දෙනෙකුගේ අනුමැතියෙන් එම තීරණ බලාත්මක කළ හැකිය.

(5) (අ) දකුණු පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ නමින් රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක් ලෙස ගිණුම පවත්වාගෙන යා යුතුය.

(ආ) සෑම ලිත් වර්ෂයක් අවසානයේ ගිණුමේ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාවක් අනුගාමික මුදල් වර්ෂයේ මාර්තු මස තිස් එක දිනයට පූර්වයෙන් කොමසාරිස්වරයා විසින් පිළියෙල කොට ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

ගිණුමට මුදල් උපයා ගන්නා ආකාරය

(6) ආරම්භක මුදල වශයෙන් රුපියල් ලක්ෂයක මුදලක් පළාත් සභා අරමුදල මගින් මෙම ගිණුමට ලබා දීමෙන් ගිණුම ආරම්භ කළ යුතුය.

(7) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන තත්කාලීන ප්‍රඥප්ති යටතේ පළාත් සභා අරමුදලට බැර වන ආදායමින් පහත (අ) සහ (ආ) මගින් විස්තර වන ආදායම් ශීර්ෂයන්ගෙන් එහි සඳහන් ප්‍රතිශතයන්ට යටත් වූ මුදල් ප්‍රමාණයක් පළාත් සභා අරමුදලින් අර්ධ වාර්ෂිකව මෙම ගිණුමට බැර කළ යුතුය.

(අ) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් ප්‍රඥප්තියක සඳහන් විධිවිධානවලට අනුව යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බවට නියම කර ඇති බද්දක් හෝ ගාස්තුවක් නියමිත කාලයේදී නිසි පරිදි ගෙවා නොමැති අවස්ථාවක ක්‍රියාත්මක වී එම නියමිත බද්ද හෝ ගාස්තුව ආදායමක් ලෙස රැස්කර ගනු ලැබූ අවස්ථාවක සහ

පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක් යටතේ ඉදිරිපත් කළ යුතු බවට එකී ප්‍රඥප්ති මගින් නියම කර ඇති වාර්තා නොසැපයීම සහ යම් වාර්තාවක ප්‍රකාශ කර ඇති පිරිවැටුම, යම් සාධන පත්‍රයක ප්‍රකාශ කර ඇති වටිනාකම, ප්‍රඥප්තියේ විධිවිධාන අනුව පරීක්ෂා කිරීමේදී අසත්‍ය ලෙස ප්‍රකාශ කර ඇති බවට තහවුරු වීම යන කරුණ මත තක්සේරුකරුවකු විසින් කරනු ලබන තක්සේරුවක් සහ සාධන පත්‍රයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව

පිළිබඳව 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 62 වගන්තිය යටතේ නිකුත් කළ මත ප්‍රකාශයක් මගින් ආදායම රැස් කරගනු ලැබ ඇති අවස්ථාවක එලෙස රැස් කර ගනු ලබන ආදායමෙන් සියයට දොළහයි දශම පහක් (12.5%) ද,

(ආ) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක් යටතේ පනවනු ලබන දඩ සහ දණ්ඩන මගින් රැස් කරනු ලබන ආදායමෙන් සියයට පහක් (5%) ද ගිණුමට බැර කළ යුතුය.

(ඇ) ඉහත (අ) හා (ආ) කරුණු යටතේ පළාත් සභා අරමුදලට රැස් කරන ලද මුදල සම්බන්ධයෙන් ලේඛන කොමසාරිස්වරයා විසින් පවත්වාගෙන යායුතුය.

ගිණුමින් කරනු ලබන ගෙවීම්

(8) ගිණුම පරිපාලනය සඳහා වූ කමිටුව විසින් පහත කරුණු සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රමාණයන් වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබා දිය යුතුය.

(අ) ගිණුම පිහිටුවීම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අර්ධ වර්ෂයකට වරක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ලබා දෙන දිරි දීමනා සහ වැටුප් සංශෝධනයන්හිදී උද්ගත වන හිඟ දිරි දීමනාව,

(ආ) නිලධාරීන්ගේ සුභ සාධනය සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රමාණ,

(9) එක් එක් ලිත් වර්ෂයට අදාළව ඉහත (8) උප වගන්තිය යටතේ දැක්වෙන වියදම් පියවා ගැනීමෙන් අනතුරුව රුපියල් ලක්ෂ දහයක මුදලක් ගිණුම තුළ රඳවා ඉතිරි වන මුදල් ප්‍රමාණය වර්ෂ අවසානයේ පළාත් සභා අරමුදලට බැර කළ යුතුය.

(10) මෙම ගිණුම යටතේ වන මුදල් ගිණුමින් ඉවත් කර ගැනීම සඳහා වන චෙක් පත් හෝ අණකර ප්‍රධාන ලේකම් විසින් ඒ සඳහා නිශ්චිතව බලය ලබා දෙන නිලධාරීන් දෙදෙනෙකු විසින් කළ යුතුය.

සාමාන්‍ය කරුණු

(11) මෙම ගිණුම සම්බන්ධව එක් එක් ලිත් වර්ෂය සඳහා පිළියෙල කරන අවසන් ගිණුම් වාර්තා 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියෙහි 102 වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව විගණකාධිපතිවරයාගේ විගණනයට යටත්ව පවත්වා ගත යුතුය.

(12) (අ) ගිණුම ක්‍රියාත්මක කිරීමට අදාළ කාර්ය පටිපාටි නියම කිරීම සඳහා ද, ආකෘතිපත් නියම කිරීම සඳහා ද,ඊට ආනුශාංගික කරුණු සඳහා ද කොමසාරිස්වරයාගේ නිර්දේශ මත අමාත්‍යවරයා විසින් කලින් කලට කාර්ය පටිපාටික රීති නියම කළ හැකිය.

(ආ) ඉහත (අ) යටතේ සාදන ලද කාර්ය පටිපාටික රීති අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කළ යුත්තේය.

03. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

09-422

41. 2018 අංක 02 දරන දකුණු පළාතේ බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය.

01. මේ ප්‍රඥප්තිය 2018 අංක 02 දරන දකුණු පළාතේ බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

02. 2013 අංක 01 දරන දකුණු පළාතේ බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියෙහි පළමු පිටුවේ සඳහන් "මේ ප්‍රඥප්තියේ විධිවිධාන 1942 අංක 13 දරන බඩු උකස් ගන්නන්ගේ ආඥා පනතේ විධිවිධානවලට අනුකූල වේ" යන වචනය ඉවත් කොට "අනනුකූල වේ" යනුවෙන් සංශෝධනය කරනු ලැබේ. අනුකූල වේ යන වචනය ඉවත් කොට අනනුකූලවේ යනුවෙන් සංශෝධනය කිරීම

03. ප්‍රධාන ප්‍රඥප්තියේ 11වන වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 11(1) වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.

11 (1) උකස් ව්‍යාපාර තැන්පතු මුදල මත උද්ගත වන යම් පොළියක් වේ නම් එම මුදල පළාත් සභා අරමුදලට බැරවිය යුතුය.

04. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වූ විටෙක සිංහල භාෂා පාඨය බලපවත්වන්නේය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල නාමය බලපැවැත්විය යුතු බව.

9-421

42. 2019 අංක 01 දරන දකුණු පළාත් වාරිමාර්ග ප්‍රඥප්තිය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයේ 09 වන උපලේඛනයේ 01 වැනි ලැයිස්තුවේ 19 වැනි ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා දකුණු පළාතේ අන්තර් පළාත් වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර සියලු වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රම සම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ නඩත්තු කිරීම පිණිස ද ඊට අදාළවන කාර්ය කටයුතු පහසු වනු පිණිස දකුණු පළාත් වාරි සංවර්ධන අරමුදල නම් වූ අරමුදලක් පිහිටුවීම පිණිස ද ඊට අනුශංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි. පූර්විකාව

මෙම ප්‍රඥප්තිය මගින් 1951 අංක 01 දරන වාරිමාර්ග (සංශෝධිත) පනත, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධිත) පනත, 1973 අංක 37 දරන වාරිමාර්ග (සංශෝධිත) පනත, 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධිත) පනත, 1990 අංක 34 දරන වාරිමාර්ග (සංශෝධිත) පනත, 1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධිත) පනත යන පනත්වලින් සංශෝධිත 1948 අංක 32 දරන වාරිමාර්ග ආඥාපනත අනනුකූල කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය 2019 අංක 01 දරන දකුණු පළාත් වාරිමාර්ග ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

02. දකුණු පළාත් ආණ්ඩුකාරවයාගේ අනුමැතිය ලත් දින සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන්නේය. ක්‍රියාත්මක වන දිනය

I වැනි පරිච්ඡේදය

03. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම උදෙසා (මෙහි මින්මතු දෙපාර්තමේන්තුව නමින් හඳුන්වනු ලබන) දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබේ. දෙපාර්තමේන්තුව පිහිටුවීම

(1) මෙම ප්‍රඥප්තිය යටතේ දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා (මෙහි මින්මතු අධ්‍යක්ෂවරයා නමින් හඳුන්වනු ලබන) දකුණු පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ යන නාමය යටතේ අධ්‍යක්ෂවරයෙකු පත්කරනු ලබන අතර, ඔහු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේය. දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු පත් කිරීම

(2) දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහාත් කළමනාකරණය පහසු කිරීම සඳහාත් මෙම දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂවරයෙක්, ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරුවරයෙක් දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරුවරුන් තිදෙනෙක්, වාරිමාර්ග ඉංජිනේරුවරුන් තිදෙනෙක් සහ සහාය කාර්ය මණ්ඩලයකින් ද සමන්විත වන්නේය.

දෙපාර්තමේන්තු සංයුතිය

(3) පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ, අතිරේක පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ තනතුරු පත් කිරීම සම්බන්ධයෙන් 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධිත) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තියේ විධිවිධාන අදාළ වන්නේය.

04. අධක්ෂවරයා පළාත් වාරිමාර්ග විෂයභාර ලේකම්වරයාගේ සාමාන්‍ය පරිපාලනනයට හා විධායන්ට යටත්ව ක්‍රියා කළයුතු වන්නේය.

ලේකම්වරයාගේ විධානයන්ට යටත් වන බව

II වැනි පරිච්ඡේදය

05. අධ්‍යක්ෂවරයාට පහත සඳහන් බලතල පවතින්නේය:

අධ්‍යක්ෂවරයා සතු බලතල

(1) පළාත තුළ පවතින වාරිමාර්ග ක්‍රම වඩාත් ඵලදායී අයුරින් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(2) පළාත තුල නව වාරිමාර්ග ක්‍රම වඩාත් ඵලදායී අයුරින් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(3) වාරි ක්‍රම පුනරුත්ථාපනය, නඩත්තුව හා සංරක්ෂණය සඳහා ගොවි ජනතාවගේ සහභාගිත්වය ලබාගැනීම.

(4) වාරි ක්‍රම, වාරි රක්ෂිත වලට හානි පමුණුවන පුද්ගලයින් නීතිය හමුවට පැමිණවීමට කටයුතු කිරීම, ඊට අදාළ චෝදනා පැමිණිලි කිරීම හා අභිචෝදනා ඉදිරිපත් කිරීම.

(5) වාරි රක්ෂිත ප්‍රදේශ සිතියම් ගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.

(6) වාරික්‍රම අබලන්වීම හා විනාශවීමට තුඩුදෙන පාරිසරික හානි වැලැක්වීම, අවම කිරීම හා ඒ සඳහා පරිසර පද්ධතිය සංවර්ධනය කිරීම.

(7) ගංවතුර මගින් සිදුවන හානි අවම කිරීම සඳහා නිර්මිත ඉදිකිරීම හා නඩත්තුව සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(8) කරදිය කුඹුරු බිම් කරා ගලා ඒම මගින් සිදුවන හානි අවම කිරීම සඳහා නිර්මිත ඉදිකිරීම හා නඩත්තුව සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(9) වාරි පද්ධති සංවර්ධන කමිටු අධීක්ෂණය සඳහා නිලධාරීන් පත් කිරීම.

(10) මෙම ප්‍රඥප්තියේ කාර්යය හා කර්තව්‍යය ඉටු කිරීම සඳහා පූර්ව දැනුම් දීමකින් අනතුරුව යම් පරීක්ෂා කිරීමක් වෙනුවෙන්, සංවර්ධනය කිරීම වෙනුවෙන්, නඩත්තු කිරීම වෙනුවෙන් යම් දේපළකට ඇතුළත් වීම.

අධ්‍යක්ෂවරයා සතු බලතල පැවරීම

06. අධ්‍යක්ෂවරයා සතු බලතල අධ්‍යක්ෂවරයා විසින් ලිඛිතව අතිරේක පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂකට, ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරුවරයාට පවරා දිය හැකිය.

අධ්‍යක්ෂවරයාගේ කාර්ය සහ කර්තව්‍ය

07. අධ්‍යක්ෂවරයාගේ කාර්යය හා කර්තව්‍යයන් පහත සඳහන් ආකාරයට වන්නේය.

(1) දකුණු පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් දෙපාර්තමේන්තුවේ විෂයය පථයට අයිතිවන සියළුම වර්ගයේ වාරික්‍රම හඳුනා ගැනීම, ලේඛනගත කිරීම, සිතියම් ගත කිරීම හා ප්‍රකාශයට පත්කිරීම.

එසේ වුවද ප්‍රකාශයට පත්කරන ලද නිවේදනයට ඇතුලත් වාරික්‍රම වෙනස් කිරීමකට හෝ අලුතින් ඇතුළත් කිරීමකට හේතු වන්නේ නම් එකී වෙනස් කිරීම හෝ ඇතුළත් කිරීම අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව අධ්‍යක්ෂවරයා විසින් ප්‍රකාශයට පත්කළ යුතුය;

(2) පළාත් වාරිමාර්ග පද්ධතිය, නව ඉදිකිරීම්, පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හා සංරක්ෂණය කිරීම සඳහා වාර්ෂිකව, කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන සැලසුම් සකස් කිරීම;

(3) පිළියෙල කරන ලද සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට පෙර පළාත් සැලසුම් කමිටුව වෙත හෝ ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගැනීම;

(4) පළාත් වාරි යෝජනා ක්‍රමයක් සඳහාම වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුව නමින් කමිටුවක් යාය මට්ටමින් පිහිටුවා පවත්වාගෙන යාම හා ලියාපදිංචිය;

(5) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටු නියෝජනය වන පරිදි වාරි පද්ධති සංරක්ෂණ හා සංවර්ධන කමිටුව නමින් වාරි පද්ධතියට අදාළ වන කමිටු පිහිටුවා පවත්වාගෙන යාම හා ලියාපදිංචිය;

III වැනි පරිච්ඡේදය

08. දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් සෑම පළාත් වාරි යෝජනා ක්‍රමයන් සඳහාම වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුව නමින් කමිටුවක් යාය මට්ටමින් පිහිටුවිය යුතුය. යාය මට්ටමේ කමිටු පිහිටුවීම, සාමාජිකත්වයේ ගන පූර්ණය, ව්‍යවස්ථාව හා කාර්යයන්

(1) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවක සාමාජිකයෙකු වීම සඳහා පහත සඳහන් සුදුසුකම් විය යුත්තේය. සුදුසුකම්

(අ) කෘෂි කර්මාන්තය ප්‍රධාන ජීවිකාව කරගත් තැනැත්තෙක් වීම.

(ආ) වයස අවුරුදු දහඅටට නොඅඩුවීම.

(ඇ) තමා සාමාජිකත්වය අපේක්ෂා කරන වාරි සංරක්ෂණය හා සංවර්ධන කමිටු බල ප්‍රදේශයේ ස්ථිරව පදිංචිව සිටීම හෝ අවුරුදු දෙකකට වැඩි කාලපරිච්ඡේදයක් සඳහා ඒ බල ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතුවල නිරතවී සිටීම.

(2) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවක ආශ්‍රිත සාමාජිකයෙකු වීම සඳහා පහත සඳහන් සුදුසුකම් විය යුත්තේය. ආශ්‍රිත සාමාජිකයෙකුගේ සුදුසුකම්

(අ) තම ප්‍රධාන ජීවිකාව කෘෂිකර්මාන්තය නොවුනේ වුවද, කමිටු බල ප්‍රදේශය ඇතුලත ඉඩමක හිමිකරු හෝ පදිංචිකරුවකු හෝ භුක්තිකරුවෙකු වීම. කෘෂිකාර්මික

(ආ) කෘෂිකර්මයට අදාළ නිෂ්පාදනයක හෝ කෘෂිකාර්මික නිෂ්පාදන හා භාණ්ඩ අලෙවියෙහි නිරතවන අයකුවීම.

(3) දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අනුමැතියට යටත්ව හා මෙම කමිටු සාමාජිකත්වයේ එකඟත්වය මත වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවේ උපදේශකවරයා ලෙස අදාළ ප්‍රදේශය භාර කෘෂිකර්ම උපදේශකවරයා පත්කර ගත හැකිය.

(4) මෙසේ පිහිටුවාගත් කමිටුවේ රැස්වීම් පැවැත්වීම සඳහා මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක සන පූර්ණයක් විය යුතුය.

(5) සෑම වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවක් අධ්‍යක්ෂවරයා විසින් අනුමත කළ ව්‍යවස්ථාවකට අනුව ක්‍රියා කළ යුතුය.

09. වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවක කාර්යයන් පහත සඳහන් ආකාරයට වන්නේය.

වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවේ කාර්යයන්

(1) සෑම වාරි සංරක්ෂණය හා සංවර්ධන කමිටුවක් විසින්ම ස්වකීය බල ප්‍රදේශය තුළ ඇති එල්ලංගාව වැව්, අමුණු හා ඇළ මාර්ග, බුබුල් ආශ්‍රිතව සිදු කළ යුතු නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීම හා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදු කිරීම.

(2) වාරි කළමනාකරණ කටයුතු නිසි කලට වේලාවට කරනු ලබන බවට වගබලා ගැනීම.

(3) වාරි කර්මාන්තවලින් සැපයෙන ජලය හා කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රයෝජනයට ගන්නා ජලය, කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය සහයෝගය අදාළ ආයතන තුළින් ලබා දීමට කටයුතු කිරීම.

(4) කෘෂිකාර්මික ඉඩම්වල හෝ කුඹුරුවල හෝ වී වගා කිරීම නැතහොත් වෙනත් ආකාරයක භෝග වගාකිරීම සඳහා ධෛර්ය දීම පිණිස ගොවි සංවිධානවලට අවශ්‍ය සහාය ලබාදීම.

(5) වී වගා කිරීම හෝ වෙනත් ආකාරයේ වගා කිරීම් වලට අදාළ චාරිත්‍ර වාරිත්‍ර සිදු කිරීම සඳහා ගොවි සංවිධානවලට අවශ්‍ය සහාය ලබාදීම හා පෙළඹවීම.

(6) පස සංරක්ෂණය කිරීම සඳහා පලිබෝධ වලින් හා රෝගවලින් ආරක්ෂා කිරීමට පියවර ගැනීම.

10. (1) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවේ සාමාජිකයින්ගේ වැඩි කැමැත්තෙන් "යාය නියෝජිතයා" නමින් අයෙකු තෝරා පත්කර ගත යුතු අතර ඔහු වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවේ නිලයක් දරන්නෙකු හෝ සාමාජිකයෙකු විය හැකිය.

යාය නියෝජිතයා පත් කිරීම හා ධූර කාලය

(2) පත්වන යාය නියෝජිතයෙකු පත් කරන ලද දින සිට ඉවත් නොකරන තාක් වසර 3 ක කාලයක් ධූරය දැරිය හැකිය.

11. ඉහත 10 වගන්තිය යටතේ පත්වනු ලබන යාය නියෝජිතයාගේ ධූර කාලය පහත අවස්ථා යටතේ හිස් වන්නේය.

යාය නියෝජිතයා ඉවත් කිරීම හෝ ඉල්ලා අස් වීම

(1) යාය නියෝජිතයා මිය යාම.

(2) අධ්‍යක්ෂවරයා වෙත යවනු ලබන ඉල්ලා අස්වීමේ ලිපියක් හා එය පිළිගනු ලැබූ බවට අධ්‍යක්ෂවරයා කරනු ලබන දැනුම්දීමකින්.

(3) අකාර්යක්ෂමතාවය හෝ අකටයුතුකම් පදනම් කරගෙන අධ්‍යක්ෂවරයා විසින් කරන ලද පරීක්ෂණයකින් හෙළි වූ කරුණු පදනම් කරගෙන ඉවත් කිරීමකින්.

(4) වාරි සංරක්ෂණ හා සංවර්ධන කිමටුවේ සමස්ථ සාමාජිකත්වයෙන් තුනෙන් දෙකක බහුතර ඡන්දයක් සහිත යෝජනා සම්මතයකින්.

ඉවත් කිරීම සම්බන්ධයෙන් වන අභියාවනා

12. (1) ඉහත 11 වගන්තියේ (2) හා (3) උප වගන්ති යටතේ කරනු ලබන ඉවත් කිරීමක් සම්බන්ධයෙන් වන අභියාවනයක් ඉවත් කරනු ලබන දින සිට දින 30 ක් ඇතුළත ලේකම් වෙත එසේ ඉවත් කිරීමට ලක්වූ අය විසින් ලිඛිතව ඉදිරිපත් කළ හැකි අතර එසේ ඉදිරිපත් වන අභියාවනයක් සම්බන්ධයෙන් ලේකම්ගේ තීරණය අවසානාත්මක විය යුතුය.

(2) මෙහි පළවන උප වගන්තිය යටතේ අභියාවනයක් ඉදිරිපත් කර ඊට අදාළ තීරණය ලේකම් විසින් දැනුම් දෙන තෙක් හෝ ඉවත් කිරීම සිදුවී දින 30 ක කාලසීමාවක් ගතවන තෙක් වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවක් විසින් යාය නියෝජිතයෙකු පත්කර ගැනීම අත්හිටුවිය යුත්තේය.

යාය නියෝජිතයාගේ කාර්යයන්

13. යාය නියෝජිතයාගේ කාර්යයන් පහත ආකාරයෙන් විය යුතුය.

(1) තම බල ප්‍රදේශයේ වාරිමාර්ග ආරක්ෂා කිරීම, වාරි ක්‍රමවලට හානි පමුණුවන්නන් නීතිය ඉදිරියට ගෙන යාමට අවශ්‍ය සහයෝගය දෙපාර්තමේන්තුවට ලබාදීම වාරි ජලාශවල හා අනෙකුත් වාරික්‍රමවලින් නිකුත් කෙරෙන ජලය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම, වගා සැලසුම් කාල සටහන්වලට අනුව වගා වැඩසටහන් ගෙන යාම හා මෙහෙයවීම සඳහා සහාය දීම.

(2) අවශ්‍ය සෑම අවස්ථාවකදීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් තම බල ප්‍රදේශයට අදාළව පවත්වාගෙන යන කුඹුරු නාමලේඛනයට අනුකූලව අවශ්‍ය ක්‍රියා සිදු කිරීම.

(3) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුඹුරු නාම ලේඛනයෙහි එක් එක් ඉඩම් හිමියාට හෝ භුක්තිකරුට හිමිවන කුඹුරු ඉඩම්වල වපසරියට හා පංගුවට අනුගතව ඔවුන් වෙත ප්‍රධාන වාරි වේල්ල හා ප්‍රධාන බෙදුම් ඇල වෙන්කොට ඊට අනුගතව ජල පරිහරණය යථා පරිදි සිදුවන අයුරින් භාරදීම හා එසේ භාරදීමට අදාළව ක්‍රියාත්මක විය යුතු ආකාරය සම්බන්ධයෙන් අදාළ පාර්ශවය සමග ලියවිල්ලකට එළඹීම.

(4) යාය නියෝජිතයා විසින් එක් එක් ඉඩම් හිමියාට හෝ භුක්තිකරු බෙදා බාරදුන් කෙටස අධ්‍යක්ෂවරයාගේ සහය ඇතිව සුදුසු ක්‍රමයක් යටතේ මායිම් සලකුණු කර දීම.

(5) සෑම කන්නයක් ආරම්භ වීමට ප්‍රථම අදාළ පාර්ශවය වෙතින්, සලකුණු කරනු ලබන කොටසේ වැඩී ඇති කටු පඳුරු සහිත කැළය ඉවත් කොට පස සේදී යාම නිසා හානිවී ඇති බැම්මේ කොටස්, වෙන් කොට ඇති රක්ෂිතයෙන් හෝ බාහිරින් පස් කපා පුරවා මනා සේ සකස් කර පවත්වාගෙන යාමට වගබලා ගැනීම.

අධ්‍යක්ෂවරයා විසින් මහේස්ත්‍රාත්වරයා වෙත කරුණු ඉදිරිපත් කිරීම

14. (1) ඉහත 13 වගන්තියෙහි (3) වන උප වගන්තියේ සඳහන් ලියවිල්ලෙන් වූ එකඟතාවය කඩවන ආකාරයට ක්‍රියා කරන්නේ නම් එසේ ක්‍රියා කිරීම සම්බන්ධයෙන් යාය නියෝජිතයා විසින් අධ්‍යක්ෂවරයා වෙත වාර්තා කළ යුතුය.

(2). අධ්‍යක්ෂවරයා වෙත ඉහත (1) වන උප වගන්තිය යටතේ වන වාර්තා කිරීමක දී එකඟතාවයෙන් බැහැර වී කටයුතු කරන ලද පාර්ශවය වෙත දින 7 ක් කල් දෙමින් කරනු ලබන දැන්වීමකින් අනතුරුව තවදුරටත් ඇළෙහි පංගු කොටස් නඩත්තු කාර්යයන් එකී පාර්ශවය විසින් ඉටු නොකරන්නේ නම් ඒ සම්බන්ධයෙන් ඊට අදාළ වන බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත් වෙත අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නිශ්චිතව බලය පවරන අය වාර්තා කළ යුතු අතර මහේස්ත්‍රාත්වරයා විසින් එකී වාර්තා කිරීම මත අදාළ පාර්ශවය කැඳවා ප්‍රධාන නඩත්තු කාර්යය ඉටු කරනු පිණිස වූ සුදුසු නියෝගයක් කරනු ලැබිය හැකිය.

IV වැනි පරිච්ඡේදය

වාරි පද්ධති සංවර්ධන කමිටු පිහිටුවීම

15. වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටු නියෝජනය කරන වාරි නියොජිතයන්ගෙන් සැදුම්ලත්වන පරිදි වාරි පද්ධතිවල භෞතික පිහිටීම පදනම් කර ගනිමින් වාරි පද්ධතියටම අදාළවන පරිදි වාරි පද්ධති සංවර්ධන කමිටුවක් පිහිටුවිය යුතුය.

වාරි පද්ධති සංවර්ධන කමිටු සංයුතිය

16. (1) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටු නියෝජනය කරන යාය නියෝජිතයන් අතරින් එක් අයෙකු සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යනුවෙන් තිදෙනෙකු සාමාජිකයන් විසින් පත්කරගත යුතුය.

(2) සෑම වාරි පද්ධති සංවර්ධන කමිටුවක සාමාජිකයන් විසින් එම කමිටුවේ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන නිලයන් නිත්‍ය සාමාජිකයන් වශයෙන් සෙසු සාමාජිකයන් සිව් දෙනෙකුට නොවැඩි වන සංයුතියක් යටතේ වාරි පද්ධති සංවර්ධන කමිටුව සඳහා වූ සුදුසු කාරක සභාවක් පත් කර ගත යුතුය.

(3) කමිටුවේ යම් නිලයක් පුරප්පාඩු වූ කල එම නිලය සුදුසු යාය නියෝජිතයෙකු නැවතත් සාමාජික ඡන්දයකින් පත්වන තෙක් එකී නිලයට අදාළ වගකීම ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු කමිටුව නියෝජනය කරන සාමාජිකයෙකු අධ්‍යක්ෂ විසින් පත් කළ යුතු අතර එසේ පත් කරනු ලබන අයගේ ධූර කාලය ධූරය හිස් වූ සාමාජිකයාගේ ඉතිරි වූ ධූර කාලය විය යුතුය.

(4) වාරි පද්ධති කමිටුවේ නිලයක් දරන්නෙකුගේ ධූරයේ කටයුතු සම්බන්ධයෙන් විරෝධතාවයන් පැන නැගී ඇති අවස්ථාවක එකී ධූරයෙන් ඔහු ඉවත් කළ යුතු බවට වාරි පද්ධති සංවර්ධන කමිටුවෙහි සාමාජිකයන්ගේ 2/3 ක ඡන්දයකින් යෝජනාවක් සම්මත කර අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ හැකි අතර, එවැනි අවස්ථාවකදී අධ්‍යක්ෂ විසින් ඒ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගත යුතුය.

වාරි පද්ධති සංවර්ධන කමිටුවේ කාර්යයන්

17. වාරි පද්ධති සංවර්ධන කමිටුවේ කාර්යයන් පහත සඳහන් ආකාරයට වන්නේය.

(1) තම වාරි පද්ධතියේ සංරක්ෂණය සඳහා කටයුතු කිරීම.

(2) පුනරුත්ථාපනය, සංවර්ධන කටයුතුවල දී පද්ධතියේ වාරිමාර්ග ව්‍යාපාරවලට දිය යුතු ප්‍රමුඛතාවය සම්බන්ධයෙන් අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම.

(3) පද්ධතිය පුරා පිහිටි වාරි රක්ෂිත හා පෝෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම.

(4) පද්ධතියේ සියලු වාරි ක්‍රම හා ජල ප්‍රවාහන ප්‍රදේශ ආරක්ෂා කිරීම සහාය වීම.

(5) පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමත පද්ධති සැලැස්මට අනුව වාරි පද්ධතියක් තුළ තිබිය යුතු අංගෝපාංග හා රක්ෂිත ආරක්ෂා කිරීමට දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහාය වීම.

18. සෑම වාරි පද්ධති සංවර්ධන කමිටුවක්ම අධ්‍යක්ෂවරයා විසින් ලියාපදිංචි කළ යුතුය.

19. (1) සෑම වාරි පද්ධති සංවර්ධන කමිටුවක් විසින් කමිටුව නමින් රජය පිළිගත් බැංකුවක් යටතේ ගිණුමක් පවත්වාගෙන යා යුතුය.

(2) කමිටු විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම අධ්‍යක්ෂ විසින් බලය පවරන ලද අයකු විසින් විගණනය කළයුතු අතර, විගණනය පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් අරමුණු කර ගනිමින් අනුගාමී වර්ෂයේ මාර්තු 31 ට පෙර කමිටුවේ සභාපති විසින් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

20. කිසියම් වාරි යෝජනා ක්‍රමයක් යටතේ කෘෂිකාර්මික නොවන වාණිජ පරමාර්ථයක් සඳහා අධ්‍යක්ෂවරයාගේ අනුමැතියකින් තොරව කවර තැනැත්තෙක් හෝ වාරි ජලය මුදා ගැනීමක් සිදු නොකළ යුතුය.

කෘෂිකාර්මික නොවන වාණිජ පරමාර්ථයක් සඳහා වාරි ජලය භාවිතා කිරීම

කිසියම් වාරි පද්ධතියක් යටතේ කෘෂිකාර්මික නොවන වාණිජ පරමාර්ථයන් සඳහා ජලය මුදා හැරීමක් සඳහා අධ්‍යක්ෂවරයා විසින් අනුමැතිය ලබා දෙන්නේ නම් ඒ සඳහා අය කළ යුතු ගාස්තු මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන නියෝග මගින් නියම කරනු ලබන ආකාරයට විය යුතුය.

V වන පරිච්ඡේදය

21. මෙම ප්‍රඥප්තියේ පරමාර්ථයන් සඳහා කටයුතු කිරීම පහසු වනු පිණිස පළාත් වාරිමාර්ග සංවර්ධන අරමුදල නම් වූ අරමුදලක් මෙයින් පිහිටුවනු ලබයි.

පළාත් වාරි සංවර්ධන අරමුදල සංස්ථාපනය

22. (1) ඉහත 21 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද අරමුදල එම අරමුදල නමින් සංස්ථාවක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, අරමුදලේ නමින් නඩු පැවරීමට හා පවරනු ලැබීමට යටත් විය යුතුය.

(2) (මෙහි මින්මතු අරමුදල නමින් හඳුන්වනු ලබන) පළාත් වාරි සංවර්ධන අරමුදල නිල බලයෙන් පත්වන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයකින් සමන්විත විය යුතුය.

එනම්,

(අ) දකුණු පළාත් වාරිමාර්ග විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්,

(ආ) දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්),

(ඇ) දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්),

(ඈ) දකුණු පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ,

(ඉ) දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ,

(3) අමාත්‍යාංශයේ ලේකම්, අරමුදලෙහි සභාපතිවරයා වන්නේය.

(4) අරමුදලේ ලේකම්, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරුවරයා විය යුතුය.

(5) අරමුදලේ ගිණුම් සකස් කිරීම, අරමුදලේ ලේකම්ගේ පරිපාලනයට යටත්ව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී විසින් කළ යුතුය.

23. අරමුදලේ අරමුණු පහත පරිදි වේ.

අරමුදලේ අරමුණු

(1) පළාතේ වාර්මාර්ග ව්‍යාපාරවලට අදාළවන නඩත්තු හා මෙහෙයුම්, සංවර්ධන පුනරුත්ථාපන කටයුතු වඩා කාර්යක්ෂමව ඉටු කිරීම.

(2) වාරිමාර්ග ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම.

(3) ගංවතුර හා කරදිය ගැලීම නිසා සිදුවන ආපදා පාලනය වඩා කාර්යක්ෂමව සිදු කිරීම.

(4) වාරිමාර්ග රක්ෂිත සංරක්ෂණය සඳහා පහසුකම් සැලසීම.

(5) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවල හා වාරි පද්ධති සංවර්ධන කමිටුවල මානව සම්පත වැඩි දියුණු කිරීම.

24. (1) දේපළක් දැරීම, බැහැර කිරීම, මිලට ගැනීම, බදු දීම හෝ විකිණීම.

අරමුදලේ බලතල හා කාර්යයන්

(2) අරමුදලේ අරමුණු යටතට ගත හැකි කවර හෝ කරුණු සම්බන්ධයෙන් වෙනත් පාර්ශ්ව සමඟ ගිවිසුම් ගත වීම.

(3) අරමුදලේ අරමුණු යටතට ගත හැකි කවර හෝ කරුණු සම්බන්දයෙන් ක්‍රියාත්මක කළයුතු ව්‍යාපෘති හඳුනාගැනීම, අනුමත කිරීම හා ක්‍රියාත්මක කිරීමද, එසේ ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා අවශ්‍ය වන ශ්‍රම දායකත්වය හා උපදේශන සේවාවන්.

(4) අරමුදලේ අරමුණු යටතට ගතහැකි කවර හෝ කරුණු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය කරන භෞතික සම්පත් පහසුකම් හා වෙනත් කවර හෝ සේවාවන් ලබාගැනීම.

(5) අරමුදලේ අරමුණු යටතට ගතහැකි කවර හෝ කරුණු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය කරන ශ්‍රම දායකත්වයන් වෙනුවෙන් අදාළ වන පාරිශ්‍රමිකයේ නියම කිරීම හා ගෙවීම.

(6) මෙම ප්‍රඥප්තියේ අරමුදලේ අරමුණු යටතට ගතහැකි කවර හෝ කරුණු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම හා ඊට අදාළව වියදම් දැරීම.

25. අරමුදලේ ලැබීම් පහත ආකාරයට වන්නේය.

අරමුදලේ ලැබීම

(1) කෘෂිකාර්මික නොවන වාණිජ කටයුතු සඳහා ජලය නිකුත් කිරීමේදී අයකරනු ලබන ගාස්තු.
(2) රජය මගින් ආධාර වශයෙන් වරින් වර ප්‍රදානය කරනු ලබන මුදල්
(3) දකුණු පළාත් සභාව විසින් අරමුදල් ගිණුමේ කාර්යයන් සඳහා සම්මත කරනු ලැබිය හැකි මුදල්
(4) යම් පුද්ගලයෙක්, ආයතනයක් හෝ සංවිධානයක් මගින් කෙරෙන පළාතේ වාරිමාර්ග දියුණුව සඳහා පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල්
(5) කමිටු මගින් සේවා ගාස්තු වශයෙන් ලබාගන්නා මුදල්
(6) සංදර්ශන, ලොතරැයි හා වෙනත් සම්මත ක්‍රම මඟින් ලබා ගන්නා සියළුම මුදල්.

26. අරමුදලෙන් කරන වියදම් පහත ආකාරයට වන්නේය.

අරමුදලේ වියදම

(1) මෙම ප්‍රඥප්තියේ අරමුණු යටතට ගැනිය හැකි කවර හෝ කාර්යයක් සම්බන්ධයෙන් කළ යුතු වියදම්
(2) අරමුදල නමින් බැඳී ඇති ගිවිසුම් ඉෂ්ඨ කිරීම වෙනුවෙන් කළ යුතු වියදම්, අරමුදල වෙනුවෙන් ලබාගන්නා සේවාවන් හෝ මිලදී ගැනීම වෙනුවෙන් කරනු ලබන වියදම්.
(3) අරමුදල වෙනුවෙන් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගෙවිය යුතු පාරිශ්‍රමික හෝ අනිකුත් ගෙවීම්.
(4) අරමුදලේ නමින් කළ යුතු වගකීම ඉෂ්ට කිරීමක් වෙනුවෙන් කළ යුතු කවර හෝ වියදම්

27. අරමුදල සඳහා වූ ගිණුම් රජය අනුමත කළ බැංකුවක් යටතේ පවත්වාගෙන යා යුතුය.

28. අරමුදලේ මුදල් සඳහා මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු අතර, සෑම ලිත් වර්ෂයක් සඳහාම වන ආදායම්-වියදම් පිළිබඳ වාර්ෂික ගිණුම් වාර්තාව අනුගාමී වර්ෂයේ මාර්තු 31 ට පෙර අරමුදලේ ලේකම් විසින් සකස් කර ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

29. අරමුදලේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතුය.

අරමුදලේ ගිණුම් පවත්වාගෙන යාම හා විගණනය.

(1) අරමුදලේ පරිපාලනය හා ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අරමුදලේ ලේකම් විසින් සෑම ලිත් වර්ෂයක් සඳහාම පිළියෙල කරනු ලබන වාර්ෂික වාර්තාව අනුගාමී වර්ෂයේ මැයි 31 වන දිනට පෙර සකස් කරන අරමුදලේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇති වාර්තාව එම වර්ෂයේ ජුනි මස 30 වන දිනට පූර්වයෙන් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ අරමුදල සම්බන්ධයෙන් වූ වාර්ෂික පාලන වාර්තාව එම සංවර්ධන අරමුදල් ගිණුමේ විගණනය කරන ලද එම වර්ෂයේ ගිණුම්වල පිටපතක්ද, එම ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවද සමග දකුණු පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත දකුණු පළාත් සභාව හමුවේ තැබිය යුතුය.

VI වන පරිච්ඡේදය

30. මෙම ප්‍රඥප්තිය යටතේ පහත ක්‍රියා සිදු කිරීම වරදක් වන්නේය.

(1) (අ) අවහිර කරනු ලැබීම.
(ආ) බාධා කරනු ලැබීම.
(ඇ) අනවසරයෙන් කොටු කර ගනු ලැබීම.
(ඈ) බාධා කිරීමට හෝ කොටු කර ගැනීමට කටයුතු සැලැස්වීම.
(ඉ) රැස්කොට ඇති ජලය ඕනෑකමින් හෝ ද්වේශ සහගතව අපතේ හැරීමට කටයුතු කිරීම.
(ඊ) ගස් කැපීම.
(උ) අනවසරයෙන් යම් ඉදිකිරීමක් සිදුකිරීම.
(ඌ) අනවසරයෙන් වගා කිරීම.

(2) යම් වැඩකින්, ජලධාරා ප්‍රදේශයේ පිහිටි ඇළකින්, වාරි කර්මාන්තයකින්, මාර්ගයකින්,බැම්මකින්, ඉවුරකින්, ර ක්ෂිතයකින්, වේල්ලකින් වැවක ප්‍රවේශයකින් හෝ වාරි කර්මාන්ත සංචිතයකින් අවසරයකින් තොරව ඛනිජ පස් හෝ වැලි ඉවත් කිරීම හෝ ඉවත් කිරීමට සැලැස්වීම.

(3) යම් වාරිමාර්ගයකට, ඇළකට, ජල මාර්ගයකට, වාරි රක්ෂිතයකට, හෝ කුඹුරු ඉඩමකට අපද්‍රව්‍ය මුදා හැරීමට සැලැස්වීම හෝ ගලායාමට ඉඩ හැරීම හෝ එසේ වන පරිදි, වාහන, යන්ත්‍රෝපකරණ වැනි දෑ සේදීම.

(4) අධ්‍යක්ෂවරයාගේ ලිඛිත අවසරය මත ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව මිස යම් ඇළක් කැනීම, වැවක් ඉදිකිරීම, නිර්මිත ඉදි කිරීම හෝ පවත්වාගෙන යාම.

(5) යම් වාරිමාර්ගයකට, ඇළකට, ජල මාර්ගයකට, වාරි රක්ෂිතයකට, හානි සිදුවන සේ අයාලයේ සැරිසැරීමට හැකිවන පරිදි සතුන් මුදා හැරීම.

(6) පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයාගේ නිසි ලිඛිත අවසරයක් නොමැතිව වැව් තාවුල්ලෙහි වගා කටයුතු කිරීම.

(7) කන්න රැස්වීමේදී තීරණය කොට එකඟතාවයකට පැමිණ පසු ඊට පටහැනිවී, වෙනත් වාරි භෝග හෝ අනවසරයෙන් බහු වාර්ෂික භෝග වගා කිරීම.

(8) යම් අයෙකුගේ වාරි අයිතිවාසිකම්වලට, අනිසි ලෙස බලපවත්වන සේ කටයුතු කිරීම.

31. ඉහත 30 වගන්තියේ සඳහන් (2) අනු වගන්තිය හැර අනෙකුත් කවර හෝ වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු රුː10,000 කට නොඅඩු හා රුː50,000 කට නොවැඩි දඩයකින් හෝ මාස 6 කට නොඅඩු හා මාස 12 කට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කිරීම හෝ ඒ දෙයාකාරයෙන්ම දඬුවමකට යටත් විය යුතුය.

32. ඉහත 30 වගන්තියේ (2) අනු වගන්තිය අනුව වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු රුː50,000 කට නොඅඩු හා රුː100,000 කට නොවැඩි දඩයකින් හෝ මාස 6 කට නොඅඩු හා මාස 12 කට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කිරීම හෝ ඒ දෙයාකාරයෙන්ම වූ දඬුවමකට යටත් විය යුතුය.

33. මෙම ප්‍රඥප්තිය යටතේ නියෝග සෑදිය යුතු යැයි සඳහන් කරුණු සම්බන්ධයෙන් හා පහත සඳහන් කරුණු ද ඇතුළුව ප්‍රඥප්තියේ අරමුණු යටතට ගැනෙන කවර හෝ කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය යුතුය.

34. දෙපාර්තමේන්තුවේ සියලුම නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථ නිරූපනයකට අනුකූලව රජයේ නිලධරයන් ලෙස සැළකිය යුතුය.

35. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල ගැන්විය යුතුය.

36. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස

අර්ථ නිරූපන

(1) "පළාත් සභාව" යන්නෙන්, දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ;

(2) "අමාත්‍යවරයා" යන්නෙන්, දකුණු පළාතේ වාරිමාර්ග විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ;

(3) "ලේකම්වරයා" යන්නෙන් දකුණු පළාතේ වාරිමාර්ග විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

(4) "පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව" හෝ "දෙපාර්තමේන්තුව" යන්නෙන් දකුණු පළාතේ වාරිමාර්ග විෂයභාර දෙපාර්තමේන්තුව අදහස් වේ;

(5) "අතිරේක පළාත් අධ්‍යක්ෂ" යන්නෙන් දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධානියා අදහස් වේ;

(6) "කුඹුරු ඉඩම්" යන්නෙන් මේ ප්‍රඥප්තියේ අර්ථානුකූලව වී වගා කිරීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන හෝ ප්‍රයෝජනයට ගත හැකි ඉඩම් අදහස් වන අතර, පෞද්ගලික ඉඩම් හා ඉඩම් සංවර්ධන ආඥාපනත, රජයේ ඉඩම් ආඥාපනත හා වෙනයම් පනතක් යටතේ අන්සතු කරනු ලැබූ ඉඩම්ද ඊට ඇතුළත්ය;

(7) "යාය" යන්නෙන් දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නම් කිරීමෙන් හෝ භාවිතයෙන් සම්මත කරගත් වගා කරන භූමියෙන් ඕනෑම කොටසක් අදහස් වේ;

(8) "භුක්තිකරු" යන්නෙන් ඉඩම් හිමියන් හෝ බදුකර හෝ වෙනත් හේතුවකින් අඳයට ගෙන වගා කිරීම නිසා කෘෂිකාර්මික ඉඩම් වගා කරන තැනැත්තා අදහස් වන අතර, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ හෝ වෙනයම් පනතක් යටතේ හෝ අන්සතු කරනු ලැබූ ඉඩම් ප්‍රයෝජනයට ගන්නා වූ හා භුක්ති විඳින්නාවූ තැනැත්තා ද ඇතුළත් වේ.

(9) "වාරිමාර්ග වැව" යන්නෙන් කෘෂිකාර්මික ඉඩම් හිමි නාමලේඛනයට නීත්‍යානුකූලව ඇතුළත් රක්ෂිත, ඇළ, දොල, කුඹුරු වලින් සමන්විත වූ වාරිමාර්ග එකක් හෝ කිහිපයකින් සමන්විත ප්‍රදේශයක් අදහස් වේ.

(10) "එල්ලංගාව හෝ වාරිමාර්ග පද්ධතිය" යන්නෙන් යම් නිශ්චිත බෑවුම් සහිත ප්‍රදේශයකින් ආරම්භව එක් දිශාවකට ගලා බසින

ජල ප්‍රවාහය වර්ෂාව ලැබීම හේතුවෙන් පිටාර යමින් ජලය එකතු වෙමින් ගලා ගොස්, අවසානයේ ප්‍රධාන ගංගාවකට, ඔයකට සම්බන්ධවීමට ප්‍රථම ජලය එකතුවීමට සලස්වා එම ජලය හසුරුවා ගත හැකි පරිදි ඉදිකර ඇති වාර්මාර්ග නිර්මිත හා ජලය එක් රැස් කරන පෝෂක ප්‍රදේශ, රක්ෂිත, ඇල, දොල, කුඹුරුවලින් සමන්විත වූ වාරිමාර්ග එකක් හෝ කිහිපයකින් සමන්විත ප්‍රදේශයක් අදහස් වේ.

(11) "සේවා ගාස්තු" යන්නෙන් වාරි සංවර්ධන කමිටු විසින් යථෝක්ත සුළු වාරිමාර්ගය අමුණු ඇළ වේලි පද්ධතිය ඉදිරියේ දී මනා ලෙස පවත්වාගෙන යාම සඳහා යම් යම් අවස්ථාවලදී රජයෙන් පළාත් සභාවෙන් හෝ වෙනයම් කුමන සංවිධානයකින් මූල්‍ය ප්‍රතිපාදන ලැබුණහොත්, එම ප්‍රතිපාදනයන් ප්‍රමාණවත් නොවීම හෝ නොලැබීම හේතුවෙන් කළ යුතු අත්‍යාවශ්‍ය වන්නා වූ පුනරුත්ථාපනයන් සිදු කිරීම සඳහා ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන අරමුදලකට දායක කරගන්නා වූ මේ ප්‍රඥප්තියට අනුකූලව විෂයභාර අමාත්‍යවරයා විසින් රීති, රෙගුලාසි මඟින් නීත්‍යානුකූලව පනවනු ලබන ජල ඒකකයේ ප්‍රමාණය මත තීරණය කෙරෙන මුදලකි.

(12) "පංගුව" යන්නෙන්, යම් කිසි සුළු වාරිමාර්ග ව්‍යාපෘතියක හෝ ජලය ලබාගෙන ගොවිතැන් කෙරෙන යායක, කුඹුරු නාම ලේඛනයට ඇතුළත්ව ඇති ගොවීන් සංඛ්‍යාව හා කුඹුරු ඉඩම් ප්‍රමාණය ගණනය කොට, අනුපාතිකව බෙදා වෙන් කළ පසුව, ප්‍රධාන වේල්ලෙන් හෝ ඇල මාර්ගයන් වන කොටස අදහස් වේ.

(13) "වාරි රක්ෂිතය" යනු වාරිමාර්ග පද්ධතියේම කොටසකි. එම පද්ධතියට අයත් ඇලක්, ජල මාර්ගයක්, වැවක්, කෘෂි පාරක් හෝ පද්ධතියේ යම් අංගයකට අදාළ වන අනාගත වැඩි දියුණු කිරීම සඳහා හෝ ගංවතුර වැනි විශේෂ ආපදා තත්ත්වයන් යටතේ ජල මට්ටම ඉහළ යාමක් නිසා ජලය පැතිරී යාමකට නතු වීමට ඉඩ ඇති එමෙන්ම දෙපාර්තමේන්තුවේ සේවකයින් හෝ ඉදි කිරීම්වල නිරත වන සේවකයින් හා ඔවුන්ගේ යන්ත්‍රෝපකරණවල පරිහරණය සඳහා අවශ්‍ය වන අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන භූමි ප්‍රමාණයකි.

43. දකුණු පළාත් සභාවේ 2019 අංක 02 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය.

දකුණු පළාතේ සමුපකාර සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් විසින් එම යෝජනා ක්‍රමය දකුණු පළාතේ මෙහෙයවනු ලැබීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, ඊට සම්බන්ධ වූ හෝ අනුශංගික වූ කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:

01. 2019 අංක 02 දරන දකුණු පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන මෙය දකුණු පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

I කොටස
සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිහිටුවීම

02. (i) මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සඳහා සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලබන යෝජනා ක්‍රමයක් පිහිටුවනු ලැබිය යුතුය.

සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිහිටුවීම.

(ii) මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති නීතිගත සංස්ථාවක් විය යුතු අතර, එහි නෛතික සංස්ථාගත තත්ත්වයෙන් නඩු හෝ නීති කෘත්‍ය ඉදිරිපත් කිරීමට සහ නඩු සහ වෙනත් නීති කෘත්‍ය සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමටද, මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය සියලු දේ කිරීමට ද බලය ඇති නීතිගත සංස්ථාවක් බවට පත් වන්නේය.

නීතිගත සංස්ථාවක් විය යුතු බව

03. (i) සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පරිපාලනය කිරීමේ කාර්යය සඳහා තත් කාලයේ දකුණු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් ධූරය දරන තැනැත්තා යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂවරයා වන්නේය.

අධ්‍යක්ෂවරයා පත් කිරීම

(ii) අධ්‍යක්ෂවරයා යෝජනා ක්‍රමයේ කටයුතු සහ කාර්යය අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම සම්බන්ධව වගකිව යුතුය.

අධ්‍යක්ෂවරයා ගේ කාර්ය භාරය

(iii) යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් වූ සියලු කටයුතු පාලනය කිරීම සහ පරිපාලනය කිරීම සම්බන්ධව අධ්‍යක්ෂවරයාට උපදෙස් දීමේ හා නිර්දේශ ලබාදීමේ කාර්යය සඳහා මතු සඳහන් පරිදි හත් දෙනෙකුගෙන් සමන්විත උපදේශක කාරක සභාවක් සිටිය යුතුය. එම සාමාජිකයන් අතුරින් 3(iv) වන වගන්තියේ (ඊ) සහ (එ) යන වගන්ති යටතේ දැක්වෙන සාමාජිකයින් අමාත්‍යවරයා විසින් ද (ඉ) යන වගන්තියේ දැක්වෙන සාමාජිකයන් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් ද පත්කරනු ලැබිය යුතුය.

උපදේශක කාරක සභාව

(iv) උපදේශක කාරක සභාවේ සාමාජිකයින් වශයෙන්,

උපදේශක කාරක සභාවේ සංයුතිය

(අ) දකුණු පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්;

(ආ) දකුණු පළාතේ පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්);

(ඇ) කම්කරු කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන එම දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙක්;

(ඈ) දකුණු පළාතේ පළාත් සභාවේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්;

(ඉ) දකුණු පළාතේ ගාල්ල/මාතර/හම්බන්තොට සමුපකාර ග්‍රාමීය බැංකු සංගම් නියෝජනය කරමින් එක් අධ්‍යක්ෂවරයෙක් හෝ සාමාන්‍යාධිකාරීවරයෙක්;

(ඊ) වසර 05 කට නොඅඩු සේවා පළපුරුද්දක් ඇති, නීත්‍යානුකූල පරීක්ෂණයකින් වරදකරුවකු නොවූ දකුණු පළාත් සමුපකාර සමිතියක හෝ සංගමයක සභාපතිවරයෙක්;

(එ) අවුරුදු 20 කට නොඅඩු සේවා පළපුරුද්දක් ඇති සේවයේ නියුතු හෝ විශ්‍රාමික හෝ නීත්‍යානුකූල පරීක්ෂණයකින් වරදකරුවකු නොවූ දකුණු පළාතේ සමුපකාර සමිතියක හෝ සංගමයක සේවකයෙක් පත්කරනු ලැබිය යුතුය.

(v) උපදේශක මණ්ඩලයේ තීරණය පරිදි දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගෙන් පමණක් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය යොදවාගත හැකිය.

කාර්ය මණ්ඩලය

04. (i) (අ) මෙම ප්‍රඥප්තියේ 3 (iv) වගන්තියේ (අ) (ආ) (ඇ) සහ(ඉ) යන වගන්තිවල සඳහන් උපදේශක කාරක සභිකයන්ගේ ධූර කාලය එම නිල තනතුරු දරන කාලයට සීමා වන්නේය.

උපදේශක කාරක සභාවේ සාමාජිකයන්ගේ සුදුසුකම් හා ධූර කාලය

(ආ) මෙම ප්‍රඥප්තියේ 3(iv) වගන්තියේ (ඇ) වගන්තිය යටතේ පනවන උපදේශක කාරක සභික සාමාජිකයා කම්කරු කොමසාරිස් ජනරාල්වරයාම වන විට දී එම අයගේ ධූර කාලය නිල තනතුරු දරන කාලයට සීමා වන්නේය. කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරනු ලබන එම දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙකු උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලබන්නේ නම් ඔහුගේ ධූර කාලය මියයාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ධූරය හිස් වුවහොත් මිස අවුරුදු 03 ක කාල පරිච්ඡේදයක් සඳහා විය යුතුය. එසේ වුවද කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් වෙනත් නිලධාරියෙකු නම් කිරීමෙන් මුලින් පත්කළ නිලධාරියාගේ පත්වීම අහෝසි වන්නේය.

(ඇ) මෙම ප්‍රඥප්තියේ 3 (iv) වගන්තියේ (ඊ), (උ) වගන්ති යටතේ උපදේශක කාරක සභාවට පත් කරනු ලබන සාමාජිකයෙකුගේ මිය යාමෙන් හෝ කවර හෝ අවස්ථාවකදී අමාත්‍යවරයා වෙත යවන ලිපියක් මගින් ඉල්ලා අස්වුවහොත් මිස අවුරුදු 03 ක කාල පරිච්ඡේදයක් සඳහා ධූරය දැරිය යුතුය.

(ii) උපදේශක කාරක සභාවට මෙම ප්‍රඥප්තියේ 3 (iv) වගන්තියේ (ඊ) සහ (උ) වගන්ති යටතේ පත්කළ සාමාජිකයෙකු ඉහත දැක්වෙන පරිදි ධූරය හිස් කරන ලද අවස්ථාවක 03 (iii) උප වගන්තියේ විධිවිධාන ගැන සැළකිලිමත්ව ඔහු වෙනුවට වෙනත් තැනැත්තෙකු පත්කළ යුතු අතර, ඒ සාමාජිකයා තමා පත් කරනු ලැබීමට හේතු වූ අනුප්‍රාප්තිකයාගේ ඉතිරිව ඇති ධූර කාලය සඳහා ධූරය දැරිය යුතුය.

(iii) රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ උපදේශක කාරක සභාවට පත්කළ සාමාජිකයෙකුට තම කාර්යයන් ඉටු කිරීමට නොහැකි බව අනාවරණය වුවහොත් ඔහු වෙනුවට වැඩ ආවරණය කරනු ලබන තැනැත්තා වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැකිය.

(iv) ධූරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයෙකු හැර, ධූරය හිස්කරන උපදේශක කාරක සභාවේ යම් සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේය.

(v) උපදේශක කාරක සභාවට මෙම ප්‍රඥප්තියේ 3(iv) වගන්තියේ (ඉ) වගන්තිය යටතේ පත් කළ සාමාජිකයෙකු අඛණ්ඩව උපදේශක කාරක සභා රැස්වීම් වාර තුනකට සහභාගි නොවුවහොත්, සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් ඔහු වෙනුවට එම වගන්තිය යටතේ වෙනත් තැනැත්තෙකු පත් කළ යුතු අතර, ඒ සාමාජිකයා තමා පත් කරනු ලැබීමට හේතු වූ අනුප්‍රාප්තිකයාගේ ඉතිරිව ඇති ධූර කාලය සඳහා ධූරය දැරිය යුතුය.

(vi) උපදේශක කාරක සභාවට මෙම ප්‍රඥප්තියේ 3 (iv) වගන්තියේ (ඊ) සහ (උ) වගන්ති යටතේ පත් කළ සාමාජිකයෙකු අඛණ්ඩව උපදේශක කාරක සභා රැස්වීම් වාර තුනකට සහභාගි නොවුවහොත්, උපදේශක කාරක සභාව විසින් ඒ බව අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතු වන්නේය.

05. උපදේශක කාරක සභාව විසින් පහත දැක්වෙන බලතල සියල්ල හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය: *(උපදේශක කාරක සභාවේ කාර්යයන්)*

(i) මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම,

(ii) මෙම යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීමට, මෙහෙයවීමට සහ ක්‍රියාවේ යෙදවීමට අදාළ කරුණු පිළිබඳව අධ්‍යක්ෂවරයාට උපදෙස් දීම,

(iii) මෙම යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු සමාලෝචනය කිරීම.

06. (i) සමුපකාර විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා උපදේශක කාරක සභාවේ සභාපති වන්නේය. ඔහු සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතුය. *(උපදේශක කාරක සභාවේ රැස්වීම්.)*

(ii) අධ්‍යක්ෂකවරයා උපදේශක කාරක සභාවේ ලේකම් වේ. ඔහු විසින් උපදේශක කාරක සභාවේ රැස්වීම කැඳවිය යුතු අතර, එම රැස්වීම මෙම ප්‍රඥප්තිය යටතේ යෝජනා ක්‍රමයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි අන්දමින් පවත්වනු ලැබිය යුතුය.

(iii) උපදේශක කාරක සභාවේ පුරප්පාඩුවක් / පුරප්පාඩු පවතින අවස්ථාවකදී එකී උපදේශක කාරක සභාව විසින් ගනු ලබන තීරණ කිසිවක් එකී පුරප්පාඩුව හේතුවෙන් අවලංගු නොවේ. පුරප්පාඩුව/පුරප්පාඩු

(iv) උපදේශක කාරක සභාවේ රැස්වීමක සනපූර්ණය සාමාජිකයන් හතරදෙනෙකු විය යුතුය. සනපූර්ණය

07. උපදේශක කාරක සභාවේ රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් උපදේශක කාරක සභාවේ සාමාජිකයන්ට දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව සමූපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකිය. උපදේශක කාරක සභාවේ පාරිශ්‍රමිකය

2 වන කොටස

සමූපකාර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

08. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරනු ලැබූ දිනට පෙර සේවයට බැඳී, මේ දක්වා සේවයේ යෙදී සිටින වයසින් අවුරුදු 18 ට අඩු නොවූ සහ වයස 60 දක්වා වූ ස්ථිර පත්වීමක් ලද සමූපකාර සේවකයෙකුට මෙම යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ඇත. යෝජනා ක්‍රමයට බැඳීමට සුදුසුකම්

09. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරනු ලැබූ දින සිට ස්ථිර සේවයට බැඳෙන සමූපකාර සමිති සේවකයන් මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අනිවාර්යෙන් දායක විය යුතුය. යෝජනා ක්‍රමයට අනිවාර්යයෙන්ම දායක විය යුතු බව

10. (i) මෙම යෝජනා ක්‍රමයට බැඳෙන්නා වූ (මෙහි මින්මතු දායක යනුවෙන් සඳහන් කරනු ලබන) සමූපකාර සමිති සේවකයෙකු නියෝග මගින් නියම කරනු ලබන පදනමක් මත මේ යෝජනා ක්‍රමය යටතේ පහත දැක්වෙන ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබිය යුතුය. යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ

(අ) නියම කරනු ලැබිය හැකි පරිදි කාලපරිච්ඡේද අනුව විශ්‍රාම වැටුපක්

(ආ) නියම කරනු ලැබිය හැකි පරිදි කාලපරිච්ඡේද අනුව මින් මතු පාරිතෝෂික නමින් දැක්වෙන මරණ පාරිතෝෂිකයක්.

(ii) දායකත්වයේ කාලසීමාව, දායකයාගේ වයස සහ දායකයා විසින් ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන විශ්‍රාම වැටුප හෝ මරණ පාරිතෝෂිකය හෝ ගෙවීමේ පදනම නියම කරනු ලැබිය යුතුය.

11. (i) දායකයා තම වයස අවුරුදු 60 වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතුය. එසේ වුවද තම දායක මුදල් ගෙවීම ආරම්භ කළ දායකයෙකු නියම කරනු ලබන ඔහුගේ මුළු දායක මුදල් ප්‍රමාණය ගෙවා සම්පූර්ණ වුව ද විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලබනුයේ යෝජනා ක්‍රමය අනුමත වී අවුරුදු 01 ක් ඉකුත් වීමෙන් පසුවය.

විශ්‍රාම වැටුප ගෙවිය යුතු අවස්ථා

(ii) දායකයා මාසයේ කුමන දිනයක මියගියද එම මාසයේ අවසානය දක්වා විශ්‍රාම වැටුප ගෙවනු ලැබිය යුතුය.

12. තම විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබීමට පෙර දිනයක දායකයා මියගිය විටෙක නියෝගවලින් නියම කරන පදනම මත ජීවත්ව සිටින යැපෙන්නන් හට නියම කරනු ලබන මරණ පාරිතෝෂික ගෙවිය යුතුය.

මරණ පාරිතෝෂිකය

13. (i) තම විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබීමට පෙර දායකයෙකු තම සේවා යෝජකයා වූ සමුපකාර සමිතියට හෝ සංගමයට මූල්‍ය අලාභයක් හෝ හානියක් සිදුකොට ඇති බව නීත්‍යානුකූල පරීක්ෂණයකින් සනාථ වී තිබේ නම් මේ ප්‍රඥප්තිය යටතේ කිසිදු ප්‍රතිලාභ හිමිකමකට, විශ්‍රාම වැටුපකට හිමිකම් නොලැබිය යුතුය. එසේ වුවද සමිතියට හෝ සංගමයට සිදුකළ මූල්‍ය අලාභය හෝ හානිය ප්‍රතිපූර්ණය කොට යෝජනා ක්‍රමයේ රැඳී සිටීමට, නියම කරනු ලබන නියෝග අනුව හා 14 වන වගන්තියේ විධිවිධාන අනුව දායකයාට හිමිකම් තිබිය යුතුය.

විශ්‍රාම වැටුපට හිමිකම් නොලැබීම

(ii) (අ) යම් දායකයෙකු සේවයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී සිය සේවා යෝජකයා වූ සමුපකාර සමිතියට හෝ සංගමයට මූල්‍ය අලාභයක් හෝ හානියක් සිදුකොට ඔහුට එරෙහිව නීත්‍යානුකූල පරීක්ෂණයක් අවසන් වනතුරු ප්‍රඥප්තිය යටතේ ඒ දායකයාට ගෙවිය හැකි යම් විශ්‍රාම වැටුපක් තාවකාලිකව නතර කිරීමේ බලය අධ්‍යක්ෂවරයාට ඇත්තේය.

(ආ) 13 (ii) (අ) යටතේ දායකයාට එරෙහිව පැවැත්වෙන නීත්‍යානුකූල පරීක්ෂණයක් මාස 03 කට වඩා ප්‍රමාද වුවහොත් උපදේශක කාරක සභාවේ අනුමැතිය ඇතිව විශ්‍රාම වැටුපෙන් අඩක් හෝ ඊට අඩු ප්‍රමාණයක් පරීක්ෂණයට කිසිදු අගතියක් නොවන පරිදි දායකයාට ගෙවිය හැකිය.

(ඇ) ඉහත කී දායකයා වෙනුවෙන් කරනු ලබන නීත්‍යානුකූල පරීක්ෂණයේදී දායකයා නිදහස් වුවහොත් විශ්‍රාම ගත් දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් ද ලැබීමට දායකයාට හිමිකම් ලැබිය යුතුය

14. (i) යම් සමූපකාර සේවකයෙකු යෝජනා ක්‍රමයේ දායකයෙකු ලෙස බඳවා ගනු ලැබූ විට අධ්‍යක්ෂවරයා විසින් දායකයා වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර එහි දායකයා විසින්,

එක් එක් දායකයා වෙත අධ්‍යක්ෂවරයා විසින් සහතිකයක් නිකුත්කරනු ලැබිය යුතු බව.

(අ) ගෙවනු ලැබිය යුතු දායක මුදල;

(ආ) සමූපකාර සමිතියේ හෝ සංගමය විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල්;

(ඇ) සහතිකයේ නියමයන් හා කොන්දේසි;

(ඈ) දායකයා වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ දායකයාට හිමිවන ප්‍රතිලාභ;

සඳහන් කළ යුතුය.

(ii) දායකයකු විසින් වරින්වර හෝ අඛණ්ඩව කිසියම් දිනකට වාරික තුනකින් දායක මුදල් ගෙවීම පැහැර හැර ඇති විටක ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමිවිය යුතුය.

(iii) යම් දායකයෙකු වෙත නිකුත් කර ඇති සහතිකය යටතේ ප්‍රතිලාභ යම් දායකයෙකුට අහිමි වීමට ඇති අවස්ථාවක ඒ බවට දැන්වීමක් අධ්‍යක්ෂවරයා විසින් එම දායකයා වෙත නිකුත් කරනු ලැබිය යුතුය.

(iv) තම සහතිකය වලංගු කරවා ගැනීම සඳහා අධ්‍යක්ෂවරයා වෙත අභියාචනයක් කිරීමේ අයිතිය නියෝග අනුව නියම කරන පිළිවෙලක් අනුව දායකයෙකුට තිබිය යුතු අතර වාරික ගෙවීමට අපොහොසත් වීමේ හේතු දායකයාට පාලනය කළ නොහැකි වූ විට ඒ බවට අධ්‍යක්ෂවරයා සෑහීමකට පත්වුවහොත් අධ්‍යක්ෂවරයා විසින් සහතිකය වංලගු කරනු ලැබිය යුතුය.

(v) සහතිකයක් වලංගු කිරීමට අධ්‍යක්ෂවරයා තීරණය කරන අවස්ථාවක වාරික මුදල් ගෙවිය යුත්තේ යම් දිනකට පෙර ද ඒ දිනය දායකයා වෙත දැන්විය යුතුය. එදිනට පෙර එකී දායක මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් ඔහුගේ සහතිකය අවලංගු වූවා සේ සැළකිය හැකිය.

15. නියෝග මගින් නියම කරනු ලබන නියමයන් අනුව මේ යෝජනා ක්‍රමයේ දායක මුදල් දායකයා හා අදාළ සමූපකාර සමිතිය හෝ සංගමය විසින් ගෙවිය යුතුය. සමූපකාර සමිතියක හෝ සංගමයක සේවයේ නියුතු මෙම යෝජනා ක්‍රමයේ දායකයන් විසින් ගෙවනු ලබන දායක මුදල් සමිතිය හෝ සංගමය විසින් යෝජනා ක්‍රමය වෙත ප්‍රේෂණය කළ යුතුය. එම නියෝග අනුව දායක මුදල් ගෙවනු ලැබිය යුත්තේ යම් එක් එක් දායකයා වෙත අධ්‍යක්ෂවරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු බව

දායක මුදල්

දිනකට පෙරද , ඒ දිනය නිශ්චිත වශයෙන් දක්වා තිබිය යුතු අතර , සමූපකාර සමිතියක් හෝ සංගමයක් දායක මුදල් ගෙවීම එකී නිශ්චිත දිනට ගෙවීම නොකරන්නේ නම් නියෝග අනුව නියම කරන දඩ මුදලකට යටත් විය යුතුය.

16. (i) යම් සමූපකාර සමිතියක් හෝ සංගමයක් හෝ නීතිය අනුව ඈවර කිරීම සඳහා ලියාපදිංචිය අවලංගු කර ඇති විටෙක, සමිතිය හෝ සංගමය හෝ ලියාපදිංචිය අවලංගු කරන දිනය දක්වා දායකයා මුදල් ගෙවා ඇත්තේ නම් නියෝග අනුව නියම කරන ආකාරයට විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය.

සමූපකාර සමිති හෝ සංගමය ඈවර කිරීම ඒකාබද්ධ කිරීම මත විශ්‍රාම වැටුප අහිමි නොවිය යුතු බව.

(ii) යම් සමූපකාර සමිතියක් හෝ සංගමයක් හෝ නීතිය අනුව යම් සමූපකාර සංගමයක් හෝ සමග ඒකාබද්ධ වන්නේ නම් හා යම් සමූපකාර සමිතියක් හෝ සංගමයක් හෝ නීතිය අනුව යම් සමූපකාර සමිති හෝ සංගම්වලට විබද්ධ වන්නේ නම්, දායකයාට මෙම යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුපකට හිමිකම් අහිමිවීමක් සේ නොසැළකිය යුතු අතර, නව සේවා යෝජිත සමිතිය හෝ සංගමය හෝ මගින් යෝජනා ක්‍රමයේ දායකයා රැඳී සිටී යැයි සැළකිය යුතුය.

17. නියෝග මගින් නියම කරනු ලබන නියමයන් අනුව යම් දායකයෙකුට යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ප්‍රදානය කිරීම අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබිය යුතුය.

ප්‍රදානය අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු බව

18. (i) අධ්‍යක්ෂවරයාගේ තීරණය පිළිබඳව අතෘප්තියට පත් යම් දායකයකුට, සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයක් කළ හැක්කේය.

අභියාචනා බලය

(ii) අධ්‍යක්ෂවරයාගේ තීරණයක් සම්බන්ධයෙන් සෑහීමකට පත්නොවූ යම් දායකයකුට අධ්‍යක්ෂවරයාගේ තීරණය ලැබී දින 30 ක් ඇතුළත දී තම අභියාචනයට හේතු සඳහන් කරමින් සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයක් කරනු ලැබිය හැකිය.

දින 30 ක් ඇතුළත අභියාචනා කළ යුතු බව.

(iii) අභියාචනා සම්බන්ධව සමූපකාර සේවක කොමිෂන් සභාවේ තීරණය දින 90 ක් ඇතුළත අභියාචක වෙත දැන්විය යුතුය.

දින 90 ක් තුළ අභියාචනා තීරණය ලබාදිය යුතු බව

(iv) එවැනි අභියාචනයක් පිළිබඳ සමූපකාර සේවක කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා බලාත්මක විය යුතු ය.

19. යෝජනා ක්‍රමයෙන් ගෙවනු ලැබිය හැකි කිසිම විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ දීමනාවක්, පවරාදීම හෝ අන්සතු කිරීම හෝ නොකළ යුතු අතර, සෑම පවරාදීමක් හෝ අන්සතු කිරීමක්

විශ්‍රාම වැටුප, දීමනාව, පාරිතෝෂිකය, පවරාදීම හෝ ඉන් අයකර ගැනීම. හෝ නොකළ යුතු බව.

හෝ සම්පූර්ණයෙන්ම ශූන්‍ය අවලංගු හා බල රහිත වන්නේය. මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන නියෝග යටතේ හෝ අධ්‍යක්ෂවරයාට පැවරී ඇති බලතල යටතේ හැර වෙනත් පාර්ශවයකට විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂික හෝ දීමනාව හෝ ගෙවනු ලැබිය යුතු තැනැත්තාගෙන් ලැබිය යුතු යම් ණයක් හෝ ගෙවීමක් හෝ සම්බන්ධයෙන් එවැනි විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ දීමනාවක් හෝ තහනම් කිරීමක් හෝ රිට් ආඥා ක්‍රියාත්මක කිරීමෙන් අයකර ගැනීමක් හෝ කරනු නොලැබිය යුතුය.

3 වන කොටස
සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල

සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල

20. (i) මෙහි මින්මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(ii) එම අරමුදල වෙත,

(අ) යෝජනා ක්‍රමය මෙහෙයවීම සඳහා දකුණු පළාතේ පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන මුදල් ප්‍රමාණයන්;

(ආ) මුදල් විෂයභාර පළාත් අමාත්‍යවරයා විසින් කලින් කල අධ්‍යක්ෂවරයා වෙත අත්තිකාරම් වශයෙන් දෙනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන්;

(ඇ) සමූපකාර අරමුදලින් ප්‍රේෂණය කරනු ලබන්නා වූ මුදල්;

(ඈ) යම් සමූපකාර සමිතියක් හෝ සංගමයකින් හෝ වාර්ෂිකව හෝ කලින් දෙනු ලබන මුදල් ප්‍රමාණයන්;

(ඉ) මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම පිණිස, කාර්යයන් ඉටු කිරීමේදී සහ කර්තව්‍යයන් කිරීමේදී ලැබෙන සියලුම මුදල් ප්‍රමාණයන්;

(ඊ) ත්‍යාග සහ ප්‍රදාන මාර්ගයෙන් යම් සම්භවයකින් ලැබෙන සියලුම මුදල් ප්‍රමාණයන්;

(උ) යෝජනා ක්‍රමයේ දායකයන් විසින් දායක මුදල් වශයෙන් යෝජනා ක්‍රමය වෙත ගෙවනු ලබන සියලු මුදල් ප්‍රමාණයන්;

(ඌ) ආයෝජනවලින් පොලිය හෝ ලාභ හෝ වශයෙන් උපයාගන්නා ලද සියලු මුදල් ප්‍රමාණයන්;

(එ) අරමුදල වෙත ත්‍යාග හා ප්‍රදාන වශයෙන් යම් සම්භයවකින් ලැබෙන සියලු මුදල් හා මෙම යෝජනා ක්‍රමයේ කර්තව්‍යයන් කිරීමේදී අධ්‍යක්ෂවරයා වෙත

සමූපකාර සමිතිවලින් හා සංගම්වලින් අත්තිකාරම් මාර්ගයෙන් දෙනු ලැබිය හැකි වූ මුදල් ප්‍රමාණයන් ප්‍රේෂණය කළ හැකිය.

(iii) මෙම අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යා යුතුය.

(iv) මෙම ප්‍රඥප්තිය යටතේ උපදේශක කාරක සභාවේ හා අධ්‍යක්ෂකවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමේදී කාර්යයන් ඉටු කිරීමේදී සහ කර්තව්‍යයන් කිරීමේදී උපදේශක කාරක සභාව විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් හෝ දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු මුදල් ප්‍රමාණයන් ද මෙම ප්‍රඥප්තිය මගින් හෝ නියෝග යටතේ හෝ අරමුදලින් ගෙවිය යුතුවන මුදල් ප්‍රමාණයන්ද අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

මුදල් ආයෝජනය කිරීම

21. මෙම ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයාට වහාම අවශ්‍ය නොවන්නාවූ අරමුදලේ සියලු මුදල්, උපදේශක කාරක සභාවේ තීරණය අනුව අධ්‍යක්ෂවරයා විසින් රාජ්‍ය බැංකුවක හෝ රාජ්‍ය මූල්‍ය ආයතනයක හෝ ආයෝජනය කරනු ලැබිය යුතුය.

මුදල් ණයට ගැනීමේ බලතල

22. අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කාරක සභාවේ තීරණය ඇතිව අධ්‍යක්ෂවරයාගේ බැඳීම් ඉටුකිරීම සඳහා නැතහොත් මෙම ප්‍රඥප්තිය යටතේ යෝජනා ක්‍රමය ක්‍රියාවේ යෙදවීම සඳහා අධ්‍යක්ෂවරයාට අවශ්‍ය වන්නා වූ මුදල්, සමූපකාර අරමුදලින් ණයට ගැනීම කළ හැකිය.

මුදල් වර්ෂය

23. (i) යෝජනා ක්‍රමයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

ගිණුම් සැකසීම

(ii) පිළිගත් ගිණුම් මූලධර්ම, ප්‍රතිපත්ති හා ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් තැබීමට අධ්‍යක්ෂවරයා වගබලා ගත යුතුය. අධ්‍යක්ෂවරයා විසින් එම කාර්යය දකුණු පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරීවරයා ලවා ඉටුකරවා ගත යුත්තේය.

(iii) අධ්‍යක්ෂවරයා විසින් මෙම යෝජනා ක්‍රමයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කර, උපදේශක කාරක සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය.

(iv) සෑම කාර්තුවක් අවසානයේදී ත්‍රෛමාසික ලැබීම් හා ගෙවීම් පිළිබඳ වාර්තාව පිළියෙල කළ යුතු අතර එම වාර්තාව කාර්තුව අවසාන වී දින 30ක් ඇතුළත උපදේශක කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(v) අධ්‍යක්ෂවරයා විසින් එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට පැවති ආකාරයට යෝජනා ක්‍රමයේ පොත්පත් තුලනය කිරීමට සැලැස්විය යුතු අතර, එකී දිනයට ආදායම් හා වියදම් ගිණුමක් හා වත්කම්වල හා බැරකම්වල සාරාංශයක් අඩංගු ශේෂ පත්‍රයක් ඊළඟ වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර උපදේශක කාරක සභාවට ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාවට ගිණුම් ඉදිරිපත් කළයුතු බව

(vi) 23 (v) ඡේදයේ සඳහන් තොරතුරු එම වර්ෂයේ ජුනි මස 30 දිනට පෙර පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

(vii) සෑම වර්ෂයකදීම යෝජනා ක්‍රමයේ ගිණුම් පළාත් සභාවේ විගණනය භාර නිලධාරියා විසින් හෝ නීතියට අනුකූලව විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතුය. ගිණුම් විගණනය

4 වන කොටස

වෙනත් කරුණු

24. (i) ඇතැම් විට නියම කෙරෙතැයි හෝ නියම කළ යුතු යැයි මෙම ප්‍රඥප්තියේ සඳහන් කරුණු හා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි. නියෝග සෑදීම

(අ) යෝජනා ක්‍රමය විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය;

(ආ) සමුපකාර සේවකයෙකු යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ලබන්නේ කවර සුදුසුකම්. කොන්දේසි සහ අවස්ථානුගත කරුණු ඇතිව සහ කවර සීමා කිරීම් යටතේ ද වග තීරණය කිරීම;

(ඇ) දායකයන් විසින් හා දායකයන් වෙනුවෙන් සමුපකාර සමිති, සංගම් විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල් ප්‍රමාණය තීරණය කිරීම;

(ඈ) දායකයන් වෙත විශ්‍රාම වැටුප්, පාරිතෝෂිකය හෝ දීමනා ගෙවිය යුතු පදනම තීරණය කිරීම;

(ඉ) දායක මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් කොන්දේසි තීරණය කිරීම;

(ඊ) උපදේශක කාරක සභාවේ කටයුතු පිළිබඳ කාර්ය පටිපාටි හා රීති සකස් කිරීම;

(උ) අභියාචනා ක්‍රියාවලිය පිළිබඳ කාර්ය පටිපාටි හා රීති සකස් කිරීම;

(ඌ) විශ්‍රාම වැටුප් හිමිකම් සහතිකය අවසන් කිරීම හෝ අහිමි කිරීම;

(එ) මරණ පාරිතෝෂිකය ගෙවීම පදනම සහ ප්‍රමාණය තීරණය කිරීම;

(ඒ) අදාළ ආකෘති නියම කිරීම.

(ii) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. එසේ පළකරනු ලබන දිනයේදී හෝ නියෝගවල සඳහන් පසු දිනයකදී එය ක්‍රියාත්මක විය යුතුය.

(iii) එවැනි සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු ලැබූ යම් නියෝගයක් ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි ඒ අනුමත කරනු නොලැබූ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතුය.

25. (i) අධ්‍යක්ෂවරයා හෝ උපදේශක කාරක සභාව හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාට හෝ උපදේශක කාරක සභාවට හෝ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකුට හෝ සමුපකාර සේවක කොමිෂන් සභාවට හෝ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජිකයෙකුට; හෝ

මෙම ප්‍රඥප්තිය යටතේ හෝ අධ්‍යක්ෂවරයා ගේ නියෝග මත හෝ ගන්නා ලද පියවර සඳහා ආරක්ෂාව.

(ii) අධ්‍යක්ෂවරයාගේ හෝ උපදේශක කාරක සභාවේ හෝ සමුපකාර සේවක කොමිෂන් සභාවේ හෝ විධානයන් මත සද්භාවයෙන් කරන ලද හෝ එසේ අදහස් කරන ලද යම් ක්‍රියාවක් සඳහා හෝ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහායවන නිලධාරියෙකුට හෝ සේවකයෙකුට හෝ විරුද්ධව කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් හෝ පැවරීමට නොහැකි විය යුතුය.

26. මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝගයක යම් විධිවාධානයක් හෝ කඩ කරන්නා වූ නැතහොත් ඒ අනුව කටයුතු කිරීම පැහැර හරින්නා වූ සෑම සමුපකාර සමිතියක් හෝ සංගමයක් වරදට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට මාස 06 ක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දොළොස් දහසක දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම යටත් විය යුතුය.

වැරදි හා දණ්ඩන

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ

අර්ථ නිරූපනය

"පළාත් සභාව" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් තත්කාලයේ දකුණු පලාතේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා වේ.

"සමුපකාර සේවක කොමිෂන් සභාව" යන්නෙන් 1998 අංක 01 දරන දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලැබූ දකුණු පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව අදහස් වේ.

"සමුපකාර සමිතියක්" යන්නෙන් 1992 අංක 11 දරන හා 1983 අංක 32 දරන සංශෝධන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ දකුණු පළාතේ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් සංගමයක් අදහස් වේ.

"සමුපකාර සංගමයක්" යන්නෙන් 1992 අංක 11 දරන හා 1983 අංක 32 දරන සංශෝධිත පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ දකුණු පළාතේ ලියාපදිංචි කළ සමුපකාර සමිති කීපයකින් සමන්විත ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් වේ.

"සේවකයා" යන්නෙන් 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව හා අංක 1998 අංක 01 දරන දකුණු පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ අර්ථානුකූල සමුපකාර සමිතියක/සංගමයක ස්ථිර පත්වීමක් ලද සේවකයෙක්, සේවකයා යන්නෙන් අදහස් වේ.

"නීත්‍යානුකූල පරීක්ෂණයක්" යන්නෙන් විධිමත් විනය පරීක්ෂණයක් 1992 අංක 11 දරන හා 1983 අංක 32 දරන සංශෝධන පනත් වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ විධිවිධාන අනුව සිදු කරන ලද පරීක්ෂණයක් අදහස් වේ.

28. මෙම ප්‍රඥප්තියේ සිංහල , ඉංග්‍රීසි හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අනනුකූලතාව බල පැවැත්වීම

44. දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 03 දරන කෘෂිකර්ම ප්‍රඥප්තිය.

දකුණු පළාතේ ගොවි ජනතාවගේ යහපත උදෙසා කෘෂිකාර්මික හා ඒ ආශ්‍රිත නිෂ්පාදන නගා සිටුවීම අරමුණු කර ගනිමින් දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවක් පිහිටුවීම, කෘෂිකාර්මික කටයුතුවල යෙදී සිටින ප්‍රජාවගෙන් සමන්විත ස්වේච්ඡා කමිටු පිහිටුවීම, එම කමිටුවල බලතල තීරණය කිරීම සහ ඊට අනුශංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය (441 වන අධිකාරය වූ) කෘෂිකර්ම ආඥාපනතට අනනුකූල වේ.

01. මෙම ප්‍රඥප්තිය 2019 අංක 03 දරන දකුණු පළාත් කෘෂිකර්ම ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය දකුණු පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ සිට ක්‍රියාත්මක විය යුතුය. — ලුහුඩු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

I කොටස

දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

02. දකුණු පළාතේ ගොවි ජනතාවගේ යහපත උදෙසා කෘෂිකාර්මික හා ඒ ආශ්‍රිත නිෂ්පාදන නගා සිටුවීම අරමුණු කර ගනිමින් (මෙහි මින්මතු "දෙපාර්තමේන්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවක්, දකුණු පළාතේ පිහිටුවනු ලැබේ. — කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීම

03. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන දෙපාර්තමේන්තව වෙත පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා (මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ යන නාමය හා අභිධානය යටතේ අධ්‍යක්ෂවරයෙකු පත්කරනු ලබන අතර, ඔහු මෙහි 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ද විය යුතුය. මෙම අධ්‍යක්ෂවරයා ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ 1 වන පන්තියේ නිලධරයෙක් ද විය යුතුය. — දෙපාර්තමේන්තු ප්‍රධානියා පත් කිරීම

04. (1) දෙපාර්තමේන්තුවේ කාර්යයන් කාර්යක්ෂමව පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයෙකු නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයන් දෙදෙනෙකු, දිස්ත්‍රික්ක සඳහා නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරු, කලාප භාරව සහ පුහුණු ආයතන භාරව සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරු ද සහ තාක්ෂණික සේවාවන් සඳහා කෘෂිකර්ම උපදේශකවරුන්, වැඩසටහන් සහකාරවරුන් කෘෂිකර්ම, සංවර්ධන සහකාරවරුන් - කෘෂිකර්ම සහ අවශ්‍ය වෙනත් කාර්ය මණ්ඩලයක් පත්කිරීමටද බලය ඇත්තේය. — කාර්ය මණ්ඩලය පත් කිරීම

(2) මනා කළමනාකරණයක් සඳහා අන්තර් සම්බන්ධතාවයකින් යුතුව කටයුතු කිරීමට රජයේ නිලධාරීන් දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් ලෙස පත් කිරීමට අවශ්‍ය වූ අවස්ථාවක අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟතාවය ලබාගෙන පත් කිරීමට බලය ඇත්තේය.

05. අධ්‍යක්ෂවරයා ඇතුළු මෙම ප්‍රඥප්තියේ 4 වන වගන්තිය යටතේ සියලුම පත් කිරීම් සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තියේ විධිවිධාන අදාළ වන්නේය.

06. ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීමට පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමින් ආයතන පිහිටුවිය හැකිය. ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම

II කොටස

දෙපාර්තමේන්තුවේ, අරමුණ, කාර්ය සහ කර්තව්‍යය

07. දකුණු පළාතේ වගා කළ හැකි සියලුම වගා බිම් කෘෂිකාර්මික බෝග වගාව සඳහා යොමු කරමින් ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කරවීම සහ තිරසාර ආහාර නිෂ්පාදනයන්ට දායක වීම මගින් දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ ප්‍රමුඛ කොටස්කරුවීම දෙපාර්තමේන්තුවේ අරමුණ වේ. දෙපාර්තමේන්වේ අරමුණ

08. දෙපාර්තමේන්තුවේ කාර්යයන් පහත සඳහන් පරිදි වේ. දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

(අ) කෘෂිකර්මාන්තය ව්‍යාප්ත කිරීමේ කටයුතු සහ ඒ ආශ්‍රිත පුහුණු කටයුතු නිසියාකරව ඉටුකිරීම;

(ආ) අමාත්‍යවරයාගේ උපදෙස් මත සිදුකරනු ලබන සියලුම කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම, පසු විපරම් කිරීම සහ එම සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් මධ්‍ය පාලනයට නතු කොට කළමනාකරණය කිරීම;

(ඇ) පළාතේ ගොවිබිම්වල පස සංරක්ෂණ කටයුතු සම්බන්ධව ක්‍රියාකිරීම සහ පළාතේ විවිධ කෘෂිකාර්මික වගාවන් සම්බන්ධව වන පළිබෝධ හානි සහ වෙනත් දිලීර කාරකයන් මර්දනය කිරීම හා දිලීර කාරකයන් පැතිර යාම වැළැක්වීම සඳහා දැනට පවත්නා කෘෂිකර්ම උපදේශක කාර්යාල පදනම් කොටගෙන අවශ්‍ය අවස්ථාවලදී ඒකක පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඇ) පළාතේ කෘෂිකාර්මික කටයුතුවල යෙදී සිටින ගොවීන්ට අවශ්‍ය පුහුණුව සහ හුරුව ලබාදීම සඳහා දැනට පවත්නා පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම, පවත්වාගෙන යාම, නූතන තාක්ෂණික දැනුම උපයෝගී කර ගනිමින් ඔවුන්ගේ කුසලතා හා නිපුණතා ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම;

(ඉ) පළාත තුළ කෘෂිකර්ම උපදේශකවරුන්ගේ අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ ග්‍රාමීය කෘෂිකාර්මික සමිති පිහිටුවීම, අධීක්ෂණය කිරීම හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ එම සමිති ලියාපදිංචි කිරීම;

(ඊ) පළාත තුළ කෘෂිකර්ම ක්ෂේත්‍රයට ස්වේච්ඡාවෙන් සම්බන්ධ වන්නා වූ තරුණ ශ්‍රමදායකත්වය වර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කරවීමට සහ ඊට සම්බන්ධ වන්නා වූ ස්වේච්ඡා තරුණ ගොවි සමාජ ලියාපදිංචි කිරීම, එම සංවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථා සම්පාදනය හා එම සමිති කළමනාකරණය කිරීම;

(උ) පළාත තුළ ක්‍රියාත්මක වන්නා වූ කෘෂිකාර්මික වැඩසටහන් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය හෝ එහි ලේකම්වරයා විසින් බලය පවරනු ලබන නිළධාරියාගේ අනුමැතියට යටත්ව දෙපාර්තමේන්තුවේ විවිධ තාක්ෂණික මැදිහත්වීම යටතේ ක්‍රියාත්මක කිරීම;

(ඌ) දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා වගකීම් ඉටුකිරීම පිණිස ලිඛිත නීතියේ සීමාවන්ට යටත්ව දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් ලබාගත හැකි මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ආධාර ලබා ගැනීම පිණිස කටයුතු කිරීම;

(එ) දෙපාර්තමේන්තුවේ සේවය කරන කාර්යය මණ්ඩලවලට අවශ්‍ය නූතන දැනුම සහ කුසලතා වර්ධනය කර ගැනීමට අවශ්‍ය පහසුකම් ලබාදීම ඇතුළුව අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඒ) දෙපාර්තමේන්තුව විසින් ජනතාවට සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි කිරීම පිණිස එම කාර්යයන් හි නියුතු නිලධරයන් ගේ සේවය ඇගයීම සඳහා කාර්යය සාධන ක්‍රම ඇති කිරීම හා කඩිනම්ව ක්‍රියාත්මක කිරීම;

(ඔ) පළාතේ කෘෂිකාර්මික කටයුතුවල නියුතු ආයතන හා ප්‍රද්ගලයින් සම්බන්ධ තොරතුරු, දත්ත එක් රැස් කිරීම හා තොරතුරු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම; සහ

(ඕ) ඉහත කාර්යයන් ඉටු කිරීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් කවර හෝ ක්‍රියාමාර්ග ගැනීම.

09. අධ්‍යක්ෂවරයාගේ බලතල,කාර්යය සහ කර්තව්‍ය වනුයේ -

අධ්‍යක්ෂවරයාගේ බලතල කාර්යයන් සහ කර්තව්‍ය

(අ) පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අරමුණු උදෙසා පැවරෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම.

(ආ) පළාතට ආවේනික නොවන්නා වූ බෝගයක් හෝ වගාවක් දකුණු පළාත තුළ ස්ථාපිත කිරීමේ දී ඊට අදාළව අනුමැතිය ලබාදීම.

(ඇ) ප්‍රමාණවත් කාලවේලාවක් ලබාදී පූර්ව දැනුම් දීමකින් පසුව පළාතේ පෞද්ගලික හෝ රාජ්‍ය අංශයේ ඕනෑම ගොවිපලක් පරීක්ෂා කිරීම හෝ එසේ පරීක්ෂා කිරීම සඳහා වෙනත් නිලධාරියෙකුට බලය දීම.

(ඈ) අලෙවි කිරීම සඳහා යම් ව්‍යවසායකයෙකු කාබනික පොහොර නිෂ්පාදනය කරන්නේ නම් එම පොහොර නිෂ්පාදනවල ප්‍රමිතිය සැලකිල්ලට ගෙන අදාළ ව්‍යවසායකයන් ලියාපදිංචි කිරීම.

(ඉ) කෘෂිකර්ම උපදේශකවරු විසින් කරනු ලබන ලිඛිත නිර්දේශයක් නොමැතිව කෘෂි රසායන අලෙවිසැල් සම්බන්ධයෙන් කෘෂි රසායන අලෙවි කරන අලෙවිසැල් යටතේ කෘෂි රසායන අලෙවි කළ යුතු ක්‍රමවේද සම්බන්ධයෙන් අදාළ විය යුතු නියමයන් කලින් කළ ගැසට් පත්‍රයක් යටතේ ප්‍රකාශයට පත් කරනු ලබන ඒ සඳහා වූ නියමයන් මගින් නියම කිරීම.

(ඊ) පළාත තුළ සිදු කරනු ලබන සියලුම කෘෂිකාර්මික සංවර්ධන යෝජනා ක්‍රම තීරණය කිරීම.

(උ) අනිසි බෝග වගාවන් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට හා වාර්තා කිරීමට කෘෂිකර්ම උපදේශකවරුන්ට බලය පැවරී.

(ඌ) කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම හා එසේ ලියාපදිංචි කරන ලද කෘෂිකර්ම සංවර්ධන ස්වේච්ඡා සංවිධානවල අක්‍රමිකතා හෝ නිශ්චිත අරමුණෙන් බැහැරව හෝ කටයුතු කරන අවස්ථාවලදී අදාළ සංවිධානවල ලියාපදිංචි අවලංගු කිරීම.

III කොටස

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ස්වේච්ඡා සංවිධාන.

10. (අ) කෘෂිකාර්මික කටයුතුවල යෙදී සිටින ගොවීන් ඒකාබද්ධ වී කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන පිහිටුවා ගත හැකි අතර එයට ආවේණික වූ නමක් ද පවත්වාගෙන යා හැකිය.

කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන පිහිටුවීම

(ආ) කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන සඳහා වූ පොදු ව්‍යවස්ථාවක් අධ්‍යක්ෂවරයා විසින් සකස් කළ යුතුය.

(ඇ) මෙම කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් පිහිටුවා ගත හැකිය.

IV වන කොටස

පළාත් උපදේශක කමිටු

11.(1) අමාත්‍යවරයා විසින් යොමු කරන ලද කෘෂිකර්මයට අදාළ කරුණක් හෝ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීමේ කාර්යය සඳහා උපදේශක කමිටුවක් පිහිටුවිය යුතුය.

පළාත් උපදේශක කමිටු පිහිටුවීම

(2) පළාත් උපදේශක කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතුය.

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයින්

(i) දකුණු පළාත් අමාත්‍යාංශ ලේකම්

(ii) දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන , කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ විශේෂඥ දැනුම ඇති සහ සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ඒ හා සමාන හෝ ඊට ඉහළ උපාධියක් ලබා ඇති අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් හතර දෙනෙකු හා පළාතේ දිස්ත්‍රික් බල මණ්ඩලයක ධූරයක් දරන ලියාපදිංචි ගොවිජන සංවිධානයක එක් සාමාජිකයෙකු

(3) ලේකම් උපදේශක කමිටුවේ සභාපතිවරයා වන්නේය.

(4) අධ්‍යක්ෂ උපදේශක කමිටුවේ ලේකම්වරයා වන්නේය.

(5) "උපදේශක කමිටු සාමාජිකයින් සඳහා වන පාරිශ්‍රමිකයක්, පළාත් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව අමාත්‍යවරයාගේ අනුමැතිය පරිදි ගෙවිය හැකිය"

(6) කමිටුවේ සෑම පත්කළ සාමාජිකයෙකුම මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධූරයෙන් ඉවත් කිරීම නිසා ධූරය හිස් වුවහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු දෙකක කාලයක් ධූරය දැරිය යුතු අතර, ඔහු ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතුය.

(7) කමිටුවේ නිල බලයෙන් පත් වූ සෑම සාමාජිකයෙකුම ඔහු කමිටුවේ සාමාජිකයෙකු වූයේ යම් තනතුරක් දැරීම ප්‍රකාරවද, ඒ තනතුර දරන තාක් කල් ධූරය දැරිය යුතුය.

(8) යම් පත් කල සාමාජිකයෙකුම මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීම නිසා ධූරය හිස් කරනු ලබන අවස්ථාවක අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීම සඳහා වෙනත් යම් සාමාජිකයෙකු පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලබන යම් තැනැත්තකු, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූරය දැරිය යුතුය.

(9) රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා කමිටුවේ සාමාජිකයෙකුට තාවකාලිකව ස්වකීය ධූරයේ කාර්යය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවකදී, අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා නොපැමිණෙන කාලය සඳහා එම සාමාජිකයා වෙනුවට කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකිය.

(10) යම් පත්කළ සාමාජිකයෙකු හේතු දක්වා අමාත්‍යවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(11) යම් පත්කළ සාමාජිකයෙකුට ඔහු විසින් ඉල්ලා අස්වන බවට, අමාත්‍යවරයා අමතා ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ඉල්ලා අස්විය හැකිය.

12. (1) උපදේශක කමිටුවේ රැස්වීම මාස දෙකකට වරක් වත් පැවැත්විය යුතු අතර, ඊට අමතරව මේ ප්‍රඥප්තිය යටතේ එහි කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන පරිදි, රැස්වීම් ඊට වැඩි ගණනක් පැවැත්විය හැකිය. රැස්වීම්

(2) උපදේශක කමිටුවේ කවර හෝ රැස්වීමක් සඳහා ගණ පූරණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතුය.

(3) රැස්වීම් වාර්තාවල පිටපත් සාමාජිකයින්ටත්, අමාත්‍යවරයාටත් ලැබෙන්නට සැලැස්වීම උපදේශක කමිටුවේ ලේකම්වරයාගේ වගකීම වන්නේය.

(4) මේ ප්‍රඥප්තියේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, උපදේශක කමිටුවේ රැස්වීම් පිළිබඳ හා ඒ රැස්වීම්වල කටයුතු පිළිබඳ කාර්ය පරිපාටිය කමිටුව විසින්ම විධිමත් කරගනු ලැබිය යුතුය.

V වන කොටස
පොදු විධිවිධාන

13. මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමේදී දෙපාර්තමේන්තුව සහ ඒ යටතේ පිහිටුවන ලද ආයතනය විසින් දරන ලද වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් පළාත් සභා අරමුදලින් ලබා දිය යුතුය. මුදල්

14. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධාරියෙකු විසින් කවර හෝ ආයතනයකින් හෝ පුද්ගලයන්ගෙන් ඕනෑම අවස්ථාවක ප්‍රඥප්තියේ අරමුණට අදාළ වන තොරතුරක් ඉල්ලා සිටිය හැකි අතර, එසේ ඉල්ලා සිටින තොරතුරු අධ්‍යක්ෂ වෙත හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධාරියා වෙත සැපයීම අදාළ ආයතනයේ හෝ පුද්ගලයාගේ වගකීම වන්නේය. පළාත තුළ කෘෂිකර්මයට අදාළ තොරතුරු ලබා ගැනීමේ බලය

15. (1) වර්ෂයක් තුළදී පළාත තුළ කෘෂිකර්ම කටයුතු කරගෙන යන ලද ආකාරය, පැන නැගුණු ගැටළු, ඒවා විසඳීමට ගත් පියවර හා කෘෂිකර්ම විෂය ක්‍රියාත්මක වීමට අදාළ වෙනත් කරුණු ගැන සඳහන් කෙරෙන වාර්ෂික පාලන වාර්තාවක් එක් එක් වර්ෂය ඉකුත්ව මාස හතරක කාලයක් ගතවීමට පෙර අධ්‍යක්ෂ විසින් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතුය. වාර්ෂික පාලන වාර්තාව

(2) ඉහත (1) වන උප වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද පාලන වාර්තාව අමාත්‍යවරයා විසින් සාධාරණ කාලයක් තුළ පළාත් සභාවේ සභාගත කළ යුතුය.

16. දෙපාර්තමේන්තුවේ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් දෙපාර්තමේන්තුවට විශේෂ හෝ සාමාන්‍ය විධාන ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, දෙපාර්තමේන්තුව විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුත්තේය. විධාන නිකුත් කිරීමේ බලය

17. (1) මෙම ප්‍රඥප්තිය යටතේ පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් හා ප්‍රඥප්තියේ අරමුණට අදාළ වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග

(අ) කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේදී නිෂ්පාදනය කරන්නන් ලියාපදිංචියට අදාළ විය යුතු කොන්දේසි නියම කිරීම.

(ආ) කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීමට අදාළ වන කොන්දේසි නියම කිරීම හා ලියාපදිංචියට අදාළ වන ආකෘති නියම කිරීම.

(ඇ) මෙම ප්‍රඥප්තියේ අරමුණු යටතට ගැනිය හැකි වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන්,

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් ඉදිරි දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එය යටතට කලින් කරන ලද කිසිවකට අගතියක් නොවන සේ එහි අනුමත නොකළ දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ සේ සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

18. මෙහි පහත සඳහන් කරුණු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේය; වැරදි හා දඬුවම්

(1) කෘෂිකාර්මික සංවර්ධන කටයුතු සඳහා රජය හෝ පළාත් සභාව විසින් දෙන ලද කෘෂිකාර්මික ආධාර හෝ උපකරණ අයථා ලෙස පරිහරණය කිරීම හෝ අධ්‍යක්ෂවරයාගේ අනු දැනුමකින් තොරව වෙනත් අයෙකුට විකිණීම හෝ පරිහරණය කිරීම.

(2) වගා කටයුතුවලදී අධ්‍යක්ෂවරයා විසින් දෙනු ලබන ලිඛිත නියෝගයකට අනුකූල නොවීම.

(3) යම් නිලධරයෙකු හෝ පුද්ගලයෙකු විසින් මෙම ප්‍රඥප්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමේදී කවර හෝ නිලධාරියෙකුට බාධා කිරීම.

(4) යම් කෘෂිකර්ම කටයුත්තකදී කෘෂි වගාවකට හෝ ජීව හෝ රසායනික කරුණු මත සිදුවී ඇති හානි ප්‍රාදේශීය මට්ටමින් හෝ ජාතික මට්ටමින් ව්‍යාප්ත වීම වළක්වා ගැනීම පිණිස අධ්‍යක්ෂවරයා හෝ කොට්ඨාශ භාර සහකාර අධ්‍යක්ෂවරයා හෝ දෙනු ලබන නියෝග පිළි නොපැදීම.

(5) දකුණු පළාත තුළ වගා වන නීත්‍යානුකූල බෝග වගාවකට හානි වන පරිදි හෝ හානි කිරීමේ අභිලාශයෙන් ආගන්තුක පලිබෝධ හෝ බීජ වර්ග ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම.

(6) (i) අධ්‍යක්ෂවරයාගේ එකඟතාවය නොමැති නම් කෘෂිකාර්මික යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉවු කිරීම

(ii) මෙම ප්‍රඥප්තිය යටතේ මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු විභාගයකින් පසුව වරදකට වරදකරු වන සෑම තැනැත්තෙකුම රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීම යන දෙයාකාරයකින් එක් ආකාරයකට හෝ එම බන්ධනාගාර ගත කිරීම සහ දඩය යන දෙයාකාරයටම හෝ ඔහු යටත්විය යුතුය.

19. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, අර්ථ නිරූපණය

"පළාත් සභාව" යන්නෙන්, දකුණු පළාත් සභාවද;

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාතේ කෘෂිකර්ම විෂයභාර අමාත්‍යවරයාද;

"ලේකම්වරයා" යන්නෙන් දකුණු පළාතේ කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාද;

"අධ්‍යක්ෂවරයා" යන්නෙන් දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාද;

"කෘෂිකර්ම ඉඩමක්" යන්නෙන් කුඹුරු වගා කිරීම සඳහා ප්‍රයෝජනයට ගතහැකි ඉඩම් හෝ කෘෂිකර්මය කළ හැකි පෞද්ගලික ඉඩම් හෝ ඉඩම් සංවර්ධන ආඥාපනත, රජයේ ඉඩම් ආඥාපනත හෝ වෙන යම් පනතක් යටතේ අන්සතු කරනු ලැබූ ඉඩම්ද,

"අනිසි බෝග" යන්නෙන් ප්‍රදේශයට නිර්දේශිත නොවන හෝ නීත්‍යානුකූල නොවන හෝ බෝගද,

"පලිබෝධ" යන්නෙන් කෘෂිකාර්මික බෝගයක වර්ධනය අඩාල කරමින් එම බෝගයේ ඵලදාවට හෝ නිරෝගී බවට හානි සිදුකළ ඕනෑම ජීවී විශේෂයක්ද,

"පළාත" යන්නෙන් දකුණු පළාත ද අදහස් වේ.

20. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් වේ නම් සිංහල පාඨය ප්‍රමුඛ වේ.

4-889

45. දකුණු පළාත් සභාවේ 2019 අංක 04 දරන වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රඥප්තිය.

දකුණු පළාත තුළ සංස්ථාගත කරනු නොලැබූ වෙළෙඳ ස්ථාන විධිමත් කිරීම, එසේ වෙළෙඳ ස්ථාන පවත්වාගෙන යන ආයතන හා තැනැත්තන් ලියාපදිංචි කිරීම හා ඊට අනුශංගික සියලු කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, දකුණු පළාතේ 1991 අංක 1 දරන ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා ද විධිවිධාන සැලසීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය 2019 අංක 04 දරන දකුණු පළාතේ වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, දකුණු පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමතය ලබාදීමෙන් පසු ක්‍රියාත්මක වන්නේය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

I කොටස

02. (1) දකුණු පළාත තුළ (මෙහි මින්මතු වෙළෙඳ ස්ථාන යනුවෙන් හඳුන්වනු ලබන) සංස්ථාගත කරනු නොලැබූ වෙළෙඳ ස්ථානයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ම මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිය ඇතිව ඊට අදාළ සහතිකයක් යටතේ පවත්වාගත යුතුය.

ව්‍යාපාර ආයතන සහ තැනැත්තන් ලියාපදිංචි විය යුතුය.

(2) මෙම වගන්තිය යටතේ වෙළෙඳ ස්ථානයක් සඳහා ලබාගත් වෙළෙඳ සහතිකය ව්‍යාපාරය පවත්වාගෙන යන පරිශ්‍රය තුළ පැහැදිලිව පෙනෙන සේ ප්‍රදර්ශනය කළ යුතුය.

(3) මෙම වගන්තිය යටතේ වෙළෙඳ ස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා අදාළ කාර්යය පටිපාටිය, දෙන ලද ලියාපදිංචියක් අවලංගු කිරීම හා ඊට අදාළ කාර්යය පටිපාටිය නියම කිරීම, ඉට අදාළ වන ආකෘති නියම කිරීමට හා ඊට ආනුශාංගික කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රීති මඟින් නියම කරනු ලබන ආකාරයට විය යුතුය.

03. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පූර්ව දිනයේ දී දකුණු පළාතේ 1991 අංක 01 දරන ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයක් ලබාගෙන කරගෙන යන සෑම ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙකු/තැනැත්තන් මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වූවා සේ සැළකිය යුතුය. එසේ වුවද මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයෙන් පසුව සිදු කරනු ලබන වෙනස් කිරීමක් හෝ අවලංගු කිරීමක් මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන්ට අනුකූලව සිදු කළ යුතුය.

කලින් ලියාපදිංචි කළ ආයතන

04. (1) ජනාධිපතිවරයා ජනාධිපති, ජාතික, රාජ්‍ය, ශ්‍රී ලංකා, මුදල්, මූල්‍ය .... යන වචන හෝ නාගරික හෝ සංස්ථාගත යන වචන හෝ ඒවායේ සංක්ෂේපයක් නැතහොත් රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව යම් මහා නගර සභාවකට හෝ වෙනත් පළාත් පාලන ආයතනයකට හෝ පාර්ලිමේන්තු පනතකින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාගත කරන ලද යම් සමිතියකට, මණ්ඩලයකට හෝ රාජ්‍ය ආයතනයකට සම්බන්ධතාවයක් හඟවන හෝ හැඟවීමට ඉඩ ඇති වචන හෝ සමුපකාරය, සංස්ථාව යන වචන හෝ ඓතිහාසික හෝ සංස්කෘතික වශයෙන් උරුමයන් සඳහා වන වචන හෝ ජාති, ආම්, කුල, හැඳින්වෙන නාම හෝ ඒ ආශ්‍රිත වචන හෝ එම අදහස හැඟවෙන වචන සහ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් විසින් භාවිතා නොකළ යුතු යැයි නිශ්චය කරනු ලබන වචන ඇතුලත් වන්නා වූ වෙළෙඳ සහතිකයක් ඉල්ලුම් කළ නොහැක.

ව්‍යාපාර නාම සඳහා භාවිතා නොකළ යුතු වචන

(2) වෙළෙඳ සහතිකයක ස්වභාවය කරන කොට ගෙන හෝ එය ප්‍රයෝජනයට යොදවන ආකාරය කරන කොට ගෙන, එය සදාචාරයට හෝ මහජන සාමයට පටහැනි වන්නේ නම් සහ ඉන් යම් ජන කොටසකට ආගමික හෝ වාර්ගීය හැඟීම් රිදවීමකට ඉඩ ඇති නම් හෝ මහජනතාව නොමඟ යැවීමට ඉඩ ඇති නම් හෝ දැනටමත් එම ව්‍යාපාරය දකුණු පළාත තුළ හෝ සමාගම් නීතිය යටතේ ලබාගෙන ඇති නාමයක් වන විටෙක ඒ සඳහා ඉල්ලුම් නොකළ යුතුය.

05. (1) ව්‍යාපාරයේ ස්වභාවය හෝ ව්‍යාපාර ස්ථානය වෙනස් කිරීමක් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් සිදුකළ හැකිය.

සංශෝධන

(2) ව්‍යාපාරය හිමිකාරිත්වය වෙනස් වීමේදී පහත පරිදි ක්‍රියා කළ යුතුය.

(අ) ව්‍යාපාර හිමිකරු ජීවතුන් අතර සිටින අවස්ථාවලදී.
වෙළෙඳ සහතිකය හිමි පුද්ගලයා දිවුරුම් ප්‍රකාශයක් මඟින් තම කැමැත්ත ප්‍රකාශ කරන අවස්ථාවක, අදාළ ව්‍යාපාරය තමාගේ නමින් සංශෝධනය කිරීමට අළුතින් ඉදිරිපත් වන හිමිකරුගේ කැමැත්ත සහිත ලිපිය.

(ආ) ව්‍යාපාරයේ හිමිකරු මියගිය අවස්ථාවකදී,

(i) හිමිකරු විවාහකයෙකු නම්,
නිත්‍යානුකූල කලත්‍රයා හා වයස අවුරුදු 18 ට වැඩි දරුවන් සිටී නම් ඔවුන්ගේ එකඟතාවය මත හිමිකාරිත්වය පැවරිය හැක (අදාළ එකඟතාවය දිවුරුම් ප්‍රකාශ මඟින්);
වයස අවුරුදු 18 ට අඩු දරුවන් සිටී නම්, නීත්‍යානුකූල කලත්‍රයා වෙත හිමිකාරිත්වය පැවරිය හැක. (කලත්‍රයා ලිඛිත ඉල්ලීමක් අනුව)

(ii) හිමිකරු අවිවාහක නම්,
මව, පියා හා වයස අවුරුදු 18 ට වැඩි සහෝදර සහෝදරියන්ගේ එකඟතාවය මත(අදාළ එකඟතාවය දිවුරුම් ප්‍රකාශ මඟින්);

(3) (1) ඉහත (i) හා (ii) අවස්ථා දෙකෙහිදීම අදාළ ඉල්ලීම අනුව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වෙතින් වාර්තාවක් කැඳවා අනතුරුව සංශෝධනය කිරීම සුදුසු වේ.

(3) (2) ඉහත (i) හා (ii) අවස්ථාවලදී සිදුකරනු ලබන සංශෝධනය අදාළ දේපල සම්බන්ධයෙන් අධිකරණය විසින් ගනු ලබන තීන්දුවකට යටත්වන අතර එහිදී ලබාදෙන අධිකරණ තීන්දුව අනුව ව්‍යාපාර හිමිකම වෙනස් විය හැක.

(4) හවුල් ව්‍යාපාරයට අලුත් හවුල්කරුවකු ඇතුළත් වන විට සංශෝධන අයදුම්පතක් මඟින් ඉල්ලීම සිදුකළ යුතුය. හවුල්කරුවන් 2 ට වඩා වැඩි ප්‍රමාණයක් සිටින විට එක් හවුල්කරුවෙකු හෝ ඊට වැඩි දෙනෙකුට ඉවත් වීමටත්, නව හවුල්කරුවන්ට ඇතුළුවීමටත් හැකිය. හවුල්කරුවන් දෙදෙනෙකු පමණක් සිටින විට එක් හවුල්කරුවෙකු ඉවත් වනවිට හවුල් ව්‍යාපාරය අවලංගු කර ඉතිරි පුද්ගලයාට තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කළ හැකිය.

(5) තනි පුද්ගල ව්‍යාපාරයක් හවුල් ව්‍යාපාරයක් බවට පත් කිරීම.

මේ සඳහා තනි පුද්ගල ව්‍යාපාරය හිමිකරුගේ හා අනෙක් හවුල්කරුවන්ගේ දිවුරුම් ප්‍රකාශ මඟින් කැමැත්ත ලබාගෙන අදාළ පරිවර්තනය කළ හැක. එහිදී හවුල් ව්‍යාපාරයේ ආරම්භක දිනය වන්නේ ලිපි ලේඛන කාර්යාලය වෙත භාර දෙන දිනය වේ.

(6) හවුල් ව්‍යාපාරයක් තනි පුද්ගල ව්‍යාපාරයක් බවට පත් කිරීම. සියලු හවුල්කරුවන්ගේ කැමැත්ත දිවුරුම් ප්‍රකාශ මඟින් ලබාදිය යුතුය. එහිදී තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස තවදුරටත් ව්‍යාපාරය කරගෙන යෑමට අදාළ වූ කැමැත්ත ද සඳහන් කර තිබිය යුතුය. (ඉවත් වන හවුල්කරුවන්ගේ ඉවත්වීමක් තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස කරගෙන යාමත් සඳහන් විය යුතුය. තවද තනි පුද්ගල ව්‍යාපාරය ලෙස භාර ගන්නා පුද්ගලයාගේ ඒ සඳහා කැමැත්ත දිවුරුම් ප්‍රකාශයක් මඟින් පැහැදිලිව සඳහන් කළ යුතුය.)

(7) කෙසේ වුවත් ඉහත සංශෝධන කිරීමේ දී ඒවා පහත කොන්දේසි සපුරාලීමට යටත්ව සිදුකළ යුතුය.

(අ) තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාරයේ නාමය මුළුමනින්ම සංශෝධනය කිරීම නොකළ යුතුය.

(ආ) ව්‍යාපාර ස්වභාවය කැපී පෙනෙන සංශෝධනයක් කිරීම නොකළ යුතුය.

(ඇ) තනි පුද්ගල ව්‍යාපාරයක් හවුල් ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරන්නේ නම්, තනි පුද්ගල ව්‍යාපාරයේ අයිතිකරු හවුල් ව්‍යාපාරයේද හවුල්කරුවෙක් විය යුතුය.

(ඈ) හවුල් ව්‍යාපාරයක් තනි පුද්ගල ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරන්නේ නම් හවුල් ව්‍යාපාරයේ අයිතිකරුගෙන් අයෙක් තනි පුද්ගල ව්‍යාපාරයේ අයිතිකරු විය යුතුය.

II කොටස
පත් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය.

රෙජිස්ට්‍රාර්වරයා පත් කිරීම සහ රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යය

06. (1) පළාත් වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා (මෙහි මින්මතු රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් හඳුන්වනු ලබන) පළාත් වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයෙක් පත් කරනු ලැබිය යුතුය. මේ සඳහා දකුණු පළාත් සභාවේ වෙළෙඳ විෂය හිමි අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් පළාත් වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා ලෙස පත්වීම් ලබයි.

(2)මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පළාත තුළ වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ සාමාන්‍ය පාලනය හා අධීක්ෂණය රෙජිස්ට්‍රාර්වරයා සතු වන්නේය.

07. මෙම ප්‍රඥප්තිය, රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල, කාර්ය හෝ කර්තව්‍යය, රෙජිස්ට්‍රාර්වරයාගේ අධිකාරිය හෝ පාලනය යටතේ, ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා බලයලත් නිලධාරියෙකු වෙත පැවරිය හැකිය. එනම් ප්‍රාදේශීය ලේකම් හෝ වෙනත් යම් නිලධාරියෙකු වෙත බලයලත් නිලධාරියෙකු වෙත බලය පැවරිය හැකි අතර ප්‍රාදේශීය ලේකම් හෝ ඔහු වෙනුවෙන් කාර්යය හා කර්තව්‍යය ඉටු කරනු ලබන නිලධාරියාට අදාළ සහතිකයේ ස්වකීය අත්සන යොදා සහතික නිකුත් කිරීම කළ හැකිය.

බලතල පැවරීම

08. (1) යම් තැනැත්තෙකු හෝ තැනැත්තා හවුල්කරුවකු වන ව්‍යාපාර ආයතනය මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කළ යුතුද නැද්ද යන්න හෝ ලියාපදිංචි කළ විස්තරවල වෙනසක් කළ යුතුද යන්න දැන ගැනීම සඳහා අවශ්‍ය යැයි තමාට පෙනෙන විස්තර තමා විසින් නියම කරනු ලබන කාලය තුළ තමා වෙත සපයන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලබන හැකි අතර, සංස්ථාවක් සම්බන්ධයෙන් වනවිට, ඒ විස්තර සපයන ලෙස එහි ලේකම්වරයාට හෝ ලේකම්වරයාගේ කාර්ය ඉටුකරන සංස්ථාවේ වෙනත් යම් නිලධරයකුට නියම කරනු ලැබිය හැකිය.

රෙජිස්ට්‍රාර්වරයා වෙත විස්තර සැපයීමේ කාර්ය

(2) (1) වන උප වගන්තිය යටතේ නියම කරනු ලබන විස්තර රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චිතව සඳහන් කරන කාලයක් ඇතුළත හෝ ඔහු විසින් තවදුරටත් ඉඩ දිය හැකි කාලයක් තුළ සැපයීම් නොකරන යම් තැනැත්තෙකු හෝ සත්‍ය නොවන විස්තර සපයන යම් තැනැත්තකු වරදක් කරන අතර, ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු එසේ අතපසු කිරීම නොකඩවා කරගෙන යනු ලැබූ එක් එක් දිනකට රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

(3) (2) වන උප වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී අධිකරණය විසින් කරනු ලබන ආඥාවේ නිශ්චිත ලෙස සඳහන් කරනු ලබන විස්තර ආඥාවේ සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත සපයන හෝ සැපයීමට සලස්වන ලෙස ඒ තැනැත්තාට ආඥා කිරීම සුදුසු යැයි අධිකරණය අදහස් කරන අවස්ථාවක අධිකරණය විසින් එසේ ආඥා කළ හැකිය.

(4) යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙක් මේ ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාරයක් ලියාපදිංචි කළ යුතු බව හෝ ලියාපදිංචි කර ඇති විස්තරවල වෙනසක් කර ඇති බව එසේ සපයන ලද යම් තොරතුරකින් රෙජිස්ට්‍රාර්වරයාට පෙනී ගියහොත් ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට ඉඩ දෙනු ලබන කාලයක් තුළදී තමාට අවශ්‍ය කරනු ලබන විස්තර සපයන ලෙස ඒ ව්‍යාපර ආයතනයට හෝ තැනැත්තාට ඔහු විසින් නියම කරනු ලැබිය හැකිය. එහෙත් මේ ප්‍රඥප්තිය යටතේ යම් පැහැර හැරීමක් කර ඇති බව මේ වගන්තිය යටතේ ලබාගත් තොරතුරුවලින් අනාවරණය වූ අවස්ථාවක, මේ වගන්තිය යටතේ යම් කාලයක් ඇතුළත තමා වෙත සපයන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට දන්වා ඇති විටක, ඒ කාලය ඉකුත්වීමට පෙර, තැනැත්තාට විරුද්ධ ප්‍රඥප්තිය යටතේ නඩු කටයුතු ආරම්භ නොකළ යුතුය.

(5) මෙම ප්‍රඥප්තිය යටතේ සහතිකලත් වෙළෙඳ ව්‍යාපාරයක් එහි ව්‍යාපාරික ස්වභාවය, ස්ථානය හෝ අයිතිය වෙනස්වන සෑම අවස්ථාවකදී ම එසේ වෙනස්වීම සිදුවී මාසයක් ඇතුළත මෙම ප්‍රඥප්තිය යටතේ දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉල්ලුම් කර ඊට අදාළ සහතිකය ලබාගත යුතුය.

09. (1) මේ ප්‍රඥප්තිය යටතේ කාර්ය ඉටු කිරීම පිණිස තමාට අවශ්‍ය තොරතුරු තමා වෙත සපයනු නොලැබීමට ඉඩ ඇති බව තමා අදහස් කරන්නේ නම් හෝ ඒ තොරතුරු යටතේ කරනු ඇතැයි තමා සැක කරන්නේ නම්, ඒ තොරතුරු ලබා ගැනීමේ කාර්යය සඳහා සෝදිසි කර බලා රෙජිස්ට්‍රාර්වරයා නියම කරන තොරතුරු ලබාගන්නා ලෙස තත් කාර්යය සඳහා පත්කර ඇති නිලධරයකුට රෙජිස්ට්‍රාර්වරයාවිසින් ලියවිල්ලකින් බලය පැවරිය හැකි අතර, ඒ බලය පැවරීම තත් කාර්යයට අදාළව තබාගෙන පවත්වාගෙන යන ලේඛනයේ සටහන් කරනු ලැබිය යුතුය.

සෝදිසි කර බැලීමේ බලය

(2) මේ ප්‍රඥප්තිය යටතේ යම් තොරතුරක් දැන ගැනීමේ කාර්යය (1) වන උප වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් විශේෂයෙන් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින්, අවශ්‍ය නම් සාම නිලධරයකු ද කැටුව යා හැකි අතර, පහත දැක්වෙන ක්‍රියා අතුරින් යම් ක්‍රියාවක් හෝ ඒ ක්‍රියා සියල්ලක් ම හෝ සිදු කරනු ලැබිය හැකිය.

(අ) යම් තැනැත්තකුට හෝ ව්‍යාපාර ආයතනයකට අයිතිවන යම් පොත්, ලේඛන හෝ වෙනත් ලියකියවිලි යම් ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක තිබිය හැකි බවට තමාට විශ්වාස කිරීමට තොරතුරු ඇති විටක, ඒ ගොඩනැගිල්ලට හෝ ස්ථානයට ඇතුල් වී පරීක්ෂා කිරීම සහ ඒ පොත්, ලේඛන හෝ ලියකියවිලි පරීක්ෂා කිරීම හෝ පරීක්ෂා කරනු ලැබීමට සැලැස්වීම.

(ආ) යම් ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් පරීක්ෂා කරන අතරතුරදී හමුවන යම් පොතකින්, ලේඛනයකින් හෝ ලියවිල්ලකින් සටහන් කර ගැනීම ඉන්වෙන්ටරියක් සකස් කිරීම හෝ උධෘතයන් ගැනීම.

(ඇ) ඒ ගොඩනැගිල්ල හෝ ස්ථානය තුළ සිට ඔහුට හවුවන යම් තැනැත්තෙකුගෙන්, මේ ප්‍රඥප්තියට අදාළ වන්නා වූ හෝ ඒ යටතේ වූ යම් කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම, මේ වගන්තිය යටතේ කරනු ලබන සෝදිසි කිරීම්වලට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ සෝදිසි කිරීම්වලට අදාළ විධිවිධානම හැකිතාක් දුරට අදාළ විය යුතුය.

(ඈ) යම් ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් සෝදිසි කර බලන අතරතුර හමුවන යම් පොතක්, ලේඛනයක් හෝ වෙනත් ලියවිල්ලක් ඉවතට ගෙන යාම සහ එය ඉවත් කර ගන්නා ලද්දේ යම් තැනැත්තෙකුගේ භාරකාරත්වයෙන්ද ඒ තැනැත්තාට ඒ වෙනුවෙන් ලදුපතක් නිකුත් කිරීම සහ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද ලේඛනයෙහි ඒ පොත්, ලේඛන හෝ වෙනත් ලියකියවිලි පිළිබඳ විස්තර අප්‍රමාදව ඇතුළත් කිරීම.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියවිල්ලක් මගින් විශේෂයෙන් බලය පවරන ලද යම් නිලධරයකු විසින් නියම කරනු ලැබූ අවස්ථාවක එසේ යම් තොරතුරක් සැපයීමට හෝ යම් පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට හෝ අපොහොසත් වන්නා වූ ඉහත සඳහන් විධිවිධාන යටතේ යම් පරීක්ෂා කිරීමක් කරගෙන යාමට බාධා කරන හෝ ඉඩදීමට අපොහොසත් වන යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙක්, සංස්ථාවක්,අනුයෝජිතයෙක්,අධ්‍යක්ෂවරයෙක් , නිලධරයෙක් හෝ එවැනි ව්‍යාපාර ආයතනයක හෝ තැනැත්තකුගේ සේවා නියුක්තයෙක්, වරද කරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම

වැළැක්වීම සඳහා තමා නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඔහු විසින් ඔප්පු කරන්නේ නම් මිස, වරදකට වරදකරු විය යුතුය.

(4) (3) වන උප වගන්තියේ සඳහන් වරදකට මේ ප්‍රඥප්තිය යටතේ වරදකරු කරනු ලැබූ තැනැත්තා, හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක, වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී හවුල් ව්‍යාපාරයේ වූ හවුල් ව්‍යාපාරකරුවෙක් හෝ කළමනාකරුවකු වූ සෑම තැනැත්තෙකුම ඒ වරදට වරදකරුවෙකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු මාස දොළහක් නොඉක්මවන්නා වූ කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් විසි පන්දහසක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙයාකාරයෙන්ම වූ දඬුවමකට යටත් කරනු ලැබිය යුතුය.

(5) ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිය දීර්ඝ කර ගැනීමකදී හෝ නව ලියාපදිංචියක් ලබා ගැනීමේදී පූර්වයෙන් පැවති ලියාපදිංචි අංකයක් යටතේ සහතිකයක් නිකුත් කිරීමට බාධාවක් නොවිය යුතුය.

රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රකාශන ගොනු කිරීම සහ ලියාපදිංචි කිරීමේ සහතියක් නිකුත් කිරීම සහ නාම පුවරුවක් හා අංකය ප්‍රදර්ශනය කිරීම කළ යුතු බව

10. (1) මේ ප්‍රඥප්තිය ප්‍රකාර යම් වෙළෙඳ ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් අතිරේක වූ ප්‍රකාශයක් ඉල්ලුම්කරු වෙතින් ඉල්ලා සිටින්නේ නම් ඊට අදාළ අතිරේක වූ ප්‍රකාශය නියමිත කාලය තුළ ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතර එය ඊට අදාළ ගොනුවට ඇතුළත් කර තැබීමට සැලැස්විය යුතුය. එසේම ඒ මත සෑහීමට පත්වන අවස්ථාවකදී වෙළෙඳ ස්ථානය ලියාපදිංචි කිරීමට අදාළ සහතිකය ඉල්ලුම්කරු වෙත භාරදීම හෝ ලියාපදිංචි තැපැල් මගින් යැවිය හෝ කළ යුතුය.

(2) (1) වන උප වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබූ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා විසින්, එය ලැබී දින දහහතරක් ඇතුළත, ඒ සහතිකය හෝ එය සහතික කරන ලද පිටපතක් ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ සහ ව්‍යාපාරය කරගෙන යන සෑම ස්ථානයකම ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතුය.

(3)මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සෑම තැනැත්තෙකුම හෝ ව්‍යාපාර ආයතනයක්ම විසින්,

(අ) සිය ලිපි ශිර්ෂවල:-

(i) තැනැත්තකු විසින් කරගෙන යන්නා වූ (හවුල්කරුවන්ගෙන් එක් හවුල්කරුවකුවත් සංස්ථාවක නොවන) ව්‍යාපාර ආයතනයක් හවුල්කරුවන් විසින් පවත්වාගෙන යන්නා වූ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විටක, වෙළෙඳ සහතිකය සහ ව්‍යාපාරය කරගෙන යන්නා වූ පුද්ගලයාගේ නම හෝ සිය හවුල්කරුවන්ගේ නම් සහ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය සහ ඒ ව්‍යාපාරයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය.

(ii) (හවුල්කරුවන්ගෙන් එක් අයකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සංස්ථාවක් වන) ව්‍යාපාර ආයතනයක හවුල්කරුවන් විසින් කරගෙන යන්නා වූ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විටක, ලියාපදිංචි කළ වෙළෙඳ සහතිකය, තැනැත්තෙකු වන්නා වූ හවුල්කරුගේ හෝ තැනැත්තන් වන්නා වූ හවුල්කරුවන්ගේ නම හෝ නම් සහ සංස්ථා නාමය සහ සංස්ථාවක සිය හවුල්කරුවන්ගේ සංස්ථාගත කිරීමේ විස්තර සහ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය සහ ඒ ව්‍යාපාරයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය.

(ආ) සිය ලදුපත්වල සහ ඉන්වොයිස්වල:-

(i) ව්‍යාපාරයේ නාමය සහ

(ii) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය සඳහන් කරනු ලැබිය යුතුය.

(4) (2) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබුවහොත්, එසේ පැහැර හැරීම කරන සෑම තැනැත්තෙකුම හා ඒ තැනැත්තා ව්‍යාපාර ආයතනයක හවුල්කරුවකු ආයතනයේ සෑම හවුල්කරුවකුම වන හවුල් ව්‍යාපාරිකයකුම හෝ ඊට අදාළ කළමනාකරුවෙකු හෝ භාරකරුවකු වරදක් කරන අතර මහේස්ත්‍රාත් අධිකාරණයක් විසින් ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතුය.

(5) යම් ප්‍රකාශයක් ලියාපදිංචි කිරීම හෝ ඒ ලියාපදිංචි කිරීම වෙනුවෙන් වූ සහතිකය හෝ ඒ ප්‍රකාශය සපයන තැනැත්තාට එරෙහිව හැර ඒ ප්‍රකාශයෙහි සඳහන් කරුණු පිළිබඳ සත්‍යතාව සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන හෝ අන්‍යාකාර කරුණු වශයෙන් තේරුම් නොගත යුතුය.

11. (1) මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් ව්‍යාපාරික ආයතනයක් විසින් හෝ තැනැත්තෙකු විසින් ස්වකීය ව්‍යාපාර කටයුතු වෙළෙඳ සහතිකය යටතේ කරගෙන යාම නතර කරනු ලැබුවහොත්, එසේ නතර කරන ලද අවස්ථාවේ සිට මාස තුනක් ඇතුළත ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා විසින් ඒ වෙළෙඳ සහතිකය යටතේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම අවසාන කර ඇති බවට නියමිත ආකෘතියෙහි වූ ප්‍රකාශයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත තැපැල් මගින් යැවීම හෝ භාර දීම සිදුකළ යුතුය. ව්‍යාපාර කටයුතු කරගෙන යාම නතර කරන ලද අවස්ථාවේදී, ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවන් වූ තැනැත්තන්ගේ හෝ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තා මියගොස් ඇතිවිට ඔහුගේ පෞද්ගලික නියෝජිතයන් මෙම වගන්තිය යටතේ වූ කාර්යය සිදුකළ යුතුය.

අවසන් කිරීමේ දැන්වීම සහ ලේඛනයේ නාමය ඉවත් කිරීම

(2) (1) වන උපවගන්තියෙන් නියම කරන ලද ප්‍රකාශය දීම ස්වකීය කාර්යයව තිබුණු යම් තැනැත්තෙකු විසින් ඉහත කී කාලය ඇතුළත දී එසේ කිරීම පැහැර හරිනු ලැබුවහොත්, ඔහු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතුය.

(3) (1) වන උපවගන්තියේ සඳහා දැන්වීම ලැබුණු පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් එය ගොනු කර තැබිය යුතු අතර, ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ ලියාපදිංචි කිරීම ලේඛනයෙන් ඉවත් කරමින් ලේඛනයෙහි සටහන් කළ යුතුය.

(4) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරන ලද යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙකු ලියාපදිංචි කළ වෙළෙඳ ව්‍යාපාර නාමය යටතේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන නොයන බව විශ්වාස කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට සාධාරණ හේතු ඇති විටක,

(අ) ලියාපදිංචි තැපෑලෙන් යැවෙන නිවේදනයකින් හෝ පුවත්පත් යටතේ පළ කරනු ලබන දැන්වීමක් මගින් එම වෙළෙඳ ව්‍යාපාරයේ ලියාපදිංචිය අවලංගු නොකිරීමට හේතු ඇතොත් මාසයක් ඇතුළත දැනුම් දෙන ලෙසට නියම කළ හැකි අතර එසේ සාධාරණ විරෝධතාවක් නියම කරන ලද දිනයට දැනුම්දීම නොකළහොත් අදාළ වෙළෙඳ ව්‍යාපාරයේ ලියාපදිංචිය අවලංගු කර ඒ බව දැන්වීමට ක්‍රියා කළ යුතුය. දැන්වීම පළ කිරීමෙන් මාසයක් ඇතුළත තමා වෙත විරෝධතා නොලැබුණහොත්, ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ නාමය ලේඛනයෙන් ඉවත් කරන බව සඳහන් කරමින් දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කිරීමට හෝ,

(ආ) ඒ දැන්වීමේ පිටපතක් ඒ දැන්වීමෙහි සඳහන් ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට සහ එක් එක් හවුල්කරුවාට ඔහුගේ වාසස්ථානයේ ලිපිනයට, ලියාපදිංචි කළ තැපෑලෙන් නොපමාව යැවීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

(5) එකී දැන්වීම යවනු ලැබීමෙන් පසු එක් මාසයක් ඇතුළත, එකී දැන්වීම පිළිබඳ විරෝධතාවයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත නොලැබුණහොත්, ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ නාමය ඔහු විසින් ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

12. (1) යම් වෙළෙඳ ස්ථානයක් ලියාපදිංචි කිරීම , මෙම ප්‍රඥප්තිය හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රීතීන්හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව ඉල්ලුම් කර ඇති විටෙක අදාළ ලියාපදිංචිය ලබාදීම රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කළ යුතුය.

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට ඇති බලය

(2) මේ ප්‍රඥප්තිය යටතේ වෙළෙඳ ස්ථානයක් ලියාපදිංචි කිරීමට පරිබාහිරව, එය භාවිතා කිරීම තහනම් කරනු ලැබිය හැකි නම්, එය භාවිතා කිරීමට ඒ ලියාපදිංචි කිරීම මගින් බලය දෙන ලෙස තේරුම් නොගත යුතුය.

13. මේ ප්‍රඥප්තිය යටතේ වෙළෙඳ සහතිකයක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ අවසන් කරනු ලැබූ අවස්ථාවක, ඒ ව්‍යාපාරය දිගටම කරන යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙකු වරදක් කරන සිදුකරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබුවහොත් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට සහ වරද කරනු ලැබීමෙන් පසු දිගටම කරනු ලබන සෑම දිනයක් සඳහාම රුපියල් පන්සීයක අඛණ්ඩ දඩයකට ඔහු යටත් විය යුතුය.

ප්‍රතික්ෂේප කරන ලද හෝ අවසන් කරන ලද ව්‍යාපාර නාමයක් භාවිත කිරීම සඳහා දණ්ඩනය

14. මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ගන්නා ලද යම් තීරණයකින් හෝ කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් ඒ තීරණය හෝ නියමය තමා වෙත ලියවිල්ලකින් දැනුම් දීමෙන් පසු විෂය භාර අමාත්‍යවරයා වෙත අභියාචනය කළ හැකිය. අමාත්‍යවරයා විසින් අභියාචනයක් ලැබී තුන් මසක් ඇතුළත ඔහුගේ තීරණය ප්‍රකාශයට පත් කළ යුතුය. එකී තීරණය අවසානාත්මක තීරණය විය යුතුය.

අභියාචනා

15. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් ගොනුකර තබා ඇති ලේඛන, නියම කරනු ලබන ගාස්තු ගෙවා , යම් තැනැත්තෙකු විසින් තම ව්‍යාපාරය සම්බන්ධ පරීක්ෂා කර බලනු ලැබිය හැකිය.

ලියාපදිංචි කරන ලද ප්‍රකාශ පරීක්ෂා කිරීම සහ සහතික කළ පිටපතක් නිකුත් කිරීම

(2) යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙකු ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ යම් නියමිත ආකෘතියක කරන ලද යම් ප්‍රකාශයක පිටපතක් හෝ උද්ධෘතයක් රෙජිස්ට්‍රාර්වරයා ලවා සහතික කරවා ගැනීම පිණිස තම ව්‍යාපාරය සම්බන්ධව යම් තැනැත්තෙකු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකිය. ඒ සහතිකය සහතික කරන ලද පිටපත හෝ් උධෘතය සඳහා නියම කරනු ලබන ගාස්තුව ගෙවිය යුතුය.

(3) ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සපයන ලද හෝ ලියාපදිංචිකරන ලද ප්‍රකාශයක පිටපතක් හෝ ඡායාස්ථිත පිටපතක් හෝ උද්ධෘතයක්, එය සත්‍ය පිටපතක් බවට රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සනින් යථා පරිදි සහතික කොට තිබේ නම්, එය සාක්ෂිමය ආවේශනයකට යටත් ලේඛනයක් වශයෙන් සැලකිය යුතුය.

යම් වාර්තා ලේඛනයක වෙළුමක හෝ ලිපිගොනුවක වූ යම් වෙළෙඳ සහතිකයක් නැති වී හෝ හානි වී හෝ විනාශ වී ඇති බවට හෝ එහි ඇති සටහන් හෝ ඒ සටහන්වල යම් වැදගත් කොටසක් කියවීමට නොහැකි වන පරිදි මැකී ගිය බවට හෝ හානියට පත්වී ඇති බව නිසි පරීක්ෂණයකින් පසු රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත්වූ අවස්ථාවක දී සකස් කළ වෙළෙඳ සහතිකයක් ඒ වෙනුවෙන් නිකුත් කිරීමට හැකිය.

16. මේ ප්‍රඥප්තියේ විධිවාධන යටතේ දීමට හෝ භාරදීමට නියම කරනු ලැබ ඇති යම් දැන්වීමක්, ලිඛිත නිවේදනයක්, සහතිකයක් හෝ වෙනත් ලේඛනයක්, එය අමතනු ලැබ තැනැත්තාගේ ලියාපදිංචි කළ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය වෙත ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කළ තැපැලෙන් යවා ඇත්තේ නම්, එය යථා පරිදි දී ඇති ලෙස හෝ භාරදී ඇති ලෙස සලකනු ලැබිය හැකිය.

දැන්වීම් භාරදීම

17. (1) ව්‍යාපාර ආයනයක් හෝ තැනැත්තෙකු මේ ප්‍රඥප්තිය යටතේ වෙළෙඳ ව්‍යාපාර සහතිකයක් අයදුම්පකර ඇති අවස්ථාවක ඊට අදාළ සහතිකය නිකුත් කිරීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියවිල්ලකින් නියම කරනු ලැබූ විස්තර සැපයීම හෝ ඔහු විසින් නියම කරනු ලැබූ යම් සංශෝධන මුල් ඉල්ලීමෙහි ඇතුළත් කිරීම පැහැර හැරි අවස්ථාවක, එකී විස්තර හෝ සංශෝධන ඉල්ලීමෙහි ඇතුළත් කරන ලෙසට නියමිත ආකෘතියෙන් වූ දැන්වීමක් එම

අයදුම්පත්‍රයන් අහෝසි වන අවස්ථා

තැනැත්තාට හෝ ව්‍යාපාර ආයතනට රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකිය. එසේ නිකුත් කිරීමේ දින සිට එක් මාසයක කාලයක් ඇතුළත හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් දෙනු ලබන ඊට වැඩි කාලයක් ඇතුළත ඒ තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් එම දැන්වීමෙහි සඳහන් කරුණු ඉටු කිරීම පැහැර හරිනු ලැබුවහොත්, එම ඉල්ලීම අහෝසි වූ ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකනු ලැබිය හැකි අතර, ඒ මත සහතිකයක් නිකුත් කිරීම සඳහා තවදුරටත් ක්‍රියා නොකර සිටිය හැකිය;

එසේ වුවද, මුල් ඉල්ලීම මත නියම කරනු ලබන වැඩිමනත් ගාස්තුවක් ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා විසින් ගෙවනු ලබන්නේ නම්, සහ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලැබූ ඒ විස්තර සපයන්නේ නම් හෝ ඔහු විසින් නියම කරනු ලැබූ සංශෝධනය මුල් ඉල්ලීමෙහි ඇතුළත් කරන්නේ නම් රෙජිස්ට්‍රාර්වරයා විසින් එසේ අහෝසි වූ ඉල්ලීම මත තවදුරටත් ක්‍රියා කරනු ලැබිය හැකිය.

(2) මෙම වගන්තිය යටතේ අහෝසි වූ වෙළෙඳ සහතිකයන් පාවිච්චි කිරීම, අඛණ්ඩව කරගෙන යන යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙකු (1) වල උපවගන්තියේ අතුරු වගන්තිය ප්‍රකාර කටයුතු කිරීමට පියවර ගෙන නොමැති නම්, ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට දී ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හා වරදකරු කරනු ලැබීමෙන් පසු වරද අඛණ්ඩව කරගෙන යනු ලබන දිනයක් සඳහා රුපියල් එක් සියයක අඛණ්ඩ දඩයටකද ඔහු යටත් විය යුතුය.

18. (1) මෙම ප්‍රඥප්තිය යටතේ වෙළෙඳ ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම, ලියාපදිංචියක් දීර්ඝ කිරීම, ඊට අදාළ සසහතිකය නිකුත් කිරීම හා වෙනත් ඕනෑම ප්‍රකාශයක්, උද්ධෘතයක්, වාර්තාවක් ඇතුළු ලේඛනයක් ප්‍රඥප්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සිදු කරනු ලබන වෙනත් කවර හෝ සේවාවක් වෙනුවෙන් අයකළ යුතු ගාස්තු මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් රීති මඟින් නියම කරනු ලබන ආකාරයට විය යුතුය.

රීති මඟින් ගාස්තු නියම කිරීම

(2) මෙම ප්‍රඥප්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ බලය අභිනියෝජනය කිරීම මත කාර්යය කටයුතු පවත්වාගෙන යන බලයලත් නිලධාරීන් වෙත එසේ කරනු ලබන කාර්යය කටයුතු සම්බන්ධයෙන් සුදුසු පාරිශ්‍රමික දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය මත දකුණු පළාත් අමාත්‍ය මණ්ඩලය අනුමත කරන පරිදි ගෙවිය හැකිය.

19. (1) රීති මගින් නියම කරනු ලබන ආකාරයට විය යුතු යැයි මෙම ප්‍රඥප්තිය යටතේ නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ රීති සාදනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසු ගැසට් පත්‍රයේ සඳහන් දින සිට හෝ එහි සඳහන් ඉදිරි දිනයක සිට බලාත්මක විය යුතු අතර එසේ බලාත්මක වී මාස 03 ක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

(3) එසේ පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් රීතියක් පරිච්ඡින්න වූවාසේ සැලකිය යුතු අතර එහෙත් ඒ යටතේ එතෙක් ගන්නා ලද කවර හෝ ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි පරිච්ඡින්න වූවා සේ සැලකිය යුතුය.

(4) යම් රීතියක් පරිච්ඡින්න කරනු ලැබූ දිනය ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය

අසත්‍ය ප්‍රකාශ හෝ වෙළෙඳ සහතිකය ලියාපදිංචි කරනු ලැබූ බවට අසත්‍ය ලෙස කරුණු දැක්වීම සම්බන්ධයෙන්

20. (1) (අ) වෙළෙඳ ස්ථානයක් ලියාපදිංචි කර නොමැතිව තිබිය දී දැන දැනම එය ලියාපදිංචි කර ඇති බවට කරුණු දක්වන හෝ ලියාපදිංචි සහතිකයේ ලියාපදිංචි අංකය දැන දැනම වෙනස් කරන,

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ යම් ප්‍රකාශයක් හෝ දිවුරුම් ප්‍රකාශයක් අසත්‍ය ලෙස ඉදිරිපත් කරන හෝ දෙන හෝ ඉදිරිපත් කිරීමට හෝ දීමට සලස්වන,

යම් තැනැත්තෙකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට දී ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීමට හෝ ඔහු යටත් විය යුතුය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අභිමතානුසාරී බලය

21. මේ ප්‍රඥප්තියෙන් හෝ ඒ යටතේ සාදන ලද රීතියකින් රෙජිස්ට්‍රාර්වරයා වෙත අභිමතානුසාරී බලතල පවරා දී ඇති අවස්ථාවක දී ආවේදිත පාර්ශවයට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සලසා දී ඇති වුවද, රෙජිස්ට්‍රාර්වරයා විසින් සෑම විටම තමන්ගේ බලතල අභිමතය පරිදි ක්‍රියාත්මක කිරීම සද්භාවයෙන් කළ යුතුය.

22. මෙම ප්‍රඥප්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් තබා ගනු ලබන ලියාපදිංචි කිරීමේ සටහනක කලින් කල සොයාගනු ලබන යම් ලිපි දෝෂයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකනු ලබන පරීක්ෂණයකින් පසු ඔහු විසින් නිවැරදි කළ හැකිය.

ලිපි දෝෂ නිවැරදි කිරීම

23. මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා සද්භාවයෙන් කරන ලද හෝ ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට එරෙහිව නඩුවක් හෝ වෙනත් නීති කෘත්‍යයක් නොපැවරිය යුතුය. නොපැවැත්විය යුතුය.

රෙජිස්ට්‍රාර්වරයාට විරුද්ධව නඩු පැවරීමට නොහැකි බව

24. රෙජිස්ට්‍රාර්වරයා හෝ මෙම ප්‍රඥප්තිය යටතේ එකී කාර්යය සිදු කරනු ලබන යම් තැනැත්තෙක්, එකී ධූරය දරන තාක්කල්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

රෙජිස්ට්‍රාර්වරයා සහ අනෙකුත් සේවකයින් රජයේ සේවකයන් බව.

25. මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ තබා ගැනීමට හා පවත්වාගෙන යාමට නියමිත සියලු වාර්තා ලේඛන, රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ බලය පවරන නිලධාරියාගේ අධීක්ෂණය යටතේ, ලියාපදිංචි කාර්යාලයේ තබා ගැනීම හා පවත්වාගෙන යාම කළ යුතුය.

වාර්තා ලේඛන ආදිය පවත්වාගෙන යාම.

26. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් දකුණු පළාතේ 1991 අංක 01 දරන දකුණු පළාතේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලබන අතර, එම ප්‍රඥප්තිය යටතේ පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් යටතේ පවත්වාගෙන යන හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු යටතේ පවත්වාගෙන යනු ලැබූ සියලු ලේඛන මෙම ප්‍රඥප්තිය යටතේ වන රෙජිස්ට්‍රාර්වරයාගේ භාරයේ ඇති ලේඛන වශයෙන් සලකා කටයුතු කළ යුතුය.

අන්තර් විධිවිධාන.

(2) 1991 අංක 01 දරන දකුණු පළාත් ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන සහතිකයක් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පසුව එළඹෙන අනුගාමී මුදල් වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින දක්වා කාලසීමාවට අදාළ වන පරිදි මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන වෙළෙඳ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් වශයෙන් අවශ්‍ය පමණට සැලකිය යුතුය.

(3) එකී ප්‍රඥප්තිය යටතේ යම් අධිකරණයක නියමිත දිනයට පෙරාතුව වූ දිනයක විනිශ්චයට භාජනව පවත්නා නීති කෘත්‍යය, එම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ විභාග වන අතර ඒ යටතේ අර්ථ නිරූපනය කළ යුතුය.

27. මේ ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"වෙළෙඳ ව්‍යාපාරය" යන්නට මුදල් හුවමාරුවක් සිදුවන යම් වෙළඳාමක්, වෘත්තියක්, සේවාවක් ඇතුලත් වේ.

"ව්‍යාපාර ලියාපදිංචි සහතිකය" යන්නෙන්, තනි පුද්ගල ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන්නේ යම්, නාමයක් හෝ අභිධානයක් යටතේ ද ඒ නාමය හෝ අභිධානය අදහස් වන අතර, විලාසමක් ද ඊට ඇතුළත් වේ.

"සංස්ථාව" යන්නෙන්, යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ පිහිටුවන සංස්ථාවක් අදහස් වන අතර, සමාගම්වලට අදාළ නීතියෙන් කථනය කරනු ලැබ ඇති සමාගමක් ද ඊට ඇතුළත් වේ.

"අධ්‍යක්ෂවරයා" හා "ලේකම්වරයා" යන්නට, කවර හෝ නමකින් හඳුන්වනු ලබන අධ්‍යක්ෂවරයාගේ හෝ ලේකම්වරයාගේ තත්ත්වය දරනු ලබන තැනැත්තෙකු ඇතුළත් වේ.

"ව්‍යාපාර ආයතනය" යන්නෙන්, ලාභය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ අරමුණ ඇතිව එකිනෙකා සමඟ හවුල් ව්‍යාපාරයක් හා බැඳුනු තැනැත්තන් දෙදෙනෙකුගෙන් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් හෝ තැනැත්තන් එක්කෙනෙකුගෙන් හෝ සමන්විත ව්‍යාපාර ආයතනයක් අදහස් වේ. එහෙත් 2007 අංක 01 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගමක් අදහස් නොවේ.

"තැනැත්තා/තැනැත්තන්" යන්නෙන්, ස්වභාවික තැනැත්තෙකු/තැනැත්තන් අදහස් වේ. (වයස අවුරුදු 18 ට නොඅඩු දකුණු පළාත් සභාව තුළ ව්‍යාපාර ස්ථාන ස්ථාපිත කර ඇති තැනැත්තා/තැනැත්තන්)

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාත් වෙළෙඳ විෂය භාර පළාත් අමාත්‍යවරයා අදහස් වේ.

28. මේ ප්‍රඥප්තියේ සිංහල , ඉංග්‍රීසි හා දෙමළ භාෂා පාඨ අයතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

04-893

46. 2019 අංක 05 දරන දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය.

දකුණු පළාතේ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීමට අදාළ විධි විධාන සැලැස්වීම සඳහාත්, දකුණු පළාත තුළ සමූපකාර සමිතිවල සේවකයින් සමිතිවල සේවකයින් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහාත්, සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අනුශංගික විධිවිධාන සැලැස්වීම සඳහාත් වූ ප්‍රඥප්තියයි.

01. (1) මෙම ප්‍රඥප්තිය දකුණු පළාත් සභාවේ 2019 අංක 05 දරන දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

(2) 1972 අංක 12 දරන සමූපකාර සේවක කොමිෂන් සභා පනතේ විධිවිධාන; මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හා අනනුකූල වන්නේ නම් එම පනතේ විධිවිධාන දකුණු පළාත තුළ අවලම්භිතව හා අක්‍රියව තිබිය යුතුය.

02.(1) අමාත්‍යවරයා, පළාත් කොමසාරිස්වරයා සහ කොමිෂන් සභාව විමසා ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයන් මගින් මෙම ප්‍රඥප්තියේ විධි විධාන අදාළ කර ගැනීම;

අමාත්‍යවරයාට මෙම ප්‍රඥප්තිය අදාළ කර ගැනීමෙන් සමූපකාර සමිති නිදහස් කළ හැකි බව

(අ) එහි නියමය කළයුතු ඕනෑම සමූපකාර සමිතියක්; හෝ

(ආ) එසේ නියම කළයුතු ඕනෑම සමූපකාර සමිති පන්තියක් නිදහස් කළ හැකිය

I වන කොටස

දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම.

03. (1) දකුණු පළාතේ සමූපකාර සේවක කොමිෂන් සභාව (මෙම ප්‍රඥප්තියේ කොමිෂන් සභාව ලෙස හඳුන්වන) ලෙස හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් මෙයින් පිහිටුවනු ලැබේ.

සමූපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම

(2) කොමිෂන් සභාව (1) උප වගන්තියෙන් ඊට පැවරෙන නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එහි නාමයෙන් නඩු පැවරීමට ද, ඊට විරුද්ධව නඩු පවරනු ලැබීමද, කළ හැකිය.

04. අමාත්‍යවරයා විසින්; 5 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් පත් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විය යුතු අතර, එම සාමාජිකයින් වයස අවුරුදු 65 නොඉක්මවන අවම වශයෙන් වසර 10 ක් වත් නිතිඥ වෘත්තියේ නියළුණු නීතිඥයින් විය යුතුය.

සමූපකාර සේවක කොමිෂන් සභාවේ සංයුතිය

05. කිසියම් පුද්ගලයෙකු සමූපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙසට පත් කිරීම හෝ පත් කරනු ලැබ සිටින්නේ නම් තව දුරටත් ධූරය දැරීමට පහත කරුණු නුසුදුසුකමක් වේ. ඔහු හෝ ඇය,

කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වීම සම්බන්ධයෙන් නුසුදුසුකම්.

(අ) සමූපකාර සමිතියක සේවකයකු හෝ හිටපු සේවකයෙකු නම්;

(ආ) සමූපකාර සමිතිවල යම් සේවක ගණයක් වැටුප්, වේතන හෝ සේවා කොන්දේසි සැකසීම එහි අරමුණු හෝ අරමුණුවලින් එකක් ලෙස ඇති සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන යම් පුද්ගල මණ්ඩලයක සාමාජිකයෙකු වේ නම්;

(ඇ) සමූපකාර සමිතියක නිලධාරියෙකු වන පුද්ගලයෙක් නම්;

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු, හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු වේ නම් හෝ, එවැන්නෙකු ලෙස පත් කරනු ලැබූ අයෙකු වේ නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවේ නම්, හෝ එවැන්නකු වීම අවසන් වන අයෙකු නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නීතියක් යටතේ සිහිවිකල් බැව් තීරණය කළ හෝ ප්‍රකාශයට පත් කළ අයෙකු නම්;

(උ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අපරාධ වරදක් සම්බන්ධව යම් අධිකරණයක් විසින් පනවන ලද සිරදඬුවමක් විඳ තිබූ අයෙකු නම්, හෝ විඳිමින් සිටින අයෙකු නම්;

(ඌ) කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතියක් හෝ ප්‍රතිලාභයක් ඍජුව හෝ වක්‍රාකාරව දරා සිටින අයෙකු නම්, හෝ භුක්ති විඳින අයෙකු නම්;

(එ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත්කරුවෙකු හෝ නිදහස් නොකළ බංකොලොත්කරුවෙකු ලෙස ප්‍රකාශ කර ඇති පුද්ගලයෙක් නම් ;

(ඒ) කොමිෂන් සභාවේ සමාජිකයෙකු ලෙස ඔහු සිය කාර්යයන් ඉටු කිරීමේ දී හානිකර ලෙස බලපෑ හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතා තිබෙන අයෙකු නම්, හෝ;

(ඔ) කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණි අයෙකු වීම.

06. (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින්ගෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙසත්, (මෙහි මින්මතු සභාපතිවරයා යනුවෙන් හඳුන්වනු ලබන) වෙනත් සාමාජිකයෙක් උප සභාපතිවරයා ලෙසත්, පත් කළ යුතුය.

කොමිෂන් සභාවේ සභාපතිවරයා

(2) කොමිෂන් සභාවේ රැස්වීම්වල න්‍යාය පත්‍රය පිළියෙල කිරීම සහ මෙම ප්‍රඥප්තියේ මූලධර්ම සහ විධිවිධාන ඉටුකිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන ප්‍රතිපත්ති සහ නිර්දේශ කොමිෂන් සභාවට සලකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා වගකිව යුතු වන්නේය.

(3) අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට සභාපති ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා එය පිළිගත් දින සිට එම ඉල්ලා අස්වීම ක්‍රියාත්මක විය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් 5 වන වගන්තියේ කරුණකට අදාළ වූ හේතු දක්වා සභාපතිවරයා සභාපති ධූරයෙන් ඉවත් කළ හැකිය.

(5) (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධූර කාලය, ඔහු කොමිෂන් සභාවේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතුය.

(6) රොගාතුර වීම නිසා හෝ වෙනත් දුබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ඔහුගේ ධූරයේ කාර්යය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත්වන අවස්ථාවක සාමාජිකයෙකු ලෙස පත්කළ වෙනත් ඕනෑම පත්කළ සාමාජිකයෙකු ඔහුගේ සාමාන්‍ය රාජකාරි වලට අමතරව; සභාපතිවරයා ලෙස වැඩබැලීම සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

07. (1) කොමිෂන් සභාව විසින් එහි බලතල සහ කාර්යයන්ගෙන් කිසිවක් සභාපතිවරයාට පැවරිය හැකිය.

කොමිෂන් සභාව එහි බලතල එහි සභාපතිවරයාට පවරනු ලැබිය හැකි බව.

(2) එසේ පවරනු ලැබූ බලතල හා කාර්යයන් සභාපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාන්‍ය හා විශේෂ නියමයන්ට යටත්ව ක්‍රියාත්මක කළ යුතුය.

08. (1) යම් තැනැත්තෙකු කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීමට පෙර ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඔහුගේ කාර්යයන් ඉටු කරනු ලැබීම කෙරෙහි හානිකර අන්දමින් බලපෑ හැකි මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතා ඔහු සතුව නොමැති බවට අමාත්‍යවරයා සෑහීමට පත් විය යුතුය.

සාමාජිකයන්ගේ මූල්‍ය සම්බන්ධතා

(2) පත් කරනු ලැබූ දින සිට කොමිෂන් සභාවේ සාමාජිකයින් කිසිවෙක් එවැනි යම් සම්බන්ධතාවයක් අත්පත් කරගෙන නොමැති බවට ද, අමාත්‍යවරයා වරින් වර සෑහීමට පත් විය යුතුය.

(3) (අ) කොමිෂන් සභාව ඇතුලත් වන්නා වූ හෝ ඇතුළත් වීමට යෝජිත යම් කොන්ත්‍රාත්තුවක් සඳහා කෙළින්ම හෝ වක්‍රාකාරව හෝ යම් ආකාරයක සම්බන්ධතාවයක් ඇති කොමිෂන් සභාවේ කවර හෝ සාමාජිකයෙකු විසින් ඔහුගේ එම සම්බන්ධතාවයේ ස්වභාවය කොමිෂන් සභාවේ රැස්වීමක දී අනාවරණය කල යුතුය; සහ

(ආ) එම අනාවරණය කිරිම කොමිෂන් සභාවේ රැස්වීම් වාර්තාවහි වාර්තා කළ යුතුය. තවද එම සාමාජිකයා කොමිෂන් සභාවේ එකී කොන්ත්‍රාත්තුව හා සම්බන්ධ සාකාච්ඡාවකට හෝ තීරණයකට හෝ සහභාගි නොවිය යුතුය.

09. (1) අමාත්‍යවරයා වෙත යවන ලිපියක් මගින් කොමිෂන් සභාවේ කවර හෝ සමාජිකයෙකුට ඔහු දරන ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා එය පිළිගත් දින සිට එම ඉල්ලා අස්වීම ක්‍රියාත්මක විය යුතුය.

සාමාජිකයන්ට අදාළ විධිවිධාන

(2) අමාත්‍යවරයා විසින් 5 වන වගන්තියේ කරුණකට අදාළ වූ හේතු දක්වා කවර හෝ සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(3) (අ) කොමිෂන් සභාවේ හම් සාමාජිකයෙකු මිය ගිය, ඉල්ලා අස් වූ හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක අමාත්‍යවරයා විසින් 4 සහ 5 වගන්තිවල විධිවිධාන සැලකිල්ළට ගනිමින් වෙනත් සාමාජිකයෙකු පුරප්පාඩු වූ ඔහුගේ ධූරයට පත් කරනු ලැබිය යුතුය.

(ආ) අමාත්‍යවරයා විසින් (අ) ඡේදයේ ඇතිවන පුරප්පාඩුවක් සඳහා හැකි ඉක්මනින් සාමාජිකයෙකු පත්කළ යුතුය.

(4) (3) වන උපවගන්තිය යටතේ පත්කළ සාමාජිකයෙකු ඔහු අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධූර කාලයෙහි නොගෙවී ඉතිරි වී ඇති කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

(5) කවර හෝ සාමාජිකයෙකු රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ඔහුගේ ධූරයේ රාජකාරි ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත්වන අවස්ථාවක ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා 4වන සහ 5 වන වගන්තිවල විධිවිධාන සැළකිල්ලට ගනිමින් වෙනත් තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැක.
(6) මෙම වගන්තිවල පූර්ව විධිවිධාන වලට යටත්ව කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයෙකුගේ ධූර කාලය වසර තුනක් විය යුතු අතර, විනය හේතු මත ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස එම සාමාජිකයා නැවත පත්කිරීම සඳහා සුදුස්සෙකු විය යුතුය.

කොමිෂන් සභාවේ රැස්වීම

10. (1) සභාපතිවරයා කොමිෂන් සභාවේ සැම රැස්වීමකම මූලාසනය දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටිය හොත් උපසභාපතිවරයා එම රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.

(2) (අ) කොමිෂන් සභාව විසින් තීරණය කළ යුතු සියලු කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ රැස්වීමක දී ක්‍රියාකළ යුතු අතර පැමිණ ඡන්දය ලබාදෙන සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතුය.

(ආ) රැස්වීමකදී සලකා බලන යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඡන්ද එක හා සාමාන වූ විට රැස්වීමේ දී මූලාසනය දරන සාමාජිකයාට ඔහුගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතුය.

(ඇ) හේතු මගින් සනාථ කළ සියලු තීරණ ලිඛිතව වාර්තා විය යුතු අතර, ඊට කොමිෂන් සභාවේ මුද්‍රාව තැබිය යුතුය.

(3) (අ) කොමිෂන් සභාවේ කුමන හෝ සාමාජිකයෙකුට රැස්වීමක් කැඳවන ලෙස සභාපතිවරයාගෙන් ලිඛිත ඉල්ලීමක් කළ හැකි අතර, සභාපතිවරයා සාධාරණ හේතු මත හැර එම ඉල්ලීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.
(ආ) 25 වන වගන්තිය යටතේ පත් කළ ලේකම්වරයා විසින් කොමිෂන් සභාවේ සියලුම රැස්වීම් කැඳවිය යුතුය.
(4) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතරේ පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසා හෝ එහි සාමාජිකයන් පත් කිරීමේ යම් දෝෂයක් වීම නිසා හෝ යන කරුණක් නිසාම පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කර්තව්‍යක් නිර්බල නොවන්නේය.

(5) කොමිෂන් සභාවේ ඕනෑම රැස්වීමක් සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(6) මෙම වගන්තියේ විධිවිධාන වලට යටත්ව කොමිෂන් සභාවේ රැස්වීම් සම්බන්ධයෙන් සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු අකාරය සම්බන්ධ කාර්යය පටිපාටිවලට අදාළව නියෝග සෑදිය හැකිය.

11. (1) කොමිෂන් සභාව එහි බලතල ක්‍රියාත්මක කිරිමේ දී හෝ කාර්යයන් සහ රාජකාරි ඉටු කිරීමේ දී එයට සහය වීම සඳහා එයට අවශ්‍ය යැයි සළකනු ලබන සාමාජික සංඛ්‍යාවකින් සමන්විත කාරක සභා පිහිටුවිය හැකිය. කොමිෂන් සභාවේ කාරක සභා

(2) කොමිෂන් සභාව එහි බලතල, කාර්යයන් හෝ රාජකාරි කිසිවක් කාරක සභාවකට පැවරිය හැකිය. එහෙත් කාරක සභාවකට පවරා තිබෙන යම් බලතල කාර්යය හෝ රාජකාරි පැවරීම ඉවත් නොකළ යුතුය.

(3) එම කාරක සභාවක් විසින් ගනු ලැබූ ඕනෑම තීරණයක් අවලංගු කිරිම හෝ සංශෝධනය කිරීම කොමිෂන් සභාවට කළ හැකිය.

12. (1) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව විසින් තීරණය කළ පරිදි විය යුතුය. මුද්‍රාව

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව;

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට සකස් කර ගත හැකිය.

(ආ) කොමිෂන් සභාව නිශ්චය කරනු ලබන පුද්ගලයෙකු හෝ පුද්ගලයන් භාරයේ තිබිය යුතුය; සහ

(ඇ) කොමිෂන් සභාවේ අනුමැතියෙන් තොරව සහ කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කිසිම ලේඛනයකට හෝ සාධන පත්‍රයකට හෝ නොතැබිය යුතුය. තමන් පැමිණ සිටින බවට ඒ සාමාජිකයන් දෙදෙනාම ඒ ලේඛනයට හෝ සාධන පත්‍රයට හෝ අත්සන් කළ යුතුය.

(3) කොමිෂන් සභාව, කොමිෂන් සභාවේ මුද්‍රාව තැබූ ලේඛන සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

13. කොමිෂන් සභාවේ සභාපතිවරයාට; උපසභාපතිවරයාට සහ අනෙක් සාමාජිකයාට අමාත්‍යවරයා විසින්, දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ මත හා මුදල් විෂය භාර පළාත් සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයෙන් පාරිශ්‍රමික ගෙවිය යුතුය.

14. (1) කොමිෂන් සභාවේ සාමාජිකයින් ඔවුන් මුල්වරට පත් කරනු ලබන අවස්ථාවේ දී මෙම ප්‍රඥප්තියේ උපලේඛනයේ දක්වා ඇති ආකාරයෙන් දිවුරුම් දිය යුතුය.

කොමිෂන් සභා සාමාජිකයන්ගේ හා නිලධාරීන්ගේ දිවුරුම

(2) කොමිෂන් සභාවේ ලේකම් ද ඇතුළුව සභාපතිවරයා විසින් එසේ කිරීමට නියම කරනු ලබන කොමිෂන් සභාවේ අනෙකුත් නිලධාරීන් ද ඔවුන් මුල්වරට පත් කරනු ලබන අවස්ථාවේ දී දිවුරුම් දිය යුතුය.

II වන කොටස
කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන්

15. (1) කොමිෂන් සභාවේ බලතල සහ කාර්යයන් පහත සඳහන් පරිදි විය යුතුය.

කොමිෂන් සභාවේ බලතල

(අ) සමූපකාර සමිතියක සේවකයින් බඳවා ගැනීමේ ක්‍රම , ඔවුන් සේවයේ යෙදවීම පිළිබඳ නියම සහ කොන්දේසි සහ සේවකයින් පත් කිරීමේ දී අනුගමනය කළ යුතු මූල ධර්ම සහ එකම සමූපකාර සමිතියේ එක් තනතුරක සිට වෙනත් තනතුරකට උසස් වීම් කිරීමේ දී එම සමූපකාර සමිති විසින් අනුගමනය කළ යුතු මූලධර්ම සම්බන්ධයෙන් සියලු කරුණු නිශ්චය කිරීම.

(ආ) සමූපකාර සමිතිවල සේවකයන් බඳවා ගැනීම සඳහා විභාග පැවැත්වීම හෝ විභාග පැවැත්වීමේ කාර්යය සඳහා පරීක්ෂණ මණ්ඩල පත් කිරීම සහ විභාග සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ගෙන් ගාස්තු අය කිරීම.

(ඇ) සමූපකාර සමිතියක ඕනෑම තනතුරකට පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම, ඕනෑම පන්තියක් හෝ ශ්‍රේණියක් හෝ එවැනි යම් තනතුරක් සඳහා වැටුප් පරිමාණ නියම කිරීම, පළාත් කොමසාරිස්වරයා විමසා වරින් වර එම වැටුප් පරිමාණ සංශෝධනය කිරීම හෝ ගැලපීම.

(ඈ) සමූපකාර සේවකයන්ගේ පාරිශ්‍රමික සහ සේවා කොන්දේසි නිශ්චය කිරීමේ දී එයට සහාය දැක්වීම සඳහා කොමිෂන් සභාව අවශ්‍ය යැයි සලකන උපදේශන යාන්ත්‍රණ පිහිටුවීම.

(ඉ) ඕනෑම පන්තියක හෝ ශ්‍රේණියක තනතුරකට හෝ තනතුරුවලට කොමිෂන් සභාව නියම කරන වැටුප් පරිමාණ අනුව වැටුප් ගෙවීමට සමුපකාර සමිතිවලට නියෝග කිරීම.

(ඊ) එහි සේවකයන්ට එරෙහිව විනයානුකූලව ක්‍රියා කිරීමට ඊට ඇති අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී සමුපකාර සමිති විසින් අනුගමනය කළ යුතු කාර්යය පටිපාටි නිශ්චය කිරිම, එහි
සේවකයන්ට එරෙහිව විනය පරික්ෂණ ආරම්භ කිරීමට ඕනෑම සමුපකාර සමිතියකට නියම කිරීම, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කාලයක් තුළ එම පරීක්ෂණ සම්පූර්ණ කිරීම සහ යම් විනයානුකූල නියෝගයකින් පැන නගින අභියාචනා විභාග කිරීම.

[

(උ) නියම කරනු ලබන ආකෘතිවලට අනුකූලව එම සමිතියේ සේවකයන්ට අදාළව ලේඛන සහ වාර්තා තබා ගැනීමට සහ පවත්වාගෙන යාමට යම් සමුපකාර සමිතියකට නියම කිරීම.

(ඌ) එම සමිතියේ යම් සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව නියම කරනු ලැබිය හැකි නියමිත වාර්තා ගොනු, අනෙකුත් ලේඛන හෝ තොරතුරු නියමිත දිනයට ඉදිරිපත් කිරීමට යම් සමුපකාර සමිතියකට නියම කිරීම.

(එ) කොමිෂන් සභාවට; ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීමට කොමිෂන් සභාව විසින් එම මණ්ඩලයට හෝ මණ්ඩලවලට යොමු කරනු ලැබිය හැකි අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරික්ෂණ කිරීම සඳහා නිලධාරි මණ්ඩලයක් හෝ මණ්ඩල පත් කිරීම.

(ඒ) සේවකයාගේ හැසිරීම පරීක්ෂණයකට විෂය වී තිබෙන සහ ඊට අදාළව සමිතියේ තීරණයට එරෙහිව කොමිෂන් සභාවට සේවකයා අභියාචනා කර තිබෙන අවස්ථාවක එම සමිතියේ එම සේවකයා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නැවත සේවයේ පිහිටුවීමට අදාළව දෙනු ලබන උපදෙස් ඇතුළු උපදෙස් ඉටු කිරීමට යම් සමුපකාර සමිතියකට නියම කිරීම.

(ඔ) ඔවුන්ගේ සේවා අවසන් කිරීම සම්බන්ධයෙන් සේවකයින්ට දෙනු ලැබිය හැකි පාරිතෝෂිකය හෝ අනෙකුත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් සාමාන්‍ය මුලධර්ම නිශ්චය කිරීම.

(ඕ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමෙන් එම සමූපකාර සමිතියක් හෝ සමූපකාර සමිති පන්තියක් නිදහස් කිරීමට අදාළව පළාතේ කොමසාරිස්වරයා විමසා අමාත්‍යවරයාට උපදෙස් ලබාදීම.

(ක) කොමිෂන් සභාවට අවශ්‍යයැයි සලකන නියෝග යම් සමූපකාර සමිතියකට හෝ එම සමූපකාර සමිතියේ සේවකයෙකුට හෝ ලබාදීම; සහ

(ග) මෙම ප්‍රඥප්තියේ 19 වන වගන්තිය යටතේ කරනු ලබන සමූපකාර සේවකයෙකුගේ මාරු කිරීමට එරෙහිව කොමිෂන් සභාවට කරනු ලබන අභියාචනයක් ඇසීමෙන් පසුව කොමිෂන් සභාව විසින් දෙනු ලැබිය හැකි උපදෙස් ඉටු කිරීමට යම් අදාළ සමූපකාර සමිතියකට නියම කිරීම.

(2) (1) වන උප වගන්තියෙන් කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දි කොමිෂන් සභාව විසින් කරන ලද තීරණයක් හෝ නිශ්චය කිරීමක් කොමිෂන් සභාවට, වෙනස් කිරීම, ප්‍රතිශෝධනය කිරීම හෝ අවහරණය කිරීම කළ හැකිය.

III වන කොටස
සමූපකාර සමිති හා ඒවායේ සේවකයෝ.

16. . (1) සෑම සමූපකාර සමිතියක්ම හා එම සමිතියක යම් සේවකයෙක් 15 වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් දෙනු ලබන නියම වලට එකඟ විය යුතුය.

සමූපකාර සමිති සහ ඒවායේ සේවකයින් කොමිෂන් සභාවේ නියම වලට යටත් විය යුතු බව

(2) කොමිෂන් සභාවේ පරීක්ෂණයක් හෝ නිල අවශ්‍යතාවයක් ඉදිරියේ පෙනී සිටිමට අපොහොසත් වන සමූපකාර සමිතියක සේවකයෙකු කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

17. මෙම ප්‍රඥප්තිය යටතේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේදී කොමිෂන් සභාවේ සෑම තීරණයක්ම සහ නියමයක්ම සියලු සමූපකාර සමිති හෝ එම සමිති වල යම් සේවකයෙක් සම්බන්ධයෙන් අනුගම්‍ය විය යුතුය.

සමූපකාර සමිතිවල සේවකයින් කොමිෂන් සභාවේ විධානවලින් බැඳුණු බව

18. සියලු සමූපකාර සමිති එම සමිතියේ සේවකයින්ට වැටුප් හා වෙනත් දීමනා එම සමිතියේ අරමුදලින් ගෙවිය යුතුය.

සමූපකාර සමිතිවල සේවකයින්ගේ වැටුප

19. (1) යම් සමූපකාර සමිතියක් එම සමිතියේ යම් සේවකයෙක් එහි යම් එක් සේවා ස්ථානයක සිට වෙනත් යම් සේවා ස්ථානයකට මාරු කළ හැකි අතර, විනයානුකූල හේතු මත හැර යම් වෙනත් හේතූන් නිසා මාරු කළ අවස්ථාවක එවැනි යම් සේවකයෙකුගේ සංවේතනවලට එම මාරු කිරීම අහිතකර ලෙස බලනොපැවැත්විය යුතුය.

සමූපකාර සමිතිවල සේවකයින් ස්ථාන මාරු කිරීම

(2) අදාළ සේවායෝජකයන්ගේ එකඟතාවය කලින් ලබාගෙන ඇත්නම්, සමාන තත්ත්වයේ තනතුරු දරන සේවකයින් දෙදෙනෙකුගේ හවුල් ඉල්ලීමක් අනුව යම් සමූපකාර සමිතියක සේවයෙන් වෙනත් සමූපකාර සමිතියකට පසුව සඳහන් කළ සමිතියේ සේවකයෙක් ලෙස මාරු කිරීමට කොමිෂන් සභාවට බලය ඇත.

20. (1) මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් රෙගුලාසියක් හෝ රීතියක් අනුව මිස සමූපකාර සමිතියක් විසින් එම සමූපකාර සමිතියේ යම් සේවකයෙකු අස්කිරීම හෝ අන්‍යාකාරයෙන් දඬුවම් කිරීම නොකළ යුතුය.

සමූපකාර සමිතිවල සේවකයින් අස් කිරීම හා දඬුවම් කිරීම

(2) යම් සමූපකාර සමිතියක් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට කලින් ක්‍රියාත්මක වූ විධිවිධාන අනුව යම් විෂමාචාරයක් හෝ විනය කඩකිරීමක් හෝ එදිනට පෙර සිදු කළ හෝ පැන නැගුන යම් පැමිණිල්ලක යම් හේතුවක් සම්බන්ධයෙන් එහි සේවකයන්ගෙන් යමෙකුට එරෙහිව දැනටමත් නොවිසඳී පවතින යම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ සම්පූර්ණ කිරීම මෙම වගන්තියේ පූර්ව විධිවිධාන කිසිවක් විසින් නීත්‍යානුකූල නොවන්නේ යැයි සැලකිය යුතු නොවන්නේය.

21. (1) අමාත්‍යවරයා රෙගුලාසි මගින් නියම කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන මුදලක් ඇප ආකාරයෙන් ඉදිරිපත් කිරීමට යම් සේවකයෙකුට නියම කිරීම සමූපකාර සමිතියක් නොකළ යුතුය.

සමූපකාර සමිතිවල සේවකයින් විසින් ඉදිරිපත් කරනු ලබන ඇප

(2) (1) වන උප වගන්තිය යටතේ ඉදිරිපත් කර ඇති යම් ඇප මුදලක් සමිතියේ නමින් රාජ්‍ය බැංකුවක ආයෝජනය කිරීම සමූපකාර සමිතියක් කළ යුතු වන අතර, ඒ මත උපචිත වන පොළිය සේවකයාට ගෙවිය යුතුය.

22. (1) සෑම සමූපකාර සමිතියක්ම;

(අ) එහි සේවකයින් සම්බන්ධයෙන් නියමිත ලේඛන සහ වාර්තා තබා ගැනීම හා පවත්වාගෙන යාම.

(ආ) එහි සේවකයින්ට අදාළව නියම කරනු ලැබිය හැකි වාර්තා හෝ වරින් වර කොමිෂන් සභාව නියම කරනු ලබන තොරතුරු ඉදිරිපත් කිරීම: සහ

(ඇ) එහි යම් කාර්යාලයකට ඇතුලුවීමට සහ එහි තබා ඇති යම්පොත්, ගිණුම් වාර්තා හෝ වෙනත් ලේඛන පරික්ෂා කිරීමට හා පිටපත් ගැනීමට, ඒ සම්බන්ධයෙන් බලය දී ඇති කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකුට හෝ සේවකයෙකුට අවසර දීම සෑම සමූපකාර සමිතියක්ම කළ යුතුය.

සේවකයින් සම්බන්ධයෙන් සමූපකාර සමිතිවල රාජකාරි

23. සියලු සමූපකාර සමිති හා එම සමිතිවල සියලු සේවකයින් යම් ලිඛිත නීතියකින් නියම කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණවලින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්ති භාර අරමුදලට කලින් කල දායක විය යුතුය.

අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්ති භාර අරමුදල

24. යම් සමූපකාර සමිතියක් එහි කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය පිණිස;

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ඇතිව සමූපකාර සමිතිය නිශ්චය කල හැකි නියම සහ කොන්දේසි මත; කොන්ත්‍රාත් පදනමින් විශේෂඥවරයෙකුගේ හෝ ප්‍රවීණයෙකුගේ සේවය ලබා ගැනීම; හෝ

(ආ) අනියම් හෝ දෛනික වැටුප් ගෙවීම් කරන සේවකයින් හෝ කැලි පදනම මත ගෙවීම් සේවකයින් සේවයේ යෙදවීම කළ හැකිය.

කෙසේ වෙතත් කොමිෂන් සභාවේ එකඟතාවයකින් තොරව දින30 ක් ඉක්මවා කාල පරිච්ඡේදයක් සඳහා එවැනි සේවකයින් යෙදවීම නොකළ යුතුය.

කොන්ත්‍රාත් පදනම හා අනියම් පදනමින් හා දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයින් යෙදවීම

IV වන කොටස

කොමිෂන් සභාවේ ලේකම් සහ කාර්ය මණ්ඩලය.

25. කොමිෂන් සභාවේ ලේකම්වරයෙක් සිටිය යුතු අතර, ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙක් විය යුතුය.

කොමිෂන් සභාවේ ලේකම්වරයා

V වන කොටස

මුදල්

26. කොමිෂන් සභාවේ වියදම් දකුණු පළාත් සභාවේ වාර්ෂික මුදල් ඇස්තමේන්තුවෙන් කාර්යයන් සඳහා ලබාදෙන මුදල්වලින් ගෙවිය යුතු වන්නේය. මූල්‍ය විධිවිධාන

27. කොමිෂන් සභාව සුදුසු යැයි සලකන යම් බැංකුවක යම් ගිණුමක් ආරම්භ කොට පවත්වා ගෙන යා හැකි අතර, එම ගිණුම්; පළාත් සභා මූල්‍ය ගනුදෙනුවලට අදාළව පවතින පළාත් සභා මූල්‍ය රෙගුලාසි අනුව ක්‍රියාත්මක කළ යුතු වන්නේය. කොමිෂන් සභාව ගිණුම් පවත්වාගෙන යා යුතු බව

28. (1) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුත්තේය. මුදල් වර්ෂය හා ගිණුම් විගණනය

(2) කොමිෂන් සභාවේ ආදායම් හා වියදම්, වත්කම් හා වගකීම් සහ අනෙකුත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්වීම කොමිෂන් සභාව කළ යුතු වන්නේය.

(3) කොමිෂන් සභාවේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මූල්‍ය තත්ත්වය පිලිබඳ සත්‍ය හා සාධාරණ මතයක් ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව පළාත් සභා මූල්‍ය රීති අනුව ගිණුම් පිළියෙල කළ යුතුය.

(4) පළාත් සභා මුදල් රීති අනුව ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු වන්නේය.

29. පළාත් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව සහ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාව ඇතිව කොමිෂන් සභාවට අයත් මුදල් ආණ්ඩුව අනුමත කළ සුරකුම්පත්වල ආයෝජනය කළ හැකිය. අරමුදල් ආයෝජනය කිරීම

30. (1) අමාත්‍යවරයාගේ සහ මුදල් විෂය පවරා ඇති පළාත් අමාත්‍යවරයාගේ ලිඛිත එකඟතාවය ඇතිව සහ දෙන ලද යම් පොදු අධිකාරි බලයක නියමයන්ට අනුව කොමිෂන් සභාවේ යම් බැඳීම් පියවීම සඳහා අවශ්‍ය යම් මුදල් ප්‍රමාණයක් ණයට ගැනීමට හෝ ණය කොන්දේසි මත ලබා ගැනීමට කොමිෂන් සභාවට හැකිය. ණය ලබා ගැනීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ බලතල

(2) මෙම වගන්තිය යටතේ , කොමිෂන් සභාව රැස්කර ගන්නා ලද යම් ණය මුදල් සම්බන්ධයෙන් යම් අවස්ථාවක හිඟව පවත්නා මුළු මුදල අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදල නොඉක්මවිය යුතුය.

VI වන කොටස

පොදු විධිවිධාන

31. (1) අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවට එහි බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සම්බන්ධයෙන් ලිඛිතව සාමාන්‍ය හා විශේෂ නියෝග වරින්වර නිකුත් කරනු ලැබිය හැකි අතර, එම නියෝග ක්‍රියාත්මක කිරීම කොමිෂන් සභාවේ රාජකාරිය විය යුතුය.

අමාත්‍යවරයාට නියෝග සෑදිය හැකි බව

(2) කොමිෂන් සභාවේ වැඩවලට අදාළ වාර්තා, ගිණුම් හෝ යම් වෙනත් තොරතුරු ඔහු නියම කරනු ලබන ආකෘතිවලින් ඔහු වෙත ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවට අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි අතර, එම නියෝග ක්‍රියාත්මක කිරීම කොමිෂන් සභාවේ රාජකාරිය විය යුතුය.

32. (1) කොමිෂන් සභාව එක් මුදල වර්ෂයක් අවසන් වී මාස 06ක් ඇතුළත එම මුදල් වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් කරගෙන ගිය ක්‍රියාකාරකම් පිලිබඳ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු අතර, එම වර්ෂයට අදාළ පහත දැක්වෙන ලේඛනවල එක් පිටපත බැගින් එම වාර්තාවට අමුණනු ලැබීමට සැලැස්විය යුතුය.

කොමිෂන් සභා වාර්තාවක් ඉදරිපත් කළ යුතු බව

(අ) වර්ෂය සඳහා කොමිෂන් සභාවේ විගණනය කළ ගිණුම්

;

(ආ) එම වාර්තා සහ ගිණුම් අදාළ වන වර්ෂයට පසුවට එළඹෙන වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම් පිලිබඳ වාර්තාවක්.

(2) (1) වන උප වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තා සහ ලේඛනවල පිටපත් එම වාර්තා ලැබුණු දින සිට මාස 06ක් ඇතුළත අමාත්‍යවරයා විසින් පළාත් සභාවට ඉදිරිපත් කල යුතුය.

33. කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙක්ම, නිලධාරියෙක්ම ,

රහස්‍යභාවය

සේවකයෙක්ම සිය රාජකාරි ආරම්භ කිරීමට පෙර මෙම ප්‍රඥප්තිය යටතේ සිය බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී ඔහු දැනගත් කොමිෂන් සභාවේ සියලු කටයුතුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීමට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර, එම ප්‍රකාශය මගින් පහත සඳහන් දේ හැර වෙනත් කරුණු අනාවරණය නොකරන බවට පොරොන්දු විය යුතුය.

(අ) එසේ කිරීමට අධිකරණයකින් නියම කරන ලද විට; හෝ

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ හා ඉටුකිරීමේ කාර්යය සඳහා.

කොමිෂන් සභාවේ බලතල පැවරීම

34. (1) කොමිෂන් සභාව ලිඛිතව සහ එහි නියම කර ඇති කොන්දේසි වලට යටත්ව කොමිෂන් සභාවේ යම් නිලධාරියෙකුට එහි බලතල සහ රාජකාරිවලින් කිසිවක් පැවරිය හැකි අතර, එවැනි යම් නිලධාරියෙක් එම බලතල කාර්යය සහ රාජකාරි කොමිෂන් සභාවේ නමින් සහ කොමිෂන් සභාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කළ යුතු වන්නේය.

(2) 1 වන උප වගන්තිය යටතේ, යම් බලතල පවරා තිබුණ ද කොමිෂන් සභාව, එසේ පවරන ලද යම් බලතල, කාර්යය හෝ රාජකාරි ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කල හැකි අතර, ඕනෑම අවස්ථාවක එම බලතල අවලංගු කල හැකිය.

කොමිෂන් සභාවේ නිලධාරීන් හා සේවකයින් රජයේ නිලධාරීන් ලෙස සැලකිය යුතු බව

35. කොමිෂන් සභාවේ ලේකම් ඇතුලු සියලුම නිලධාරීන් හා සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ ඒ කාර්යය සඳහා නිලධාරින් ලෙස සැලකිය යුතුය.

කොමිෂන් සභා උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව

36. කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව සහ කාර්යයන් සඳහා උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතු වන අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපනය කරනු ලැබිය යුතුය.

රෙගුලාසි

37. (1) මෙම ප්‍රඥප්තියෙන් රෙගුලාසි සෑදීමට නියමිත යම් කරුණු සම්බන්ධයෙන් හෝ ඒ සම්බන්ධයෙන් රෙගුලාසි සෑදීම සඳහා මෙම ප්‍රඥප්තියේ බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රෙගුලාසි සෑදිය හැකිය.

(2) (1) වන උප වගන්තියෙන් පවරා ඇති බලතලවල පොදු බවට අගතියක් නොවන පරිදි ද, අමාත්‍යවරයාට කොමිෂන් සභාව විමසා පහත සඳහන් සියලු කරුණු හෝ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් රෙගුලාසි සෑදිය හැකිය.

(අ) මෙම ප්‍රඥප්තිය යටතේ අයකළ යුතු ගාස්තු;

(ආ) 15 (උ) වගන්තිය යටතේ පවත්වාගෙන යායුතු සමූපකාර සමිතියක සේවකයන් සම්බන්ධයෙන් වන ලේඛන සහ වාර්තා;

(ඇ) සමූපාකාර සමිතියක යම් තනතුරකට පත්කරනු ලැබීම සඳහා පවත්වාගෙන යනු ලැබීමට නියම කර ඇති පදිංචිය පිලිබඳ සුදුසුකම්;

(ඈ) සමූපකාර සමිතියක සේවකයකු විසින් ඉදිරිපත් කළ යුතු ඇප මුදල් ප්‍රමාණ.

(ඉ) සමූපකාර සමිතියක සේවකයකු ලෙස බඳවා ගැනීම සඳහා විභාග පැවැත්වීම.

(ඊ) සමූපාකාර සමිතියක් සේවකයන්ගේ බඳවා ගැනීම් පටිපාටි, පත්වීම්, උසස් කිරීම්, මාරු කිරීම්, ඉල්ලා අස්වීම් සහ සේවා අවසන් කිරීම්;

(උ) එම සේවකයන්ගේ සේවා නියම සහ කොන්දේසි සහ වැටුප් පරිමාණ, දීමනා සහ පාරිතෝෂිත ගෙවීම, අත්තිකාරම්, උසස්වීම්, නිවාඩු ලබාදීම, සේවකයින්ගේ වැඩ තහනම් කිරීම, සේවයෙන් පහ කිරීම හෝ එම සේවකයන්ට වෙනත් යම් ආකාරයක දඬුවම් පැමිණවීම සහ ඒ හා සම්බන්ධ අභියාචනා;

(ඌ) අවශ්‍ය යැයි සලකන සේවකයින්ගේ සේවා නියම හෝ කොන්දේසි වලට අදාළ වෙනත් කරුණු;

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එසේ පළ කළ දින සිට හෝ නියම කරනු ලැබිය හැකි පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතුය.

(4) (අ) අමාත්‍යවරයා විසින් සකස් කරන ලද සියලුම රෙගුලාසි ඒවා ගැසට් පත්‍රයේ පළ කර මාස 6ක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු වන්නේය.

(ආ) එසේ අනුමත නොකරන ලද යම් රෙගුලාසියකින් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි එසේ අනුමත නොකළ දින සිට අවලංගු කළ ලෙස සැලකිය යුතුය.

(5) එසේ අමාත්‍යවරයා විසින් සාදන යම් රෙගුලාසියක් එසේ අවලංගු වූවා සේ සලකන දිනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු වන්නේය.

රීති සෑදීමට කොමිෂන් සභාවට ඇති බලය

38. (1). පහත සඳහන් කරුණු සියල්ල හෝ යම් එක් කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට රීති සෑදිය හැකිය.

(අ) මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් යටතේ රීති සෑදීමට කොමිෂන් සභාවට නියම කරන ලද හෝ බලය පවරන ලද කරුණු සම්බන්ධයෙන්.

(ආ) කොමිෂන් සභාවේ රැස්වීම් සහ එම රැස්වීම්වලදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි; සහ

(ඇ) කොමිෂන් සභාවේ කටයුතු වලට අදාළ යම් වෙනත් කරුණක් සම්බන්ධයෙන්.

(2) කොමිෂන් සභාව විසින් සාදන ලද සියලු රීති ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

වැරදි හා දඬුවම්

39. (1) යම් සමූපකාර සමිතියක් හෝ එහි සේවකයෙක්;

(අ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝණය කරයි නම්; හෝ

.

(ආ) කරනු ලැබීමට කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් ක්‍රියාවක් කිරීම හෝ කොමිෂන් සභාව හෝ වෙනත් නිසි බලය ඇති පුද්ගලයෙකු විසින් ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා නියම කරන යම් තොරතුරු ඉදිරිපත් කිරීම හිතාමතාම පැහැර හරියි නම් හෝ ප්‍රතික්ෂේප කරයි නම් හෝ කිරීමට අපොහොසත් වන්නේ නම්;

(ඇ) හිතාමතාම අසත්‍ය වාර්තා හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන්නේ නම්;

(ඇ) යම් සාධාරණ හෝ නීත්‍යානුකුල පදනමකින් තොරව මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් රෙගුලාසියක් යටතේ සිය බලතල ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකරන යම් පුද්ගලයෙකුට බාධා කරන්නේ නම්;

(ඉ) මෙම ප්‍රඥප්තියේ අධිකාරි බලය යටතේ ක්‍රියාකරමින් මෙම ප්‍රඥප්තිය යටතේ බලතල කාර්යයන් හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කරන හෝ ඉටුකරන අතරතුර, පීඩාකාරි හෝ ප්‍රකෝපකාරි ආකාරයෙන් හැසිරෙන්නේ නම්;

(ඊ) මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් රෙගුලාසියක යම් විධිවිධාන කිසිවක් කඩ කරන්නේ නම් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ ඔහුට දෙන ලද යම් නියම වලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන්නේ නම් හෝ එම සමූපකාර සමිතිය හෝ එම සේවකයන් මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරනු ලබන්නේය.

(2) (1) උප වගන්තිය යටතේ යම් වරදක් කරන සෑම සමූපකාර සමිතියක්, හෝ සේවකයෙක් මහේස්ත්‍රාත්වරයෙකු විසින් වැරදිකරුවෙකු කරනු ලැබූ විට, රුපියල් විසිදහසකට නොවැඩි දඩයක් හෝ මාස හයක් නොඉක්මවන සිරදඬුවමකට හෝ දඩය සහ සිරදඬුවම යන දෙකටම යටත් වන්නේය.

(3) සමූපකාර සමිතියක් විසින් මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් කරනු ලැබූ අවස්ථාවක එම වරද කරන බව ඔහු නොදැන සිටි බව හෝ එම වරද සිදුකිරීම වැලැක්වීමට නිසි සියලු දේ ක්‍රියාත්මක කළ බව හෝ ඔහු ඔප්පු නොකළහොත් එම සමිතියේ සියලු නිලධාරීන් එම වරදට වැරදිකරු ලෙස සැළකිය යුතුය.

(4) යම් සේවකයෙකු නැවත සේවයේ පිහිටුවීමට නියම කරමින් කොමිෂන් සභාව විසින් දෙනු ලබන යම් නියමයන් ඉටු කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් යම් සමූපකාර සමිතියක් වැරදිකරු කරනු ලැබූ විට එම සමූපකාර සමිතිය:

(අ) (2) වන උප වගන්තිය යටතේ එම සමූපකාර සමිතියට නියම කරනු ලැබිය හැකි යම් දඬුවමකට අතිරේකව එසේ වැරදිකරු කරනු ලැබීමෙන් පසු එම අපොහොසත් වීම අඛණ්ඩව පැවති එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක දඩයක් ගෙවීම**;** සහ

(ආ) ඒ එක් එක් දවසෙහි හා කොමිෂන් සභාවේ උපදෙස් අනුව ඒ සේවකයා නැවත සේවයට බඳවා ගත යුතුව තිබූ දිනයෙන් ආරම්භව ඒ සමූපකාර සමිතිය වරදකරු කරනු ලැබූ දිනයෙන් අවසන් වී කාලපරිච්ඡේදයේ එක් එක් දවසෙහි ඒ සේවකයා සේවයේ සිටියේ නම්, ඔහුගේ සේවය අවසන කරනු නොලැබ තිබිණි නම් ඔහුට හිමිකම තිබුණු වැටුපෙහි හෝ වේතනයෙහි ප්‍රමාණය අනුව ගණන්

බලනු ලැබූ පාරිශ්‍රමිකය එම සේවකයාට ගෙවීමට එම සමූපකාර සමිතිය බැඳී සිටී. මෙම උප වගන්තියේ (ආ) ඡේදය යටතේ ගෙවීමට සමූපකාර සමිතිය බැඳී ඇති යම් මුදලක් එම සමූපකාර සමිතිය වරදකරු කරනු ලැබූ අධිකරණය විසින් එයට පනවන දඩයක් ලෙස අධිකරණයේ නියෝගයක් මගින් අයකර ගනු ලැබිය හැකි අතර, එසේ අය කරගත් මුදල සේවකයාට ගෙවිය යුතුය.

කොමිෂන් සභාවේ කටයුතුවලට මැදිහත් වීම

40. සිය රාජකාරි ඉටු කිරීමේදී හැර කොමිෂන් සභාවේ හෝ එහි යම් සාමාජිකයෙකුගේ යම් තීරණයකට සෘජුව හෝ වක්‍රව හෝ ඔහු විසින්ම හෝ යම් පුද්ගලයෙකු මගින් හෝ කුමනාකාරයකින් හෝ බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට උත්සාහ කරන සෑම පුද්ගලයෙක්ම වරදකට වරදකරුවෙක් වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වැරදිකරු කරනු ලැබූ විට ඔහු රුපියල් විසිදහසකට නොවැඩි දඩයක් හා මාස හයක් නොඉක්මවන සිර දඬුවමකට හෝ දඩය හා සිරදඬුවම යන දෙකටම යටත් වන්නේය.

බලය නොමැතිව තොරතුරු හෙළිදරව් කිරීම තහනම් බව

41. කොමිෂන් සභාවේ කිසිදු සාමාජිකයෙකු කොමිෂන් සභාවේ ලේකම් කොමිෂන් සභා කාර්යය මණ්ඩලයේ යම් සාමාජිකයෙකු හෝ අන් කවර තැනැත්තෙකු විසින් වුවද තම නිල කාර්යයන් කිරීමෙහිලා නොවන අන් ආකාරයකින් තමාගේ රාජකාරී ඉටු කිරීමේදී තමාට දැන ගන්නට ලැබුණු කවර හෝ ලේඛනයක් සංදේශයක් හෝ තොරතුරක් පළකිරීම හෝ අන් තැනැත්තෙකුට එළිදරව් කිරීම නොකළ යුතුය.

අවලංගු කිරීම් හා ඉතිරි කිරීම්

42. (1) 1998 අංක 01 දරන දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය මෙයින් අවලංගු කෙරේ.

(2) ඉහත කී ප්‍රඥප්තිය අවලංගු කිරීම නොසළකා,

(අ) අවලංගු කරන ලද ප්‍රඥප්තිය යටතේ සාදන සහ මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට ආසන්නතම කලින් දින සිට බලාත්මකව පවතින සියලුම රෙගුලාසි, දැන්වීම්, නියෝග රීති හෝ මාර්ගෝපදේශ හෝ නිකුත් කරන ලද නියම, පනවන ලද අවශ්‍යතා නිශ්චය කිරීම් හෝ පැවරීම් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ අවස්ථාවෝචිත පරිදි නිකුත් කරන ලද හෝ පනවන ලද හෝ සාදන ලද රෙගුලාසි, දැන්වීම්, නියෝග රීති, මාර්ගෝපදේශ, නියම, අවශ්‍යතා නිශ්චය කිරීම් හෝ පැවරීම් ලෙස සැලකිය යුතුය.

(ආ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනට ආසන්නතම කලින් දිනට, අවලංගු කරන ලද ප්‍රඥප්තිය, යටතේ පිහිටුවන ලද සමූපකාර සේවක කොමිෂන් සභාවට අයත් සියලු චංචල හා නිශ්චල දේපල මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත පැවරෙන අතර, එහි දේපල ලෙස සැලකිය යුතුය.

(ඇ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට අවසන් නොවූ සහ අවලංගු කරන ලද ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් හෝ එයට එරෙහිව පවරා ඇති යම් නඩුවක්, පැමිණිල්ලක්, නීති කෘත්‍යයක්, කරුණක් හෝ දෙයක් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ප්‍රඥප්තිය යටතේ පිහිට වූ සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් හෝ එයට එරෙහිව පනවා ඇති නඩුවක්, පැමිණිල්ලක්, නීති කෘත්‍යයක්, කරුණක් හෝ දෙයක් ලෙස සැලකිය යුතු අතර, එම අධිකරණය විසින් ඇසිය යුතු වන්නේය.

(ඈ) යම් නඩුවක්, කරුණක්, නීති කෘත්‍යයක් හෝ දෙයක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විනිශ්චය සභාවක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් අවලංගු කරන ලද ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමූපකාර සේවක කොමිෂන් සභාවට පක්ෂව හෝ එරෙහිව කරන ලද සටහන් කරන ලද යම් තීන්දු ප්‍රකාශයක් නියෝගයක් හෝ තීරණයක් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමූපකාර සේවක කොමිෂන් සභාව වෙනුවෙන් හෝ එරෙහිව සටහන් කරන ලද හෝ කරන ලද තීන්දු ප්‍රකාශයක් නියෝගයක් හෝ තීරණයක් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ක්‍රියාත්මක කළ යුතුය.

(ඉ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට ආසන්නතම කලින් දිනට එකී ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමූපකාර සේවක කොමිෂන් සභාවේ ස්ථිර සේවක මණ්ඩලයේ සියලු නිලධාරීන් සහ සේවකයින් මෙම

ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමූපකාර සේවක කොමිෂන් සභාවේ ස්ථිර කාර්යය මණ්ඩලයේ නිලධාරීන් සහ සේවකයන් ලෙස සැලකිය යුතුය; සහ

(ඊ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට ආසන්නම කලින් දිනට අවලංගු කරන ලද ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමූපකාර සේවක කොමිෂන් සභාව සමග හා වෙනුවෙන් ඇති කරගත් සියලු ණය බැඳීම්, වත්කම් සහ වගකීම් ක්‍රියාත්මක කරන ලද හෝ බලාත්මක කරන ලද සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් යෙදී ඇති සියලු කරුණු හෝ කරනු ලැබීමට එකඟ වී ඇති දේවල් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට සිට මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමූපකාර සේවක කොමිෂන් සභාව සමඟ සහ වෙනුවෙන් ඇතිකර ගත් ණය බැඳීම් වත්කම් හා වගකීම් ක්‍රියාත්මක කරන ලද හෝ බලාත්මක කරන ලද සියලු කොන්ත්‍රාත් හා ගිවිසුම් යෙදී ඇති සියලු කරුණු හෝ දේවල් හෝ කරනු ලැබීමට එකඟ වී ඇති දේවල් ලෙස සැලකිය යුතුය.

43. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි, — අර්ථ නිරූපනය

"සමූපකාර සමිතිය" යන්නෙන් 1972 අංක 05 දරන සමූපකාර සමිති පනත යටතේ දකුණු පළාත තුළ ලියාපදිංචි කළ සමූපකාර සමිතියක් අදහස් වේ. එහෙත් මෙම ප්‍රඥප්තියේ දෙවන වගන්තිය යටතේ නියෝගයක් බල පවත්වන්නේ නම් සමූපකාර සමිතියක් සම්බන්ධයෙන් ද එම සමිතිය ඇතුළත් නොවේ.

"දිස්ත්‍රික්කය" යන්නෙන් දකුණු පළාත ඇතුළත යම් පරිපාලන දිස්ත්‍රික්කයක් අදහස් වේ.

"සේවකයා" යන්නෙන් යම් සමූපකාර සමිතියක් සේවයේ යොදවනු ලබන සහ එම සමූපකාර සමිතිය විසින් වැටුප් හා පාරිශ්‍රමික එහි අරමුදලින් ගෙවනු ලබන යම් පුද්ගලයෙක් අදහස් වේ. එහෙත් එයට නිලධාරියෙක් ඇතුළත් නොවේ.

"සේවා යෝජකයා" යන්නෙන් එහි සේවකයන්ට එහි අරමුදලෙන් වැටුප් හා වෙනත් පාරිශ්‍රමික ගෙවනු ලබන යම් සමූපකාර සමිතියක් අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාතේ සමූපකාර සංවර්ධන විෂය පවරා ඇති පළාත් අමාත්‍යවරයා අදහස් වේ.

"සමිති නිලධාරියා" යන්නට සමූපකාර සමිතියක මහ සභාවක් විසින් පත් කර ගත් සභාපති, උප සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන සියලු පුද්ගලයන් ඇතුලත් වේ.

"නියමිත" යන්නෙන් රෙගුලාසිවලින් නියම කරන ලද යන්න අදහස් වේ.

"පළාත" යන්නෙන් දකුණු පළාත අදහස් වේ.

"පළාත් කොමසාරිස්වරයා" යන්නෙන් 1972 අංක 05 දරන සමූපකාර සමිති පනතේ 2 වන වගන්තිය යටතේ දකුණු පළාතට පත් කරන ලද පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා යන්න අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(අ) වගන්තිය යටතේ පිහිටුවන ලද දකුණු පළාත් සභාව අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

44. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

(14 වන වගන්තිය) උප ලේඛනය

කොමිෂන් සභාවේ සාමාජිකයාගේ ප්‍රතිඥාව

සමූපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති / සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබ සිටින .... වන මම, සමූපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික ධූරයෙහි කාර්යයන් භයක් හෝ පක්ෂ භජනයක් හෝ දයාවක් හෝ ද්වේශයක් නොමැතිව ඉටු කරන බව හා ඒ කාර්යයන්ට අදාළ කිසිදු කරුණක් මට අයත් රාජකාරි ඉටු කිරීමෙහි ලා හැර, අන් ලෙසකින් කිසිදු තැනැත්තකුට නියමින් හෝ අනියමින් එළිදරව් නොකරන බවට ගාම්භීරතා පූර්වකවද, අවංකවද, දිවුරුම් දෙමි/ ප්‍රතිඥා දෙමි.

20 ... ක් වූ .... මස .... වැනි දින

....
දිවුරුම/ප්‍රතිඥා දෙන්නාගේ අත්සන

20..... මස ... වැනි දින වූ මෙදින මා ඉදිරිපිට දී දිවුරන ලදී/ ප්‍රතිඥා දෙන ලදී.

....
පළාත්බද මහාධිකරණයේ විනිශ්චයකාර

04-892

47. දකුණු පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය

දකුණු පළාත තුළ සමිති සංවිධානය, ලියාපදිංචි කිරීම, අධීක්ෂණය, පාලනය, විගණනය, සමුපකාර අධ්‍යාපනය හා ප්‍රචාරණය හා සංවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, සමුපකාර සමිති පිහිටුවීම හා පරිපාලනයට අදාළ ලිඛිත නීතිය නිශ්වය කොට දැක්වීම සඳහා ද ඊට සම්බන්ධ හෝ අනුශංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තියෙන් 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 9(4), 9(5), 24, 24(ඇ), 25, 26, 28(1), 28(2), 29(1), 29(2), 44(2)(1)(අ), 53(2), 58(1)(ඉ), 61(2)(උ), 61(2)(එ), 71, 75 බැංකුව යන්නෙන් (අ) (ආ) (ඇ) වගන්ති හැර සෙසු වගන්ති අනනුකූල කෙරේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, දකුණු පළාත් සභාවේ ආණ්ඩුකාරවර විසින් අනුමත කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

I වන පරිච්ඡේදය
ලියාපදිංචි කිරීම.

02. (1) ශ්‍රී ලංකාවේ දකුණු පළාත සඳහා සමුපකාර සංවර්ධන පළාත් කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයෙකු පත් කරනු ලැබිය යුතුය. එසේම අවශ්‍ය විය හැකි පළාත් නියෝජ්‍ය කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරුන් සහ සහකාර කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරුන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය. පත් කිරීම හා පත් කරන ලද තැනැත්තන්ගේ බලතල

(2) දකුණු පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් විශේෂ හෝ සාමාන්‍ය නියෝගයක් මගින් පළාත් නියෝජ්‍ය කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරුන් සහ සහකාර කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරුන්ට මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඊට අදාළව පනවනු ලබන රීතිවල සඳහන් පළාත් කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා සතු සියළුම බලතල හෝ ඉන් කොටසක් හෝ පැවැරිය හැකිය.

(3) සමූපකාර සංවර්ධන පළාත් කොමසාරිස් වශයෙන් හෝ සමූපකාර සංවර්ධන කොමසාරිස් වශයෙන් තත් කාලයේ ක්‍රියා කරන තැනැත්තාට, දකුණු පළාත තුළ තත් කාලයෙහි ක්‍රියා කිරීමට පත් කරනු ලබන හෝ ක්‍රියා කරනු ලබන හෝ ක්‍රියා කරනු ලබන තැනැත්තාට මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඊට අදාළව සාදනු ලැබූ හෝ සාදනු ලැබ ඇතැයි සැලකෙන යම් රීතිවලින් සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පවරනු ලැබූ බලතලම තිබිය යුතු අතර, ඔහු විසින් ඒ බලතල ක්‍රියාවේ යෙදවිය හැකිය.

(4) සමූපකාර සංවර්ධන පළාත් කොමසාරිස්වරයාට සහාය වීම පිණිස පත් කරනු ලබන එක් එක් තැනැත්තාට, මේ ප්‍රඥප්තිය යටතේ සහ, ඒ යටතේ සාදනු ලැබූ හෝ සාදනු ලැබ ඇතැයි සැලකෙන යම් රීති යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල අතුරින් ඔහු අදහස් කරනු ලබන ආකාරයට මේ වගන්තිය යටතේ කරනු ලබන යම් සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් බලතල තිබිය යුතු අතර, ඒ එක් එක් තැනැත්තා විසින් ඒ බලතල ක්‍රියාත්මක කළ හැකිය.

03. මෙහි මින් මතු අඩංගු කරනු ලබන විධිවිධානවලට යටත්ව. — ලියාපදිංචි කරනු ලැබිය හැකි සමිති

(1) ස්වකීය සාමාජිකයන්ගේ ආර්ථික, අධ්‍යාපනික, සාමාජීය හා සංස්කෘතික සුභ සාධනයට හේතු වන ආසක්තතා දියුණු කිරීම අරමුණු කරගත් සහ ස්වේච්ඡාවෙන් සංවිධානය වී සමූපකාර අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් සමූපකාර ප්‍රතිපත්ති සහ සාරධර්මවලට අනුකූල සංවිධානයක් සහ ව්‍යවසායකත්වයක් ලෙස පවත්වාගෙන යාම අරමුණු වශයෙන් යුක්ත සමිතියක්,

හෝ

(1) වන ඡේදයෙහි සඳහන් සමිතිවල ක්‍රියාකාරිත්වය පහසු කිරීමේ අරමුණු ඇතිව පිහිටුවන ලද ස්වකීය සාමාජිකයන් වශයෙන් ලියාපදිංචි සමිතිවලින් සමන්විත සමිතියක්,

සීමාසහිත වගකීම් ඇතිව හෝ නැතිව මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබිය හැකිය. එසේ වුවද ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් සාමාජිකයෙකු වන සමිතියක වගකීම සීමා සහිත වන්නේය.

(2) සමිතියක සාමාජිකයින්ගේ වගකීම සීමා කරනු ලැබූ අවස්ථාවක ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් නොවන කිසිම සාමාජිකයෙකු විසින් පහෙන් එකක උපරිම ප්‍රමාණයට යටත්ව, ඒ සමිතියේ කොටස් ප්‍රාග්ධනයෙන් රීතිවලින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක් නොදැරිය යුතුය.

ලියාපදිංචි කිරීම කොන්දේසි

04. (1) (අ) සමිතිය සාමාජිකයින්ගෙන් පමණක් සමන්විත වන අවස්ථාවක, සාමාජිකත්වය වයස අවුරුදු දහඅටට වැඩි වුවද, සමිතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය ඇතුළත පදිංචිව සිටින්නා වූ සේවයෙහි නියුක්තව සිටින්නා වූ හෝ නිශ්චල දේපළ අයත්ව සිටින්නා වූද, සමිතිය විසින් ඉටු කරනු ලබන සේවාවන් උපයෝගී කිරීමේ ශක්නුතාවය ඇත්තා වූද, සාමාජිකයින් යටත් පිරිසෙයින් විසි දෙනෙකුගෙන්වත් සමන්විත නොවන්නේ නම්; හෝ,

(ආ) (i) ලියාපදිංචි සමිතිවලින් පමණක් එය සමන්විත වන්නේ නම් සහ යටත් පිරිසෙයින් ලියාපදිංචි සමිති පහක් හෝ එකම ව්‍යාපාරික අරමුණින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතිවලින් සියයට පනහ හෝ යන දෙකෙන් වැඩි ගණනක් ඊට නොමැති නම් හා එම ව්‍යාපාරික අරමුණින් එම දිස්ත්‍රික්කය තුළ වෙනත් සංගමයක් ලියාපදිංචි වී නැත්නම්,

(ii) සමිතිවල සාමාජිකත්වයෙන් යුතු සමිතිවලින් සැදුම්ලත් සමිති මගින් පළාත් සමිතියක් හෝ සංගමයක් පිහිටුවනු ලබන්නේ නම් ලියාපදිංචි සමිති තුනක් වත් ඊට නොමැති නම්,

(ඇ) (i) සමිතිය විසින් නිරත වීමට යෝජනා කරනු ලබන කටයුතු ආර්ථික වශයෙන් යෝග්‍ය බවට;

(ii) සමිතිය විසින් යෝජිත අතුරු ව්‍යවස්ථාව, මේ ප්‍රඥප්තියෙන් හෝ ඒ යටතේ සාදන ලද හෝ සාදනු ලැබ ඇතැයි සැලකෙන රීතිවල විධිවිධානවලට අනුකූල වන බවට,

කොමසාරිස්වරයා විසින් නියම කර ඇත්තා වූ යම් තැනැත්තකුගේ හෝ ආයතනයකින් වාර්තාවක් හෝ නිර්දේශයක් සමිතිය විසින් ලබාගෙන නොමැති නම්,

(ඇ) යෝජිත අතුරු ව්‍යවස්ථා, තත්කාර්යය සඳහා යථා පරිදි කැඳවන ලද මහා සභා රැස්වීමකදී සම්මත කරනු ලැබ නොමැති නම්,

(ඉ) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය අත්සන් කරන සියළුම සාමාජිකයන් විසින් තම සාමාජිකත්වය සම්බන්ධයෙන් වූ ගෙවීම් සම්පූර්ණ කොට නොමැති නම්,

(ඊ) සමාන ව්‍යවසායක අරමුණින් යුතුව එම බල ප්‍රදේශය තුළ වෙනත් සමිතියක් ලියාපදිංචි වී ඇත්නම් හෝ සමිතියක් ලියාපදිංචි වී ඇති අවස්ථාවක, එකී ලියාපදිංචිය සමූපකාර සමිතියේ මහා සභාව යෝජිත සමූපකාර සමිතිය ලියාපදිංචි කිරීමට එකඟත්වය පළ කිරීමට යෝජනාවක් සම්මත කර මහා සභාව එකඟත්වය පළ කර නැත්නම්,

(උ) සමිතියේ කාරක සභාවේ සාමාජිකයන් අතුරින් යටත් පිරිසෙයින් දෙදෙනෙකුවත්, වයස අවුරුදු දහඅටත් තිස්පහත් අතර විය යුතු තැනැත්තන් වන බවට විධානයක් සමිතියේ යෝජිත අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් නොවන්නේ නම් සහ ඒ අනුව පත් වී නොමැති නම්,

(ඌ) යෝජිත සමිතියේ ආර්ථික හා සංවිධාන ශක්‍යතාවය හය මසක් තුළ ක්‍රියාත්මකව පැවැති බව ඔප්පු කර නැත්නම්,

(එ) ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන සියළු තොරතුරු සැපයීම ඒ සමිතිය විසින් පැහැර හැර ඇත්නම්,

කිසිම සමිතියක් මේ ප්‍රඥප්තිය යටතේ ලියා පදිංචි කරනු නොලැබිය යුතුය.

එසේ වුවද යම් සමිතියක් හෝ ලියා පදිංචි සමිතිවලින් සමන්විත වන සමිතියක් ලියාපදිංචි කිරීමේදී ඉහත (උ) උප වගන්තිය යටතේ දක්වා ඇති වයස් සීමාව නිදහස් කිරීමේ හෝ වෙනස් කිරීමේ බලය සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්වරයාට ඇත්තේය.

(2) ඉහත (1) උප වගන්තියෙහි කරුණු කෙසේ වුවත්, යෝජිත සමිතිය ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් නොවන කිනම් හෝ අවස්ථාවක කිසිම සමිතියක් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු නොලැබිය යුතුය.

(3) මේ වගන්තියේ කාර්යයන් සඳහා ඉහතින් වූ විධිවිධානවල සඳහන් කොන්දේසි සෑහීමකට පත් කර ඇති බවට යම් ප්‍රශ්නයක් පැන නගින අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් තීරණය කළ යුතු අතර ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතුය.

(4) සීමා සහිත වගකීමක් ඇතිව හෝ නැතිව මේ ප්‍රඥප්තිය යටතේ සමිතියක් ලියාපදිංචි කරනු ලැබිය හැකිය. එසේ ලියාපදිංචි කරනු ලැබූ සීමා සහිත වගකීම් වලින් යුත් සෑම සමිතියකම නමෙහි "සීමාසහිත" යන වචනය මුල් වචනය විය යුතුය. නැතහොත් එහි දෙමළ හෝ ඉංග්‍රීසි වචනය ඒ නමේ කොටසක් විය යුතුය.

05. (1) ලියා පදිංචි කිරීමේ කාර්යය සඳහා නියම කරනු ලැබූ යම් ආකාරයක් අනුව වූ ඉල්ලුම් පත්‍රයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම

(2) ඒ ඉල්ලුම්පත්‍රය -

(අ) ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් සාමාජිකයෙකු නොවන සමිතියක්, සම්බන්ධයෙන් වූ විට, 4(1) (අ) වන උප වගන්තියේ නියමයන් අනුව සුදුසුකම්ලත් තැනැත්තන් යටත් පිරිසෙයින් විසිදෙනෙකු විසින් අත්සන් කරනු ලැබිය යුතුය.

(ආ) ලියාපදිංචි කළ සමිතියක් සාමාජිකයෙකු වන, සමිත්යක් සම්බන්ධයෙන් වූ විට ලියාපදිංචි කළ එවැනි සෑම සමිතියක් වෙනුවෙන්ම යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තන් විසින් අත්සන් කරනු ලැබිය යුතුය.

(3) ඉල්ලුම්පත්‍රය සමග -

(අ) යෝජිත අතුරු ව්‍යවස්ථාවල පිටපත් දෙකක්,

(ආ) සමිතිය නිරත වීමට යෝජනා කරනු ලබන ආර්ථික කටයුතුවලට අදාළ යෝග්‍යතා වාර්තාවක්.

(ඇ) සමිතිය ලියාපදිංචි කිරීම පිණිස යෝජනාව සම්මත කරනු ලැබූ මහා සභා රැස්වීම් වාර්තාවේ සහ පැමිණීම සම්බන්ධයෙන් විස්තර වාර්තාවේ සහ අතුරු ව්‍යවස්ථාව සම්මත කරනු ලැබූ වාර්තාවේ හෝ වාර්තාවල සහතික පිටපත්.

(ඈ) ඉල්ලුම් පත්‍රය අත්සන් කරන සාමාජිකයින් විසින් සාමාජික කොටස් ගෙවනු ලැබීම ස්ථිර කෙරෙන සහ ඒ මුදල් එම කාරක සභාවේ භාරකාරත්වයේ පවතින බවට සමිතියේ කාරක සභාව විසින් සහතිකයක් අත්සන් කර ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ඉ) රෙජිස්ට්‍රාර්වරයා විසින් අයදුම්පතට අදාළව ඉල්ලා සිටින ඕනෑම තොරතුරක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

06. සමිතියක් විසින් මේ ප්‍රඥප්තිය හා රීතිවල විධිවිධානවලට අනුව ක්‍රියා කර ඇති බවට, ඒ සමිතිය නියුක්ත වීමට අදහස් කරන කටයුතු ආර්ථික වශයෙන් ශක්‍ය බවට හා සමිතියේ යෝජිත අතුරු ව්‍යවස්ථාවේ මේ ප්‍රඥප්තියට හා රීතිවලට පටහැනි නොවන බවට හා අදාළ සමිතිය යටත් පිරිසෙයින් මාස හයක්වත් ක්‍රියාකාරිත්වයේ තිබුණු බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත්වන්නේ නම් හා තමා සුදුසු යයි සලකන්නේ නම් ඔහු විසින් ඒ සමිතිය හා එහි අතුරු ව්‍යවස්ථා ලියාපදිංචිය සඳහා ඉල්ලීමක් ලැබී දින හැටක් ඇතුළත ලියා පදිංචි කළ හැකිය. යම් සමිතියක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්වරයා ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඒ බව ඉල්ලුම්කරුවන්ට ඉහත දින හැටක සීමාව ඉක්මවීමට පෙර දැනුම් දිය යුතුය. එවැනි ප්‍රතික්ෂේප කිරීමකට එරෙහිව අභියාචනයක්, රෙජිස්ට්‍රාර්වරයාගේ ලිපියෙහි සඳහන් දින සිට දින හැටක් ඇතුළත අමාත්‍යවරයා වෙත ලියාපදිංචිය සඳහා වූ ඉල්ලුම් පත්‍රයට අත්සන් කළ ඕනෑම අයෙකුට ඉදිරිපත් කළ හැකි විය යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අභියාචනයේ සඳහන් දින සිට දින හැටක් ඇතුළත තීරණය ලබා දිය යුතුය.

ලියාපදිංචි කිරීම

07. (1) සමිතියක් ලියාපදිංචි කරනු ලැබූ විට, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමිතිය වෙත ලියා පදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතුය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ සහතිකයේ සඳහන් සමිතියෙහි ලියාපදිංචි කිරීම අවලංගු කර ඇති බව ඔප්පු කළ හොත් මිස, ඒ සමිති යථා පරිදි ලියාපදිංචි කරනු ලැබූ බවට තීරණාත්මක සාක්ෂි විය යුතුය.

ලියාපදිංචි කිරීම සඳහා සාක්ෂි

08. (1) යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ ප්‍රඥප්තියට හා ඒ යටතේ සාදනු ලැබූ රීතිවලට යටත්ව, සමිතියේ නම ප්‍රකාශ කරන අතුරු ව්‍යවස්ථාව ඇතුළු සමිතියේ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කළ යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියක කිසිම අතුරු ව්‍යවස්ථා සංශෝධනයක්, ඒ සංශෝධනය මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන තෙක් වලංගු නොවිය යුතුය. ඒ කාර්යය සඳහා ඒ සංශෝධනයේ පිටපත් දෙකක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම

(3) ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් වූ සංශෝධනයක්, අවශ්‍ය අවස්ථාවක 4(1) (අ) සහ (ඇ) අනු වගන්තිවල සඳහන් වාර්තාවක් සහ රීතිවලින් නියම කර ඇති සහ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන තොරතුරු හා වාර්තා සමග ඉදිරිපත් කරනු ලබන්නේ නම් ලබන්නේ නම් මිස ඒ සංශෝධනය ලියාපදිංචි කරනු නොලැබිය යුතුය.

(4) (අ) අතුරු ව්‍යවස්ථාවල යම් සංශෝධනයක් මේ ප්‍රඥප්තියට හෝ රීතිවල විධිවිධානවලට පටහැනි නොවන බව රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් වන්නේ නම් තමා සුදුසු යයි සලකතහොත් ඔහු විසින් ඒ සංශෝධනය දින හැටක් ඇතුළත ලියාපදිංචි කළ යුතුය. එම අතුරු ව්‍යවස්ථාව සංශෝධනය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඉහත කී දින හැටක කාලය ඉක්මවීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා අදාළ සමිතියට දැනුම් දිය යුතුය. එවැනි ප්‍රතික්ෂේප කිරීමකට එරෙහිව අභියාචනයක්, රෙජිස්ට්‍රාර්වරයාගේ ලිපියෙහි සඳහන් දින සිට දින හැටක් ඇතුළත අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකි විය යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අභියාචනයේ සඳහන් දින සිට දින හැටක් ඇතුළත ඔහුගේ තීරණය ලබා දිය යතුය.

(ආ) ඉහත (අ) උප වගන්තිය යටතේ ඉදිරිපත් වන අභියාචනා වලට අදාළව අමාත්‍යවරයා විසින් ක්‍රියා කළ යුතු ආකාරය මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නියම කරනු ලබන ආකාරයට විය යතුය.

(5) සමිතියක නාමයක් වෙනස් කරන සංශෝධනයක් ඒ සමිතියේ හෝ එහි යම් සාමාජිකයන්ගේ හෝ හිටපු සාමාජිකයන්ගේ යම් අයිතිවාසිකමක් හෝ බැඳීමක් කෙරෙහි බල නොපෑ යුතු අතර, එවකට පවත්නා යම් නීති කෘත්‍යයක් එහි අළුත් නාමය යටතේ ඒ සමිතිය විසින් හෝ සමිතියට විරුද්ධව ඉදිරියටත් පවත්වාගෙන යනු ලැබිය හැකිය.

(6) ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු ලබන අවස්ථාවක තමා විසින් සහතික කරන ලද ඒ සංශෝධනයේ පිටපතක් ඔහු විසින් සමිතිය වෙත නිකුත් කළ යුතුය. ඒ සංශෝධනය යථා පරිදි ලියාපදිංචි කළ බවට ඒ සංශෝධනයේ සහතික කරනු ලැබූ පිටපත තීරණාත්මක සාක්ෂිය විය යුතුය.

(7) මේ වගන්තියෙහි "සංශෝධනය"යන්නට අළුත් අතුරු ව්‍යවස්ථාවක් සෑදීම හා අතුරු ව්‍යවස්ථාවක් වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම ඇතුළත් වේ.

(8) මෙම ප්‍රඥප්තිය යටතේ සමූපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර් විසින් අනුමත කරනු ලබන සෑම අතුරු ව්‍යවස්ථාවක්ම මෙම ප්‍රඥප්තිය හා ඒ යටතේ සාදනු ලැබූ රීතිවලට යටත්ව ක්‍රියාත්මක විය යුතුය.

ලියාපදිංචි සමිතිවල වත්කම් හා බැරකම් ඒකාබද්ධ කිරීම බෙදීම හා පැවරීම

09. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් , කළින් ලබා ගත් රෙජිස්ට්‍රාර්ගේඅනුමැතිය ඇතිව හා ඒ සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් තුනෙන් දෙකක වැඩි සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන යෝජනාවකින් -

(අ) සමිතියේ වත්කම් හා බැරකම් සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් යම් ලියාපදිංචි කරනු ලැබූ අන්කිසි සමිතියකට පැවරීම, හෝ

(ආ) සමිතිය, සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් වශයෙන් බෙදා වෙන් කර ගැනීම කළ හැකිය.

(2) යම් ලියාපදිංචි කළ සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් විසින්, රෙජිස්ට්‍රාර්වරයාගේ කළින් ලබා ගත් අනුමැතිය ඇතිව හා එක් එක් සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් තුනෙන් දෙකකට වැඩි සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන යෝජනාවකින් ඒකාබද්ධ වී අළුත් සමිතියක් පිහිටුවා ගත හැකිය.

(3) (අ) ලියාපදිංචි කළ සමිතියක් විසින් (1) වන උප වගන්තිය හෝ (2) වන උප වගන්තිය යටතේ සම්මත කරගනු ලබන යෝජනාවක අවස්ථාවෝචිත පරිදි පැවරීම, බෙදා වෙන් කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීම පිළිබඳ සියළු විස්තර අඩංගු විය යුතුය.

(ආ) යෝජිත පැවරීමේ, බෙදා වෙන් කිරීමේ හෝ ඒකාබද්ධ වීමේ යෝග්‍යතිව සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් වාර්තාවක් කැඳවිය හැකි හැකි අතර, යෝජිත පැවරීම, බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ වීම සම්බන්ධයෙන් කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණයක් ගත යුතුය. එකී තීරණය අවසානාත්මක වන්නේය.

(ඇ) ඉහත (1) හෝ (2) උප වගන්ති අනුව කටයුතු කිරීමට අනුමැතිය දෙනු ලැබුවහොත් එය ක්‍රියාත්මක කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයාට අවශ්‍ය යයි හැඟෙන, එම කාර්යය කිරීම උදෙසා එක් තැනැත්තකුගේ හෝ තැනැත්තන් කිහිපදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් රෙජිස්ට්‍රාර් විසින් පත් කරනු ලැබිය හැකිය. එම තැනැත්තාට හෝ මණ්ඩලයට එම කාර්යය ඉටු කිරීමට බලය බලය තිබිය යුතුය.

(4) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ වගන්තිය යටතේ සම්මත කර ගත් යෝජනාවකට යම් වත්කම් හා බැරකම් පැවරීමක් ඇතුළත් වන අවස්ථාවක, තත් කාලයෙහි බල පවත්නා යම් නීතියකට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, එය නොතකා ඒ සම්මත කර ගත් යෝජනාව තවදුරටත් තහවුරු කිරීමක් නොමැතිව පැවරීම්ලාභීන් වෙත ඒ වත්කම් හා බැරකම් සතු කිරීම ප්‍රමාණවත් පැවරීමක් ලෙස සලකනු ලැබිය යුතුය.

ඇතැම් අවස්ථාවලදී ලියාපදිංචි සමිතිවල ලියාපදිංචි කිරීම සහතික අවලංගු කිරීම

10. (1) ලියාපදිංචි කළ සමිතියක වත්කම් හා බැරකම් සියල්ලම වෙනත් ලියාපදිංචි කළ සමිතියකට මේ ප්‍රඥප්තියේ සඳහන් වූ විධිවිධාන අනුව පවරනු ලැබූ අවස්ථාවක පළමුව සඳහන් වූ සමිතියේ ලියාපදිංචි කිරීම අවලංගු විය යුතු අතර, ඒ සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසන් විය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් මෙම ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන අනුව අළුත් සමිතියක් වශයෙන් ඒකාබද්ධ කරනු ලැබූ අවස්ථාවක ඒකාබද්ධ කරනු ලැබූ ඒ එක් එක් සමිතියේ ලියාපදිංචි කිරීම අළුත් සමිතිය ලියාපදිංචි කරනු ලැබූ දිනයෙහි අවලංගු විය යුතු අතර, ඒ සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතීමද අවසන් විය යුතුය.

(3) ලියාපදිංචි කළ සමිතියක් මේ ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන අනුව සමිති දෙකකට හෝ වැඩි ගණනකට වෙන්ව බෙදී යන අවස්ථාවක ඒ සමිතියේ ලියාපදිංචි කිරීම අළුත් සමිති ලියාපදිංචි කිරීමෙන් පසු අවලංගු විය යුතු අතර, ඒ සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතීමද අවසන් විය යුතුය.

2 වන පරිච්ඡේදය
ලියාපදිංචි කරනු ලැබූ සමිතිවල සාමාජිකයින් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හා වගකීම.

11. (1) සාමාජිකත්වය සම්බන්ධයෙන් රීතිවලින් හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි යම් ගෙවීමක් තමා විසින් කරනු ලැබ ඇත්නම් මිස හෝ කරනු ලබන තෙක් නැතහොත් සමිතියෙහි එසේ නියම කරනු ලැබිය හැකි යම් සම්බන්ධතාවක් අත්කර ගනු ලැබ ඇත්නම් මිස හෝ අත්කර ගනු ලබන තෙක් ලියාපදිංචි කළ සමිතියක කිසිම සාමාජිකයෙකු විසින් සාමාජිකයෙකුගේ අයිතිවාසිකම් පාවිච්චි නොකළ යුතුය.

අය විය යුතු ගෙවීම් කරනු ලබන තෙක් සාමාජිකයන් විසින් අයිතිවාසිකම් පාවිච්චි නොකළ යුතු බව

(2) සමිතිය වෙත (1) වන උප වගන්තියේ සඳහන් යම් ගෙවීමක් කරනු ලැබ නැති හෝ ඒ සමිතියේ එම උප වගන්තියේ සඳහන් යම් සම්බන්ධතාවක් අත් කර ගෙන නැති අවස්ථාවක ඒ සාමාජිකයාගෙන් (1) වන උප වගන්තියේ සඳහන් ඒ ගෙවීම හෝ ඒ සම්බන්ධතාව සම්බන්ධයෙන් අයවිය යුතු මුදලක් වෙනත් ව්‍යවස්ථාපිත සමාගමක අනුයෝජිතයෙකු වශයෙන් යම් උපලේඛනගත කෘෂිකාර්මික නිෂ්පාදනයක් මිලට ගැනීම සම්බන්ධයෙන් සාමාජිකයාට සමිතියෙන් ගෙවිය යුතු යම් මුදලකින් සමිතිය විසින් අඩු කර ගැනීම නීත්‍යානුකූල විය යුතුය.

(3) (අ) සමූපකාර සමිතියක සාමාජිකයෙකු විසින් මිලයට ගත යුතු එක් කොටසක අවම වටිනාකම රුපියල් පන්සියයකි. එක කොටසක අවම වටිනාකම සාමාජිකත්වයට බැඳුනු දින සිට වසරක් තුළ ගෙවා නිම කළ යුතුය. එහෙත් පාසල් සමූපකාර සමිති සඳහා මෙම විධිවිධානයන් බල නොපැවැත්විය යුතු අතර රීති මගින් පනවා ඇති හෝ පනවනු ලබන විධිවිධානයන් අදාළ වේ.

(ආ) සමාජිකයෙකු විසින් යම් කොටසක් මිලට ගැනීම සඳහා ගෙවීම රුපියල් පනහක අවම මූලික ගෙවීමකින් ආරම්භ කළ හැකි අතර ඒ මූලික ගෙවීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත ඒ වාරිකය ගෙවීම රුපියල් පන්සියයකට වැඩි කරනු ලැබිය යුතුය. අවම වටිනාකම කැමැත්ත පරිදි වැඩි කරනු ලැබිය හැකිය. කොටසක සම්පූර්ණ වටිනාකම එක් වාරිකයකින් වුවද ගෙවනු ලැබිය හැකිය.

(4) (අ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට වසරක් ඉක්ම යාමට ප්‍රථම දකුණු පළාතේ සියළුම ලියාපදිංචි සමූපකාර සමිති එක් කොටසක අගය රුපියල් පන්සියයක් වන ලෙස අතුරු ව්‍යවස්ථා සංශෝධනය කර ක්‍රියාත්මක කළ යුතුය. එසේ වුවත් පාසල් සමූපකාර සමිති සඳහා මෙම විධිවිධානවල සඳහන් මුදල අදාළ නොවිය යුතුය.

(ආ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට සාමාජිකත්වය ලබා ඇති සාමාජිකයන්ට මෙම විධිවිධාන බල නොපැවැත්විය යුතුය.

(ඇ) තවද කොටස් මුදල සම්පූර්ණ කළ දින සිට එක් වසරක් ඉකුත් වන තෙක් ඡන්දය දීමේ අයිතිය හෝ ධූර දැරීමේ අයිතිය සාමාජිකයෙකු විසින් භුක්ති විඳිනු නොලැබිය යුතුය. එහෙත් ඉහත එක් වර්ෂයක කාලසීමාව අළුතින් ලියාපදිංචි කිරීමට රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ නම සඳහන් පුද්ගලයන්ට හා ලියා පදිංචි සමූපකාර සමිති සාමාජික වන සමිතිවලට මෙය බල නොපැවැත්විය යුතුය.

(5) පූර්ණ සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසුව පමණක් ලියාපදිංචි සමිතියක ඕනෑම රැස්වීමකදී ඡන්දය දීමට සහ නිලයකට තෝරා පත් කරනු ලැබීමට සාමාජිකයෙකුට හිමිකම තිබිය යුතුය.

(6) (අ) පාර්ලිමේන්තුවේ , පළාත් සභාවක , මහ නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරයෙකු, සභිකයෙකු වන කිසිම තැනැත්තෙකු හෝ ලියාපදිංචි කළ සමූපකාර සමිතියක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට හෝ තවදුරටත් එලෙස ධූරයේ කටයුතු කිරීමට සුදුස්සෙකු නොවිය යුතුය. තවද කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා විසින් පත් කරන ලද හොත් මිස දකුණු පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු දකුණු පළාතේ සමූපකාර සමිතියක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ ධූරයක කටයුතු කරනු ලැබීමට සුදුස්සෙකු නොවිය යුතුය. එසේ වුවද සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් පමණක් සමන්විත වන ලියාපදිංචි සමූපකාර සමිතියක ධූරයක් දැරීමට මෙම වගන්තිය බල නොපැවැත්විය යුතුය.

(ආ) කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා විසින් පත් කරන ලද හොත් මිස දකුණු පළාතේ සමූපකාර සමිතියක සේවකයෙකු සමූපකාර සමිතියක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත් කර ගනු ලැබීමට හෝ ධූරයේ කටයුතු කිරීමට සුදුස්සෙක් නොවිය යුතුය. එසේ වුවද සමූපකාර සමිතියක සේවකයින්ගෙන් පමණක් සමන්විත සමූපකාර සමිතියක ධූරයක් දැරීමට මෙම වගන්තිය බල නොපැවැත්විය යුතුය.

(7) කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා විසින් පත් කරනු ලබන අවස්ථාවකදී හැර යම් තැනැත්තෙක් තෝරා පත් කර ගන්නා දිනයේදී සාමාජිකත්වය ලියාපදිංචි සමිතිවලින් සමන්විත වන වෙනත් යම් ලියාපදිංචි සමිතියක සභාපතිව සිටින්නේ නම් ඒ තැනැත්තා සාමාජිකත්වය ලියාපදිංචි සමිතිවලින් සමන්විත වන පළමු සඳහන් සමිතියේ පරමාර්ථවලට සමාන නොවන පරමාර්ථ ඇත්තා වූ ලියාපදිංචි සමිතියක සභාපති ලෙස තෝරා පත් කර ගනු ලැබීමට නුසුදුස්සෙක් වන්නේය. එතකුදු වුවත් දිස්ත්‍රික් සමූපකාර මණ්ඩලයකට සභාපති වශයෙන් තෝරාපත් කර ගැනීමේදී ඉහත විධිවිධාන අදාළ නොවිය යුතුය.

12. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් සමිතියේ අතුරු ව්‍යවස්ථාවල අනුකූල ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ගිවිසුමකට එළඹෙන කවර හෝ පුද්ගලයෙකු ආශ්‍රිත සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගත හැකිය. එහෙත් එම ගිවිසුම සමූපකාර සමිතියේ ව්‍යාපාරික කටයුතුවලට වාසිදායක විය යුතුය

ආශ්‍රිත සාමාජිකයෝ

(2) ආශ්‍රිත සාමාජිකයෙකුට සමිතියේ වත්කම්වල හෝ ලාභවල කවර ආකාරයේ වූ හෝ කොටසකට හෝ සමිතියේ කටයුතු කරගෙන යාමෙහිලා යම් ඡන්ද බලයකට හිමිකම් නොලැබිය යුතුය.

(3) මේ වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර ආශ්‍රිත සාමාජිකයෙකුට සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි සාමාජිකයෙකුගේ වරප්‍රසාද හා අයිතිවාසිකම් තිබිය යුතු අතර සාමාජිකයෙකුගේ යම් වගකීම්වලට ඔහු යටත් විය යුතුය.

13. ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලැබූ යම් තැනැත්තකුගේ බාල වයස හෝ ඔහු නිසි වයසට නොපැමිණීම, මේ ප්‍රඥප්තිය යටතේ හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති යටතේ ඔහු විසින් ලියා අත්සන් කරනු ලැබීම අවශ්‍ය නීත්‍යානුකූල ලේඛනයක් ලියා අත්සන් කිරීම හෝ දෙනු ලැබීම අවශ්‍ය නිදහස් කිරීමක් දීමට ඔහුට බාධාවක් නොවිය යුතුය. තවද එවැනි යම් තැනැත්තකු විසින් සමිතියක් සමග ඇති කර ගනු ලැබූ යම් ගිවිසුමක් අවලංගු කිරීම සඳහා හෝ මග හරිනු පිණිස ඒ කරුණ හේතුවක් නොවිය යුතුය. එමෙන්ම එවැනි යම් තැනැත්තකු විසින් ප්‍රධාන පාර්ශවකරු හෝ ඇපකරු වශයෙන් සමිතියක් සමග ඇති කර ගත් එවැනි යම් ගිවිසුමක්, ඔහුගේ බාල වයස හෝ නිසි වයසට නොපැමිණීම නොතකා ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට විරුද්ධව නීතිය අනුව ක්‍රියාත්මක කළ හැකි විය යුතුය.

බාලවයස්කරුවන් වන සාමාජිකයන් විසින් සමිති සමග ඇති කර ගනු ලබන ගිවිසුම හා ගනුදෙනු

14. ලියාපදිංචි කළ සමිතියක යම් නිලධරයෙකු පත් කිරීමෙහිලා වූ යම් දෝෂයක් හෝ ඔහු තෝරා පත් කර ගැනීම සඳහා වූ යම් නුසුදුසුකමක් තදනන්තරව සොයා ගැනීම, ඒ සමිතිය වෙනුවෙන් ඒ නිලධරයා විසින් ඇති කර ගනු ලැබූ යම් ගිවිසුමක් අවලංගු කිරීම හෝ මග හැරවීම සඳහා හේතුවක් නොවිය යුතුය.

සමිතිවල නිලධරයන් විසින් ඇති කර ගනු ලබන ගිවිසුම්

15. යම් සමිතියක මහා සභාවක, කාරක සභාවක සාමාජිකයෙකුට සමිතියේ කටයුතු පවත්වාගෙන යාමෙහිලා එක් ඡන්දයක් පමණක් තිබිය යුතුය. එසේ වුවද ඡන්ද සම සමව බෙදුනහොත් සභාපතිට තීරක ඡන්දයක් තිබිය යුතුය.

සාමාජිකයන්ගේ ඡන්ද

එතකුදු වුවත් කාරක සභිකයන් හෝ නිලධාරීන් තෝරාගන්නා අවස්ථාවකදී ඡන්ද සම සමව බෙදුන හොත් කුසපත් ඇදීමකින් සුදුසු අයෙකු තෝරා ගත යුතුය.

16. (1) යම් මූලික සමිතියක සාමාජිකයෙකු විසින් ඒ සමිතියේ යම් රැස්වීමකදී පෞද්ගලිකවම හැර තම ඡන්දය පාවිච්චි නොකළ යුතුය.

ඡන්ද පාවිච්චි කරන ක්‍රමය

එසේ වුවද නියෝජිතයන් මාර්ගයෙන් ඡන්දය දීමට සමිතියේ අතුරු ව්‍යවස්ථාව යටතේ විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක සමිතියේ යම් රැස්වීමක දී එසේ ඡන්දය දීමට ඉඩ දිය හැකිය.

(2) වෙනයම් ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු වන ලියාපදිංචි කළ සමිතියක් විසින්, ඒ වෙන යම් ලියාපදිංචි කළ සමිතියේ කටයුතු පවත්වාගෙන යාමෙහිලා ඡන්දය දීමේ කාර්යය සඳහා ස්වකීය සාමාජිකයන්ගෙන් කෙනෙකු පත් කළ හැකිය.

17. (1) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකුගේ හෝ සිටිය සාමාජිකයෙකුගේ හෝ මිය ගිය සාමාජිකයෙකුගේ හෝ ප්‍රාග්ධනයෙහි කොටස් හෝ වෙනත් සම්බන්ධතා පැවරීම, සතුව සිටිය හැකි වැඩිම ප්‍රමාණය සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියෙන් හෝ රීතිවලින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත් විය යුතුය.

කොටස් හෝ සම්බන්ධතා පැවරීම පිළිබඳ සීමා

(2) සීමාරහිත වගකීම්වලින් යුත් ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් වූ විට කිසිම සාමාජිකයෙකු විසින් -

(අ) තමා විසින් යම් කොටසක් හෝ සම්බන්ධතාවක් එක් අවුරුද්දකට නොඅඩු කාලයක් දරන ලද්දේ නම්, හා

(ආ) සමිතිය වෙත හෝ සමිතියේ සාමාජිකයෙකු වෙත හෝ සාමාජිකත්වය සඳහා වූ ඉල්ලුම් පත්‍රය කාරක සභාව විසින් පිළිගනු ලැබ පිළිගනු ලැබ සිටින තැනැත්තකු වෙත පැවරීම කරනු ලබන්නේ නම් මිස තමා විසින් දරනු ලබන සමිතියේ ප්‍රාග්ධනයේ යම් කොටසක් හෝ සම්බන්ධතාවක් හෝ එහි යම් කොටසක් නොපැවරිය යුතුය.

3 වන පරිච්ඡේදය

ලියාපදිංචි කළ සමිතිවල යුතුකම්.

18. මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නියම කරනු ලබන ආකාරයට දැන්වීම් හා ලිපිය වනු ලැබිය හැකි, රීති අනුව ලියාපදිංචි කරනු ලැබූ ලිපිනයක් සෑම ලියා පදිංචි කළ සමිතියකම තිබිය යුතු අතර, ඒ ලිපිනය සම්බන්ධයෙන් යම් වෙනසක් ඇති වීමෙන් පසු දින හතක් ඇතුළත ඒ වෙනස රෙජිස්ට්‍රාර් වෙත දැන්විය යුතුය.

සමිතියේ ලිපිනය

19. ලියාපදිංචි කළ සෑම සමිතියක් විසින් මේ ප්‍රඥප්තිය සහ රීතිවල හා සමිතියේ අතුරු ව්‍යවස්ථාවල පිටපත් ද, කාරක නියෝගවල පිටපතක් ද සමිතියේ සාමාජිකයන්ගේ නාම ලේඛනයක් ද අවසන් විගණන වාර්තාවද සාමාජිකයෙකු විසින් ඉල්ලා සිටින විටක යුක්ති සහගත වේලාවක් තුළදී ගාස්තු ගෙවීමක් නොමැතිව පරීක්ෂා කර බැලීම සඳහා සමිතියේ ලියාපදිංචි කරන ලද ලිපිනය දරන ස්ථානයෙහි තැබිය යුතුය.

ප්‍රඥප්තිය රීති අතුරු ව්‍යවස්ථා යනාදියෙහි පිටපතක්ද පරීක්ෂා කර බැලීමට විවෘතව තිබිය යුතු බව

4 වන පරිච්ඡේදය
ලියාපදිංචි කළ සමිතිවල අයිතිවාසිකම්, බැඳීම් හා වරප්‍රසාද

සමිති සංස්ථා විය යුතු බව

20. සමිතියක් ලියාපදිංචි කිරීම හේතු කොටගෙන එය ලියාපදිංචි කරනු ලැබූ නාමය යටතේ, අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති හා දේපළ සතුව සිටීමේ ද ගිවිසුම්වලට ඇතුළත්වීමේද නඩු හා වෙනත් නීති කෘත්‍ය පැවරීමේ හා පවරනු ලැබීමේ හා ඒවා සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමේද සමිතිය පිහිටුවීමේ කාර්යය සඳහා අවශ්‍ය සියළුම දේවල් කිරීමේ ද බලය සහිත සංස්ථාවක් විය යුතුය.

සමිතියක හෝ සමිතිය මාර්ගයෙන් ද්‍රව්‍ය විකිණීම

21. (1) කෘෂිකාර්මික හෝ සත්ත්ව පාලනමය ද්‍රව්‍ය හෝ යම් කර්මාන්තයක නිෂ්පාදනය වන යම් භාණ්ඩයක් විකිණීම එක් පරමාර්ථයක් වශයෙන් ඇති ලියාපදිංචි කළ සමිතියක් විසින්;

(අ) එවැනි යම් දෙයක් නිෂ්පාදනය කරන සමිතියේ සෑම සාමාජිකයෙකු විසින් ඒ ද්‍රව්‍ය සම්පූර්ණයෙන් හෝ එහි යම් නිශ්චිත කොටසක්, සාමානුපාතයක් හෝ වර්ගයක් සමිතියට හෝ සමිතිය මාර්ගයෙන් විකිණිය යුතු බවට, හා

(ආ) අතුරු ව්‍යවස්ථා හෝ ගිවිසුම් කඩ කිරීමේ වරදට වරදකරු ලෙස රීතිවලින් නියම කළ හැකි ආකාරයකින් ඔප්පු කරනු ලැබූ හෝ තීන්දු කරනු ලැබූ සාමාජිකයෙකු විසින් රීතිවලින් හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් නිශ්චය කරනු ලබන හෝ තක්සේරු කරනු ලබන මුදලක්, ප්‍රමාණ කළ අලාභය වශයෙන් සමිතියට ගෙවිය යුතු බවට,

සමිතියේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන සැලැස්වීම හෝ එහි සාමාජිකයන් සමග ගිවිසුමකට ඇතුළු වීම කළ හැකිය.

(2) ලියාපදිංචි කළ සමිතියක් විසින් (1) වන උප වගන්තිය යටතේ ඇති කර ගත් ගිවිසුමකින් ඒ ගිවිසුම අදාළ වන නිෂ්පාදිත හෝ නිෂ්පාදනය කරනු ලැබීමට ආසන්න සියලු ද්‍රව්‍යයන් කෙරෙහි සමිතියේ වාසියට පළමු බැඳීමක් ඇතිවිය යුතුය.

(3) (1) උප වගන්තිය යටතේ වූ ගිවිසුමකින් උද්ගතවන යම් නීති කෘත්‍යයකදී ඒ ගිවිසුම ව්‍යාපාර තහනමක් වශයෙන් වූ ගිවිසුමක් යන්න නිදහසට කරුණක් නොවිය යුතුය.

(4) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු ඒ සමිතියේ සාමාජිකයෙකු වීමට පෙර තම ද්‍රව්‍ය වෙන යම් තැනැත්තෙකුට භාර දීමට ගිවිසගෙන සිටීමේ හේතුව කරණ කොට ගෙන ඒ ද්‍රව්‍ය ලියාපදිංචි කළ සමිතියට භාර දීමට ඔහු අපොහොසත් වූයේ නම් ඒ නිෂ්පාදන ඒ සමිතියට භාර දීමට තමාට නියම කෙරෙන ඒ සමිතියේ යම් අතුරු ව්‍යවස්ථාවක් ඒ සාමාජිකයා විසින් කඩ කරනු ලැබූ ලෙස නොසැලකිය යුතුය.

(5) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකත්වය සඳහා ඉල්ලුම්කරන සෑම තැනැත්තෙකු විසින්ම යම් ද්‍රව්‍යයක් වෙන යම් තැනැත්තෙකුට භාරදීම සඳහා තමා ඇති කර ගත් සියළු ගිවිසුම් පිළිබඳ විස්තර තම ඉල්ලුම් පත්‍රයෙහි එළිදරව් කරන ලෙස නියම කරනු ලැබුවහොත් එසේ කළ යුතුය.

ඇතැම් අවස්ථාවලදී ලියාපදිංචි කළ සමිතියක් මාර්ගයෙන් නිෂ්පාදන අනිවාර්යයෙන් විකිණීම

22. (1) ලියාපදිංචි කළ යම් සමිතියක් සම්බන්ධයෙන් වූ විට ඒ සමිතියේ සාමාජිකයන් හෝ එහි යම් කොටසක් දකුණු පළාතේ හෝ දකුණු පළාතේ යම් කොටසක, දිස්ත්‍රික්කයක හෝ ප්‍රදේශයක යම් භාණ්ඩයක් නිපදවන්නක් බවට අමාත්‍යවරයා සෑහීමකට පත් වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් තමාගේ අභිමතය පරිදි නියෝගයක මාර්ගයෙන් අවස්ථාවෝචිත පරිදි දකුණු පළාතේ හෝ දකුණු පළාතේ යම් කොටසක දිස්ත්‍රික්කයක හෝ ප්‍රදේශයක ඒ භාණ්ඩ පිළිබඳ එක් එක් නිපදවන්නාට ඒ නිපදවන්නා ඒ සමිතියේ සාමාජිකයෙකු වුවද, නොවුවද ඒ නිපදවන්නා විසින් නිෂ්පාදනය කරනු ලබන ඒ භාණ්ඩයෙහි සම්පූර්ණ ප්‍රමාණයෙන් ඔහුගේ ප්‍රයෝජනයට හෝ පරිභෝජනට අවශ්‍ය නොවන කොටස ඒ සමිතියට හෝ සමිතිය මාර්ගයෙන් අලෙවි කරන ලෙස විධානය කළ හැකිය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උප වගන්තිය යටතේ කරනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ නියෝගයෙහි ඒ භාණ්ඩය, නියෝගය ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශය හා ඒ භාණ්ඩය නිපදවන්නාට ගෙවිය යුත්තේ කවර පදනමක් මත ද යන වග නිශ්චිතව සඳහන් කළ යුතුය.

(3) සෑම නියෝගයක්ම ඒ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, (5) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව එය පරිච්ඡින්න කරනු ලබන තෙක් අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතුය.

(4) සෑම නියෝගයක්ම ක්‍රියාත්මක වීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා දකුණු පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(5) දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන සෑම නියෝගයක්ම පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ යටතේ කළින් කරන ලද හෝ කරනු ලැබීමට ඉඩ දෙන ලද කිසිවක වලංගු භාවයට හානිකර නොවිය යුතුය. නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය ඒ නියෝගය අනුමත කිරීම දකුණු පළාතේ පළාත් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ දිනය විය යුතු අතර ඒ දිනය ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලැබිය යුතුය.

(6) (අ) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයකින් (ඒ නියෝගය මින් මතු සංශෝධනය කිරීමේ නියෝගය යනුවෙන් සඳහන් කරනු ලැබේ.) (1) වන උප වගන්තිය යටතේ කළින් කරන ලද යම් නියෝගයක් ඕනෑම අවස්ථාවක වෙනස් කළ හැකිය. සෑම සංශෝධනය කිරීමේ නියෝගයක්ම එය ගැසට් පත්‍රයෙහි පළ කළ දින සිට ක්‍රියාත්මක විය යුතුය.

(ආ) සංශෝධනය කිරීමේ නියෝගයකින් වෙනස් කරනු ලබන (1) වන උප වගන්තිය යටතේ කරන ලද නියෝගයක් එසේ වෙනස් නොකරන ලද්දේ නම් ක්‍රියාත්මක විය හැකිව තිබූ කාල පරිච්ඡේදය තුළ එසේ වෙනස් කරනු ලැබූ පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු අතර ඊට වැඩි කාලයක් ක්‍රියාත්මක නොවිය යුතුය.

(ඈ) සෑම සංශෝධනය කිරීමේ නියෝගයක්ම අනුමත කිරීම සඳහා දකුණු පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද (1) වන උප වගන්තිය යටතේ කරනු ලබන නියෝගයක් (4) වන උප වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරනු ලැබීමට පෙර සංශෝධනය කිරීමේ නියෝගයක් හෝ නියෝග වැඩි ගණනකින් වෙනස් කරනු ලැබූ අවස්ථාවක, ඒ නියෝගය ඒ උප වගන්තිය යටතේ අනුමැතිය සඳහා දකුණු පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කළ විට ඒ සංශෝධනය කිරීමේ නියෝගයෙන් හෝ නියෝගවලින් ඇති කරන ලද සියළු වෙනස් කිරීම් එහි අන්තර්ගත කරනු ලැබිය යුතු අතර, එවැනි යම් අවස්ථාවකදී එවැනි සංශෝධනය කිරීමේ නියෝගයක් වෙන් වෙන් වශයෙන් දකුණු පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

(ඇ) අනුමැතිය සඳහා දකුණු පළාතේ පළාත් සභාව ඉදිරියට ගෙන එනු ලැබූ යම් සංශෝධනය කිරීමේ නියෝගයක් පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීම ඒ සංශෝධනය කිරීමේ නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබීමක් ලෙස සැලකිය යුතු අතර (1) වන උප වගන්තිය යටතේ කරනු ලැබූ නියෝග ඒ පරිච්ඡින්න කිරීමේ දිනයේ සිට ඒ සංශෝධනය කිරීමේ නියෝගය නොලැබුවාක් මෙන් අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතුය.

(ඉ) (1) වන උප වගන්තිය යටතේ කළින් කරන ලද යම් නියෝගයක් අමාත්‍යවරයා විසින් යම් විටෙක පරිච්ඡින්න කළ හැකිය. එවැනි යම් නියෝගයක් පරිච්ඡින්න කිරීමේ නියෝගය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර ඒ නියෝගය එසේ පළ කිරීමේ දින සිට පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය.

(7) සෑම නියෝගයක්ම දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරනු ලැබූ විට එය මෙහිලා පනවනු ලැබුවාක් මෙන් වලංගු හා බල සහිත විය යුතුය.

(8) මේ වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කිරීමට නියමිත සෑම නිවේදනයක්ම අමාත්‍යවරයාගේ අත්සන යටතේ පළ කළ යුතුය.

(9) මේ වගන්තිය යටතේ කරන ලද යම් නියෝගයක විධිවිධාන අන්කිසි ලිඛිත නීතියක විධිවිධාන සමග නොගැළපීම හෝ ගැටීම නොතකා ඒ නියෝග බලපවත්නා කාල පරිච්ඡේදය තුළ ඒ අන් ලිඛිත නීතිය අභිබවා ඒ විධිවිධාන බලපැවැත්විය යුතුය.

(10) තමා සාමාජිකයෙකු නොවන ලියාපදිංචි කළ සමිතියකට හෝ සමිතියක් මාර්ගයෙන් යම් භාණ්ඩයක් විකුණන ලෙස (1) වන උපවගන්තිය යටතේ නියෝගයකින් විධිවිධාන කරනු ලැබූ සෑම නිපදවන්නෙකුම ඒ විධානය අනුව වූ එවැනි යම් විකිණීමක් සම්බන්ධයෙන් හා ඒ විකිණීමෙන් උද්ගත වන යම් කරුණක් හෝ ගනුදෙනුවක් සම්බන්ධයෙන් ඔහු ඒ සමිතියේ සාමාජිකයෙකුව සිටියේ නම් යටත් විය හැකිව තිබූ කොන්දේසි හා බැඳීම් වලට යටත්විය යුතුය.

(11) (1) වන උප වගන්තිය යටතේ නියෝගයක් කරන ලද්දේ යම් නිපදවන්නෙකු සම්බන්ධයෙන්ද ඒ නිපදවන්නා වූ ද ලියාපදිංචි කරනු ලැබූ සමිතියේ සාමාජිකයෙකු නොවන්නා වූ ද යම් නිපදවන්නෙකු විසින් ඒ සමිතියේ සාමාජිකයෙකු ලෙස ඇතුළත් වීම සඳහා ඉල්ලුම් කරනු ලබන අවස්ථාවක සමිතිය විසින්,

(අ) ඔහු එසේ කැමති වන්නේ නම් ඔහුගේ ගිණුමට සමිතියට ලැබුණ හෝ සමිතිය විසින් දරනු ලබන යම් අරමුදල්වලින් සාමාජිකත්වය සඳහා වූ දායක මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් අය කර ගත හැක. තවද,

(ආ) ඉහත කී පරිදි යම් අයකර ගැනීමකට යටත්ව ඒ දායක මුදල සම්පූර්ණයෙන්ම ගෙවීමෙන් පසු ඔහු සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කළ යුතුය.

ගිවිසුම කඩ කිරීමට අනායයන් පොළඹවන තැනැත්තෝ

23. (1) වෙනයම් තැනැත්තකු විසින් නිෂ්පාදනය කරනු ලබන යම් භාණ්ඩයක් ලියාපදිංචි කළ සමිතියකට හෝ ඒ සමිතිය මාර්ගයෙන් විකිණීමට ඒ වෙනත් තැනැත්තා 21 වන වගන්තිය යටතේ ගිවිසගෙන සිටින හෝ 22 වන වගන්තිය යටතේ වූ නියෝගයකින් බැඳී සිටින බව දැන සිටියදී හෝ ඒ පිළිබඳව දැන්වීමක් ලැබ ඇතිව සිටියදී අවස්ථාවෝචිත පරිදි ඒ ගිවිසුම කඩ කරමින් හෝ ඒ නියෝගයට පටහැනිව ඒ භාණ්ඩය විකිණීමට හෝ භාර දීමට ඒ වෙනත් තැනැත්තා පොළඹවන හෝ කැමති කරවා ගන්නා යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

(2) (1) වන උප වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තා සංස්ථාවක් වන අවස්ථාවක ඒ වරද කරන විට ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු හෝ නිලධරයෙකුව සිටි සෑම තැනැත්තකුම ඒ වරද සිදු කරන ලද්දේ තමා නොදැනුවත්ව හෝ ඒ වරද සිදු කිරීම වැලැක්වීම සඳහා නිසි සියළු උද්යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔහු විසින්ම ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

සාමාජිකයෙකු මිය ගිය විට සම්බන්ධතා පැවරීම

24. (1) සාමාජිකයෙකු මිය ගිය පසු ලියාපදිංචි කළ සමිතියක් විසින් ඒ මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතා ඒ වෙනුවෙන් සාදනු ලැබූ රීති අනුව නම් කරනු ලැබූ තැනැත්තෙකුට හෝ එසේ නම් කරනු ලැබූ කිසිම තැනැත්තෙකු නොසිටී නම් මියගිය සාමාජිකයාගේ නීත්‍යානුකූල උරුමකරු හෝ නියෝජිතයා ලෙස කාරක සභාවට පෙනී යා හැකි වෙන යම් තැනැත්තෙකුට පැවරිය හැකිය. නැතහොත් රීති හෝ අතුරු ව්‍යවස්ථාවට අනුව නිශ්චය කරනු ලැබූ ඒ සාමාජිකයාගේ කොටසේ හෝ වෙනත් සම්බන්ධතාවේ වටිනාකමට සමාන මුදලක් ඒ නම් කළ තැනැත්තාට උරුමකරුට හෝ නීත්‍යානුකූල නියෝජිතයාට ගෙවිය හැකිය.

එසේ වුවද,

(අ) සීමාරහිත වගකීම්වලින් යුතු සමිතියක් සම්බන්ධයෙන් වූ විට අවස්ථාවෝචිත පරිදි ඒ නම් කරනු ලැබූ තැනැත්තා, උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා විසින් මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතාව සම්බන්ධයෙන් ඉහත කී පරිදි නිශ්චය කරනු ලැබූ වටිනාකම සමිතිය විසින් ගෙවන ලෙස ඉල්ලා සිටිය හැකිය.

(ආ) සීමාසහිත වගකීම්වලින් යුතු සමිතියක් සම්බන්ධයෙන් වූ විට සමිතිය විසින් මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතා සමිතියේ සාමාජිකත්වය සඳහා රීති හා අතුරු ව්‍යවස්ථාව අනුව සුදුසුකම්ලත් අවස්ථාවෝචිත පරිදි ඒ නම් කළ තැනැත්තා උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා වෙත හෝ මියගිය තැනැත්තාගේ මරණයෙන් පසු හය මසක් ඇතුළත ඔහු විසින් කරනු ලබන ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබූ එසේ සුදුසුකම්ලත් වෙන යම් තැනැත්තෙකු වෙත පැවරිය හැක.

(2) ලියාපදිංචි කළ සමිතියක් විසින් ඒ සමිතියේ මියගිය සාමාජිකයාට ගෙවිය යතු වෙනත් සියළු මුදල් අවස්ථාවෝචිත පරිදි එසේ නම් කළ තැනැත්තා, උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා වෙත ගෙවිය යුතුය.

(3) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ වගන්තියේ විධිවිධාන අනුව කරන ලද සියලු පැවරීම් හා ගෙවීම් වෙන යම් තැනැත්තෙකු විසින් සමිතියට ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමකට විරුද්ධව වලංගු හා බල සහිත විය යුතුය.

සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යා යුතු බව

25. (1) (අ) සෑම ලියාපදිංචි කළ සමිතියකම මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පනවනු ලබන හා පනවනු ලදැයි සලකන රීති හා සමිතියේ අතුරු ව්‍යවස්ථාවල නියම කර ඇති පරිදි සාමාජික නාම ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යාම කාරක සභාවේ වගකීම වන්නේය.

(ආ) එම ලේඛනය පහත සඳහන් කරුණු වලින් සමන්විත යුතුය.

(i) සාමාජිකයාගේ සම්පූර්ණ නම, ලිපිනය, උපන් දිනය, ජාතික හැඳුනුම්පත් අංකය, රක්ෂාව, ඔහුට අයත් කොටස් ගණන.

(ii) සාමාජිකයාගේ අත්සන හෝ මාපට ඇඟිලි සළකුණ.

(iii) එම සාමාජිකයා විසින් නම් කරනු ලබන තැනැත්තන් වෙතොත් සම්පූර්ණ නම, ලිපිනය, උපන් දිනය, ජාතික හැඳුනුම්පත් අංකය.

(2) යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් පවත්වාගෙන යනු ලබන සාමාජිකයන්ගේ යම් නාමලේඛනයක් හෝ ලැයිස්තුවක් එහි සටහන් කරන ලද පහත සඳහන් විස්තර වලින් යම් විස්තරයක් බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂි විය යුතුය.

(අ) සාමාජිකයෙකු වශයෙන් යම් තැනැත්තෙකුගේ නම, එම නාමලේඛනයෙහි හෝ ලැයිස්තුවෙහි සටහන් කරන ලද දිනය.

(ආ) එබඳු යම් තැනැත්තෙකු සාමාජිකත්වය ලබාගත් දිනය.

(ඇ) එබඳු යම් තැනැත්තෙකු සාමාජිකයෙකුව සිටීම නතර කළ දිනය.

(3) (අ) ඉහත සඳහන් පරිදි සකස් කරන ලද සාමාජික නාම ලේඛනයේ සහතික කළ පිටපතක් මෙම ප්‍රඥප්තිය සම්මත වී මාස තුනක් තුළද,

(ආ) සෑම ලිත් වර්ෂයක් ආරම්භවී මාස තුනක් ඇතුළත ඉකුත් වර්ෂය තුළ සාමාජික නාම ලේඛනයේ සිදුකරන ලද ඇතුළත් කිරීම්, ඉවත් කිරීම්, ඇතුළු සියලු සංශෝධනයන්ද, කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කිරීම කාරක සභාව වෙනුවෙන් සභාපතිගේ වගකීම වන්නේය.

සමිතියේ පොත්පත් වල සටහන් ඔප්පු කිරීම

26. (1) ලියාපදිංචි කළ සමිතියක් ගනුදෙනු කිරීමේදී විධිමත් ලෙස තබන ලද පොතක වූ යම් සටහනක පිටපතක් රීතිවලින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් සහතික කරනු ලැබුවේ නම් ඒ සටහන පැවැති බවට බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් ලෙස යම් සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යයකදී පිළිගත යුතුය. තවද, ඒ මුල් සටහන පිළිගනු ලබන සෑම අවස්ථාවකදීම හා පිළිගනු ලබන ප්‍රමාණයකට ඒ පිටපතෙහි සටහන් කරන ලද කරුණු ගනුදෙණු හා ගණන් පිළිබඳ සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියක් පාර්ශවකරුවෙක් නොවන යම් නීති කෘත්‍යයකදී (1) වන උප වගන්තිය යටතේ ඔප්පු කළ හැකි කරුණු අඩංගු සමිතියේ පොත්පත් ඉදිරිපත් කරන ලෙස හෝ එහි සටහන් කරන ලද යම් කරුණු, ගණුදෙනු හෝ ගණන් ඔප්පු කිරීම පිණිස සාක්ෂිකරුවෙකු වශයෙන් පෙනී සිටින ලෙස, අධිකරණය විසින් විශේෂ හේතු කරණ කොටගෙන එසේ කිරීමට විධානය කරතහොත් මිස, ඒ සමිතියේ කිසිම නිලධරයෙකුට බල නොකළ යුතුය.

සමිතියක් ඔඩපන වශයෙන් සුරැකුම්පත්

27. තත්කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතියක් හෝ වෙනත් නීතියක් නොතකා, ලියාපදිංචි කළ සමිතියක් විසින්,

(අ) සාමාන්‍ය ගිණුම් තුලනයක් සඳහා ඇපය වශයෙන් ඒ සමිතිය සතු යම් සුරැකුම්පත් ඔඩපනය කළ හැකිය, තවද

(ආ) සමිතිය වෙත නිකුත් කරනු ලැබූ දැන්වීමක් අවසන් වන දිනයෙහි මුදල් ගෙවීම නොකරන ලද්දේ නම් අධිකරණය වෙත නොගොස් සුරැකුම්පත්වලින් යමක් හෝ සියල්ලම විකුණා එයින් ලැබෙන ඒ ගිණුම තුලනයට බැර කරන ලෙස ණය හිමියාට බලය පැවරිය හැකිය.

28. ලියාපදිංචි කළ සමිතියක් විසින් එහි පරමාර්ථවලට සම්බන්ධ යම් කාර්යයන් සඳහා ඉඩම්, ගොඩනැගිලි හෝ වෙනත් චංචල හෝ නිශ්චල දේපල මිලට ගැනීමෙන්, ඉදිකිරීමෙන්, තෑගි වශයෙන් හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීම හා බද්දට ගැනීම හෝ විකිණීම, උකස් කිරීම, බද්දට දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම කළ හැකිය. දේපළ අත් කර ගැනීම

එසේ වුවද, ලියාපදිංචි කළ සමිතියකට වෙළෙඳ බඩු තොග හැර කිසිදු චංචල දේපලක වටිනාකම රුපියල් දෙලක්ෂයක් ඉක්මවන විට මහා සභාවේ අනුමැතිය නොමැතිව ද රුපියල් ලක්ෂ පහ ඉක්මවන විට මහා සභාවේ හා රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබා නොගෙනද ඉහත සඳහන් ආකාරයකින් යම් ආකාරයකට අත්කර ගැනීම කළ නොහැකිය.

ඉහත සඳහන් ආකාරයකින් යම් ආකාරයකට නිශ්චල දේපල අත්පත්කර ගැනීමේදී හා බැහැර කිරීමේදී සමිතියේ මහා සභාවේ මෙන්ම රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබාගත යුතුය.

29. (1) ලියාපදිංචි කළ සමිතියක පරාමර්ථවලට සම්බන්ධ යම් කාර්යයන් සඳහා යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අවශ්‍ය වන අවස්ථාවක ඒ කාර්යය පොදු කාර්යයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, රජය විසින් ඒ සමිතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල අත්කර ගත හැකිය. ඉඩම් හා ගොඩනැගිලි අනිවාර්යයෙන්ම අත් කර ගැනීම

(2) ලියාපදිංචි කළ සමිතියක් සඳහා රජය විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්කර ගත යුතු අවස්ථාවක ඒ සමිතිය විසින් ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ඒ පනතේ සඳහන් විධිවිධාන යටතේ නියෝගයක් කරනු ලැබීමට පෙර ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් ඒ පනත යටතේ නිශ්චය කරනු ලැබූ මුදල හා අත්කර ගැනීමේ කටයුතුවලදී රජය විසින් දරනු ලබන යම් වියදම් අදාළ සමුපකාර සමිතිය විසින් රජයට ගෙවිය යුතුය.

එසේ වුවද, ඒ පනත යටතේ වන්දි මුදල නිශ්චය කිරීමට පෙර යම් හදිසි කාර්යයක් හේතුකොට ගෙන යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්කර ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් නිශ්චය කරනු ලැබිය හැකි යැයි අත්කර ගැනීමේ නිලධාරියා අදහස් කරන යම් මුදලක් ඒ නියෝගය කිරීමට පෙර ඒ සමිතිය විසින් රජයට ගෙවිය යුතු අතර, ඉතුරු මුදලක් ඇතොත් ඒ ඉතුරු මුදල් ඒ පනත යටතේ වන්දි මුදල නිශ්චය කරනු ලැබීමෙන් පසු ගෙවිය යුතුය.

.5 වන පරිච්ඡේදය
අතුරු ව්‍යවස්ථාවලට අදාළ සාමාන්‍ය විධිවිධාන

30. (1) ලියාපදිංචි කළ සමිතියක සෑම අතුරු ව්‍යවස්ථාවකින්ම, එම අතුරු ව්‍යවස්ථාව ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු ඒ සමිතියේ එක් එක් සාමාජිකයා විසින් එම අතුරු ව්‍යවස්ථාව අත්සන් කරන ලද්දේ නම් හා ඒ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පිළිපැදීමට එක් එක් සාමාජිකයා දුන් පොරොන්දුවක් එම අතුරු ව්‍යවස්ථාවලට ඇතුළත් වූවේ නම් කෙරෙන ප්‍රමාණයටම එම සමිතිය ද එහි සාමාජිකයන්ද බැඳී සිටිය යුතුය.

සමිතියක අතුරු ව්‍යවස්ථාවලින් සාමාජිකයන් බැඳෙන බව

(2) ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථාවක අර්ථ නිරූපනය සම්බන්ධයෙන් පැන නගින යම් ආරවුලක් තීරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය නීත්‍යානුකූල අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

31. අතුරු ව්‍යවස්ථා සෑදීමට යම් රීතියකින් බලය පැවරුණු යම් කරුණක් සම්බන්ධයෙන් ලියාපදිංචි කළ සමිතියක් විසින් සාදන ලද කිසිම අතුරු ව්‍යවස්ථාවක්, ඒ ව්‍යාපාර තහනම් කිරීමේ ගිවිසුමක්ය යන හේතුව පිට පමණක් කිසිම අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

ව්‍යාපාර තහනම් කරන අතුරු ව්‍යවස්ථා බැඳෙන බලය

32. ලියාපදිංචි කළ සමිතියක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවලින් සමිතියේ අතුරු ව්‍යවස්ථාව කඩ කිරීම සම්බන්ධයෙන් එහි සාමාජිකයන්ට දඩ නියම කිරීම සඳහා රීතිවලට යටත්ව විධිවිධාන සැලැස්විය හැකිය. එසේ වුවද,

(අ) සමිතිය විසින් ඒ දඩය නියම කිරීමට අදහස් කරන බව හා ඊට හේතු ඔහු වෙත ලියවිල්ලකින් දැනුම් දී ඇත්නම් මිස හා

(ආ) රීතිවලින් නියම කරනු ලැබිය හැකි කාලයක් තුළ හා ආකාරයකින් ඒ දඩය නියම කිරීමට විරුද්ධව ප්‍රමාණවත් හේතු දැක්වීමට ඔහු අපොහොසත් වී ඇත්නම් මිස,

කිසිම සාමාජිකයෙකුට ඒ දඩය නියම නොකළ යුතුය.

සාමාජිකයන්ට දඩ නියම කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය

6 වන පරිච්ඡේදය

ලියාපදිංචි කළ සමිතිවල දේපළ හා අරමුදල්

ලියාපදිංචි කළ සමිතිවලින් දෙනු ලබන ණය

33. (1) ලියාපදිංචි කළ සමිතියක සෑම අතුරු ව්‍යවස්ථාවකින් ම එම අතුරු ව්‍යවස්ථාව ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු ඒ සමිතියේ එක් එක් සාමාජිකයා විසින් එම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පිළිපැදීමට එක් එක් සාමාජිකයා දුන් පොරොන්දුවක් එම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් වූයේ නම්, කෙරෙන ප්‍රමාණයට සමිතියද එහි සාමාජිකයන්ද බැඳී සිටිය යුතුය.

(2) ආශ්‍රිත සාමාජිකයෙකු සමග ඇති කර ගන්නා ගිවිසුමකින් ණයට ද්‍රව්‍ය සැපයිය හැකිය.

(3) සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් පනවා ඇති විධිවිධානවලට යටත්ව එකී සාමාජිකයාගේ නිශ්චල දේපළක් ඇපයට තබාගෙන සාමාජිකයන්ට ණය දිය හැකිය.

(4) සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් පනවා ඇති විධිවිධානවලට යටත්ව යම් චංචල දේපළක් හෝ නිශ්චල දේපළක් සමග පුද්ගල ඇප දෙකක් තබාගෙන සාමාජිකයන්ට ණය දිය හැකිය.

ලියාපදිංචි කළ සමිති විසින් භාර ගනු ලබන තැන්පතු හා ණය මුදල්

34. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් රීතිවලින් හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයට හා එසේ නියම කරනු ලැබිය හැකි කොන්දේසි යටතේ පමණක් සාමාජිකයන් නොවන තැනැත්තන්ගෙන් තැන්පතු හා ණය මුදල් භාරගත හැකිය.

(2) ලියාපදිංචි කළ සමිතියකට යම් නිශ්චල හෝ චංචල දේපළක උකස පිට බැංකුවක් විසින් ණය මුදලක් දෙන ලද අවස්ථාවක, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ඒ උකස ලියාපදිංචි කිරීමේ දිනයට පෙර එම ආඥාපනත යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද්දා වූ ද එම දේපළට බලපාන්නා වූ ද උකසක් හෝ එසේ ලියාපදිංචි ලද උකසකින් ආරක්ෂිත එසේ බලපාන්නා වූ ගෙවීමට බැඳී සිටීමක් හැර එම දේපළට බලපාන්නා වූ ද ඒ ලියාපදිංචි කරන ලද සමිතියේ කවර වූ හෝ අන් සෑම ණයකට හෝ එසේ බලපාන්නා වූ සෑම උකසකටම හෝ ගෙවීමට බැඳී සිටීමකට ඉහළින් ප්‍රමුඛත්වයක් ඇතිව, ඒ උකස ලියාපදිංචි කිරීමේ දිනයෙහි සිට හා ඉන් පසු ඒ උකස යටතේ වූ මුදල් ගෙවීමට ඒ දේපළ බැඳී තිබිය යුතුය.

35. ලියාපදිංචි කළ සමිතියක් විසින් සාමාජිකයන් නොවන තැනැත්තන් සමග කරනු ලබන ගනුදෙණු මෙම ප්‍රඥප්තියේ 33 හා 34 වන වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි හැර රීතිවලින් නියම කරනු ලැබිය හැකි තහනම් හා සීමා කිරීම්වලට යටත් විය යුතුය.

සාමාජිකයන් නොවන තැනැත්තන් සමග කරනු ලබන වෙනත් ගනුදෙනු සීමා කිරීම

36. (1) (අ) ලියාපදිංචි කළ සමිතියක් විසින්, භාර ආඥා පනතේ 20 වන වගන්තියේ නිශ්චිතව සඳහන් දේපලක් පිළිබඳ පළමු උකසක් නොවන යම් සුරැකුම්පත්වල හෝ යම් බැංකුකරුවෙකු සමග හෝ රෙජිස්ට්‍රාර් විසින් මේ කාර්යය සඳහා අනුමත කරන ලද බැංකුකරුවකු වශයෙන් ක්‍රියාකරන යම් තැනැත්තෙකු සමග හෝ රෙජිස්ට්‍රාර් විසින් මේ කාර්යය සඳහා අනුමත කරන ලද වෙන යම් ලියාපදිංචි කළ සමිතියක කොටස්වල හෝ ඇපය පිට හෝ රීතිවලින් අවසර දෙන ලද වෙන යම් ආකාරයකින් සමිතියේ අරමුදල් තැන්පත් කිරීම හෝ ආයෝජනය කිරීම කළ හැකිය.

සමිතියේ අරමුදල් ආයෝජනය කිරීම

(ආ) සාමාජික හා සාමාජික නොවන අයගෙන් ලබාගන්නා තැන්පත් හා දේපළ ප්‍රති ආයෝජනය කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන ප්‍රමිතීන් අනුව සිදුකළ යුතුය.

(ඇ) සමිතිය විසින් බාහිර ආයතනවලින් තැන්පත්වලට එරෙහිව හා දේපළ සුරැකුම් මත ණය හෝ අත්තිකාරම් ලබා ගැනීමේදී රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

(ඈ) මෙම පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් සමිතියක් විසින් තම මුදල් වෙනත් ව්‍යාපාර කටයුත්තක ආයෝජනය කිරීම රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතුය.

(2) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක තිබුණේ නම් අවලංගු විය හැකිව තිබූ මේ ප්‍රඥප්තිය ආරම්භ වීමට පෙර කරන ලද යම් තැන්පතුවක් හෝ ආයෝජනයක් මෙයින් වලංගු වන අතර එසේ වුවද ගිවිසුම්ගත කාලසීමාව ඉක්මවීමෙන් පසු මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන් අනුව කටයුතු කළ යුතුය.

37. (1) ලියාපදිංචි කළ සෑම සමිතියක් විසින්ම මෙම ප්‍රඥප්තියේ 39 වන වගන්තිය යටතේ විගණක විසින් නිශ්චය කරනු ලබන පරිදි යම් මුදල් වර්ෂයක් තුළ එහි

ලාභ පිළිබඳ සුදුස්සක් කිරීම

(අ) (i) විසර්ජනයට පෙර ලැබෙන ලාභයෙන් සියයට පහකට නොඅඩු මුදලක් මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන දකුණු පළාතේ සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුමට ගෙවිය යුතුය. විගණන වාර්තාව සමිතිය වෙත ලැබූ දින සිට දින අනූවක් නොඉක්මවන කාලයක් ඇතුළත අරමුදල් ගිණුමට ගෙවිය යුතුය. ඒ අනුව ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක මුදල් අයකර ගැනීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් මහේස්ත්‍රාත්වරයා වෙත සහතිකයක් නිකුත් කළ යුතුය. එසේ අයකළ යුතු මුදල දඩයක් වශයෙන් අයකර ගෙන සමුපකාර අරමුදලට බැර කිරීමට මහේස්ත්‍රාත්වරයාට බලය ඇති වන්නේය.

(ii) මෙම (i) වන වගන්තිය යටතේ යම් නීති කෘත්‍යවලදී රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකයෙහි වූ යම් ප්‍රකාශයක නිවැරදි භාවය සලකා බැලීමට පරීක්ෂා කිරීමට හෝ ඒ පිළිබඳ තීරණය කිරීමට යම් මහේස්ත්‍රාත්වරයෙකුට මේ වගන්තියේ කිසිවකින් බලය නොලැබිය යුතුය. නැතහොත් නියම විය යුතුය.

(ආ) ශුද්ධ ලාභවලින් සියයට විසිපහකට නොඅඩු යම් මුදලක් සමිතියේ ව්‍යවස්ථාපිත සංචිතයට මාරු කළ යුතුය. එමෙන්ම,

(ඇ) යම් සමූපකාර සමිතියක් පාඩු ලැබුවද අවම වශයෙන් රුපියල් පනහක් සමූපකාර සංවර්ධන අරමුදල් ගිණුමට ගෙවිය යුතුය. එතකුදු වුවත් පාසැල් සමූපකාර සමිතිවලට මෙය බල නොපැවැත්විය යුතුය.

(ඈ) සමූපකාර සංවර්ධන අරමුදල ගිණුම පාලනය කිරීම සඳහා රීති මගින් විධිවිධාන සැලැස්විය යුතුය.

(2) (i) සමූපකාර අරමුදලට හා ව්‍යවස්ථාපිත සංචිතවලට වෙන් කිරීමෙන් පසු ඉතිරි ලාභය සමිතියේ මහා සභාවේ හා රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව පහත සඳහන් කාර්යයන් සියල්ලම හෝ ඉන් යමක් සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිය හැකිය.

(අ) ඉතිරි ලාභයෙන් සියයට දහයක් හෝ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයෙන් සියයට දහය නොඉක්මවන ප්‍රමාණය යන දෙකෙන් අඩු ප්‍රමාණය සාමාජිකයන්ට කොටස් ලාභාංශ වශයෙන් ගෙවීම,

(ආ) සාමාජිකයන් විසින් සමිතිය සමඟ කරන ලද ගණුදෙනු වල වටිනාකම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවල නියමිත ප්‍රමාණයට හා ආකාරයකින් ඔවුන්ට ප්‍රතිදාන ගෙවීම.

(ඇ) අතුරු ව්‍යවස්ථාවල නියම කරනු ලැබිය හැකි යම් අරමුදල්වලට ඉතිරි ලාභයෙන් සියයට දහයක උපරිමයකට යටත්ව වෙන් කිරීම.

(ඈ) සමිතියේ සේවකයන්ට ප්‍රසාද මුදල් ගෙවීම හා ඔවුන්ගේ සුභසාධක කටයුතුවලට මුදලක් ගෙවීම.

(ඉ) අතුරු ව්‍යවස්ථාවල නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් අරමුදල්වලට වෙන් කිරීම.

(ඊ) යම් සාමාජීය, සංස්කෘතික හෝ විනෝද කාර්යයන් පිණිස හෝ ප්‍රාදේශීය හෝ මහජන ප්‍රයෝජනය සඳහා වූ වෙන යම් අරමුදලක් සඵල කිරීම සඳහා වැය කිරීම පිණිස පොදු සුභසාධක අරමුදලට ඉතිරි ලාභවලින් සියයට දහයකට නොවැඩි මුදලක් ගෙවීම.

(ii) (i) වන අනු වගන්තිය අනුව ඉතිරි ලාභ අරමුදල්වලට වෙන් කිරීමෙන් පසු ඉතිරිවන මුදල ව්‍යවස්ථාපිත සංචිතයට මාරු කළ යුතුය.

7 වන පරිච්ඡේදය

ගිණුම්, අයවැය, විගණනය, විභාගය, පරීක්ෂණය හා විමර්ශනය.

සමිතියේ ගිණුම් හා විගණනය

38. (1) සෑම ලියාපදිංචි සමිතියක්ම සමිතියේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන ප්‍රමිතීන්ට අනුව නිසි ගිණුම් පවත්වාගෙන යාමට සැලැස්විය යුතුය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින් නියම කරනු ලබන පරිදි සමිතියේ කටයුතුවලට අදාළ ගිණුම් හා සංඛ්‍යාන පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්ෂික අවසාන ගිණුම් හා ප්‍රකාශයන් සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම සකස් කරනු ලැබිය යුතුය. ඒ ගිණුම් ප්‍රකාශය එය අදාළ මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මෙසේ ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා ප්‍රකාශයන් සමිතියේ සභාපති හෝ

උප සභාපති සහ කාරක සභිකයන් දෙදෙනෙකු විසින් අත්සන් සහිතව සහතික කොට දිනය සඳහන් කර තිබිය යුතුය. මෙම සහතික කරන ලද ගිණුම් හා ප්‍රකාශයන් සාවද්‍ය බවට තහවුරු වන අවස්ථාවකදී දණ්ඩ නීති සංග්‍රහය යටතේ සඳහන් කූට ලේඛන පිළියෙල කිරීමේ වරදකට වරදකරු වන්නේය.

(3) (2) වන උප වගන්තියේ විධිවිධානවලින් කිසිවක් අනුව කටයුතු කිරීම ලියාපදිංචි කළ සමිතියක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ සමිතියේ කාරක සභාවේ සෑම සාමාජිකයෙකුම වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරුවෙකු කරනු ලැබූ විට අවමය රුපියල් දස දහසක් හෝ උපරිමය රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර, මාස තුනක් ඇතුළත ගිණුම් හා සංඛ්‍යාන පිළිබඳ කොරතුරු ඇතුළත් වාර්ෂික අවසාන ගිණුම් හා ප්‍රකාශයන් කොමසාරිස්වරයාට ඉදිරිපත් කිරීමේ නියෝගයටද කාරක සභාව යටත් විය යුතුය. එසේ වුවද වරදක් කරනු ලැබුයේ තමාගේ අනුදැනුම නොමැතිව බව සහ ඒ වරද කිරීම වැලැක්වීමට නිසි සියලු උද්යෝගයෙන් තමා සෑම විටම ක්‍රියාකළ බව ඒ සාමාජිකයා විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු ඒ වරදට වරදකරු නොවන්නේය.

(4) ඉහත (3) වල උපවගන්තියේ නියෝගය අනුව මාස තුනක අතිරේක කාලසීමාව තුළද ගිණුම් වාර්තා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් නොවුවහොත් අදාළ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැර සුදුසු පාලක මණ්ඩලයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කළ යුතුයි.

(ආ) ඉහත (අ) අනු වගන්තිය යටතේ පත් කරන ලද පාලක මණ්ඩලය විසින් අදාළ මුදල් වර්ෂය අවසාන වීමට පූර්වයෙන්, පූර්ව වර්ෂයට අදාළ ගිණුම් සකස් කර රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් කිරීමෙන් පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් ලබා දෙනු ලබන කාලය අවසානයේ මහා සභාව කැඳවා අදාළ ධූර කාලයේ ඉතිරි ධූර කාලය වෙනුවෙන් සුදුසු අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර ගැනීමට කටයුතු කළ යුතුයි. එසේ පත්කර ගනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා (4) (අ) අනු වගන්තිය යටතේ ඉවත් කරනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සුදුස්සන් නොවිය යුතුයි.

(ඇ) රෙජිස්ට්‍රාර්වරයා විසින් පොත්පත් ලියූ විටත් , වාර්තා සකස් කර ගත් විටත් ඒ සඳහා රෙජිස්ට්‍රාර්වරයාට සමිතිය විසින් ගෙවන ලද සියලු වියදම් එවකට පැවති වගකිව යුතු කාරක සභාවෙන් සාමූහිකව හා වෙන් වෙන්ව අයකර ගැනීමට සමිතිය විසින් කටයුතු කළ යුතුය.

(5) (අ) සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම ආදායම් ඉලක්ක පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් මූල්‍ය සහ මුදල් සම්පත්, මුදල් ආයෝජන, අයවැය ගතකරන ලද ලාභ අලාභ ගිණුම් ආදායම් සහ වියදම් ගිණුම් සහ ශේෂ පත්‍රය දැක්වෙන අයවැය ලේඛනයක් සෑම මුදල් වර්ෂයක් වෙනුවෙන්ම පිළියෙල කරනු ලැබිය යුතුය.

අයවැය පිළියෙල කිරීම

(ආ) ඒ අයවැය ලේඛනය අදාළවන මුදල් වර්ෂය ආරම්භ වීමට පෙරාතුව වූ මාස දෙකකට කළින් එය අනුමැතිය සඳහා සමිතියේ මහා සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ඇ) යම් සමිතියක මහ සභාව කැඳවීම අත්හිටුවමින් අධිකරණයක අතුරු නියෝගයක් පවතින අවස්ථාවක, සමිතියේ ලේකම් විසින් මෝසමක් මගින් අධිකරණයට කරුණු ඉදිරිපත් කර එම සමිතියේ වාර්ෂික ඇස්තමේන්තු හා සංවර්ධන සැලැස්ම අනුමත කර ගැනීමේ කාර්යය සඳහා පමණක් සමිතියේ විශේෂ මහා සභාවක් කැඳවීමට අවසර ලබාගත යුතුය. ඒ අනුව කොමසාරිස් විසින් සමිතියේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය.

(ඇ) එම අයවැය ලේඛනය අදාළ වන මුදල් වර්ෂය ආරම්භ වීමට පෙරාතුව වූ එක් මාසයකට කළින් ඒ අයවැය ලේඛනයේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුය.

(ඉ) එම අයවැය ලේඛනය පිළිබඳ කරනු ලැබිය යුතු ආකෘතිය සහ ආකාරය ද අඩංගු විය යුතු අවම තොරතුරු රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතුය.

39. (1) ලියාපදිංචි කළ සමිතියක විගණනය රෙජිස්ට්‍රාර්වරයා විසින් බලය පවරන ලද්දා වූ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරන ලද ඕනෑම සහතිකලත් ගණන් පරීක්ෂකරවයකු විසින් හෝ කළ යුතුය. මේ වගන්තියේ වන කාර්යන් සඳහා සහතිකලත් ගණන් පරීක්ෂකවරයකු වනුයේ:-

විගණනය

(අ) වරලත් ගණකාධිකාරීවරයකු හෝ වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක් හෝ

(ආ) රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වාගෙන යන ගණන් පරීක්ෂකවරුන්ගේ ලේඛනයට නම ඇතුළත් වී ඇති කෙනෙක් හෝ මණ්ඩලයක්ය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ විගණනයකට ඇතුළත්වන කාලය සෑමවිටම කලින් පවත්වන ලද විගණනයට ඇතුළත්වූ කාලයේ අවසාන දිනයේ සිට එවර විගණනයට පවත්වන දිනට පූර්වයෙන් අවසන් වූ මුදල් වර්ෂයේ අවසාන දින දක්වා හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් වෙනත් විධානයක් කළහොත් එසේ විධානය කරන දින තෙක් හෝ විය යුතුය.

(3) (අ) අපරාධ නඩුවක් සඳහා යම්කිසි සිද්ධියක් හෝ කරුණක් සම්බන්ධව විගණනයක් අවශ්‍ය වූ විට විශේෂ විගණනයක් කරන ලෙස 39(1) වගන්තිය ප්‍රකාරව බලය ඇති අයෙකු වෙත විධාන කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත්තේය.

(ආ) අපරාධ නඩුවක් සඳහා යම්කිසි විගණනයක් අවශ්‍ය වූ විට දොළොස් මසකට අධික නොවන කාලයක් ඇතුළත් වන විශේෂ විගණනයක් කරන ලෙස ගණන් පරීක්ෂකවරයෙකුට විධාන කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත්තේය.

(4) ගණන් පරීක්ෂකවරයකු රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන ආකාරයට ගණන් පරීක්ෂණ වාර්තාවක් පිටපත් දෙකකින් යුක්තව රෙජිස්ට්‍රාර්වරයාට ඉදිරිපත් කළ යුතුය. වෙනත් කරුණු අතරම පහත සඳහන් කරුණු පිළිබඳ ප්‍රකාශනයක් එම වාර්තාවට ඇතුළත් කළ යුතුය. එනම්,

(අ) තමාට අවශ්‍ය සියලුම තොරතුරු හා විස්තර ලබාගත්තේද යන්න

(ආ) ගිණුම් පොත් සමිතිය විසින් කලට වේලාවට ලියා තිබේද යන්න

(ඇ) මූල්‍ය ප්‍රකාශන හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සමිතියේ පොත්පත්වලට අනුකූලද යන්න

(5) ගණන් පරීක්ෂක තැන, රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන සියලුම උපලේඛන හා සහතික පත්‍ර තම ගණන් පරීක්ෂණ වාර්තාවට අමුණා එවිය යුතුය. ගණන් පරීක්ෂණ තැන රෙජිස්ට්‍රාර්වරයා විසින් හඳුන්වාදෙන ලද ආකෘති ප්‍රකාශනයට අනුව ගණන් පරීක්ෂණ සහතිකයක් සමිතියේ පරික්ෂිප්ත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතුය.

(6) ඉහත (1) වන උප වගන්තිය යටතේ වූ විගණනයෙහි,

(අ) ලියාපදිංචි සමිතිවල වත්කම් සහ බැරකම් පිළිබඳ තක්සේරුවක් හා සත්‍යාක්ෂණයක්

(ආ) නිසි මුදල් පාලනය සහ සමිතියේ කටයුතු සම්බන්ධයෙන් අඛණ්ඩ ඇගයීමක් කිරීමට හැකි කරනු පිණිස තොරතුරු ඉදිරිපත් කිරීම සහතික කිරීමට සංවිධාන ක්‍රම, කාර්යය පටිපාටි, පොත් වාර්තා සහ වෙනත් ලේඛන නිසි ලෙස සහ ප්‍රමාණවත් ලෙස සැලැසුම් කරනු ලැබ ඇත්තේ ද සහ ඒ ක්‍රම, කාර්යය පටිපාටි, පොත් වාර්තා සහ වෙනත් ලේඛන ඵලදායක ලෙස ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳ පරීක්ෂණයක්.

(ඇ) සමිතිය පවත්වාගෙන යාම මේ ප්‍රඥප්තිය හෝ ඒ යටතේ සාදන ලද රීති, නියෝග හෝ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල වන්නේද, සමිතියේ කටයුතු පරිපාලනය කිරීම මේ ප්‍රඥප්තියේ නියෝගවල හෝ ඒ යටතේ සාදන ලද රීතිවල හෝ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව කර ඇත්තේ ද යන්න පිළිබඳව පරීක්ෂණයක්,

(ඈ) අරමුදල් උපයෝගී කිරීම කාර්යක්ෂම ලෙස සහ පිරිමැසුම් සහිතව ක්‍රියාත්මක කොට ඇත්තේද යන්න පිළිබඳව පරීක්ෂණයක්,

(ඉ) ලියාපදිංචි සමිතියකට අයත් සහ එහි පාලනය යටතේ ඇති මුදල් සහ දේපලවල ආරක්ෂාව සහතික කරනු පිණිස සතුටුදායක කාර්යය පටිපාටි සකස්කොට ඇත්තේද යන්න පිළිබඳව පරීක්ෂණයක්,

(ඊ) ගිණුම්, මුදල් යෙදවීම සහ තක්සේරු කිරීම සම්බන්ධයෙන් වූ සිද්ධාන්ත කෙරෙහි නිසි අවධානය ඇතිව සැලකිල්ලට භාජනය කොට ඇති කාලසීමාව සම්බන්ධයෙන් සමිතියේ කටයුතු පිළිබඳව සත්‍ය වූ සහ නිවැරදි ගිණුම් ඉදිරිපත් කිරීම පිණිස විගණනය කරනු ලැබූ ගිණුම් සැලසුම්කොට ඇත්තේද යන්න පිළිබඳව පරීක්ෂණයක්; සහ

(උ) වෙනත් නියමිත කරුණු ඇතුලත් විය යුතුය.

(ඌ) (6) (1) වගන්තියේ සඳහන් පරීක්ෂණවලදී ඊට අදාළ කොන්දේසි, ආකෘති, ක්‍රියාපටිපාටි සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් නියම කළ යුතු අතර එසේ නියම කරනු ලබන කොන්දේසි, ආකෘති, ක්‍රියාපටිපාටිවලට අනුකූලව ඊට අදාළ වාර්තා ලබා දිය යුතුයි.

(7) ඉහත (1) වන උපවගන්තිය යටතේ විගණන කාර්යයන් සඳහා රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඒ ගණන විගණනය කිරීම පිණිස ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකුට,

(අ) රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ විගණනය සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ මතය අනුව සමිතියේ යම් ගණුදෙණු හෝ එහි කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු සැපයිය හැකි කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ යම් නිලධාරියෙකු, නියෝජිතයෙකු, සේවකයෙකු සාමාජිකයෙකු හෝ වෙනයම් තැනැත්තෙකු කැඳවීමේ, හා

(ආ) සමිතියේ කටයුතුවලට අදාළ යම් පොතක් හෝ ලේඛනයක් හෝ සමිතියට අයත් යම් මුදලක්, සුරැකුම්පතක් හෝ වෙනත් දේපලක් ඉදිරිපත් කරන ලෙස එය සන්තකව හෝ භාරව සිටින, කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ නිලධරයෙකුට, නියෝජිතයෙකුට, සේවකයෙකුට හෝ සාමාජිකයෙකුට හෝ වෙනයම් තැනැත්තෙකුට නියම කිරීමේ හා අවශ්‍ය අවස්ථාවකදී ඉහත පොත්පත්, ලේඛනවල හා සුරැකුම්පතක සහතික කළ පිටපතක් ලබාදෙන ලෙස නියම කිරීමේ හා,

(ඇ) ඒ විගණනයේදී තමා විසින් වංචාවක් සොයාගනු ලබන අවස්ථාවක සමිතියේ ගණන් පොත් හෝ ලේඛන තම භාරයට ගැනීමේ,

(ඇ) ඒ විගණනයේදී අදාළ සමිති කාර්යාලයට හා එකී සමිතියේ සියළුම ව්‍යාපාරික ස්ථාන වලට ඇතුළුවීමේ, පරීක්ෂා කිරීමේ හා භෞතික තොග ගණන් ගැනීමේ,

බලය ඇත්තේය.

(8) රෙජිස්ට්‍රාර්වරයාට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් තත්කාර්යය සඳහා සාමාන්‍ය හෝ විශේෂ නියමයක් මගින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට ලියාපදිංචි කළ සමිතියක් විසින් පවත්වාගෙන යනු ලබන සියළු පොත්, ලේඛන, ගිණුම් සහ ලියවිලි, සුරැකුම්පත් සහ අතේ ඇති මුදල් සියළු අවස්ථාවලදී ලබාගැනීමට ද, පරීක්ෂා කිරීමටද හිමිකම් තිබිය යුතුය. තවද ඉහත කී දේ භාරව සිටින හෝ පවත්වාගෙන යන හෝ සන්තකයේ ඇතිව සිටින සෑම තැනැත්තෙකුම ඒවා රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද තැනැත්තාට ඉදිරිපත් කළ යුතුය. නැතහොත් සමිතියේ ගනුදෙණු සහ වැඩ කටයුතු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා හෝ ඒ පරීක්ෂණය හෝ විගණනය කරන ඒ බලය දෙන ලද තැනැත්තා විසින් නියම කරනු ලබන තොරතුරු සැපයිය යුතුය.

(9) රෙජිස්ට්‍රාර්වරයා සහ ලියාපදිංචි කළ සමිතිය ගණන් විගණනය කිරීම සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ සෑම තැනැත්තෙකුම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

(10) (අ) සමිතියක සංවිධානයක හෝ කළමනාකාරිත්වය භාරව සිටින හෝ භාරව සිටි හෝ සමිතියක නිලධරයෙකුව සේවකයෙකුව සිටින හෝ කවර හෝ අවස්ථාවක සිටි යම් තැනැත්තෙකු විසින් මේ ප්‍රඥප්තියේ හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ පනවනු ලැබූ රීතිවල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද සමූපකාර සමිතිවලට හෝ මුදල් කාර්යය පටිපාටියට අදාළ රීතිවල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද පොදු විධාන කිසිවක හෝ අතුරු ව්‍යවස්ථාවල හෝ සමිතියේ කාරක රීතිවල විධිවිධානයන්ට පටහැනිව යම් ගෙවීමක් කර ඇති බව හෝ සමිතියේ යම් අරමුදල් පාවිච්චි කර ඇති බව මෙම ප්‍රඥප්තිය යටතේ වූ විගණනයක් පැවැත්වෙද්දී හෝ එය අවසානයේදී සොයා ගතහොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් එවැනි සෑම ගෙවීමකටම හා එවැනි සෑම අරමුදල් පාවිච්චි කිරීමකටම ඉඩ නොදිය යුතු අතර, ඒ නීති විරෝධී ගෙවීම් හෝ අරමුදල් පාවිච්චි කරන හෝ කිරීමට බලය දෙන තැනැත්තාට හෝ තැනැත්තන්ට එය අධිභාර කළ යුතුය. තවද ඒ තැනැත්තාගේ නොසැලකිල්ල හෝ විෂමාචාරය හේතු කොටගෙන දරන්නට සිදුවූ යම් ඌනතාවයක් හෝ පාඩුවක් සහ ඒ තැනැත්තා ගණන් දැක්විය යුතු වූ නමුත් එසේ ගණන් නොදක්වන ලද යම් මුදලක් ඒ තැනැත්තාගෙන් අයකර ගත යුතුය. තවද එක් එක් අවස්ථාවේදී ඒ තැනැත්තාගෙන් අයවිය යුතු මුදල සහතික කොට තම තීරණය ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත දන්වා යැවිය යුතුය.

(ආ) යම් තැනැත්තෙකුට යම් ඉඩදීමක් නොකිරීමට හෝ යම් අධිභාරයක් කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ වෙනුවෙන් ලියවිල්ලකින් හෝ සාමාන්‍ය හෝ විශේෂ නියෝගයකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් සුදුසු යැයි සිතිය හැකි යම් කරුණක් සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට හෝ යම් කරුණු ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට ඔහු විසින් අවස්ථාවක් දිය යුතු අතර එවැනි ඉඩ නොදීමක් හෝ අධිභාර කිරීමක් කරනු ලැබුවහොත් හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ තීරණය සඳහා හේතු ඉල්ලා ඔහු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ ඉඩ නොදීම හෝ අධිභාර කිරීම සම්බන්ධයෙන් තම තීරණයේ හේතු ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත සැපයිය යුතුය.

(ඇ) රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලබන තීරණයකට අනුකූලව ක්‍රියා නොකරන ලද අවස්ථාවක මෙම ප්‍රඥප්තියේ 65 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

40. (1) ලියාපදිංචි කළ සමිතියක ක්‍රියාකාරිත්වයේ යම් අඩුපාඩු මෙම ප්‍රඥප්තිය යටතේ කරන ලද විගණනයේදී හෙළිදරව් වුවහොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් එහි අඩුපාඩු සමිතියේ දැනගැනීමට හා ඒ සමිතිය අන් සමිතියක සාමාජිකයෙකු නම් ඒ අන් සමිතියේ දැන ගැනීමටද සැලැස්විය හැකිය.

විගණනයේදී අනාවරණය වූ අඩුපාඩු සමිතිය වෙත දැන්වීම.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෙළිදරව් වූ අඩුපාඩු සම්බන්ධයෙන් පිළියම් යෙදීම සඳහා නියෝගයක් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පියවරක් ඒ නියෝගයෙහි සඳහන් කාලය ඇතුළතදී ගන්නා ලෙස සමිතියට හෝ නිලධරයන්ට විධාන කෙරෙන නියෝගයක් කළ හැකිය.

(3) ඉහත (2) උප වගන්තිය අනුව මෙම නියෝග අනුව කටයුතු නොකරනු ලබන්නේ නම් මෙම ප්‍රඥප්තියේ 56(2)(අ) වගන්තියට අනුව කටයුතු කළ හැකිය.

41. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් තම මෙහෙයවීමෙන් ලියාපදිංචි සමිතියේ සංයුතිය ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකිය. තව ද කාරක සභාවේ බහුතරයකගේ ඉල්ලීම මත හෝ ලියාපදිංචි සමිතියක මහා සභා සාමාජිකයන්ගේ තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගේ ඉල්ලීම මත ලියාපදිංචි සමිතියක සංයුතිය ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වනු ලැබිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා විසින් තත්කාර්යය සඳහා ලිඛිත නියමයක් මගින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට ලියාපදිංචි සමිතියේ සංයුතිය, ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට විධාන කළ හැකිය.
එසේ වුවද මෙම වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි විභාගයක් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විභාගයක් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා විධාන කිරීමට පෙර එවැනි විභාගයක් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයක් කිරීමට ප්‍රමාණවත් කරුණු ඇත් ද යන්න පිළිබඳ සෑහීමකට පත්වීම සඳහා සුදුසු ආකාරයේ පූර්ව පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විධාන කිරීමටද රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත්තේය.

පූර්ව පරීක්ෂණය විභාගය හා පරීක්ෂණය

(2) (1) වන උප වගන්තිය යටතේ විභාගයක් පැවැත්වීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර්වරයාට හෝ විභාගයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට, විසින් බලය දෙනු ලැබූ තැනැත්තාගේ මතය අනුව සමිතියේ ගනුදෙණු කිසිවක් සම්බන්ධයෙන් හෝ එහි කටයුතු

(අ) කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ යම් නිලධරයෙකු නියෝජිතයෙකු, සේවකයෙකු හෝ සාමාජිකයෙකු හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ විභාග කිරීමට හෝ පරීක්ෂා කිරීමට ඔහු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වැදගත් තොරතුරු දිය හැකි වෙනත් යම් තැනැත්තෙකු කැඳවීමට,

(ආ) සමිතියේ කටයුතුවලට අදාළ යම් පොතක් හෝ ලේඛනයක් හෝ සමිතියට අයත් මුදලක්, සුරැකුම් පතක් හෝ වෙනත් දේපළක් ඉදිරිපත් කරන ලෙස එය සන්තකයෙහි ඇත්තා වූ හෝ භාරව සිටින්නාවූ සමිතියේ කලින් සිටි හෝ දැනට සිටින යම් නිලධරයෙකු, නියෝජිතයෙකු, සේවකයෙකු හෝ සාමාජිකයෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකුට සමිතියේ කටයුතුවලට අදාළ යම් පොතක් හෝ ලේඛනයක් හෝ සමිතියට අයත් යම් මුදල් හෝ ඇප හෝ වෙනත් දේපළ ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට, නිලධරයෙකු, නියෝජිතයෙකු, සේවකයෙකු, සාමාජිකයෙකු හෝ වෙනයම් තැනැත්තෙකුට අවශ්‍ය අවස්ථාවකදී ඉහත පොත් පත්, ලේඛනවල හා සුරැකුම් පතක සහතික කළ පිටපතක් ලබා දෙන ලෙස නියම කිරීමට,

(ඇ) තමා විසින් යොමු කරනු ලබන යම් කාරණා තීරණය කිරීම පිණිස තමා විසින් සඳහන් කරනු ලබන යම් වේලාවක සහ ස්ථානයකදී සමිතියේ මහා සභා රැස්වීමක් හෝ කාරක සභා රැස්වීමක් රීති අනුව කැඳවීමට,

(ඈ) ඒ විභාගය හෝ පරීක්ෂණය අතරතුර වංචාවක් හෝ අක්‍රමිකතාවක් ඇති බව විශ්වාස කිරීමට තමාට හේතු ඇති අවස්ථාවක සමිතියේ ගිණුම් පොත් හෝ ලේඛන තම භාරයට ගැනීමට සහ,

(ඉ) ඒ විභාගයේදී හෝ පරීක්ෂණයේදී අදාළ සමිති කාර්යාලයට හා එකී සමිතියේ සියලුම ව්‍යාපාරික ස්ථානවලට ඇතුළ්වීමේ, පරීක්ෂා කිරීමේ හා භෞතික තොග ගණන් ගැනීමට, බලය ඇත්තේය.

කාරක සභාව අත් හිටුවා අන්තර්කාලීන පාලක මණ්ඩලයක් පත් කිරීම.

(3) 41 වන වගන්තිය යටතේවූ විභාගයක් හෝ පරීක්ෂණයක් නිම කිරීමට පෙර එකී විභාගය හෝ පරීක්ෂණයට අදාළව ලබාගන්නා අතුරු වාර්තාවක් තුළින් කාරක සභාව තම කාර්යයන් නිසි ආකාරයට ඉටු නොකරනු ලබන බව හෝ කාර්යක්ෂම ලෙස තම කාර්යය ඉටු කිරීමට නුසුදුසු බව හෝ වෙනත් ආකාරයකින් නොහැකි බව රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් වන්නේ නම් ඒ කාරක සභාව මාස හයක කාලසීමාවක් සඳහා අත්හිටුවීමටද සමිතියේ වැඩ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම පිණිස අන්තර්කාලීන පාලක මණ්ඩලයක් පත් කිරීමටද රෙජිස්ට්‍රාර්වරයාට හැකිය. එහි කාරක සභාව අත්හිටුවනු ලැබූ දින සිට මාස හයක කාලසීමාවක් ඇතුළත ඒ විභාගය හෝ

පරීක්ෂණය රෙජිස්ට්‍රාර්වරයා විසින් නිමකළ යුතු අතර ඒ කාරක සභාව විසුරුවා හැරීම සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගනු ලැබිය හැකිය.

(4) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක සාමාජිකයෙකු ඒ සමිතියේ ධූරයකට යථා පරිදි තෝරාපත් කර ගන්නා ලද්දේ ද යන්න සම්බන්ධයෙන් සාමාජිකයෙකු ඒ සමිතියේ සාමාජිකයෙකු වූ හෝ නිළධරයෙකුව සිටීම නතර වූයේද යන්න සම්බන්ධයෙන් හෝ සමිතියේ යම් මහා සභා රැස්වීමක් කාරක සභා රැස්වීමක් වලංගුව පවත්වනු ලැබුයේද යන්න සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් පරීක්ෂා කිරීම හෝ ඒ වෙනුවෙන් ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක මාර්ගයෙන් ඔහු විසින් බලය පවරනු ලබන යම් තැනැත්තෙකු ලවා පරීක්ෂා කරවීම කළ හැකිය.

සාමාජිකත්වය, ධූරය/නිලය, රැස්වීම් නිත්‍යානුකූලභාවය පිළිබඳ පරීක්ෂණ

(5) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක මූල්‍ය තත්ත්වය පිළිබඳව හෝ තොග තත්ත්වයන් පිළිබඳව හෝ භෞතිකව පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගුණ විටකදී හෝ ගණුදෙනු පිළිබඳව හෝ පොත්පත් පිළිබඳව හෝ ලේඛන පිළිබඳව පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගුණු විටක පූර්ව දැනුම් දීමකින් තොරව ක්ෂණික හෝ හදිසි පරීක්ෂාවක් සඳහා තමාට හෝ නිලධාරීන් යෙදවීමට හා විධානය කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත්තේය.

ක්ෂණික හෝ හදිසි පරීක්ෂණ

(6) රෙජිස්ට්‍රාර්වරයා සහ මෙම ප්‍රඥප්තියේ යම් කාර්යයක් සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ සෑම තැනැත්තෙකුම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

42. මෙම ප්‍රඥප්තිය යටතේ පවත්වනු ලැබූ විගණනයකින්, විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් සහ ක්ෂණික හෝ හදිසි පරීක්ෂණයකින් පසුව කටයුතු කරගෙන යනු ලබන කාරක සභාව වෙත රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී විභාගය හෝ පරීක්ෂණයෙන් හෙළිදරව් වන කරුණු සම්බන්ධව විධානය කරනු ලබන පරිදි විධානයේ දින සිට මාස තුනක් තුළ කටයුතු කිරීමට කාරක සභාව බැඳී සිටිය යුතුය. එසේ කටයුතු කිරීම පැහැර හරින කාරක සභාවක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේය.

පරීක්ෂණ නිලධාරීන් රජයේ නිලධාරීන් ලෙස සැලකීම

8 වන පරිච්ඡේදය
ලියාපදිංචි කළ සමිතියක කාරක සභාව විසුරුවා හැරීම හෝ කාරක සභිකයන් ඉවත් කිරීම.

සමිතියේ කාරක සභාව විසුරුවා හැරීම

43. (1) 41 වන වගන්තිය යටතේ විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසුව ලියාපදිංචි සමිතියක කාරක සභාව හෝ එකී කාරක සභාවේ සාමාජිකයෙකු හෝ සාමාජිකයන් ස්වකීය කාර්යය නිසි ආකාරයෙන් ඉටු නොකරන බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම්, එම කාරක සභාව විසුරුවා හැරීම සම්බන්ධයෙන් හෝ එම කාරක සභාවේ සාමාජිකයෙකු හෝ සාමාජිකයන් හෝ ඉවත් කිරීම සම්බන්ධයෙන් එම කාරක සභාවේ හෝ සාමාජිකයෙකුගේ හෝ සාමාජිකයන්ගේ යම් විරෝධතා ඇතොත් එම විරෝධතා දැක්වීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ කාරක සභාවට හෝ ඒ කාරක සභාවේ සාමාජිකයෙකුට හෝ කාරක සභාවේ සාමාජිකයන්ට අවස්ථාවකදී මෙන් පසුව 41 වන වගන්තිය යටතේ වූ ඒ විභාගය හෝ පරීක්ෂණය රෙජිස්ට්‍රාර්වරයාගේ මෙහෙයවීමෙන් පවත්වනු ලැබුවේ නම් රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් කැඳවනු ලැබූ මහා සභාවටද ඒ විභාගය හෝ පරීක්ෂණය කාරක සභාවේ බහුතරයක ඉල්ලීම මත හෝ සභාවේ සාමාජිකයන් තුනෙන් එකක නොඅඩු සංඛ්‍යාවකගේ ඉල්ලීම මත පවත්වනු ලැබුවේ නම්, අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව කැඳවනු ලැබූ හෝ රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් කැඳවනු ලැබූ මහා සභා රැස්වීමටද රෙජිස්ට්‍රාර්වරයා විසින් සොයා ගන්නා ලද කරුණු හා රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වාර්තා කළ යුතුය.

(අ) එකී මහා සභාව විසින්, වරද කරන ලද කාරක සභාව හෝ කාරක සභාවේ සාමාජිකයා හෝ සාමාජිකයන් එම අවස්ථාවේදීම ඉවත් කල යුතු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන පුරප්පාඩු ඉවත්කළ තැනැත්තන් නොවන අය අතුරින් අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව පුරවනු ලැබිය හැකිය.

(ආ) ඉහත (අ) ඡේදය අනුව කාරක සභාව අවලංගු වන අවස්ථාවකදී එම කාරක සභාව විසුරුවා හැර ඉවත් කළ තැනැත්තන් නොවන අය අතුරින් අළුත් කාරක සභාවක් තෝරා පත් කර ගනු ලැබිය හැකිය. එසේ චෝදනාවට ලක්වූ කාරක සභාව සාමාජිකයා හෝ සාමාජිකයන් මහා සභාව විසින් ඉවත් නොකරන්නේ නම් රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී

කාරක සභා සාමාජිකයා හෝ සාමාජිකයන් ඉවත්කර පුරප්පාඩු පුරවා ගන්නා ලෙස නියම කළ යුතුය. කාරක සභාව අහෝසි වන අවස්ථාවකදී රෙජිස්ට්‍රාර්වරයා විසින් පාලක මණ්ඩලයක් පත් කළ යුතුය. පාලක මණ්ඩලයක් පත්කරන අවස්ථාවක එසේ පත්කරනු ලබන පාලක මණ්ඩලයට සමිතියේ අතුරු ව්‍යවස්ථානුකූලව මහ සභාවකට හිමි මහා සභාව සතු සියළු බලතල තිබිය යුතුය.

(ඇ) ලියාපදිංචි කළ සමිතියක සමස්ථ කාරක සභාවම නියමිත ආකාරයට ස්වකීය කාර්යය ඉටු නොකරන බව 41 වන වගන්තිය යටතේ පවත්වනු ලැබූ විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසු රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම්, ඒ කාරක සභාව විසුරුවා හැරීමට විරුද්ධව හේතු කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කිරීමට ඒ කාරක සභාවට අවස්ථාවක් ලබාදීමෙන් පසු රීතිවලට අනුකූළව රෙජිස්ට්‍රාර්වරයා විසින් කැඳවනු ලබන මහා සභාව වෙත තමා සොයාගත් කරුණු හා මතය වාර්තා කළ යුතු අතර, එකී කාරක සභාව ඉවත් කර වෙනත් කාරක සභාවක් පත්කර ගන්නා ලෙස දැන්විය යුතුය. එකී මහා සභාව විසින් ඒ කාරක සභාව එම අවස්ථාවේදීම ඉවත් කරනු ලැබිය යුතු අතර, එසේ ඉවත් කළ තැනැත්තන් නොවන අනිකුත් සාමාජිකයන් අතුරින් කාරක සභාව තෝරා පත්කර ගත යුතුය. එසේ කාරක සභාව ඉවත් කර නව කාරක සභාවක් පත් කිරීම සඳහා මහා සභාව විසින් කටයුතු නොකරන අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ කාරක සභාව ඉවත් කිරීමෙන් පසු පාලක මණ්ඩලයක් පත් කළ යුතුය. එසේ පත් කරන ලද කාරක සභාවක හෝ පාලක මණ්ඩලයක නිල කාලය 43(2) වගන්තියේ විධිවිධානයන්ට අනුකූල විය යුතුය.

(ඇ) එසේ (අ), (ආ), සහ (ඇ) වගන්ති අනුව ඉවත් කරනු ලැබූ කාරක සභිකයින් වර්ෂ හතක් ගත වන තුරු කිසිම සමූපකාර සමිතියක කිසිදු නිලයක් දැරීමට, නිලයකට පත්වීමට සහ පත් කරනු ලැබීමට නුසුදුස්සන් වන්නේය.

(ඉ) (i) යම් ලියාපදිංචි සමිතියක මහා සභාවේ විශ්වාසභංග යෝජනා සම්මතයකින් ඉවත් කරනු ලැබූ කාරක සභිකයෙකු වර්ෂ හතක් ගතවනතුරු කිසිම සමූපකාර සමිතියක කිසිදු නිලයක් දැරීමට, නිලයකට පත්වීමට සහ නිලයකට පත්කරනු ලැබීමට නුසුදුස්සෙක් වන්නේය.

(ii) එසේම 41 විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසු, පූර්ව කාරක සභාවක කටයුතු කර ඇති තැනැත්තකු හෝ තැනැත්තන් චෝදනාවලට ලක්ව ඇති අවස්ථාවක එකී චෝදනා සම්බන්ධව නියෝගයක් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත. එකී නියෝගය අනුව අදාළ තැනැත්තා හෝ තැනැත්තන් වරද කර ඇති බවට නියෝග කරනු ලබන්නේ නම් එසේ නියෝග කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ නියෝගය නොකළ යුත්තේ මන්දැයි කරුණු කියා සිටීමට හා හේතු දැක්වීමට ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට අවස්ථාව දිය යුතුය. මේ අනුව වරදකරු බවට නියෝග කර ඇති තැනැත්තෙකුට එකී නියෝගයේ දින සිට වසර හතක් ගතවන තෙක් කිසිදු සමූපකාර සමිතියක කිසිදු නිලයක් දැරීමට, නිලයකට පත්වීමට සහ කිසිදු නිලයකට පත් කරනු ලැබීමට නුසුදුස්සෙක් වන්නේය. තවද ධූරයක් හෝ ධූර දරන්නේ නම් එම ධූරය හෝ ධූර දැරීම එම කරුණින්ම නතර වන්නේය.

(ඊ) ඉහත (අ), (ආ), (ඇ) සහ (ඉ) (i), (ඉ) (ii) වගන්ති අනුව ඉවත් කරනු ලැබූ මූල්‍ය චෝදනාවන්ට ලක්වූ කිසිදු කාරක සභිකයෙකු හට කිසිදු සමූපකාර සමිතියක කිසිදු නිලයක් දැරීමට සහ කිසිදු නිලයකට පත්විමට හා පත් කරනු ලැබීමට නුසුදුස්සෙක් වන්නේය. එලෙස නුසුදුසු වූ අයගේ නම් අසාදු ලේඛනගතකර වාර්ෂිකව ගැසට් කිරීම හා සමූපකාර දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුලත් කිරීම රෙජිස්ට්‍රාර් විසින් කළ යුතුය.

(2) (අ) (1) උප වගන්තියේ (අ) (ආ) ඡේද අනුව තෝරා පත්කර ගනු ලැබූ කාරක සභාව හෝ එසේ පත්කර ගනු ලැබූ තැනැත්තා හෝ තැනැත්තන් විසුරුවා හරිනු ලැබූ කාරක සභාවේ ධූර කාලයෙන් ඉතිරිව ඇති කාලය සඳහා ධූරය දැරිය හැකිය.

(ආ) එසේ පත්කරනු ලබන පාලක මණ්ඩලයකට ඉහත අනු උපවගන්තියේ සඳහන් කාලය තුළ ධූරය දැරිය හැකි අතර එකී පාලක මණ්ඩලයට සමිතියේ යථා පරිදි පත්කරන ලද කාරක සභාවක බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද ක්‍රියාත්මක කළ හැකිය.

(3) ඉහත (1) උපවගන්තියේ (ආ) සහ (ආ) ඡේද අනුව පත්කරනු ලැබූ තැනැත්තා හෝ තැනැත්තන් විසින් සමිතියේ යථා පරිදි පත්කරන ලද කාරක සභාවක සියළු බලතල අයිතිවාසිකම් හා වරප්‍රසාද ක්‍රියාත්මක කළ හැකිය.

(4) (1) වන උපවගන්තියේ (ආ) සහ (ආ) ඡේද අනුව පත්කරන ලද යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් මෙම ප්‍රඥප්තිය හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට හෝ නියෝගවලට පටහැනිව ඔවුන් විසින් සිදුකරන ලද යම් ක්‍රියා මගින් සිදුකරන ලද යම් පාඩු සඳහා තනි තනිව හා සාමූහිකව වගකිව යුතුය.

(5) ලියාපදිංචි සමිතියක කටයුතු කළමනාකරණය කිරීම මේ වගන්තිය යටතේ පත්කරනු ලැබුවා වූ ද (2) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ විධාන බලරහිතවීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධූරය හෝ ධූර දරමින් සිටියා වූ තැනැත්තා හෝ තැනැත්තන් විසින් එකී දිනයට පෙර සමිතියේ අතුරු ව්‍යවස්ථාවට අනුකූලව නව කාරක සභාවක් තෝරාපත් කිරීම සඳහා කටයුතු සැලැස්වීම ඒ තැනැත්තා හෝ තැනැත්තන්ගේ කාර්යය වන්නේය.

(6) මෙම ප්‍රඥප්තියේ 45 වන වගන්තිය යටතේ සමිතියේ ලියාපදිංචිය අවලංගු කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට ඇති බලය කෙරෙහි මේ වගන්තියේ කිසිවකින් බලපෑමක් ඇතිකර වන්නේ යැයි සලකනු නොලැබිය යුතුය.

(7) සමිතියේ කාරක සභාව අකර්මන්‍යව ඇති අවස්ථාවක රීති මාලාව අනුව හෝ අතුරු ව්‍යවස්ථානුකූලව හෝ කැඳවන ලද සමිතියක මහා සභාව විසින් එම සමිතියේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරනු ලබන පාලක මණ්ඩලයකට භාර කරන ලෙස යෝජනාවක් සම්මත කර රෙජිස්ට්‍රාර්වරයාගෙන් ඉල්ලීමක් කළහොත් තිදෙනෙකුට නොඅඩු පාලක මණ්ඩලයක් පත් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇති වන්නේය. එසේ පත්කළ පාලක මණ්ඩලය මෙහි (2) (ආ) අනු උපවගන්තියේ විධිවිධානවලට අනුකූල විය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරනු ලබන අය අතුරින් සභාපති හෝ උප සභාපති හෝ ඒ දෙදෙනාම හෝ නම් කිරීමේ බලය රෙජිස්ට්‍රාර්වරයා සතු වන්නේය.

9 වන පරිච්ඡේදය

ලියාපදිංචි කළ සමිතියක කාරක සභාව විසුරුවා හැරීම.

44. (1) 41(1) වන උප වගන්තිය යටතේ වූ විභාගයකින් පසු නැතහොත් පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසු හෝ ලියාපදිංචි කළ සමිතියක මහා සභා සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක කොටසක් විසින් විසුරුවා හැරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ලැබීමෙන් පසු හා තම විරෝධතා ඉදිරිපත් කිරීමට සමිතියට සහ සමිතියේ ණය හිමියන්ට අවස්ථාවක් ලබාදීමෙන් පසු සමිතිය විසුරුවා හැරිය යුතු යැයි රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරයි නම් ඒ සඳහා ඔහු විසින් තම අත්සන යටතේ වූ නියෝගයක් මගින් ඒ සමිතියේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකිය.

විසුරුවා හැරීම

(2) ලියාපදිංචි කළ යම් සමිතියක යම් සාමාජිකයෙකු විසින් හෝ ණය හිමියෙකු විසින් (1) වන උප වගන්තිය යටතේ වූ නියෝගයක දිනයේ සිට දින 60 ක් ඇතුළත ඒ නියෝගයට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් කළ හැකිය. එසේ ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අභියාචනයේ සඳහන් දින සිට දින හැටක් ඇතුළත තීරණය ලබාදිය යුතුය.

(3) සමිතියක ලියාපදිංචිය අවලංගු කරමින් නියෝගයක් කිරීමේ දින සිට දින හැටක් ඇතුළත කිසියම් ආයාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක ඒ නියෝගය ඒ කාලය ගතවූ විට ක්‍රියාත්මක විය යුතුය. දින හැටක් ඇතුළත ආයාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක නියෝගය ස්ථිර කරනු ලබන තෙක් ඒ නියෝගය බල නොපැවැත්විය යුතුය.

(4) සමිතියක ලියාපදිංචිය රෙජිස්ට්‍රාර්වරයා විසින් (1) උප වගන්තිය යටතේ අවලංගු කරනු ලැබූ අවස්ථාවක සමිතියේ ලියාපදිංචිය අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වන තෙක් හෝ අභියාචනයකදී අමාත්‍යවරයා විසින් නියෝගය අවලංගු කරනු ලබන තෙක් සමිතියේ පොත්, ලේඛන හා වෙනත් දේපළ භාරව සිටීමට හා ඒ සමිතියේ කටයුතු පාලනය කිරීම සඳහා එක් තැනැත්තෙකු හෝ තැනැත්තන් වැඩි ගණනක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කළ හැකිය. ඒ තැනැත්තා හෝ තැනැත්තන් පත්කරනු ලැබූ විට සමිතියේ කාරක සභාව විසින් හෝ සමිතියේ පොත් ලේඛන හා වෙනත් දේපළ භාරව සිටින වෙනයම් තැනැත්තෙකු විසින් ඒ පොත්, ලේඛන හෝ දේපළ පළමු සඳහන් තැනැත්තා හෝ

තැනැත්තන් වෙත භාරදිය යුතු අතර, ලියාපදිංචිය අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වනතුරු හෝ අමාත්‍යවරයා විසින් අභියාචනයකදී ඒ නියෝගය අවලංගු කරනු ලබන තෙක් ඒ කාරක සභාව අක්‍රිය විය යුතුය.

45. යම් ලියපාදිංචි කළ සමිතියක ලියාපදිංචිය අවලංගු කිරීම.

සමිතියක ලියාපදිංචිය අවලංගු කිරීම

(අ) සමිතිය යටත් පිරිසෙයින් සාමාජිකයන් විසි දෙනෙකුගෙන්වත් සමන්විත විය යුතු බව ඒ සමිතිය ලියාපදිංචි කිරීමේ කොන්දේසියක් වන අවස්ථාවක ඒ සමිතියේ සාමාජික සංඛ්‍යාව විස්සකට වඩා අඩුවී ඇත්නම්, හෝ

(ආ) සමිතිය ලියාපදිංචි කළ දින සිට අවුරුදු එකක කාල පරිච්ඡේදයක් තුළ ඒ ලියාපදිංචි කළ සමිතිය වැඩ ආරම්භ කොට නැත්නම් හෝ මේ වගන්තිය යටතේ අවලංගු කිරීමේ නියෝගය පැනවීමේ දිනයට පෙර අවුරුදු දෙකක කාලපරිච්ඡේදයක් තුළ අක්‍රියව තිබුණේ නම් රෙජිස්ට්‍රාර්වරයා විසින් වූ ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් එම සමිතියේ ලියාපදිංචිය අවලංගු කළ හැකිය.

(ඇ) යම් ලියාපදිංචි සමූපකාර සමිතියක පොත්පත්, ලිපි ලේඛන හා කාරක සභාව හෝ සාමාජිකයන් හෝ වෙනත් පාර්ශවයක් ඉදිරිපත් නොවන අවස්ථාවක හිමිකම් පෑම සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් ඔවුන්ට මාස 03 ක කාලයක් ලබාදීමෙන් අනතුරුව රෙජිස්ට්‍රාර්වරයා විසින් ගැසට් පත්‍රයක් මගින් දැන්වීම පළ කිරීමෙන් ලියාපදිංචිය අවලංගු කළ හැකිය. තවද ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසුව ඉදිරිපත් වන කිසිදු හිමිකම් පෑමකට රෙජිස්ට්‍රාර්වරයාගේ බැඳීමක් නොමැති විය යුතුය.

(ඇ) (1) ලියාපදිංචි කර තිබූ සමූපකාර සමිතියකට කොමසාරිස්වරයාට හෝ කොමසාරිස්වරයා බලය පැවරූ අන් තැනැත්තෙකු එම සමිතියට ඇතුළු වීමට හෝ පොත්පත් පරීක්ෂා කිරීමට හෝ පොත්පත් ඉදිරිපත් කිරීමට දැන්වූ විට එයට බාධා කරන අවස්ථාවක හා කාරක සභා, මහා සභා රැස්වීම්වලට සහභාගිත්වය වලක්වනු ලබන අවස්ථාවක හෝ වාර්ෂික විගණනය යාවත්කාලීන නොකරන අවස්ථාවක හෝ තැන්පත්කරුවන් වෙනුවෙන් ඉටු කරන අදාළ වගකීම් ඉටු නොකරනු ලබන අවස්ථාවක දී හෝ සමිතියේ මහා සභාවේ සාමාජිකයන්ගෙන් 2/3 කට නොඅඩු සංඛ්‍යාවකගේ ඉල්ලීමක් කොමසාරිස් වෙත විධිමත්ව ලද විටක දී රෙජිස්ට්‍රාර්වරයාගේ අභිමතය පරිදි වෙනත් ලියාපදිංචි සමිතියකට

ඒකාබද්ධ කිරීමට හෝ ලියාපදිංචිය අවලංගු කිරීමට හෝ සමූපකාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමට අමාත්‍යතුමාගේ නිර්දේශ මත නියෝගයක් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට බලය ඇත්තේය.

(2) පළාත් අමාත්‍ය මණ්ඩල නියෝගය ලැබීමෙන් පසුව එම නියෝගය අනුව ඒකාබද්ධ කිරීම හෝ ලියාපදිංචිය අවලංගු කිරීම හෝ සමූපකාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීම හෝ කළ යුතුය.

ලියාපදිංචිය අවලංගු කිරීමේ බලපෑම

46. (අ) ලියාපදිංචි කළ සමිතියක ලියාපදිංචිය 44 වන වගන්තියේ හෝ 45 වන වගන්තිය යටතේ වූ නියෝගයකින් අවලංගු කරනු ලැබූ අවස්ථාවක මෙහි මින් මතු විසුරුවා හැරීමේ දිනය වශයෙන් සඳහන් කෙරෙන ඒ නියෝගය ක්‍රියාත්මක වන දින සිට ඒ සමිතිය සංස්ථාවක් ලෙස පැවතීම නතර විය යුතුය.

එසේ වුවද මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් නෛතික විධිවිධාන යටතේ සමිතිය වෙත පැවරුණු යම් වරප්‍රසාද රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමිතිය සඳහා පත්කරනු ලැබූ ඇවරකරුවෙකු හෝ ඇවරකරුවන් වෙත ඒකාබද්ධ කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

සමිතියක ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසු ඇවර කිරීම

47. 44 වන වගන්තිය හෝ 45 වන වගන්තියේ (ඇ) සහ (ඈ) උප වගන්ති හැර එම වගන්තිය යටතේ ඇති සෙසු උපවගන්ති යටතේ සමිතියක් ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ අවස්ථාවක ඒ සමිතියේ ඇවරකරු හෝ ඇවරකරුවන් වශයෙන් එක් තැනැත්තෙකු හෝ තැනැත්තන් වැඩි ගණනක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කළ හැකිය.

අවස්ථාවෝචිත පරිදි 44 වන වගන්තිය හෝ 45 වන වගන්තියේ (ඇ) සහ (ඈ) උපවගන්ති හැර එම වගන්තිය යටතේ ඇති සෙසු උපවගන්ති යටතේ අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වන දිනයෙහි සමිතියේ සියලුම දේපළ ඇවරකරු හෝ ඇවරකරුවන් වෙත පවරනු ලැබිය යුතුය.

ඇවරකරුවෙකු වෙත ඇති බලය

48. (1) 47 වන වගන්තිය යටතේ පත්කරන ලද ඇවරකරුට රෙජිස්ට්‍රාර්වරයාගේ මග පෙන්වීම හා පාලනයට සහ 49 වන වගන්තිය යටතේ වූ නියෝගයක් මගින් රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන යම් සීමා කිරීම්වලට යටත්ව පහත සඳහන් කටයුතු කිරීමේ බලය තිබිය යුතුය.

(අ) සමිතියේ වත්කම්වලට සමිතියේ සාමාජිකයින් හා හිටපු සාමාජිකයින් විසින් ගෙවිය යුතු හෝ සමිතියේ මියගිය සාමාජිකයන්ගේ බූදල්වලින් ලැබිය යුතු දායක මුදල් කලින් කල නිශ්චය කිරීම.

(ආ) හිමිකම් කියාපෑම සමිතියේ පොත්පත්වල එතෙක් සටහන් වී නැති ණය හිමියන් විසින් සිය හිමිකම් කියාපෑම ඇතුළත් කරවා ගැනීම සඳහා ඒවා ඉදිරිපත් කළ යුත්තේ හෝ ඒ හිමිකම් කියාපෑම් ඔවුන් විසින් තහවුරු කිරීමට පෙර කෙරෙන වත්කම් බෙදා දීමෙන් ඒ ණය හිමියන් අත්හරිනු ලැබිය යුත්තේ යම් දිනකට පෙර ද ඒ දිනය ප්‍රකාශයකින් හෝ දැන්වීමකින් නියම කිරීම.

(ඇ) ණය හිමියන් අතර උද්ගතවන ප්‍රමුඛත්වය පිළිබඳ යම් ප්‍රශ්නයක් මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව තීරණය කිරීම.

(ඈ) 53 වන වගන්තියේ සඳහන් යම් විස්තරයක් යම් ආරවුලක් (සමිතිය සම්බන්ධයෙන් එහි සඳහන් කිරීම ඇවරකරු සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් ලෙස තේරුම් ගෙන) ඒ වගන්තිය යටතේ බේරුම් කිරීම සඳහා යොමු කිරීම හා සමිතිය වෙනුවෙන් තමාගේ නමින් ධූරයෙන් සිවිල් නඩු හා වෙනත් නීති කෘත්‍ය පැවරීම හා නීති කෘත්‍යවලදී ප්‍රතිවාද ඉදිරිපත් කිරීම.

(ඉ) ඇවර කිරීමේ ගාස්තු කවර පුද්ගලයින් විසින් හා කවර ප්‍රමාණවලින් දැරිය යුතු ද යන්න තීරණය කිරීම.

(ඊ) සමිතිය ගණන් බේරා වසා දැමීමේදී අවශ්‍ය විය හැකි වත්කම් එකතු කොට බෙදා දීම සම්බන්ධයෙන් විධාන කිරීම,

(උ) රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය කලින් ලැබ ඇත්නම් සමිතිය විසින් හෝ සමිතියට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් කියාපෑම් සමථයකට පත්කිරීම,

(ඌ) ඇවර කිරීම නිසිලෙස පැවැත්වීම සඳහා අවශ්‍ය විය හැකි සාමාජිකයන්ගේ මහා සභා රැස්වීම් කැඳවීම,

(එ) සමිතියේ පොත් ලේඛන හා වත්කම් තමා සන්තකයට ගැනීම,

(ඒ) සමිතියේ දේපළ විකිණීම,

(ඔ) වැඩදායී ලෙස ගණන් බේරා වසා දැමීම සඳහා අවශ්‍ය විය හැකිතාක් දුරට සමිතියේ කටයුතු පවත්වාගෙන යාම, එසේ වුවද ණය දෙන සමිතියක ඈවරකරුට යම් ණය මුදලක් නිකුත් කිරීම සඳහා මෙහි අඩංගු කිසිවකින් හිමිකම් නොලැබිය යුතුය.

(ඕ) රෙජිස්ට්‍රාර්වරයා විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමයක් අනුමත කරනු ලැබූ විට සමිතියේ වත්කම් පහසු ආකාරයකින් බෙදාදීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

(2) මේ ප්‍රඥප්තිය යටතේ පත්කරන ලද යම් ඈවරකරුවෙකුට ඒ වෙනුවෙන් සාදනු ලැබිය හැකි යම් නියෝගවලට යටත්ව මේ වගන්තියේ කාර්යයන් කරගෙන යාම පිණිස යම් බලතල අවශ්‍ය වන ප්‍රමාණයට දිසා අධිකරණයක් සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ විධිවිධාන සලස්වා ඇති මාර්ගයෙන්ම හා (අවශ්‍ය වියහැකි පමණින්) ඒ අකාරයටම පාර්ශවකරුවන් හා සාක්ෂිකරුවන් කැඳවීමට හා පැමිණ සිටීමට ඔවුන්ට බල කිරීමටත් ලේඛන ඉදිරිපත් කරන ලෙස ඔවුන්ට බල කිරීමටත් බලය තිබිය යුතුය.

49. ඈවරකරු රෙජිස්ට්‍රාර්වරයාගේ පාලනයට හා විධානයට යටත්ව සිය බලතල ක්‍රියාවේ යෙදවිය යුතු අතර, ඈවර කිරීම පාලනය කිරීමට රෙජිස්ට්‍රාර්වරයා සතු බලය

(අ) ඈවරකරුවකු විසින් කරනු ලබන යම් නියෝගයක් පරිච්ඡින්න කොට හෝ වෙනස් කොට අවශ්‍ය කවර හෝ අලුත් නියෝගයක් කිරීම ද,

(ආ) ඈවරකරුවෙකු ධුරයෙන් ඉවත් කිරීමද,

(ඇ) සමිතියේ සියලු පොත් ලේඛන හා වත්කම් ඉදිරිපත් කරන ලෙස නියම කිරීම ද,

(ඈ) 48 වන වගන්තිය යටතේ වූ ඈවරකරුගේ බලතල ලියවිල්ලකින් වූ නියෝගයකින් සීමා කිරීමට ද,

(ඉ) ගණන් ඉදිරිපත් කරන ලෙසට ඈවරකරුට තම අභිමතය පරිදි නියම කිරීම ද,

(ඊ) ඈවරකරුගේ ගණන් විගණනනය කරවා ගැනීම හා සමිතියේ වත්කම් බෙදා දීමට බලය පැවරීම ද,

(උ) ඈවරකරුට පාරිශ්‍රමික ගෙවීමට නියෝග කිරීමට ද,

(ඌ) ඇවරකරු හා යම් තෘතීය පාර්ශවකරුවකු හා පවත්නා වූ 48(1) (ඇ) වගන්තිය යටතේ බේරුම් කිරීමට යොමු කළ හැකි ආරවුලක් නොවන යම් ආරවුලක් ඒ පිළිබඳව බේරුම් කරදෙන තීරණයෙන් බැඳී සිටීම ඒ පාර්ශවකරු ලියවිල්ලකින් කැමැත්ත ප්‍රකාශ කරතොත් බේරුම් කිරීම සඳහා යොමු කිරීමට ද රෙජිස්ට්‍රාර් විසින් කළ හැකිය.

(එ) සමූපකාර අතිරික්ත අරමුදල් ගිණුම යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර ඇවරකරු විසින් රැස්කරනු ලබන සියලු මුදල් මෙම අරමුදලට බැරකළ යුතුය. තවද, මෙම අරමුදල රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතුය.

නියෝග ක්‍රියාත්මක කිරීම

50. (1) 49 වන වගන්තිය යටතේ තමා වෙත යොමු කරනු ලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් වූ බේරුම්කරුගේ තීරණයන් පාර්ශවකරුවන් බැඳී සිටිය යුතු අතර ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලැබූ නියෝගයක් ක්‍රියාත්මක කරන ආකාරයට ඒ තීරණය ක්‍රියාත්මක කළ හැකි විය යුතුය.

(2) බේරුම්කරුවකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් 48 වන වගන්තිය හෝ 49 වන වගන්තිය යටතේ කරනු ලැබූ නියෝගයක් කිසිම සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු අතර, ඒ සමිතිය ලියාපදිංචි කරන ලද කාර්යාලය පිහිටි ස්ථානය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති යම් සිවිල් අධිකරණයක් විසින් ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කරන ආකාරයෙන් ඒ නියෝග ක්‍රියාත්මක කළ යුතුය. එසේ වුවද ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සමිතියක ණය හිමියකු වන යම් බැංකුවකට යම් ඇවරකරුවෙකු හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් 48 වන වගන්තිය හෝ 49 වන වගන්තිය යටතේ කරන ලද නියෝගයකට විරුද්ධව ඒ ඇවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ නියෝගයේ දිනයේ සිට දින හැටක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනා කිරීමට හිමිකම් තිබිය යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අභියාචනයේ සඳහන් දින සිට දින හැටක් ඇතුළත තීරණය ලබාදිය යුතුය.

සිවිල් අධිකරණ හා අධිකරණ බලය සීමා කිරීම

(3) 48 වන වගන්තිය හෝ 49 වන වගන්තිය යටතේ ඇවරකරුවකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියෝගයක් කිරීමෙන් පසු, දින හැටක් ඇතුළත අමාත්‍යවරයා වෙත කිසිම අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක ඒ ඇවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ එම නියෝගය ඒ කාලපරිච්ඡේදය ගත වීමෙන් පසු බල පැවැත්විය යුතුය. දින හැටක් ඇතුළත අමාත්‍යවරයා වෙත

අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ස්ථිර කරනු ලබන තෙක් ඇවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ නියෝගය බල නොපැවැත්විය යුතුය.

51. මෙහි පෙරාතුව ප්‍රකාශිතවම විධිවිධාන සැලසුණු ප්‍රමාණයට හැර මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කළ සමිතියක් විසුරුවා හැරීමට අදාළව යම් කරුණක් සම්බන්ධයෙන් කිසිම සිවිල් අධිකරණයක කිසිම අධිකරණ බලයක් නොතිබිය යුතුය.

52. (1) ලියාපදිංචිය අවලංගු කරන ලද සමිතියක් ඇවර කිරීමේදී සංචිත අරමුදල ඇතුළු අරමුදල් මේ ප්‍රඥප්තියේ සඳහන් විධිවිධානවලට යටත්ව ප්‍රථම කොට ඇවර කිරීමේ ගාස්තු සඳහා ද ඊළඟට රජයේ හෝ පළාත් සභාවේ ඇප වූ ණය ආපසු ගෙවීම සඳහා ද ඉක්බිතිව සමිතිය වෙනත් වගකීම් ඉටු කිරීම පිණිස ද, ඉක්බිතිව කොටස් ප්‍රාග්ධනය ගෙවීම පිණිස ද, ඉක්බිතිව සමිතියේ අතුරු ව්‍යවස්ථාවෙන් අවසර ලැබෙන්නේ නම් ලාභ බෙදනු නොලැබූ යම් කාලපරිච්ඡේදයක් සඳහා අවුරුද්දකට සියයට දහයකට නොවැඩි ප්‍රමාණයකින් ලාභාංශයක් ගෙවීම සඳහා ද ලාභ පිළිබඳව සුදුස්සක් කරනු නොලැබූ යම් කාලපරිච්ඡේදයක් වෙනුවෙන් ඒ කාලපරිච්ඡේදය විසුරුවා හැරීමේ දිනයට පෙරාතුවම වූ අවස්ථාවක සාමාජිකයන්ට ප්‍රතිදානයක් ගෙවීම සඳහා ද යෙදිය යුතුය.

ඇවර කිරීම අවසන් කිරීම

(2) සමිතියක් ඇවර කිරීම අවසන් කරනු ලැබූ හා ඒ සමිතියේ යම් ණය හිමියකු විසින් වත්කම් බෙදා දීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අයවිය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියා පෑමක් ඉදිරිපත් කරනු නොලැබූ හෝ ඒ දේ ඔහුට නොලැබුණහොත් ඇවර කිරීමේ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළකල යුතුය. තවද, ඒ සමිතියේ අරමුදල් සම්බන්ධයෙන් වූ යම් හිමිකම් කියා පෑමක් පිළිබඳ කිසිම නඩුවක් එය ඒ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට දින අනූවක් ඇතුළත ආරම්භ වන්නේ නම් මිස පවත්වාගෙන නොයා යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කාර්යයන් සඳහා සහ (2) උපවගන්තිය යටතේ නඩුවක් පවරනු ලැබූ යම් හිමිකම් කියා පෑම් ගෙවීම් සඳහා මුදල් යෙදීමෙන් පසු ඉතිරිවන යම් අතිරික්තයක් මේ ප්‍රඥප්තියේ පිහිටුවනු ලැබිය හැකි අතිරික්ත අරමුදලකට ගෙවනු ලැබිය හැකිය.

10 වන පරිච්ඡේදය

ආරවුල්

53. (1) ලියාපදිංචි කළ සමිතියක ව්‍යාපාරයට සම්බන්ධ යම් ආරවුලක්, ආරවුල් සමථයකට පත් කිරීම

(අ) සාමාජිකයකු, හිටපු සාමාජිකයකු සහ සාමාජිකයන් හිටපු සාමාජිකයන් හා මියගිය සාමාජිකයන් මගින් හිමිකම් කියාපාන තැනැත්තන් අතර හෝ සමිතියේ අතීත හෝ වර්තමාන නිලධරයන් හෝ සේවකයන් අතර හෝ මියගිය නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ උරුමකරුවන්ගේ හෝ නීත්‍යානුකූල නියෝජිතයන් අතර හෝ

(ආ) සාමාජිකයකු, හිටපු සාමාජිකයකු හෝ සාමාජිකයන් හිටපු සාමාජිකයන් හෝ මියගිය සාමාජිකයෙකු මගින් හිමිකම් කියාපාන තැනැත්තකු හා සමිතිය, එහි කාරක සභාව හෝ එහි අතීත හෝ වර්තමාන යම් නිලධරයෙකුගේ හෝ සේවකයකු හෝ මියගිය යම් නිලධරයෙකුගේ හෝ සේවකයෙකුගේ යම් උරුමකරුවකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු අතර, හෝ

(ඇ) සමිතිය හෝ එහි කාරක සභාව හා සමිතියේ අතීත හෝ වර්තමාන යම් නිලධරයෙකු හෝ සේවකයෙකුගේ හෝ යම් මියගිය නිලධරයෙකුගේ හෝ සේවකයෙකුගේ යම් උරුමකරුවකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු අතර, හෝ

(ඈ) සමිතිය හෝ එහි කාරක සභාව සහ,

(i) ව්‍යාපාරයක් හෝ ඉන් කොටසක් ඒ සමිතියට පවරනු ලැබූ වෙනයම් සමිතියක සාමාජිකයෙකු හෝ නිලධරයෙකු හෝ සේවකයෙකුව සිටි යම් තැනැත්තෙකු,

(ii) (i) අනු ඡේදයෙහි සඳහන් සමිතියේ සාමාජිකයෙකු හිටපු සාමාජිකයෙකු හෝ මියගිය සාමාජිකයෙකු මගින් හිමිකම් කියාපාන යම් තැනැත්තෙකු

(iii) (i) අනු ඡේදයෙහි සඳහන් යම් නිලධරයෙකු හෝ සේවකයෙකුගේ උරුමකරුවක් හෝ නිත්‍යානුකූල නියෝජිතයෙකු වන යම් තැනැත්තකු අතර, හෝ

(ඉ) සමිතිය හා ලියාපදිංචි කළ අන්කිසි සමිතියක් අතර උද්ගත වන්නේ නම් තීරණය සඳහා එම ආරවුල රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කරනු ලැබිය යුතුය. අතීත හෝ වර්තමාන සාමාජිකයෙකුගෙන් නිලධරයෙකුගෙන් හෝ සේවකයෙකුගෙන් හෝ මියගිය සාමාජිකයෙකුගේ නිලධරයෙකුගේ හෝ සේවකයෙකුගේ යම් නම් කල තැනැත්තකුගෙන් උරුමකරුවකුගෙන් හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකුගෙන් හෝ ලියාපදිංචි සමිතියකට

අයවිය යුතු යම් ණයක් ඉල්ලීමක් හෝ අලාභයක් සඳහා ඒ සමිතිය විසින් ඉදිරිපත් කරනු ලැබූ හිමිකම්පෑමක් ඒ ණය ඉල්ලීම හෝ අලාභය පිළිගතයුතු වුවද නොවුවද මේ උප වගන්තියෙහි අර්ථානුකූලව සමිතියේ ව්‍යාපාරයට අදාළ ආරවුලක් ලෙස සලකනු ලැබිය යුතුය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් (1) වන උප වගන්තිය යටතේ යොමුකිරීමක් ලැබීමෙන් පසු,

(අ) තමා විසින්ම ඒ ආරවුල සම්බන්ධයෙන් තීරණය කළ හැකිය. නැතහොත්

(ආ) ඒ පිළිබඳව සුදුස්සක් කිරීම සඳහා බේරුම්කරුවකු හෝ බේරුම්කරුවන් වෙත යොමුකළ හැකිය.

(3) (අ) බේරුම්කරුවකුගේ හෝ බේරුම්කරුවන්ගේ හෝ තීන්දුවකින් අතෘප්තියට පත් යම් පාර්ශවකරුවන් විසින් එකී තීන්දුවට විරුද්ධව රෙජිස්ට්‍රාර්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. තීන්දුවකට විරුද්ධව රෙජිස්ට්‍රාර්වරයාට කරන ඕනෑම අභියාචනයක් ඊට හේතු ලියවිල්ලකින් දක්වමින්, තීන්දුව දෙන ලද දින සිට දින 60 ක් ඇතුළත කළ යුතු වේ. එවැනි අභියාචනයක් කරනු ලබන්නේ තීරක විභාගයක වගඋත්තරකරුවකු විසින් තමාට විරුද්ධව දෙන ලද තීන්දුවකට එරෙහිව නම් එම තීන්දු කරනු ලබන මුදලින් 10% ක් ද අභියාචනා ඉදිරිපත් කරනු ලබන්නේ පැමිණිලි පාර්ශ්වය විසින් නම් තීරක විභාගයේදී ඉල්ලා සිටි මුළු මුදලින් 10% ක්ද වශයෙන් අභියාචනා තැන්පත් මුදලක්ද එම අභියාචනය සමග යැවිය යුතුය. එතෙකුදු වුවත් කවර පාර්ශවකරුවකු විසින් හෝ අභියාචනා තැන්පත් වශයෙන් යැවිය යුතු මුදල රුපියල් දහසකට අඩු නොවිය යුතු අතර රුපියල් පනස් දහසක් නොඉක්මවිය යුතුය.

(ආ) ඉහත සඳහන් (අ) උප වගන්තියට අනුකූලව නොකරන අභියාචනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතුය.

(4) (3) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යම් අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ කිසිම පාර්ශ්වකරුවකුට ඒ පාර්ශවකරු විසින් යම් නියෝජිතයෙකු මාර්ගයෙන් රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ පෙනී සිට ඒ අභියාචනය සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට ඉල්ලීමක් කර අවසර ලබාගත හැකිය.

(5) (2) වන උපවගන්තිය යටතේ හෝ (3) වන උපවගන්තිය යටතේ හෝ අභියාචනයකදී රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු අතර ඒ පිළිබඳව කිසිදු සිවිල් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

(6) (2) වන උප වගන්තිය යටතේ බේරුම්කරුවෙකුගේ හෝ බේරුම්කරුවන්ගේ තීන්දුව සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත කිසිම අභියාචනයක් යොමු කරනු නොලබන්නේ නම් හෝ එබඳු යම් ආයාචනයක් අත්හරිනු ලබන්නේ නම් හෝ ඉල්ලා අස්කර ගනු ලබන්නේ නම්, ඒ තීන්දුව අවසානාත්මක විය යුතු අතර ඒ පිළිබඳව කිසිදු සිවිල් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

(7) මේ වගන්තිය යටතේ ආරවුලක විෂය වන යම් හිමිකම් කියාපෑමක් සම්බන්ධයෙන් කාලාවරෝධන ආඥාපනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

(8) මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කරනු ලැබූ ලියාපදිංචි කළ සමිතියක ව්‍යාපාරයට අදාළ ආරවුලක් ද යන්න පිළිබඳව යම් ප්‍රශ්නයක් උද්ගත වුවහොත් ඒ සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු අතර ඒ පිළිබඳව කිසිම සිවිල් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

(9) මේ වගන්තිය "සාමාජිකයා" යන්නට ආශ්‍රිත සාමාජිකයෙක්ද ඇතුළත් වේ.

(10) මෙම වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා සහ ආරවුල් බේරුම්කරුවකු වශයෙන් පත්කරනු ලැබූ තීරකවරයා දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයෙකු ලෙස සැලකිය යුතුය.

තීරණයක් හෝ තීන්දුවක් ක්‍රියාත්මක කිරීම

54. (1) 53 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කරනු ලැබූ ආරවුලක් හෝ අභියාචනයක් සම්බන්ධයෙන් ඔහුගේ තීරණයකින් (මේ වගන්තියෙහි මින්මතු එය "තීරණයක්" යනුවෙන් හඳුන්වනු ලැබේ.) හෝ ඒ වගන්තිය යටතේ බේරුම්කරුවෙකු වෙත යොමු කරනු ලැබූ ආරවුලක් පිළිබඳවූත් ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයාවෙත යථා පරිදි ආයාචනයක් ඉදිරිපත් කරනු නොලැබූත්, මේ වගන්තියේ මින් මතු තීන්දුවක් යනුවෙන් හඳුන්වනු ලබන තීන්දුවකින් කෙරෙන නිගමනය ඒ ආරවුලේ එක් පාර්ශ්වකරුවෙකුගෙන් ඒ ආරවුලේ අනෙක් පාර්ශවකරුට මුදලක් අයවිය යුතු බව වූත් ඒ මුදල ඊට සම්බන්ධ ගාස්තු හා පොලී ඇතොත් ඒවා සමග නොගෙවා ඇත්තා වූත් අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ මුදල් අයවිය යුත්තේ යම් පාර්ශ්වකරුවෙකුගෙන්ද මේ වගන්තියේ මින්මතු පැහැර හරින්නා යනුවෙන් හඳුන්වනු ලබන ඒ පාර්ශ්වකරු සම්බන්ධයෙන්,

(අ) ගාස්තු හා පොලී ඇතොත් ඒ පොලියද සමග ඒ මුදල් පිළිබඳ විස්තර හා පැහැර හරින්නාගේ නම අඩංගු සහතිකයක් ඒ පැහැර හරින්නා පදිංචිව සිටින හෝ ඒ පැහැර හරින්නාට අයත් යම් චංචල හෝ නිශ්චල දේපලක් පිහිටි යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලය ඇති දිසා අධිකරණයක් වෙත නිකුත් කිරීම, හෝ

(ආ) අයවිය යුතු මුදල පිළිබඳ විස්තර හා පැහැර හරින්නාගේ නම සහ අන්තිමට දැනගත් ඔහුගේ ව්‍යාපාරික හෝ පදිංචි ස්ථානය අඩංගු සහතිකයක් ඒ ස්ථානය පිහිටි කොට්ඨාශයේ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයෙකු වෙත නිකුත් කිරීම් කළ හැකිය.

(2) (1) උප වගන්තියේ (අ) ඡේදය යටතේ දිසා අධිකරණයක් වෙත සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක එය ලැබීමෙන් පසු ඒ අධිකරණය විසින් ඒ පැහැර හරින්නාගේ සියළුම චංචල හෝ නිශ්චල දේපළ හෝ ඉන් යමක් හෝ ඒ මුදල අයකර ගැනීම සඳහා පිස්කල් විසින් අවශ්‍ය යැයි සැලකිය හැකි ඉන් යම් කොටසක් තහනමට ගෙන විකුණන ලෙස පිස්කල්ට බලය පැවරෙන හා නියම කෙරෙන දේපළ තහනම් ඇස්කීසියක් පිස්කල් වෙත නිකුත් කරන ලෙස විධානය කළ යුතුය. ඒ තහනමට ගෙන විකිණීම කෙරෙහි සහ ඊට අදාළ 1979 අංක 15 දරන සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වැනි වගන්තිය දක්වා වූ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(3) (1) වන උප වගන්තිය (ආ) ඡේදය යටතේ මහේස්ත්‍රාත්වරයෙකු වෙත සහතිකය නිකුත් කරනු ලැබූ අවස්ථාවක මුදල් අයකර ගැනීම සඳහා පැහැර හරින්නාට විරුද්ධව වැඩිදුරටත් ක්‍රියා නොකළ යුත්තේ මන්දැයි හේතු දැක්වීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවිය යුතු අතර ප්‍රමාණවත් හේතු ඔහු විසින් නොදක්වන ලද්දේ නම් බන්ධනාගාර ගත කිරීමෙන් දඩුවම් කළ නොහැකි වුවද දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වුවද දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදකට ඒ පැහැර හරින්නා සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද දණ්ඩන නියමයකින් නියම කෙරෙන දඩයක් ලෙස ඒ මුදල සලකනු ලැබිය යුතුය. එවිට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වැනි වගන්තියේ (ඒ වගන්තියෙන් (1) වන උප වගන්තියේ (අ) සහ (ඇ) ඡේද හැර) විධිවිධාන අදාළ විය යුතු අතර, ඒ දණ්ඩන නීතිය නියමය කරන අවස්ථාවේදී ඒ වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් විධානයක්

ඔහු විසින් කළ හැකිය. දඩයක් ලෙස මුදල් ගෙවීමට පැහැර හරින්නා එකඟත්වය පළකරන විට එම මුදල රෙජිස්ට්‍රාර්වරයා විසින් සඳහන් කරන ලද බැංකු ගිණුමකට හෝ වෙනත් ආකාරයට ගෙවන ලෙසට මහේස්ත්‍රාත්වරයෙකු විසින් පැහැර හරින්නෙකුට නියම කළහැකි අතර කුවිතාන්සිය නීත්‍යානුකූල බව පිළිබඳ සෑහීමට පත්වන අවස්ථාවක, එය අධිකරණයට ගෙවන ලද මුදලක් ලෙසට සලකා නියෝග කිරීමට මහේස්ත්‍රාත්වරයෙකුට බලය ඇතිවේ.

(4) 1979 අංක 15 දරන අපරාධ නඩු සංග්‍රහ පනතේ 291 වගන්තිය අනුව නියම කරනු ලැබූ දඩය පැහැර හැරීමේලා බන්ධනාගාරගත කිරීමේ කාලයට දණ්ඩන නියමයක් කරනු ලැබූ යම් පැහැර හරින්නෙකු 54 (1) (ආ) වගන්තියේ නිශ්චිත සහතිකයේ සඳහන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් නිදහස් කරනු නොලැබිය යුතුය.

(5) රෙජිස්ට්‍රාර්වරයා මේ වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරන අවස්ථාවක ඒ පිළිබඳව නිවේදනයක් පෞද්ගලිකව භාරදීමෙන්, ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ විදුලි පණිවුඩ මාර්ගයෙන් යැවීමෙන් පැහැර හරින්නා වෙත නිකුත් කළ යුතුය. එහෙත් පැහැර හරින්නා ඒ නිවේදනය නොලැබීම හේතු කොටගෙන මේ වගන්තිය යටතේ වූ නීති කෘත්‍ය අවලංගු නොවිය යුතුය.

(6) මේ වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යවලදී රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකයෙහි වූ යම් ප්‍රකාශයක නිවැරදිභාවය සලකා බැලීමට පරීක්ෂා කිරීමට හෝ ඒ පිළිබඳව තීරණය කිරීමට යම් දිසා අධිකරණයක හෝ මහේස්ත්‍රාත්වරයෙකුට මේ වගන්තියේ කිසිවකින් බලය නොලැබිය යුතුය නොහොත් නියම නොවිය යුතුය.

(7) (2) වන උප වගන්තිය යටතේ විකිණීමෙන් ලත් යම් මුදලක් හා (3) වන උපවගන්තිය යටතේ ගෙවන ලද හෝ අයකරන ලද යම් මුදලක් අවස්ථාවෝචිත පරිදි දිසා අධිකරණය හෝ මහේස්ත්‍රාත්වරයා විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ මුදල් සම්බන්ධයෙන් අදාළ තීරණය හෝ තීන්දුව අනුව සුදුස්සක් කළ යුතුය.

11 වන පරිච්ඡේදය

ලියාපදිංචි කළ සමිතිවලට අදාළ විශේෂ විධිවිධාන

55. (1) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකත්වය සඳහා යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ඒ සමිතිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ඒ තැනැත්තා විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත අභියාචනය කළ හැකිය. ඒ අභියාචනය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය දින හැටක් ඇතුළත ලබාදිය යුතු අතර, රෙජිස්ට්‍රාර්වරයාගේ එම තීරණය අවසානාත්මක විය යුතු අතර එය පිළිපැදීමට සමිතිය බැඳී සිටිය යුතුය.

වෙනත් ඇතැම් කරුණු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කළ යුතු බව

(2) ලියාපදිංචි කළ සමිතියක් සාමාජිකයෙකු ඒ සමිතියේ ධූරයකට යථා පරිදි තෝරා පත්කර ගන්නා ලද්දේ ද යන්න සම්බන්ධයෙන් හෝ සාමාජිකයෙකු ඒ සමිතියේ සාමාජිකයෙකුව හෝ නිලධරයෙකුව සිටීම නතර වූයේද යන්න සම්බන්ධයෙන් හෝ සමිතියේ යම් මහා සභාවක් සහ කාරක සභා රැස්වීමක් වලංගු ලෙස පවත්වනු ලැබුවේද යන්න සම්බන්ධයෙන් හෝ යම් ප්‍රශ්නයක් උද්ගත වන අවස්ථාවක ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කළ යුතු අතර, රෙජිස්ට්‍රාර්වරයාගේ එම තීරණය අවසානාත්මක විය යුතු අතර එය පිළිපැදීමට සමිතිය බැඳී සිටිය යුතුය.

56. ලියාපදිංචි කළ සමිතියක් විසින් රජයෙන් හෝ පළාත් සභාවෙන් ණයක් අත්තිකාරමක්, ප්‍රදානයක් හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ නිර්දේශ මත වෙනත් යම් රාජ්‍ය හෝ රාජ්‍ය අනුබද්ධ ආයතනයකින් ණයක් අත්තිකාරමක් හෝ ප්‍රදානයක් හෝ ලබාගන්නා විට හෝ එවැනි සෑම ණයක්ම අත්තිකාරමක් හෝ ප්‍රදානයක් වන මුදලක්ම පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතුය.

විශේෂ කොන්දේසි

(1) සමිතියේ පරමාර්ථවලට සම්බන්ධ යම් කාර්යයක් සඳහා යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ වෙනත් චංචල හෝ නිශ්චල දේපලක් මිලට ගැනීමට, බද්දට ගැනීමට, ත්‍යාගයක් වශයෙන් හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීමට පෙර හා එවැනි යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් චංචල හෝ නිශ්චල දේපලක් විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ වෙනත් යම් ආකාරයකින් නියාදනය කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ලියවිල්ලකින් ලබාගත යුතුය.

නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ වැඩ අත් හිටුවීම හෝ ඔවුන්ගේ වැඩ තහනම් කිරීම සහ ඔවුන් ඉවත් කිරීම ආදිය

(2) (අ) 41 වගන්තිය යටතේ සිදු කරන විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් හෝ 40(2) උපවගන්තිය යටතේ වූ නියෝගයක් මත, රෙජිස්ට්‍රාර්වරයා විසින් නිදහසට කරුණු විමසා ඒ සඳහා ඉදිරිපත් කරන ලද නිදහසට කරුණු සම්බන්ධව

රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් නොවූ විටක එවැනි පූර්ව කාරක සභිකයෙකු පරීක්ෂණ කාලයට අදාළ කාලසීමාවෙන් පසුව අදාළ සමිතියේ කාරක සභාවට තේරී පත් වී සිටින්නේ නම් ඒ තැනැත්තා ඉවත් කරනු ලැබිය යුතු අතර ඒ තැනැත්තාට වර්ෂ හතක් ගතවන තුරු කිසිදු ලියාපදිංචි සමූපකාර සමිතියක කාරක සභික ධූරයකට හෝ නිලයකට තේරී පත් වීමට නොහැකි විය යුතුවාක් මෙන්ම 43(1)(අ) සහ 43(1)(ආ) වගන්ති යටතේ තීරණයක් ලැබූ පුද්ගලයෙකු කිසිදු ලියාපදිංචි සමූපකාර සමිතියක කාරක සභික ධූරයකට පත්වීමට නුසුදුස්සකු විය යුතුය.

(ආ) 41 වගන්තිය යටතේ පවත්වනු ලැබූ විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසුව ලියාපදිංචි කළ සමූපකාර සමිතියක යම් නිලධරයකු විසින් තම කාර්යය නිසි අයුරින් ඉටු නොකරන බව හෝ කාර්යක්ෂම ලෙස තම කාර්යය ඉටු කිරීම නුසුදුසු බව හෝ වෙනත් ආකාරයකින් නොහැකි බව රෙජිස්ට්‍රාර්වරයා විසින් නිගමනය කරනු ලැබුවහොත් මේ ප්‍රඥප්තියේ හෝ වෙනයම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත්ද ස්වකීය විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නිලධරයාට ලබාදීමෙන් පසුව අවශ්‍යවන පරිදි පරීක්ෂණයක් පැවැත්වීමට බලාපොරොත්තුවෙන් නිලධාරියාගේ තනතුර අත්හිටුවීමට ලිඛිත නියමයක් මගින් කරනු ලැබිය හැකිය. පෙර සඳහන් පරීක්ෂණයෙන් වැරදිකරු වන නිලධාරියෙකුට කිසිදු ලියාපදිංචි කළ සමූපකාර සමිතියක නිලයකට ඉදිරිපත් විය නොහැකිය. එසේ ඉවත් කරනු ලැබිය හැකි තැනැත්තාට ඉවත් කරනු ලබූ දිනයේ සිට වසර හතක් යනතුරු කිසිදු සමූපකාර සමිතියක කිසිදු තනතුරකට පත්වීමට නොහැකිය.

(ඇ) 41 වගන්තිය යටතේ පවත්වනු ලැබූ විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසුව ලියාපදිංචි කළ සමූපකාර සමිතියක යම් සේවකයෙකු විසින් තම කාර්යය නිසි අයුරින් ඉටු නොකරන බව හෝ කාර්යක්ෂම ලෙස තම කාර්යය ඉටු කිරීම නුසුදුසු බව හෝ වෙනත් ආකාරයකින් නොහැකි බව රෙජිස්ට්‍රාර්වරයා විසින් නිගමනය කරනු ලැබුවහොත් මේ ප්‍රඥප්තියේ හෝ වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතද ස්වකීය විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සේවකයාට ලබා දීමෙන් පසුව අවශ්‍ය වන පරිදි පරීක්ෂණයක් පැවැත්වීමට බලාපොරොත්තුවෙන් සේවකයාගේ තනතුර අත්හිටුවීමට ලිඛිත නියමයක් මගින් කරනු ලැබිය හැකිය. පෙර සඳහන් පරීක්ෂණයෙන් වැරදිකරු වන සේවකයෙකුට කිසිදු ලියාපදිංචි කළ සමූපකාර සමිතියක තනතුරකට ඉදිරිපත් විය නොහැකිය එසේ ඉවත් කරනු ලැබිය හැකි තැනැත්තාට ඉවත් කරනු ලැබූ ලැබූ දිනයේ සිට වසර හතක් යනතුරු කිසිදු සමූපකාර සමිතියක කිසිදු තනතුරකට පත් වීමට

නොහැකිය. එසේ වුවද මේ උපවගන්තිය යටතේ කරන ලද ඉවත් කිරීමේ නියමයකින් අතෘප්තියට පත් යම් සේවා නියුක්තකයෙකු විසින් දවස් 30ක් ඇතුලත දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයක් කළහැකි අතර ඒ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේය.

57. ලියාපදිංචි සමිතියක කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහතික කර ගැනීම සඳහා තැන්පත් කරුවන්ගේ තැන්පතුවල ආරක්ෂාව, සාමාජික අයිතිවාසිකම් ආරක්ෂාකර දීම, ඒ සමිතියට රජයෙන් හෝ පළාත් සභාවෙන් කරන ලද ආයෝජන හෝ මුදලින් නැතහොත් භාණ්ඩවලින් දෙන ලද අත්තිකාරම් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා එම ලියාපදිංචි සමිතියේ කාරක සභාවට සාමාජිකයන් වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් නම් කිරීම අවශ්‍ය බව හෝ අවස්ථාවෝචිත බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන අවස්ථාවක මේ ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් නීතියක හෝ ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථාවල හෝ කුමක් සඳහන්ව තිබුණද ඔහු විසින් ඔහුගේ මතය අනුව අවස්ථාවෝචිත පරිදි ලියාපදිංචි සමිතියේ කාරක සභා සාමාජිකයන් වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් නම් කළ හැකිය. එසේ වුවද එසේ නම් කරන සාමාජික සංඛ්‍යාව ඒ කාරක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් හරි අඩකට අඩු විය යුතුය. එසේ නම් කළ අය අතුරින් සභාපති උප සභාපති හෝ ඒ දෙදෙනාම හෝ නම් කිරීමේ බලය රෙජිස්ට්‍රාර්වරයා සතු වන අතර එම නම් කිරීමත් සමගම ඒ වන විට කාරක සභාවේ එම ධූරය දරන්නන්ගේ සභාපති හා උප සභාපති ධූර එම කරුණින්ම අහෝසි විය යුතුය. වෙනත් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද මෙසේ නම් කිරීමෙන් පසු කාරක සභාවේ සන පූර්ණය වශයෙන් නම් කරන ලද කාරක සභා සාමාජිකයින් ඇතුළුව මුළු කාරක සභික සංඛ්‍යාවෙන් අඩකට වැඩි ප්‍රමාණයකින් සමන්විත විය යුතුය.

12 වන පරිච්ඡේදය

රීති

58. (1) මේ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියලු රීති විෂයභාර අමාත්‍යවරයා විසින් සෑදිය හැකිය.

(2) විශේෂයෙන්ම හා (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව ඒ රීතිවලින්,

(අ) සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී අනුගමනය කළ යුතු කොන්දේසි හා ඒ ඉල්ලුම් කිරීම පිණිස කාර්යය පටිපාටිය නියම කළ හැකිය.

(ආ) සාමාජිකයන් වශයෙන් ඇතුළත්වීම සඳහා ඉල්ලුම් කරන හෝ සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලැබූ තැනැත්තන් විසින් අනුගමනය කළ යුතු කොන්දේසි නියම කළහැකි අතර කලින් කල සාමාජිකයන් තෝරා පත්කර ගැනීම හා ඇතුළත් කර ගැනීම හා සාමාජිකත්වයේ අයිතිවාසිකම් පාවිච්චි කිරීමට පෙර කළ යුතු ගෙවීම් හා ලබාගත යුතු සම්බන්ධතා සඳහා විධිවිධාන සැලැස්විය හැකිය.

(ඇ) සාමාජිකයන් ඉල්ලා අස්වීම හා නෙරපීම සඳහා ද ඉල්ලා අස්වන හෝ නෙරපනු ලබන සාමජිකයන්ට කළයුතු ගෙවීම් සඳහාද හිටපු සාමාජිකයන්ගේ වගකීම් සඳහාද විධිවිධාන සැලැස්විය හැකිය.

(ඇ) ලියාපදිංචි කළ සමිතියක සාමාජික සංඛ්‍යාව ඒ සමිතිය විසින් සීමාකළ හැකි ප්‍රමාණය නියම කළ හැකිය.

(ඉ) මියගිය සාමාජිකයන්ගේ සම්බන්ධතාවයේ වටිනාකම නිශ්චය කළයුතු ආකාරය සඳහාද ඒ සම්බන්ධතාවයේ වටිනාකම ගෙවිය හැකි හෝ පැවරිය හැකි තැනැත්තෙකු නම් කිරීම සඳහාද විධිවිධාන සැලැස්විය හැකිය.

(ඊ) 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සාමාජිකයෙකු සතුව තිබිය හැකි ලියාපදිංචි කළ සමිතියක ප්‍රාග්ධනයේ වැඩිම කොටස් ගණන හෝ පංගුව නියම කළ හැකිය.

(උ) සමිතියක සාමාජිකයන්ට ලාභ බෙදාදිය හැක්කේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි හා සමිති විසින් ගෙවිය හැකි ලාභාංශ පිළිබඳ උපරිම ප්‍රමාණය නියම කළ හැක.

(ඌ) සාමාජිකයන්ගේ මහා සභා රැස්වීම් සඳහාද, ඒ රැස්වීම්වල කාර්ය පටිපාටිය සඳහාද, ඒ රැස්වීම්වලදී පාවිච්චි කළයුතු බලතල සඳහාද, විධිවිධාන සැලැස්වීමත් ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු කාරක සභාවේදී හෝ ප්‍රාදේශීය හෝ ශාඛා කාරක සභාවක සාමාජිකයෙකු ලෙස තෝරාපත් කර ගැනීම සම්බන්ධයෙන් වූ නුසුදුසුකම් නියම කිරීමක් කළ හැකිය.

(එ) කාරක සභාවල සාමාජිකයන් හා වෙනත් නිලධරයන් පත්කිරීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම හා ඔවුන් ඉවත් කිරීම සඳහා ද කාරක සභා රැස්වීම්වල කාර්යය පටිපාටිය සඳහාද කාරක සභාව හා වෙනත් නිලධරයන් විසින් පාවිච්චි කළයුතු බලතල හා ඉටුකල යුතු යුතුකම් සඳහා ද විධිවිධාන සැලැස්විය හැක.

(ඒ) සමිතියක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි හෝ සෑදිය යුතු කරුණු සහ අතුරු ව්‍යවස්ථා සෑදීමේදී වෙනස් කිරීමේදී හා පරිච්ඡින්න කිරීමේදී අනුගමනය කළයුතු කාර්යය පටිපාටිය, ඒ අතුරු ව්‍යවස්ථාව පැනවීමට, වෙනස් කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට පෙර සපුරාලිය යුතු කොන්දේසි නියම කළ හැකිය.

(ඔ) ලියාපදිංචි කළ සමිතියක් විසින් තැබිය යුතු ගිණුම් හා පොත්පත් සහ ලියාපදිංචි කළ සමිතියක වත්කම් හා බැරකම් පෙන්නුම් කරන ශේෂ පත්‍රයක් කලින් කල පළ කිරීමට නියම කළ හැකිය.

(ඕ) ලියාපදිංචි කළ සමිතිවල ගිණුම් විගණනය කිරීම සඳහා සහ ඒ විගණනය සඳහා ගෙවිය යුතු යම් ගාස්තු ඇතොත් ඒ ගාස්තු ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම ද පවත්නා සමිති විගණනය කිරීම, ඒවා පරිපාලනය කිරීම සහ ඒවාට සහාය දීම සඳහා ද සමූපකාර ප්‍රචාරක ව්‍යාපෘති කටයුතු සඳහා ද සමූපකාර අධ්‍යාපනය හා දේශීය හා විදේශීය පුහුණුව සඳහා ද සමූපකාර ව්‍යාපාරයේ කටයුතු කිරීම සඳහාද නෛතික කටයතු කිරීමේදී දැරීමට සිදුවිය හැකි සියලුම වැය සඳහා රෙජිස්ට්‍රාර්වරයාට අවශ්‍යවන අවශ්‍යතා සපයා ගැනීමද පාවිච්චි කිරීම පිණිස මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන දකුණු පළාත් සමූපකාර සංවර්ධන අරමුදල් ගිණුමට සියලුම ලියාපදිංචි කළ සමිතිවලින් හා එවැනි යම් සමිතිවලින් දායක මුදල් අය කිරීමට විධිවිධාන සැලැස්වීමද, සමූපකාර අරමුදල ගෙවීම පැහැර හැරීම් සඳහා කළමනාකරණය සඳහා විධිවිධාන සැලැස්වීම ද කළ හැකිය.

(ක) ලියාපදිංචි කළ සමිති වලින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා සහ ඒ වාර්තා ඉදිරිපත් කළ යුතු තැනැත්තන් හා ආකාරය නියම කළ හැකිය.

(ග) ලියාපදිංචි කළ සමිති සතු පොත්පත්වල ඇතුළත්ව ඇති සටහන්වල පිටපතක් සහතික කළහැකි තැනැත්තන් හා ආකාරය සඳහා විධිවිධාන සැලැස්විය හැකිය.

(ච) සාමාජිකයාගේ නාමලේඛනයක් හා සාමාජිකයන්ගේ වගකීම් කොටස්වලින් සීමා සහිත වූ අවස්ථාවක කොටස් පිළිබඳ නාමලේඛනයක් සකස්කොට පත්වාගෙන යාම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය.

(ජ) සංචිත අරමුදලක් ඇතිකොට පවත්වාගෙන යාම හා ඒ අරමුදල් යෙදිය හැකි පරමාර්ථ සඳහා ද ලියාපදිංචි කළ සමිතියක පාලනය යටතේ ඇති යම් අරමුදල් ආයෝජනය කිරීම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය.

(ට) සමිතියක් වෙත හෝ ඒ මාර්ගයෙන් ද්‍රව්‍ය විකිණීමට අදාළ යම් තොරතුරු ව්‍යවස්ථාවක් හෝ ගිවිසුමක් කඩ කිරීම පිළිබඳ යම් ප්‍රශ්නයක් නිශ්චය කළ හැකි ආකාරය හා එබඳු යම් කඩකිරීමක් නිසා වූ ප්‍රමාණය කළ අලාභය නිශ්චය කළ හැකි හෝ තක්සේරු කළහැකි ආකාරය නියම කළ හැක.

(ඩ) බේරුම්කරුවෙකු හෝ බේරුම්කරුවන් පත් කිරීමේ ක්‍රමය හා රෙජිස්ට්‍රාර්වරයා හෝ බේරුම්කරුවෙකු හෝ බේරුම්කරුවන් ඉදිරියේදී පැවැත්වෙන කාර්යයන්හිදී අනුගමනය කළයුතු කාර්යය පටිපාටිය හා රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණ හෝ බේරුම්කරුවන්ගේ තීරණ ද ක්‍රියාත්මක කළයුතු ආකාරය නියම කළ හැකි අතර රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා තැන්පත් කළයුතු මුදල් පිළිබඳ නියම කිරීම කළ හැකිය.

(ණ) රෙජිස්ට්‍රාර්වරයා වෙත ආරවුල්ගත යොමුවක් ඉදිරිපත් කළයුතු කාලසීමාවන් පිළිබඳ නියමයක් කළ හැකිය.

(ත) සමූපකාර සමිතියක කාරක සභාවක් තෝරා පත්කර ගැනීමට අදාළවන නියමයන් හා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නියමයන් කළ හැකිය.

(ද) වත්කම් මිලදී ගැනීම, අත්පත් කර ගැනීම, විකිණීම සහ බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නියමයන් කළ හැකිය.

(න) රජයෙන් හෝ පළාත් සභාවෙන් මුදල් ආධාර සඳහා ඉල්ලුම් කරන ලියාපදිංචි කළ සමිතියක් විසින් පිළිපැදිය යුතු කොන්දේසි නියම කළ හැකිය.

(ප) රෙජිස්ට්‍රාර්වරයා විසින් කරන ලද නියෝගවලට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි යුතු වුවද මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නැත්තාවූ ද කරුණු නිශ්චය කළ හැකිය.

(බ) 47 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ ඇවරකරුවෙකු විසින් අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය හා ඇවරකරුගේ නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කළ හැකි විය යුතු අවස්ථා නියම කළ හැකිය.

(ම) 37(1)(අ) වන අනු උපවගන්තියෙහි සඳහන් සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුමක් පිහිටුවා පත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම හා එම අරමුදල් ගිණුමේ මුදල් වියදම් කළහැකි ආකාරය හා කාර්යයන් නියම කිරීම.

(ය) 53(3)වන උපවගන්තියේ සඳහන් අතිරික්ත අරමුදල් ගිණුමක් පිහිටුවා පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම හා එම අරමුදලේ මුදල් වියදම් කළහැකි ආකාරය හා කාර්යයන් නියම කළ හැකිය.

(ර) විවිධ සේවා සමූපකාර සමිතිවල ප්‍රාදේශීය කාරක සභිකයන් තෝරා පත්කර ගැනීමේ සහ අනෙකුත් සියලුම ලියාපදිංචි සමූපකාර සමිතිවල සමූපකාර නිලවරණ පැවැත්වීමට අදාළ විධිවිධාන සැලැස්වීමට අදාළ කාර්ය පටිපාටි නියම කිරීම හා ඊට අනුශංගික කරුණු සම්බන්ධයෙන් නියෝග නියම කළ හැකිය.

(ල) මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ රීති යටතේ අභියාචනා ඉදිරිපත් කිරීම, විභාග කිරීම හා ඒ පිළිබඳ සුදුස්සක් කිරීම සමබන්ධයෙන් පාවිච්චි කළයුතු ආකෘති, ගෙවිය යුතු ගාස්තු, පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය හා එම කරුණු සම්බන්ධ හෝ අනුශංගික වෙනත් සියලු කරුණු නියම කළ හැකිය.

(3) දකුණු පළාත් සභාව විසින් අනුමත කරනු ලැබුවේ නම් මිස කිසිම රීතියක් බල නොපැවැත්විය යුතුය.

(4) 3 වන උපවගන්තියෙන් නියම නිවේදනය පළාත් සභාවෙන් අනුමත කර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු සෑම රීතියක්ම මෙහි පනවනු ලැබුවාක් මෙන් වලංගු හා බල සහිත විය යුතුය.

13 වන පරිච්ඡේදය

රජයේ හෝ පළාත් සභාවට අයවිය යුතු ණය.

සමිතිවලින් රජයට, පළාත් සභාවට අය විය යුතු ණය අය කිරීමේ විධිවිධාන

59. (1) ලියාපදිංචි කළ සමිතියකින් හෝ ලියාපදිංචි කළ සමිතියක් යම් නිලධරයෙකුගෙන් හෝ සාමාජිකයෙකුගෙන් හෝ එහි හිටපු සාමාජිකයෙකුගෙන් එම තත්ත්වයෙන් රජයේ හෝ පළාත් සභාවේ ණය හා රජය හෝ පළාත් සභාවට ඇප වූ ණය වෙනුවෙන් අයවිය යුතු මුදල් හා රජයට හෝ පළාත් සභාවටද අයවිය යුතු ණය අයකර ගැනීම සඳහා ආණ්ඩුවේ ණයකරු ආඥාපනත යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන්ම අය කරනු ලැබිය හැකි අතර 39(2) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව අන්කිසි තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට අයවිය යුතු මුදල්වලට ඉහළින් ඒවාට ප්‍රමුඛත්වය ලැබිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියකින් රජයට, පළාත් සභාවට අයවිය යුතු (1) වන උපවගන්තිය යටතේ අයකරගත හැකි මුදල් පළමුව සමිතියේ දේපලවලින් අයකර ගත හැකිය. දෙවනුව සාමාජිකයන්ගේ වගකීම් සීමා කරනු ලැබූ ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් වූ විට සාමාජිකයාගේ වගකීමේ සීමාවට යටත්ව සාමාජිකයන්ගෙන් ද, තෙවනුව අන් සමිති සම්බන්ධයෙන් වූ විට සාමාජිකයන්ගෙන් ද අයකර ගත හැකිය.

14 වන පරිච්ඡේදය

අරමුදල් ගිණුම්

සමූපකාර සංවර්ධන අරමුදල් ගිණුම හා අතිරික්ත අරමුදල් ගිණුම

සමූපකාර සංවර්ධන අරමුදල් පාලන ගිණුම

60. (1) දකුණු පළාත තුළ සමූපකාර සංවර්ධන කාර්යය ඉටු කිරීම අරමුණු කරගත් (මෙහි මින්මතු සමූපකාර සංවර්ධන අරමුදල් ගිණුම වශයෙන් සඳහන් කරන්නා වූ) දකුණු පළාත් සමූපකාර සංවර්ධන අරමුදල් ගිණුම යනුවෙන් හැඳින්වෙන්නා වූ අරමුදල ගිණුමක් පිහිටුවන්නේය.

(2) මෙම අරමුදල් ගිණුම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ iii වන කොටසේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

(3) මෙම අරමුදල් ගිණුමට පහත සඳහන් මුදල් බැරකළ යුතුය.

(අ) මෙම ප්‍රඥප්තිය 37(1) වගන්තිය යටතේ ලියාපදිංචි සමිතිවලින් ලැබෙන මුදල්

(ආ) රජයේ හෝ පළාත් සභාවෙන් ලැබෙන අරමුදල් හෝ පරිත්‍යාග.

(ඇ) සමූපකාර සමිතිවලින් හෝ පුද්ගලයන්ගෙන් ලැබෙන යම් ආධාර හෝ පරිත්‍යාග.

(4) මෙහි මින්මතු දැක්වෙන විධිවිධානවලට යටත්ව පහත සඳහන් එක් කාරණයක් හෝ කාර්යයන් කිහිපයක් වෙනුවෙන් එකී අරමුදල් ගිණුමෙන් මුදල් වැය කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් සිදුකළ හැකිය.

(අ) සමූපකාර අධ්‍යාපන ව්‍යාප්තිය, ප්‍රචාරක වැඩ හා පුහුණුව,

(ආ) සමූපකාර සමිතිවල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම,

(ඇ) සමූපකාර සමිතිවලට ආධාර කිරීම,

(ඈ) සමූපකාර අරමුදල් ගිණුම කළමනාකරණය කිරීමේ දී අවශ්‍ය වන නෛතික කටයුතුවලදී දැරීමට සිදුවන සියලු වැය,

(ඉ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී දකුණු පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වන සියලුම නෛතික කටයුතුවලදී දැරීමට සිදුවන සියලු වැය,

(ඊ) සමූපකාර නීතිය යටතේ පවරනු ලබන කාර්යයකදී යම් නිලධාරියෙකුට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ගයක් ගනු ලබන අවස්ථාවක දී රජයේ නීති සහාය නොලැබෙන විට ඒ සඳහා නීති සහාය ලබාදීම වෙනුවෙන් දරන වියදම්,

(උ) සමූපකාර සමිති විගණනයේ දී හා සංවර්ධනයේ දී දැරීමට සිදුවන වැය,

(ඌ) සමූපකාර සමිති සාමාජික නාම ලේඛන හා ඡන්ද නාමලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම සඳහා දැරීමට සිදුවන වැය,

(ඌ) සමූපකාර සාමාජිකයා, කාරක සභිකයින්, සමිතියේ සේවකයින් හා එම ව්‍යාපාරය මෙහෙයවීමට සෘජුව සම්බන්ධවන ආයතන හා නිලධාරීන් සඳහා දැරීමට සිදුවන වැය,

(එ) සමූපකාර සංවර්ධන අරමුදල් ගිණුම පරිපාලනය කිරීමේ වැය.

(5) සමූපකාර අරමුදල් ගිණුම පරිපාලනය කිරීමේ කාර්යය සඳහා කොමසාරිස් විසින් හත්දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත්කළ යුතු අතර එම කමිටුව අරමුදලේ පාලක මණ්ඩලය වන්නේ ය. එම කමිටුව,

(අ) රෙජිස්ට්‍රාර්වරයා කමිටුවේ සභාපති වශයෙන්ද, සමූපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (පාලන), විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරන ලද අමාත්‍යාංශ නිලධාරියෙකු, සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (සංවර්ධන), දිස්ත්‍රික් තුන නියෝජනය වීම සඳහා එක් සහකාර කොමසාරිස්වරයෙකු, දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී හා සමූපකාර සමිති නියෝජනය වීම සඳහා දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල තුනෙහි අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් අතුරින් එක් අයෙකු ද සමන්විත විය යුතුය.

(ආ) කමිටු රැස්වීමක සන පූර්ණය හතරක් විය යුතු අතර, අවශ්‍ය අවස්ථාවල කමිටුව රැස්වී ලැබී ඇති ඉල්ලීම් සලකා බලා මුදල් ගෙවීම සඳහා තීරණය ගත යුතුය.

(6) (අ) සමුපකාර අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

(අ) සෑම වර්ෂයක්ම අවසන් වී මාස 03 ක් ඇතුළත අරමුදල් ගිණුම පිළිබඳ වාර්තාවක් රෙජිස්ට්‍රාර්වරයා විසින් සමුපකාර විෂය භාර අමාත්‍යාංශ ලේකම් මගින් පළාත් සභාව වෙත ඉදිරිපත් කල යුතුය.

(ඇ) රාජ්‍ය ආයතනවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියේ විධිවිධාන දකුණු පළාත් සභා රීති සමුපකාර අරමුදල් ගිණුමේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

61. (1) ලියාපදිංචිය අවලංගු කරන ලද සමිතිවල ගණන් බේරා වසා දැමීමේ කාර්යය ඉටු කිරීම සඳහා (මෙහි මින්මතු අතිරික්ත අරමුදල් ගිණුම වශයෙන් සඳහන් කරන්නාවූ) දකුණු පළාතේ මෙම අතිරික්ත අරමුදල් ගිණුම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 111 වැනි කොටසේ විධිවිධානවලට අනුකූල විය යුතුය. අතිරික්ත අරමුදල

(2) මෙම අතිරික්ත අරමුදල් ගිණුමට පහත සඳහන් මුදල් බැර කල යුතුය.

(අ) ලියාපදිංචිය අවලංගු කරන අවස්ථාවේදී සමිතියක බැංකු ගිණුම්වල පැවති මුදල් හා ඉතිරි අරමුදල් ශේෂ.

(ආ) ඇවරකරුවන් විසින් අය කරනු ලබන මුදල්.

(ඇ) ලියාපදිංචිය අවලංගු කිරීමට පෙරාතුව සිදුකරන ලද ගණුදෙනුවක් සඳහා ලැබිය හැකි ඕනෑම ආකාරයක මුදල්.

(ඈ) වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන මුදල්.

(3) මෙම ප්‍රඥප්තිය 52 (1) හා (2) උප වගන්තිවල දැක්වෙන කාර්යයන් සඳහා රෙජිස්ට්‍රාර් විසින් මෙම අරමුදලින් මුදල් වැය කළ හැකිය. එසේ වුවද එවැනි යම් සමිතියක් වෙනුවෙන් කරන ගෙවීම්, එම සමිතිය වෙනුවෙන් ලැබී ඇති මුදල් නොඉක්මවිය යුතුය.

(4) ඉහත 3 උපවගන්තියේ සඳහන් කාර්යය සඳහා මුදල් යෙදවීමෙන් පසුව යම් අතිරික්තයක් ඇති වුවහොත් අතිරික්ත පහත සඳහන් කාර්යයන් වෙනුවෙන් වැය කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් කල හැකිය.

(අ) ඕනෑම ලියාපදිංචි කරන ලද ප්‍රාථමික සමිතියක කොටස් මිලයට ගැනීම හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කල හැකි වෙනත් ආකාරයකට හෝ එවැනි සමිතියකට අධාර කිරීම,

(ආ) ලියාපදිංචි කරන ලද සමිතියකට ස්ථාවර වත්කම් මිලයට ගැනිමට අධාර කිරීමට,

(ඇ) ඇවරකරුවෙකුට විරුද්ධව ඇති සිවිල් නඩුවකදි ඔහුගේ නිදහසට ක්‍රියා කිරීමට ඔහුට අධාර කිරීමට.

(ඈ) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටවනු ලබන හා පිහිටුවන ලද ඕනෑම ලියාපදිංචි කල සමිතියකට හෝ ලියාපදිංචි කල සමිතිවලට අධාර කිරිමේ කටයුත්තක් සඳහා වෙනත් ආයතනයකට හෝ ආධාර කිරිමට,

(ඉ) සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුම පරිපාලනය කිරිමේ වැය

(5) අතිරික්ත අරමුදල් ගිණුම පරිපාලනය කිරීමේ කාර්යය සඳහා කොමසාරිස් විසින් පස් දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත්කල යුතු අතර, එම කමිටුව අතිරික්ත අරමුදලේ පාලක මණ්ඩලය වන්නේය. එම කමිටුව,

(අ) රෙජිස්ට්‍රාර්වරයා කමිටුවේ සභාපති වශයෙන් ද, සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (පාලන) විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරන ලද අමාත්‍යාංශ නිලධාරියකු සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයකු දෙපාර්තමේන්තුවේ හා ගණකාධිකාරි යන අයගෙන් සමන්විත විය යුතුය.

(ආ) කමිටු රැස්වීමක සනපුර්ණය 3ක් විය යුතු අතර අවශ්‍ය අවස්ථාවල කමිටුව රැස්වී ලැබී ඇති ඉල්ලීම සලකා බලා මුදල් ගෙවීම් සඳහා තීරණය ගත යුතුය.

(6) (අ) අතිරික්ත අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය

(ආ) සෑම වර්ෂයක්ම අවසන් වි මාස 03 ක් ඇතුලත අරමුදල් ගිණුම පිළිබඳ වාර්තාවක් රෙජිස්ට්‍රාර් විසින් සමුපකාර විෂය භාර අමාත්‍යාංශ ලේකම් මගින් පළාත් සභාව වෙත ඉදිරිපත් කල යුතුය.

(ඇ) රාජ්‍ය ආයතන ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන දකුණු පළාත් සභා රීති අතිරික්ත අරමුදල් ගිණුම විගණනය කිරීම සම්බන්ධයෙන් අදාල විය යුතුය.

15 වන පරිච්ඡේදය
විවිධ කරුණු.

62. මෙම ප්‍රඥප්තියේ කුමක් සදහන්ව ඇත්ද එය නොතකා අමාත්‍යවරයා විසින් එක් එක් අවස්ථාවෙහි විශේෂ නියෝගයකින් හා ඔහු විසින් නියම කල හැකි යම් කොන්දේසිවලට යටත්ව ලියාපදිංචි කිරිම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේහි වූ නියමයන්ගෙන් යම් නියමයකින් යම් සමිතියක් නිදහස් කළ හැකිය.

ලියාපදිංචි කිරීම් සම්බන්ධයෙන් වූ නියමයන්ගෙන් යම් සමිතියක් නිදහස් කිරීමට අමාත්‍යවරයා සතු විශේෂ බලය

63. අමාත්‍යවරයා විසින් සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක් මාර්ගයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන වලට යම් විධිවිධානයකින් ලියාපදිංචි කල යම් සමිතියක් හෝ සමිති පන්තියක් නිදහස් කිරීම හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් දිනක සිට වෙනස් කිරිම සහිතව ඒ විධිවිධාන යම් සමිතියකට හෝ සමිති පන්තියකට අදාල විය යුතු යැයි විධාන කිරීම කල හැකිය.

මේ ප්‍රඥප්තියෙහි විධිවිධානවලින් සමිති නිදහස් කිරීමට අමාත්‍යවරයා සතු විශේෂ බලය

64. (1) "එක්සත් සහකාර" යන වචනය හෝ "සමුපකාර" යන වචනය හෝ දෙමළ භාෂාවෙන් "අයික්කිය" යන වචනය හෝ "කූට්ටුරවු" යන වචනය හෝ ඉංග්‍රිසි භාෂාවෙන් "කෝපරේටිව්"යන වචනය හෝ කොටසක් යන නාමයක් හෝ අභිධානයක් යටතේ වෙළදාම් කිරිම හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම ලියාපදිංචි කළ සමිතියක් නොවන කිසිම තැනැත්තෙකු විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව නොකළ යුතුය.

සමූපකාරය යන වචනය සීමා කිරීම.

එසේ වුවද 1921 සැප්තැම්බර් මස 22 වන දිනට පෙර යම් තැනැත්තෙකු විසින් වෙළෙඳාමක් කරගෙන යන ලද්දේ හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලද්දේ යම් නාමයක් හෝ අභිධානයක් යටතේ ද ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ සම්බන්ධතාවයෙහි අනුප්‍රාප්තිකයා විසින් ඒ නාමය හෝ අභිධානය පාවිච්චි කිරිම සම්බන්ධයෙන් මේ වගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතුය.

(2) මේ වගන්තියේ විධිවිධාන කඩ කරන කවර තැනැත්තෙකු වුවද මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහස දක්වා විය හැකි දඩයකට හා වරද අඛණ්ඩ පවත්වාගෙනු ලබන අවස්ථාවක් වූ විට ඒ වරද වරදකරු කරනු ලැබීමෙන් පසු තවදුරටත් ඒ වරද කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් සියයක අතිරේක දඩයකට ද යටත්විය යුතුය.

65. (1) ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් 39 වන වගන්තිය යටතේ විගණනයකදී හෝ 41 වන වගන්තිය යටතේ විභාගයකදේී හෝ සමිතියේ පොත් පරික්ෂා කර බැලිමේදී හෝ ගණන් බේරා වසා දැමීමේදී ඒ සමිතිය සංවිධානය කිරීමෙහිලා හෝ එහි කළමනාකාරිත්වයේහි ලා හෝ සහභාගි වූ මේ ප්‍රඥප්තියේ හෝ වෙනත් ප්‍රඥප්තියක විධිවිධාන වලට හෝ ඒ යටතේ සාධන රීතිවලට හෝ නැතහොත් සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට හෝ කාරක නියෝගවලට රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද මුදල් කාර්ය පටිපාටියෙන් රෙජිස්ට්‍රාර්වරයා හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් යම් පොදු විධිවිධාන වලට පටහැනිව සමිතියේ අරමුදල් ප්‍රයෝජනයට ගත් යම් තැනැත්තෙකුගෙන් හෝ තැනැත්තන් කණ්ඩායමකින් හෝ සමිතියේ සිට හෝ දැනට සිටින යම් නිලධාරයෙකුගෙන් හෝ සේවකයෙකුගෙන් ඒ සමිතියට යම් මුදලක් හෝ අන් දේපලක් ලැබිය යුතු බව පෙනෙන අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි රෙජිස්ට්‍රාර්වරයා විසින් තමාගේ ඉල්ලීම පිට හෝ සමිතියේ කාරක සභාවේ හෝ ඇවරකරුගේ හෝ යම් ණය හිමියෙකුගේ දායකයෙකුගේ ඉල්ලීම පිට තැනැත්තාගේ හෝ තැනැත්තන් කණ්ඩායමේ හෝ නිලධරයන් හෝ සේවකයන්ගේ ක්‍රියා කළාපය සම්බන්ධයෙන් පරික්ෂා කර,

(අ) ඒ මුදල හෝ එහි කොටසක් රෙජිස්ට්‍රාර්වරයා විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන පොළියක් සමග ආපසු ගෙවන ලෙස,

(ආ) ඒ අන් දේපල හෝ එයින් කොටසක් ආපසු භාරදෙන ලෙස, හෝ

(ඇ) සමිතියේ වත්කම්වලට සුදුසු යැයි අදහස් කරනු ලබන යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවන ලෙස,

ඔහුට හෝ ඒ කණ්ඩායමට නියෝග කළ හැකිය, එවැනි යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට විරුද්ධව එබඳු යම් නියෝගයක් කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ නියෝගය නොකළ යුත්තේ මන්දැයි කරුණු කියා සිටීමට හා හේතු දැක්වීමට ඒ තැනැත්තාට හෝ තැනැත්තන් කණ්ඩායමට අවස්ථාවක් දිය යුතුය. එම තැනැත්තා සේවකයෙකු නම් ඔහුගේ සේවය තහනම් කරන ලෙස කාරක සභාවට නියෝග කළ හැකිය.

(2) ලියාපදිංචි කළ සමිතියකට යම් මුදලක් ආපසු ගෙවීම සඳහා හෝ එහි වත්කම්වලට යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවීම සඳහා (1) වන උප වගන්තිය යටතේ කරන ලද නියෝගයක් අනුව ක්‍රියා කර නොමැති අවස්ථාවක සමිතියේ ලියාපදිංචි කළ ව්‍යාපාර ස්ථානය පිහිටි හෝ නියෝගය කරන ලද්දේ යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් නිලධාරියෙකුට හෝ සේවකයෙකුට විරුද්ධව ද ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම හෝ නිලධාරියා හෝ සේවකයා පදිංචිව සිටින හෝ ව්‍යාපාරය කරගෙන යන ස්ථානය පිහිටි කොට්ඨාශය තුළ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත මෙම ප්‍රඥප්තියේ 54(1)(ආ) වගන්තිය ප්‍රකාර සහතිකයක් මගින් ඉල්ලුම්කොට ඒ මුදල බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදක් සඳහා ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම නිලධරයා හෝ සේවකයා සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයාගේ හෝ දණ්ඩන නියමයකින් නියම කරන ලද දඩයක් වූවාක් මෙන් අයකරනු ලැබිය හැකි අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 291 වගන්තියෙහි (එම වගන්තියේ (i) වන උප වගන්තිය (අ) සහ (ඇ) ඡේද හැර) විධිවිධාන ඉක්බිතිව අදාළ විය යුතුය. තවද ඒ දණ්ඩනය නියම කරන අවස්ථාවේ දී ඒ වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත්වරයා විසින් නියම කළ හැකිව තිබූ යම් විධානයක් ද ඔහු විසින් කළ හැකිය. රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලැබූ යම් නියෝගයක නිරවද්‍යතාව මේ වගන්තිය යටතේ කිසිම නීති කෘත්‍යකදී සළකා බැලීමට, පරීක්ෂා කිරීම හෝ තීරණය කිරීමට මහේස්ත්‍රාත්වරයාට මේ වගන්තියේ කිසිවකින් බලය ලැබීම හෝ නියම වීම සිදු නොවිය යුතුය.

(3) අන් කිසි ලිඛිත නීතියක් යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් (1) වන උප වගන්තියේ සඳහන් යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් නිලධාරියෙකුට හෝ සේවකයෙකුට විරුද්ධව නඩුවක් පැවරීම හෝ පවත්වාගෙන යාම මේ වගන්තිය පෙරාතුව වූ විධිවිධාන හෝ ඒ යටතේ යම් නියෝගයක් කිරීම හේතුකොට ගෙන වැළැක්වෙන ලෙස හෝ ඒ කෙරෙහි වෙන යම් ආකාරයකින් බලපාන ලෙස සලකනු ලැබීම හෝ තේරුම් ගැනීම නොකළ යුතුය.

වත්කම් බැරකම් ප්‍රකාශ කිරීම හා දිවුරුම් ප්‍රකාශ

66. (1) ලියාපදිංචි සමූපකාර සමිතියක සභාපතිවරයා විසින් සහ කාරක සභාවේ සෑම සාමාජිකයෙකු විසින්ම වාර්ෂිකව රෙජිස්ට්‍රාර්වරයා වෙත නියමිත ආකෘතියෙහි වූ වත්කම් හා බැරකම් ප්‍රකාශයක්, ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.ඒ ප්‍රකාශය කරන්නේ යම් වර්ෂයක් වෙනුවෙන්ද ඒ වර්ෂයේ මාර්තු 31 දිනට පැවති පරිදි,

(අ) ඔහුගේ සියලු වත්කම් හා බැරකම් පිළිබඳව ද,

(ආ) ඔහුගේ කලත්‍රයාගේ සියලුම වත්කම් හා බැරකම් පිළිබඳව සහ

(ඇ) ඔහුගේ එක් එක් දරුවාගේ සියලු වත්කම් හා බැරකම් පිළිබදව තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් ප්‍රකාශය ලියාපදිංචි සමිතියක සභාපතිවරයා හෝ කාරක සභාවේ සෑම සාමාජිකයෙකු විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත අවස්ථාවෝචිත පරිදි වූ සභාපතිවරයා හෝ කාරක සභාවේ සෑම සාමාජිකයා තෝරා පත්කරගනු ලැබූ පත් කරනු ලැබූ දින සිට මාස 03ක් ඇතුළත ද ඔහු සභාපති ධූරයේ හෝ කාරක සභාවේ සාමාජික ධූරය දැරීම නතර වුවහොත් මිස ඔහු ප්‍රථම ප්‍රකාශය කළ වර්ෂයෙන් පසුව එළඹෙන එක් එක් අනුක්‍රමික වර්ෂයෙන් ජූලි මස පළමු වන දිනට පෙර ද කළ යුතුය.

(3) ලියාපදිංචි කළ සමිතියක කාරක සභාවට හෝ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය කාරක සභාවකට හෝ තෝරා පත්කර ගනු ලැබූ කෙනෙක් එසේ තෝරා පත් වී දින 14ක් තුළ ලියාපදිංචි තැපෑලෙන් රෙජිස්ට්‍රාර්වරයා වෙත තමා එසේ තෝරා පත්කර ගැනීමට නුසුදුසු නොවන බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

(4) ඉහත (2) සහ (3) වන උප වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීම පැහැර හරින තැනැත්තෙකුගේ ධූරය එම කරුණින්ම අහෝසි වන්නේය. එසේ ධූරය අහෝසි වන දින සිට ඉතිරි ධූර කාලය තෙක් එම සමිතියේ කිසිදු ධූරයකට පත් කිරීමට නුසුදුස්සෙකු වන්නේය.

(5) ඉහත (2) හා (3) වන උප වගන්තිය අනුව කරන ලද ප්‍රකාශයන් අසත්‍ය බවට තහවුරු වුවහොත් එදින සිට වර්ෂ හතක් ගත වන තුරු කිසිදු සමුපකාර සමිතියක කිසිදු ධූරයක් දැරීමට නුසුදුස්සෙකු වන්නේය.

67. ලියාපදිංචි කළ සමිතියක ගණන් 39වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි විගණනය කිරීමෙන් පසුව හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසුව සමිතියේ නිලධරයකු හෝ සාමාජිකයකු හෝ සේවකයකු වශයෙන් වූ තම තත්ත්වයෙන් යම් මුදලක් යම් බඩු හෝ දේපළ භාරව සිටින හෝ යම් අවස්ථාවක භාරව සිටි නැතහොත් ඒ මුදල් බඩු හෝ දේපළ පිළිබඳ ආධිපත්‍යය ඇතිව සිටින හෝ යම් අවස්ථාවක ඇතිව සිටි හෝ තැනැත්තකු විසින් ඒ නිලධරයා සාමාජිකයා හෝ සේවකයා වශයෙන් තමා ළඟ තබාගෙන සිටින හෝ තමන්ගෙන් අයවිය යුතු බවට තමා විසින් තබන ලද හෝ අත්සන් කරන ලද ගණන් පොත් වල හෝ ප්‍රකාශ වල පෙන්නුම් කෙරෙන යම් මුදලක් හෝ එහි ශේෂයක් හෝ අයථා ලෙස පරිහරණය කරන ලද යම් මුදලක් හෝ ගෙවන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස හෝ එවැනි යම් බඩුවල හෝ දේපළවල වටිනාකම ගෙවන ලෙස හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල විය යුතුය.

විශ්වාසය කඩ කිරීම හා ඒ සඳහා වන දඬුවම්

තවද එසේ නියම කරනු ලැබීමෙන් පසුව ඒ තැනැත්තා විසින් ඒ මුදල හෝ එහි ශේෂය හෝ වටිනාකම ගෙවීම හෝ ඉදිරිපත් කිරීම හෝ එම බඩුවල හෝ දේපළවල වටිනාකම ගෙවීම යථා පරිදි ඒ සඳහා ගණන් ඉදිරිපත් කිරීම පැහැර හැරියහොත් ඔහු සාපරාධී විශ්වාසය කඩ කිරීමේ වරදකට වැරදිකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු 10ක් නොඉක්මවන කාල සීමාවකට දෙයාකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට යටත්විය යුතුවාක් මෙන්ම, දඩයකටද යටත් විය යුතු අතර ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්ම වුවද එය නොතකා ක්‍රියාත්මක කළ හැකි විය යුතුය.

68. (1) (අ) සෑම ලියාපදිංචි සමුපකාර සමිතියකම එකී සමුපකාර සමිතියේ අනුමත අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති කාරක සභා නිළ කාලය ඉකුත් වී මාස තුනක් ගත වීමට පෙර නව කාරක සභාවක් පත් කර ගැනීමට කටයුතු කිරීම තත් කාලයේ කාරක සභාවේ වගකීම වන්නේය.

පාලක මණ්ඩලය පත් කිරීමේ බලය

(ආ) එසේ නොකරන්නේනම් එකී කාරක සභාව අහෝසි වූවා සේ සලකා කොමසාරිස්වරයා විසින් පාලක මණ්ඩලයක් පත්කළ යුතුය. එකී පාලක මණ්ඩලයට සමිතියේ යථා පරිදි පත් කරන ලද කාරක සභාවක බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද ක්‍රියාත්මක කළ හැකිය.

(ඇ) එකී පාලක මණ්ඩලය විසින් මාස හයක් ඇතුළත අතුරු ව්‍යවස්ථානුකූලව මහා සභාවක් කැඳවා කාරක සභාවක් පත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

(2) (අ) තවද පහත සඳහන් කවර හෝ අවස්ථාවකදී වුවද පාලක මණ්ඩලයක් පත් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත්තේය.

(i) කාරක සභාව ඉල්ලා අස්වී ඇති නමුත් අලුතින් කාරක සභාවක් පත් කිරීමට නොහැකි තත්වයක් උද්ගතව තිබීම,

(ii) මහා සභාව විසින් කාරක සභාවක් පත් කිරීම, පැහැර හැරීම හෝ කාරක සභාවක් පත්කරනු ලැබීමට කටයුතු නොකිරීම,

(iii) සමිතියේ පරිපාලනය යම් නිශ්චිත කාලයකට රෙජිස්ට්‍රාර් විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් කළ යුතු බවට මහා සභාව යෝජනා සම්මත කිරීම.

(ආ) එකී පාලක මණ්ඩලය විසින් මාස හයක් ඇතුළත අතුරු ව්‍යවස්ථානුකූලව මහා සභාවක් කැඳවා කාරක සභාව පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. එකී පාලක මණ්ඩලයට සමිතියේ යථා පරිදි පත් කරන ලද කාරක සභාවක බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද ක්‍රියාත්මක කළ හැකිය.

(3) (අ) තවද ඉහත 68(1) අ වගන්තිය පරිදි කටයුතු කිරීම නොහැකි වන පරිදි අධිකරණයක් මගින් අතුරු තහනම් නියෝගයක් ලබා දී ඇති අවස්ථාවකදී නැතහොත් අධිකරණ අතුරු නියෝගයක් හෝ නියමයන් හේතුවෙන් කාරක සභාව හෝ මහ සභාව අකර්මන්‍ය වී ඇති අවස්ථාවක දී, කොමසාරිස් විසින් මෝසමක් මගින් අධිකරණයට කරුණු ඉදිරිපත් කර පාලක මණ්ඩලයක් පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. එකී පාලක මණ්ඩලයට සමිතියේ යථා පරිදි පත් කරන ලද කාරක සභාවක බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද ක්‍රියාත්මක කළ හැකිය.

(ආ) එකී පාලක මණ්ඩලය විසින් අධිකරණය වෙනත් ආකාරයකට නියම කළහොත් මිස මාස හයක් ඇතුළත අතුරු ව්‍යවස්ථානුකූලව මහා සභාවක් කැඳවා කාරක සභාව පත්කර ගැනීමට කටයුතු කළ යුතුය.

(4) මෙම වගන්තියට අමතරව මෙම ප්‍රඥප්තියේ 38, 43, 56, හා 57 යන වගන්තිවලින්ද පාලක මණ්ඩලය පත් කිරීමේ බලය රෙජිස්ට්‍රාර්වරයා වෙත ඇත්තේය.

(5) මෙම ප්‍රඥප්තියේ 38, 43, 56, 57 හා 68 වගන්ති යටතේ කොමසාරිස්වරයා විසින් සිදුකරනු ලබන, සියළු පාලක මණ්ඩල පත්කිරීම් වලදී විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගත යුතුය.

69. ලියාපදිංචි කළ සමිතියක අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් විමර්ෂණ පැවැත්වීම, විභාග කිරීම සහ 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XVII පරිච්ඡේදයේ සඳහන් නඩු පැවරීම මෙහෙයවීම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධරයෙකු විසින් කිරීම නීත්‍යානුකූල වන්නේය.

නඩු පැවරීම මෙහෙයවීම කවුරුන් කළ යුතු ද යන වග

70. අන් කිසි ලිඛිත නීතියක කුමක් සදහන්ව ඇත්ද එය නොතකා රෙජිස්ට්‍රාර්වරයා විසින් අවශ්‍ය යැයි ඔහු අදහස් කරන අවස්ථාවක

(අ) යම් කිසි ලියාපදිංචි සමිතියක් විසින් බැංකුව සමග කරනු ලබන ගණුදෙනු සම්බන්ධයෙන් යම් තොරතුරක් සපයන ලෙස, හෝ

(ආ) බැංකු සමග පවතින ඒ සමිතිය ගිණුම් පෙන්නුම් කරන පිටපතක් බැංකු විසින් තබා ඇති ලෙජරයෙන් ඉදිරිපත් කරන ලෙස, හෝ

(ඇ) සමිතියේ බැරට ගෙවන ලද සමිතිය විසින් පිටසන් කරන ලද යම් චෙක් පතක් ඉදිරිපත් කරන ලෙස, යම් බැංකුවකට නියම කළ හැකිය.

යම් තොරතුරක් යනාදිය ඉදිරිපත් කරන රෙජිස්ටාර්වරයා විසින් බැංකුවට නියම කළ ඇති බව.

71. සමාගම් පනත හා වෘත්තීය ආඥාපනතේ විධිවිධාන හා ඒ පනත් සංශෝධනය කරන යම් ප්‍රඥප්තිවල විධිවිධාන මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබු සමිතිවලට අදාළ නොවිය යුතුය.

සමාගම් පනත හා වෘත්තීය සමිති.

72. (1) 1983 අංක 32 දරන සමූපකාර සමිති (සංශෝධන) පනත සමග 1992 අංක 11 දරන සමූපකාර සමිති (සංශෝධන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර පනත යටතේ හා 1970 අංක 35 දරන සමූපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත හා 1970 අංක 34 දරන සමූපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත යටතේ ලියාපදිංචි කර ඇති සමූපකාර සමිති මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, මෙහි සඳහන් සියළු කටයුතු කිරීමට බලය තිබිය යුතුය. එබඳු වූ යම් සමිතියක සේවකයින් හෝ නිලධරයන් අතුරු ව්‍යවස්ථා කාරක නියෝග රීති, ආරවුල්, අභියාචනා හෝ යම් නීති කෘත්‍යයන් සියල්ලක් මෙම ප්‍රඥප්තිය යටතේ කළා වූ කටයුතු ලෙස සැලකිය යුතු වන්නේය.

දැනට පවත්නා පනත රීති යනාදිය පිළිබඳ ඉතිරි කටයුතු කිරීම පිළිබඳ බලය හා සංශෝධනය කිරීම.

(2) මෙම ප්‍රඥප්තිය ආරම්භ වන අවස්ථාවේ බලපවත්නා සියලු රීති ඒවා ප්‍රඥප්තියේ විධිවිධාන ග ගැලපෙන පමණට මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ රීති වෙනුවට 58 වන වගන්තිය යටතේ අලුත් රීති සාදනු ලබන තෙක් ඒවා අඛණ්ඩව බලපැවැත්විය යුතුය.

(3) මෙම ප්‍රඥප්තිය මගින් කටයුතු ආරම්භ කිරීමට යම් පනතක් යටතේ කරන ලද හෝ කරන ලදැයි සැලකෙන සියලු පත්කිරීම් සහ නියෝග නිකුත් කරනු ලැබූ නිකුත් කරන ලදැයි සැලකෙන සියලු නිවේදන හා දැන්වීම් බේරුම්කරුවන් විසින් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන සියලු තීරණ පවරනු ලබන හෝ පවරනු ලදැයි සැලකෙන සිවිල් නඩු හා වෙනත් නඩු කටයුතු සහ උද්ගතව ඇති සියලු ආරවුල් හැකිතාක් දුරට පිළිවෙලින් මෙම ප්‍රඥප්තිය යටතේ කරනු ලැබූ ලෙස නිකුත් කරනු ලැබූ ලෙස හා උද්ගත වූ ලෙස සලකනු ලැබිය යුතුය.

73. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් යථා පරිදි බලය පවරනු ලැබූ අන් තැනැත්තෙකු විසින් නියම කරන ලද යම් ක්‍රියාවක් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම ඕනෑකමින් පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ එහි නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ සාමාජිකයෙකු සහ මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද යම් කැඳවීමේ නියෝගයකට හෝ නීත්‍යානුකුල ලිඛිත නියෝගයකට ඕනෑකමින් හෝ යම් සාධාරණ හේතුවක් නොමැතිව අකීකරු වන හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන

ප්‍රඥප්තිය අනුව ක්‍රියා නොකිරීම සඳහා දණ්ඩන

යටතේ නිකුත් කරන ලද යම් තොරතුරක් සපයන ලෙස නියම කිරීමට බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් එසේ සැපයීමට නීත්‍යානුකූලව නියම කරන ලද යම් තොරතුරක් සැපයීම පැහැර හරින සෑම තැනැත්තෙකුම සහ ඕනෑකමින් අසත්‍ය වාර්ථාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරු සපයන සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ එහි යම් නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ සාමාජිකයෙකු හෝ මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතුය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් වරදක් සිදුකරන සෑම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු 02 ක් නොයික්මවන කාල සීමාවක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් පන්දහසක් නොයික්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයෙකු සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවුවද ඔහු යටත් විය යුතුය.

(3) ඉහත (2) උප වගන්තිය යටතේ දණ්ඩනයකට පත්වන තැනැත්තෙකුට ලියාපදිංචි කිසිදු සමූපකාර සමිතියක කිසිදු ධූරයක් දැරීමට හෝ ධූරයකට පත්වීමට නුසුදුස්සෙකු වන්නේය.

රෙජිස්ට්‍රාර්වරයා ආදීන්ගේ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව

74. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක් කරනු ලැබූ අවස්ථාවක කරන ලද යම් යුතුකමක් කඩ කිරීමක් වේද ඒ යුතුකම ඉටු කිරීමට අතුරු ව්‍යවස්ථාවලින් හෝ නියෝගවලින් බැඳී සිටින එම සමිතියේ සෑම නිලධරයෙකුම හෝ එබඳු නිලධරයෙක් නොසිටී නම් කාරක සභාවේ සෑම සාමාජිකයෙක්ම ඒ සාමාජිකයා ඒ වරද කිරීම ගැන නොදැන සිටින හෝ එය වැළැක්වීමට ප්‍රයත්න දැරූ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස ඔහු විසින් ඒ වරද කරන ලද්දේ නම් ඔහු යටත් විය යුතු වන දණ්ඩනයට යටත් විය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී හෝ කර්තව්‍ය කිරීමේදී සත්භාවයෙන් කරන ලද හෝ කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට, නියෝජ්‍ය කොමසාරිස්වරයන්ට, ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස්වරයන්ට, සහකාර කොමසාරිස්වරයන්ට හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධානයන් යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් යථා පරිදි බලය දෙන ලද හෝ පත්කරන ලද වෙනත් තැනැත්තන්ට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතුය.

75. මෙම ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණයට එරෙහිව හා මෙම ප්‍රඥප්තිය මත රෙජිස්ට්‍රාර්වරයා විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට එරෙහිව නීති කෘත්‍යයන් පවත්වාගෙන යාම සඳහා සමිතියේ මුදලින් කිසිදු වැය බරක් දැරීමට ලියාපදිංචි සමුපකාර සමිතියකට බලය නැති වන්නේය.

76. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියේ "අතුරු ව්‍යවස්ථා" යන්නෙන් තත්කාලයෙහි දකුණු පළාත තුළ බල පවත්වා ලියාපදිංචි කළ අතුරු ව්‍යවස්ථා අදහස් වන අතර, ඊට අදාළ ව්‍යවස්ථාවල ලියාපදිංචි කළ සංශෝධනයන්ද ඇතුළත් වේ:

"කාරක සභාව" යන්නෙන් ලියාපදිංචි කළ සමිතිය කටයුතු පිළිබඳ කළමණාකාරිත්වය භාර කරනු ලැබූ ඒ සමිතියේ පාලක මණ්ඩලය අදහස් වන අතර, ලියාපදිංචි කළ සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය සහ 43, 44 සහ 55 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරන ලද තැනැත්තෝද ඊට ඇතුළත් වෙති ;

"නිලධරයා" යන්නට සමිතියක හෝ මේ ශාඛාවක සභාපතිවරයා, උපසභාපතිවරයා, භාණ්ඩාගාරිකවරයා, සභිකයන් අතුරින් තේරී පත්වී ඇති ලේකම්වරයා හෝ වෙනත් කාරක සභිකයෙකු ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන් දකුණු පළාත් සභාව අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා හැඳින්වේ ;

"මූලික සමිතිය" යන්නෙන් 3(1)(අ), (ආ) හා (ඇ) ඡේදවල සඳහන් යම් අරමුණක් ඇතිව හෝ යම් කාර්යයක් සඳහා පිහිටුවන ලද සමිතිය නොවන ලියාපදිංචි කළ සමිතියක් අදහස් වේ ;

"රීතිය" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ හෝ පනවනු ලැබූ ලෙස සැලකෙන රීති අදහස් වන්නේය ;

"සේවකයා" යන්නට සමුපකාර සමිතියේ අරමුදලින් වැටුප් ලබන සේවය කරන තැනැත්තා වන්නේය ;

''රජයේ අරමුදල'' යන්නෙන් රජය විසින් හෝ පළාත් සභාව විසින් දෙනු ලබන ණය අත්තිකාරම් ආධාර සහ ප්‍රදාන අදහස් වන අතර ප්‍රඥප්තියේ 61, 62 වගන්තිවලින් සඳහන් අරමුදල්වලින් දෙනු ලබන ණය අත්තිකාරම් ප්‍රධාන හා ආධාරද රෙජිස්ට්‍රාර්වරයාගේ නිර්දේශය මත හෝ අනුමැතිය මත වෙනත් ආයතනවලින් ලබා ගන්නා සියලුම මුදල් හා ණය හා රෙජිස්ට්‍රාර්වරයා ගෙවිය යුතු මුදල් ඇතුලත් වේ ;

''රෙජිස්ට්‍රාර්වරයා යන්නෙන්'' මේ ප්‍රඥප්තිය යටතේ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් කෙනෙකුගේ යුතුකම් ඉටු කිරීම සඳහා පත්කරන ලද දකුණු පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් අදහස් වේ ;

''සමූපකාර දෙපාර්තමේන්තුවේ නිලධරයා'' යන්න මෙම ප්‍රඥප්තියේ 2(1) හා 2(2) වගන්තිය යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාට සහාය වීම සඳහා පත් කරනු ලබන සමූපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්, සමූපකාර සංවර්ධන ජ්‍යෙෂ්ඨ පළාත් සහකාර කොමසාරිස්, දිස්ත්‍රික් සංවර්ධන නිලධාරින්, මූලස්ථාන සංවර්ධන නිලධාරින්, සමූපකාර සංවර්ධන නිලධාරීන් අයත් වන්නේය ;

''ලියාපදිංචි කළ සමිතිය'' යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සැලකෙන සමිතියක් හෝ සංගමයක් අදහස් වේ ;

''සාමාජිකයා'' යන්නට සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමට වන තැනැත්තන් ද ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු නියෝග සහ අතුරු ව්‍යවස්ථා අනුව සාමාජිකත්වයට ඇතුළත් කර ගන්නා ලද තැනැත්තෙක්ද ඇතුළත් වේ ;

''පූර්ණ සාමාජිකයා'' අතුරු ව්‍යවස්ථාවෙන් නියම කරනු ලබන කොටස් මුදල සම්පූර්ණ කර ඇති හා සාමාජිකත්වයෙන් අනුමත කර වර්ෂයක් ගත වූ කෙනෙක් විය යුතුය. පූර්ණ සාමාජිකත්වයට ඇතුළත් කිරීමට කොටස් මුදල වර්ෂයක් තුළ සම්පූර්ණ කරගත් අයකු විය යුතුය.

77. මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

48. 2019 අංක 07 දරන දිවා සුරකුම් මධ්‍යස්ථාන ප්‍රඥප්තිය.

දකුණු පළාත් දිවා සුරකුම් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම, පරිපාලනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අනුශංගික වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස වූ නීති ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව මෙසේ පනවනු ලැබේ.

01. මෙම නීති ප්‍රඥප්තිය දකුණු පළාත් සභාවේ 2019 අංක 07 දරන දිවා සුරකුම් මධ්‍යස්ථාන ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලබන අතර, එය (මින් ඉදිරියට, "ක්‍රියාත්මකවන දිනය" වශයෙන් හඳුන්වනු ලබන) දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලද දින සිට ක්‍රියාත්මක වේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

02. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් විය යුතුය:

ප්‍රඥප්තියේ අරමුණු

(අ) (මින් ඉදිරියට, "දිවා සුරකුම් මධ්‍යස්ථානයක්" යනුවෙන් හඳුන්වනු ලබන) වයස මාස හතරේ සිට අවුරුදු දොළහ දක්වා වූ සීමාවේ ළමයින්ට තම නිවෙස්වලින් බැහැරව දවසේ යම් කිසි කාලසීමාවක් තුළ රැකවරණය සැලසීම මගින් ළමයින්ගේ සුරකුම් හා වර්ධනය සඳහා දෙමාපියන්ට සහය වන පළාතේ දිවා සුරකුම් මධ්‍යස්ථාන සම්බන්ධව සම්පූර්ණ අධීක්ෂණයක් පවත්වාගෙන යාම හා දිවා සුරකුම් මධ්‍යස්ථානයේ රැඳී සිටින කාලය තුළ දරුවාගේ සම්පූර්ණ වගකීම භාර ගැනීම සහ;

(ආ) පළාත ඇතුළත දිවා සුරකුම් මධ්‍යස්ථානවල දරුවන්ගේ කායික හා මානසික සංවර්ධනය සඳහා ඉවහල්වන පරිසරයක් ඇති කිරීම.

1 වන කොටස

මෙහෙයුම් මණ්ඩලය පිහිටුවීම, බලතල සහ කාර්යයන්.

03. (මින් ඉදිරියට, "මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) මෙහෙයුම් මණ්ඩලයක් ප්‍රඥප්තියේ කාර්යයන් ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා පිහිටුවනු ලැබිය යුතුය.

මෙහෙයුම් මණ්ඩලය පිහිටුවීම

04. (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය:

මණ්ඩලයේ සංයුතිය හා ධූර කාලය.

(අ) නිල බලයෙන් පත් වූ සාමාජිකයන් වන -

(i) සභාපතිවරයා විය යුතු පළාතේ සමාජ සුබසාධනපරිවාස හා ළමාරක්ෂක සේවා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන්;

(ii) ලේකම්වරයා විය යුතු පළාතේ සමාජ සුභසාධන පරිවාස හා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයාගෙන්;

(iii) පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයාගෙන්;

(iv) පළාතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගෙන්;

(v) පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාගෙන්;

(vi) නියෝජ්‍ය/සහකාර පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගෙන්;

(vii) නියෝජ්‍ය/ සහකාර සමාජ සුභසාධන අධ්‍යක්ෂවරයාගෙන්;

(viii) ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක තුනෙහි ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධරයන් තිදෙනාගෙන්;

(ix) ගාල්ල මාතර හම්බන්තොට දිස්ත්‍රික්ක තුනෙහි දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධරයන් තිදෙනාගෙන්;

(x) ගාල්ල මාතර හම්බන්තොට දිස්ත්‍රික්ක තුනෙහි දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධරයන් තිදෙනාගෙන්; සහ

(ආ) (මෙහි මින් මතු ‘‘පත්කළ සාමාජිකයන්’’ යනුවෙන් සඳහන් කරනු ලබන) (මින් ඉදිරියට “අමාත්‍යවරයා”යනුවෙන් හඳුන්වනු ලබන) පළාතේ විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු තැනැත්තන් තිදෙනෙකුගෙන්;

(2) යම් තැනැත්තෙකු,

(අ) පාර්ලිමේන්තුව හෝ පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් සඳහා මහජන ඡන්දයෙන් පත් වූ හෝ වෙනත් ආකාරයකින් පත් වූ සභිකයෙකු වේ නම්,හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ සිහිවිකල තැනැත්තෙකු බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශකර ඇත්තම්,හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටින ලද හෝ යටත්ව සිටින තැනැත්තෙකු වී ඇත්නම්,හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බල, පවත්නා නීතියක් යටතේ බුන්වත් තැනැත්තෙකු හෝ නොබිඳුණු බංකොලොත්කරුවකු ලෙස ප්‍රකාශයට පත්කරන ලද තැනැත්තෙකු වී ඇත්නම්,හෝ

(ඉ) මණ්ඩලයේ සාමාජිකයෙකු වයෙයන් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අගතිදායක ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇති තැනැත්තෙකු වී ඇත්නම්, හෝ ඔහු මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ දිගටම කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු වන්නේ ය.

(3) නිල බලයෙන් පත් වූ සෑම සාමාජිකයකු ම ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වූයේ යම් ධූරයක් ප්‍රකාරවද එම ධූරය දරන තාක්කල් මණ්ඩලයේ ධූරය දැරිය යුතුය.

(4) (අ) පත්කළ සෑම සාමාජිකයෙක් විසින්ම ඔහු මියයාම ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ස්වකීය ධූරය ,කලින් හිස් කරනු ලැබුවහොත් මිස, ඒ ධූරයට පත් කරනු ලැබූ දින පටන් අවුරුදු තුනක කාලයක් සඳහා ධූරය දැරිය යුතු අතර ඔහු ධූරයෙන් අස් කරනු ලැබුවහොත් මිස නැවත පත්කරනු ලැබීමට සුදුසු විය යුතුය.

(ආ) අමාත්‍යවරයා විසින් එසේ කිරීම සුදුසු යැයි සලකනු ලබන විටදී, හේතු දක්වා යම් පත්කළ සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(ඇ) යම් පත් කළ සාමාජිකයෙකු විසින් අමාත්‍යවරයා අමතා ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිපියක් මගින් කවර අවස්ථාවක දී වුව ද ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(ඇ) පත්කළ යම් සාමාජිකයෙකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධූරයෙන් ඉවත් කිරීම හේතුවෙන් ධූරය හිස්කරනු ලබන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන එම සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීම සඳහා වෙනත් යම් තැනැත්තෙකු පත්කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලබන යම් සාමාජිකයෙකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූරය දැරිය යුතුය.

05. මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක් තීරණයක් හෝ නීති කෘත්‍යයක් මණ්ඩලයේ පුරප්පාඩුවක් හෝ එහි යම් සාමාජිකයෙකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් නිර්බල වූ ලෙස සලකනු නොලැබිය යුතුය. පුරප්පාඩුවක් ඇති වීම හේතුවෙන් ක්‍රියා නිර්බල නොවන බව

06. මණ්ඩලයේ සාමාජිකයන්ට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකිය. මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

07.(1) මණ්ඩලයේ රැස්වීම යටත් පිරිසෙන් මාස තුනකට වරක්වත් පැවැත්විය යුතුය. කෙසේ වුවද මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතුයැයි අමාත්‍යවරයා විසින් හෝ යටත් පිරිසෙන් මණ්ඩලයේ සාමාජිකයන් හත්දෙනෙකු විසින් වත් මණ්ඩලයේ ලේකම්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබ ඇත්නම් ඒ ඉල්ලීමේ දින සිට දින හතක් ඇතුළත ඔහු විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතුය. මණ්ඩලයේ රැස්වීම

(2) මණ්ඩලයේ ලේකම්වරයා විසින් මණ්ඩලයේ එක් එක් සාමාජිකයා වෙත යටත් පිරිසෙයින් රැස්වීමට දින හතකටවත් පෙරාතුව රැස්වීම පිළිබඳව ලිඛිතව දැනුම් දිය යුතුය.

(3) යම් රැස්වීමක ගණ පූරණය සාමාජිකයන් හත් දෙනෙකු විය යුතුය.

(4) සභාපතිවරයා විසින් මණ්ඩලයේ මුලසුන දැරිය යුතුය. මණ්ඩලයේ රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින්, පැමිණ සිටින සාමාජිකයන් අතුරින් නිල බලයෙන් පත්කළ සාමාජිකයෙකු එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරාගනු ලැබිය යුතුය.

(5) මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්ද පිළිබඳ සමානතාවක් ඇති වූ විටෙක රැස්වීමේ මූලසුන දරන තැනැත්තාට,තම ඡන්දයට අතිරේකව, තීරක ඡන්දයක් තිබිය යුතුය.

(6) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට, යටත්ව රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකිය.

08. මණ්ඩලය පහත කාර්යයන් ඉටු කරනු ලැබිය යුතු ය: මණ්ඩලයේ කාර්යය

(අ) දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ප්‍රමිතිය නංවාලීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහ අවශ්‍ය සහය ලබාදීම,

(ආ) දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය අවම ප්‍රමිතීන් රීති මගින් නියම කිරීම,

(ඇ) දිවා සුරැකුම් මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලයට තිබිය යුතු අවම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් රීති මගින් නියම කිරීම,

(ඈ) විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා රැකවරණය සැලසීමේ දී අවශ්‍ය වන ප්‍රමිතීන් රීති මගින් නියම කිරීම,

(ඉ) මෙම ප්‍රඥප්තියේ අරමුණු ක්‍රියාත්මක කිරීමෙහිලා අවශ්‍ය රීති සෑදීම.

II වන කොටස
දිවා සුරැකුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම.

09 (1) මින් මතු නිර්වචනය කරනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ලේකම් විසින් එම දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීම සඳහා නියමිත ආකෘතියෙන් වූ අයදුම්පතක් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ලියාපදිංචිය සඳහා අයදුම් කිරීම

(2) (1) වැනි උපවගන්තිය යටතේ ලියාපදිංචිය සඳහා අයදුම්කරනු ලබන සෑම දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්ම මෙම ප්‍රඥප්තියේ නියම සහ කොන්දේස්වලට යටත් වන්නේ දැයි සලකා බැලීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි සලකන යම් තොරතුරු හෝ ලේඛන කොමසාරිස්වරයා විසින් ඉල්ලුම්කරුගෙන් කැඳවනු ලැබිය හැකිය.

10. (1) දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑමේ කාර්යය සඳහා වූ (මින් ඉදිරියට "කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික යන තනතුරුවලින් සමන්විත පාලක මණ්ඩලයක් සිටිය යුතුය. ලියාපදිංචිය සඳහා වූ අවශ්‍යතා

(අ) යම් තැනැත්තෙකු,

(i) පාර්ලිමේන්තුව හෝ පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් සඳහා මහජන ඡන්දයෙන් පත් වූ හෝ වෙනත් ආකාරයකින් පත් වූ සභිකයෙකු වේ නම්, හෝ

(ii) අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් ළමා කටයුතු සම්බන්ධව රාජකාරී සඳහා පත් කරනු ලැබූ නිලධරයකු හෝ පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු සම්බන්ධ අධීක්ෂණ හෝ රාජකාරි කටයුතුවල නියැලෙන රජයේ අමාත්‍යාංශයක , දෙපාර්තුමේන්තුවක ආයතනයක හෝ අධිකාරියක නිලධරයෙකු හෝ පොලිස් නිලධරයෙකු වේ නම්, හෝ

(iii) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ සිහිවිකල තැනැත්තෙකු බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කර ඇත්නම්,හෝ

(iv) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත් ව සිටින තැනැත්තෙකු වී ඇත්නම්, හෝ

(v) ළමා අපයෝජන හෝ අපචාර සිදුවීමකට චෝදනා ලැබ අධිකරණයක් මගින් විධිමත් නඩු විභාගයකින් පසු නිදොස් කොට නිදහස් කරනු නොලැබූ තැනැත්තෙකු නම්, හෝ

(vi) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ බුන්වත් තැනැත්තෙකු හෝ නොබිඳුණු බංකොලොත්කරුවෙකු ලෙස ප්‍රකාශයට පත් කරන ලද තැනැත්තෙකු වී ඇත්නම්, හෝ

(vii) කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අගතිදායක ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවයක් ඇති තැනැත්තෙකු වී ඇත්නම් හෝ ඔහු කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ දිගටම කටයුතු කරගෙන කරගෙන යාමට හෝ නුසුදුස්සකු වන්නේය.

(ආ) කමිටුවේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තිදෙනෙකුවත් දිවා සුරැකුම් මධ්‍යස්ථානය පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පදිංචිකරුවන් විය යුතුය.

(ඇ) කමිටුවේ සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුවත් දිවා සුරැකුම් මධ්‍යස්ථානයට පැමිණෙන ළමයින්ගේ මව්පියන් විය යුතු අතර අදාළ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ප්‍රධාන පාලිකාව කමිටුවේ ලේකම් විය යුතුය.

(2) කලින් කලට අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන, 8 වැනි වගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේදයෙහි සඳහන් පරිදි මණ්ඩලය විසින් රීති මගින් නියම කර ඇති ප්‍රමිතීන්වලට අනුකූලව දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ කටයුතු කළ යුතුය:

වාර්තා ලබා ගැනීම

11. කොමසාරිස්වරයා වෙත අයදුම්පතක් ලද විටක හෝ අනුමැතියකින් තොරව දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන බවට පැමිණිල්ලක් ලද විටක හෝ පරිවාස නිලධරයෙකුට හෝ කොමසාරිස්වරයා විසින් බලය පවරන වෙනත් යම් නිලධරයෙකුට පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සති හතරක් ඇතුළත වාර්තාවක් ලබාදෙන ලෙස නියම කළ යුතු ය.

(අ) එකී දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ළමයින්ගේ උපරිම සුබසිද්ධිය හා රැකවරණය එම දිවා සුරැකුම් මධ්‍යස්ථානය මගින් සැලසෙන්නේ ද යන්න සම්බන්ධව;

සහ

(ආ) 10(1) සහ 10(2) වැනි උප වගන්තිය යටතේ කර ඇති නියම සහ කොන්දේසි වලට අනුකූලව ක්‍රියාකර ඇත් ද යන්න සම්බන්ධව,

(i) 10(2) වැනි උපවගන්තිය යටතේ නියම කර ඇති ප්‍රමිතීන්වලින් සියයට පනහක්වත් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ii) ඉතිරි ප්‍රමිති අවශ්‍යතාවයන් දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීමෙන් පසු වසර දෙකක් ඉකුත් වීමට පෙර සපුරාලීමට එකී දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් විසින් කොමසාරිස්වරයා සමග ගිවිසුමකට එළඹිය යුතුය.

පරීක්ෂණය සිදු කිරීම

12. 11 වැනි වගන්තිය යටතේ වූ වාර්තාව ලද පසු එහි නේවාසිකව සිටින ළමයින්ගේ සුබසිද්ධිය හා රැකවරණය එම දිවා සුරැකුම් මධ්‍යස්ථානය මගින් සැලසෙන්නේ ද සහ අපේක්ෂිත ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාකර තිබේදැයි පරීක්ෂාකර බැලීම සඳහා ඕනෑම අවස්ථාවක දී එම දිවා සුරැකුම් මධ්‍යස්ථානයට ඇතුළුවීමට කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධරයෙකුට හැකිය.

13. 12 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයෙන් පසුව කොමසාරිස්වරයා විසින් සාධාරණව සෑහීමට පත්වන්නේ නම් අයදුම්පත ඉදිරිපත් කර මාස හයක් ඇතුළත එකී දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීමට කොමසාරිස්වරයා විසින් කටයුතු කළ යුතුය. ලියාපදිංචි කිරීම

14. (1) දිවාසුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් නියමිත ආකෘතියෙහි වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක්, නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු කොමසාරිස්වරයා විසින් දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් වෙත නිකුත් කළ යුතුය. එවැනි සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක් ම අවුරුදු දෙකක කාලයක් සඳහා වලංගු විය යුතුය. ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම

(2) 11 ආ (ii) අනුඡේදය යටතේ වූ ගිවිසුමකට එළඹෙන අවස්ථාවක දී මාස හයක කාලයක් සඳහා වලංගු වන තාවකාලික ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු ය.

(3) (1) හා (2) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද කිසිදු ලියාපදිංචි කිරීමේ සහතිකයක් වෙනත් යම් තැනැත්තෙකු වෙත පවරනු ලැබිය නොහැකි අතර ඒ අනුව එවැනි යම් පැවරීමක් ශූන්‍ය හා බලය රහිත වන්නේය.

(4) (1) හා (2) වැනි උපවගන්තීන් යටතේ නිකුත් කරන ලද සෑම සහතිකයක් ම, ඒ සහතිකය මගින් බලය දෙනු ලැබ ඇති තැනැත්තා විසින් ප්‍රධාන කාර්යාලයේ හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ සෑම අවස්ථාවකදී ම ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(5) තමා විසින් තාවකාලික ලියාපදිංචි සහතිකයක් හෝ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම මගින් ලියාපදිංචි කරන ලද සෑම දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් ම එම දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ නම, ලිපිනය, ලියාපදිංචි කිරීමේ අංකය හා දිනය සහ කොමසාරිස්වරයාට අවශ්‍ය යැයි හැඟී යන වෙනත් තොරතුරක් වේ නම් ඒවා ද ඇතුළත් නියමිත ආකෘතියෙන් යුත් ලේඛනයක් කොමසාරිස්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

(6) කොමසාරිස්වරයා තමා විසින් (1) හා (2) වැනි උපවගන්තීන් යටතේ ලියාපදිංචි කරන ලද දිවා සුරකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් වාර්තාවක් අවශ්‍ය අවස්ථාවල දී මණ්ඩලයේ රැස්වීමට ඉදිරිපත් කළ යුතු ය.

15. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් දරන සෑම තැනැත්තෙකු විසින් ම, මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වීම සඳහා වූ තම අයදුම් පත්‍රයෙහි ඇතුළත් විස්තරවල යම් වෙනසක් සිදුවුවහොත් එම වෙනස පිළිබඳව එය සිදු වී දින තිහක් ඇතුළත කොමසාරිස්වරයාට දැනුම් දිය යුතු ය.

ලියාපදිංචි වීමේ අයදුම්පතෙහි විස්තරවල ඇති යම් වෙනසක් කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු බව

16. (1) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක්,

සහතිකය අලුත් කිරීම

(අ) බලාත්මකව පවතින කාලසීමාව ඉකුත්වීමට ලිත් මාස තුනකට පෙරාතුව වූ කාලසීමාව ඇතුළත ලියාපදිංචියේ දී සපයා ඇති තොරතුරුවල කිසියම් වෙනස් කිරීමක් තිබේ නම් එය සංක්ෂිප්තව දක්වමින් නියමිත ආකෘතියෙන් යුත් අයදුම් පත්‍රයක් මගින් ලියාපදිංචිය අලුත් කිරීම සඳහා කොමසාරිස් වෙතින් ඉල්ලීමක් කළ යුතු ය.

(ආ) නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල වීමට අවශ්‍ය සාධක සම්පූර්ණ කිරීමේ ප්‍රගතියක් පෙන්වන බවට කොමසාරිස් සෑහීමකට පත්වන්නේ නම්, නියමිත ගාස්තුව ගෙවීමෙන් පසුව ලියාපදිංචිය අළුත් කර දිය යුතු ය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද තාවකාලික ලියාපදිංචි කිරීමේ සහතිකයක්,

(අ) බලාත්මකව පවතින කාලසීමාව ඉකුත්වීමට ලිත් මාසයකට පෙරාතුව වූ කාලසීමාව ඇතුළත ලියාපදිංචියේ දී සපයා ඇති තොරතුරුවල කිසියම් වෙනස් කිරීමක් තිබේ නම් එය සංක්ෂිප්තව දක්වමින් නියමිත ආකෘතියෙන් යුත් අයදුම් පත්‍රයක් මගින් තාවකාලික ලියාපදිංචිය අළුත් කිරීම සඳහා කොමසාරිස් වෙතින් ඉල්ලීමක් කළ යුතු ය.

(ආ) නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල වීමට අවශ්‍ය සාධක සම්පූර්ණ කිරීමේ ප්‍රගතියක් පෙන්වන බවට කොමසාරිස් සෑහීමකට පත් වන්නේ නම්, මාස හයකට වලංගු වන පරිදි තාවකාලික ලියාපදිංචිය අළුත් කර දිය යුතු ය. මෙසේ ගිවිසුම්ගත කාලය අවසන් වන තෙක් වූ කාලසීමාව තුළ දී තාවකාලික ලියාපදිංචිය සෑම මාස හයකට වරක් ම අළුත් කරගැනීමට කටයුතු කළ යුතු ය.

කොමසාරිස්වරයාගේ බලතල

17. (1) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, තමා විසින් ලියාපදිංචි කරන ලද දිවා සුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් කොමසාරිස්වරයාට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය.

(අ) දවසේ යම් යුක්ති සහගත වේලාවක් තුළ දී දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වනු ලබන ස්ථානවලට ඇතුළු වී ඒවා පරීක්ෂා කිරීම;

(ආ) පළාත ඇතුලත යම් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ලේකම්වරයාට වාර්තා සහ තොරතුරු ලබාදෙන ලෙස නියම කිරීම;

(ඇ) පළාත ඇතුළත පවත්වාගෙන යනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථන ලියාපදිංචි කිරීම;

(ඈ) කොමසාරිස්වරයා සාධාරණව සෑහීමකට පත්වන්නේ නම් දිවා සුරැකුම් මධ්‍යස්ථාන වල නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය අවස්ථාවල දී ආධාර ලබාදීම;

(ඉ) දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවන් සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(2) මේ ප්‍රඥප්තියේ විධිවිධාන කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මේ ප්‍රඥප්තිය මගින් කොමසාරිස්වරයා වෙත පවරනු ලැබ ඇති බලතලවලින් යම් බලයක් තමා යටතේ රාජකාරි කරනු ලබන යම් නිලධරයෙකුට පැවරීම අවශ්‍ය බවට කොමසාරිස්වරයා විසින් සලකනු ලබන්නේ නම්, කොමසාරිස්වරයා විසින් එවැනි යම් බලයක් එකී නිලධරයෙකුට පවරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යා නොහැකි බව

18. (1) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින පටන් හා ඉන්පසුව, මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක බලය යටතේ සහ එහි නියම හා කොන්දේසිවලට අනුකූලව හැර, කිසිම තැනැත්තෙකු විසින් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම කරනු නොලැබිය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන යම් තැනැත්තෙකු විසින් මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින පටන් මාස හයක කාලසීමාවක් සඳහා එය පවත්වා ගෙන යනු ලැබිය හැකි නමුත්, එකී මාස හයක කාල සීමාව ඉකුත් වීමට පෙර ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කර මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ සහතිකයක් ලබාගත යුතුය.

19. 11 වැනි වගන්තිය යටතේ වූ වාර්තාව ලද පසුව 12 වගන්තිය යටතේ සිදු කරන පරීක්ෂණයෙන් අනතුරුව 10(1) හා (10)2 වැනි උප වගන්තීන් යටතේ වූ ඡේද හා අනු ඡේද යටතේ සඳහන් වන අවශ්‍යතා සපුරා නොමැති බව සනාථ වුවහොත්, එම දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කළ නොහැකි බවට නොමසාරිස්වරයා විසින් කමිටුවේ ලේකම්වරයාට ලිඛිත ව දැන්විය යුතුය.

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප වීම

20. කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම සම්බන්ධයෙන් සෑහීමකට පත්නොවන යම් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ලේකම්වරයෙකුට ඒ දැන්වීමේ දින සිට දින දාහතරක් ඇතුළත (මින් ඉදිරියට "අමාත්‍යාංශ ලේකම්වරයා" ලෙස හඳුන්වනු ලබන) පළාතේ විෂයයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව

21. (1) අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් පත්කරන කොමසාරිස්වරයාගේ තනතුරට සමාන හෝ කොමසාරිස්වරයාගේ තනතුරට වඩා උසස් තනතුරු දරන රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් හෝ එවැනි තනතුරක් දැරූ විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතුය.

අභියාචන පිළිබඳ අමාත්‍යාංශ ලේකම්වරයාගේ තීරණය

(2) පරීක්ෂණයේ තීරණය පහත සඳහන් පරිදි විය යුතුය.

(අ) දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ව හේතු එම දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් වෙත ලිඛිතව දන්වා යැවීම;

(ආ) දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කොමසාරිස්වරයා වෙත දැනුම් දීම;

(ඇ) 10 (1) හා 10 (2) වැනි උප වගන්තීන් යටතේ වූ ඡේද හා අනු ඡේද යටතේ සඳහන් වන අවශ්‍යතාවයන් සපුරා ගැනීමට වසරකට නොවැඩි සහනදායී කාලසීමාවක් ලබාදීම සහ එසේ සපුරාලන්නේ නම් ඉන් අනතුරුව දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීම අනුමත කරන ලෙස කොමසාරිස්වරයාට දැනුම් දීම.

22. 21 වැනි වගන්තිය යටතේ දෙන ලද තීරණයක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් පාර්ශවකරුවෙකු විසින් ඒ තීරණයේ දින සිට දින දාහතරක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව

23. 22 වැනි වගන්තිය යටතේ අභියාචනයක් ලද විටකදී, අමාත්‍යාංශ ලේකම්වරයාගේ තනතුරට සමාන හෝ එයට වඩා උසස් තනතුරු දරන රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් හෝ එවැනි තනතුරක් දැරූ විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසින් ඒ අභියාචනය පිළිබඳව පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර එම පරීක්ෂණයේ වාර්තාව අනුව අමාත්‍යවරයා විසින් 21(2) (අ),(ආ) හෝ (ඇ) උප වගන්තිය අනුව තම තීරණය ලබා දිය යුතුය. අභියාචන පිළිබඳ අමාත්‍යාවරයාගේ තීරණය

24. දිවා සුරැකුම් මධ්‍යස්ථානයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සමග කටයුතු කිරීමට හැකියාව ඇති එකම තැනැත්තා එම දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම්වරයා වන්නේ ය. ලේකම්වරයා කමිටුව වෙනුවෙන් කටයුතු කළ යුතු බව

III වන කොටස

දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ පරිපාලනය හා ඊට අදාළ අනෙකුත් කරුණු.

25. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක සිටින ළමයින්ගේ සුබ සිද්ධිය හෝ එහි පරිපාලනය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධරයෙකු විසින් හෝ දෙනු ලබන උපදෙස් හෝ නියෝග එම දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම්, කමිටුව සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය අනුගමනය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම කළ යුතුය. උපදෙස් අනුගමනය කළ යුතු බව සහ නියෝග ක්‍රියාත්මක කළ යුතු බව

26. (1) කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිලධරයෙකු විසින් ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ සඳහන් කාල සීමාව ඇතුළත දී යම් තොරතුරු හෝ වාර්තා සපයන ලෙස දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් වෙත නියම කරනු ලැබිය හැකිය.

තොරතුරු සහ වාර්තා සැපයිය යුතු බව

(2) එම තොරතුරු හෝ වාර්තා සැපයීමේ දී දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් විසින් වැරදි හෝ ව්‍යාජ තොරතුරු සැපයීමෙන් වැළකී සිටිය යුතුය.

IV වන කොටස

දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලියාපදිංචිය අවලංගු කිරීම

27. පහත සඳහන් අවස්ථාවලදී කොමසාරිස්වරයා විසින් පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව කොමසාරිස්වරයා විසින් සාධාරණව සෑහීමකට පත්වන්නේ නම් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් අවලංගු කිරීම කරනු ලැබිය හැකිය.

ලියාපදිංචිය අවලංගු කිරීම.

(අ) දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ බහුතර සාමාජික සංඛ්‍යාවකගේ ඡන්දයෙන් එකී දිවා සුරැකුම් මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට නොහැකි බවට යෝජනාවක් සම්මත කර ඒ බව ලිඛිතව කොමසාරිස්වරයා වෙත දන්වන ලද අවස්ථාවක දී;

(ආ) සහතිකය දරන්නා හෝ කමිටුව හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය විසින් මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ විධිවිධානයක් උල්ලංඝණය කර ඇති බවට හෝ කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයෙකු විසින් දෙනු ලබන උපදෙස් හෝ නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හැර ඇති බවට හෝ නියම කරනු ලබන තොරතුරු හෝ වාර්තා සැපයීම පැහැර හැරීම හෝ වැරදි හෝ ව්‍යාජ තොරතුරු සපයා ඇති බවට කොමසාරිස්වරයා සෑහීමකට පත් වුවහොත් කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් සහතිකය දරන්නාට ලබා දීමෙන් අනතුරුව;

(ඇ) ඉහත 14(2) වැනි උප වගන්තිය යටතේ තාවකාලික ලියාපදිංචි සහතිකයක් නිකුත් කර ඇති අවස්ථාවක, 11(ආ)(ii) අනු ඡේදය යටතේ කොමසාරිස්වරයා සමග ගිවිසුම්ගත වූ කාලසීමාව ඉකුත් වුව ද අපේක්ෂිත ප්‍රමිතීන් සම්පූර්ණ කර නොමැති අවස්ථාවකදී;

28. 27 (අ),(ආ) සහ (ඇ) ඡේද යටතේ කිසියම් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ලියාපදිංචිය අවලංගු කිරීමට කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, ඔහු විසින් එම තීරණයට එළඹුන දින සිට දින තිහක් ඇතුළත ඒ බව දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවිය යුතුය.

ලියාපදිංචිය අවලංගු කිරීමේ දැන්වීම

29. කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචිය අවලංගු කිරීමේ දැන්වීම සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන යම් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ලේකම්වරයෙකුට ඒ දැන්වීමේ දින සිට දින හතක් ඇතුළත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව

30. (1) 29 වන වගන්තිය යටතේ වූ අභියාචනයක් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලද අවස්ථාවකදී, ඔහු විසින් හෝ ඔහු විසින් පත්කරන කොමසාරිස්වරයාගේ තනතුරට වඩා උසස් තනතුරු දරන රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් හෝ එවැනි තනතුරක් දැරූ විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසින් කරන ලද පරීක්ෂණයකින් පසුව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පහත සඳහන් ක්‍රියාවලි අතුරින් එකක් අනුගමනය කළ යුතුය.

අභියාචනා පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය

(අ) ලියාපදිංචිය අවලංගු කිරීම තහවුරු කිරීම.

(ආ) ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා වූ කොමසාරිස්වරයාගේ තීරණය නිශ්ප්‍රභා කිරීම.

(2) අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ගනු ලැබූ තීරණය කොමසාරිස්වරයා වෙත ද පිටපතක් සහිතව අභියාචනය ලැබුණ දින සිට මසක් ඇතුළත දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම් වරයා වෙත ලිඛිතව දන්වා යැවිය යුතුය.

31. 30 (1) වැනි උප වගන්තිය යටතේ දෙන ලද තීරණයක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් පාර්ශවකරුවෙකු විසින් ඒ තීරණයේ දින සිට දින හතක් ඇතුළත අවසාන තීරණය සඳහා අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව

32. 31 වැනි වගන්තිය යටතේ අභියාචනයක් ලද විටදී අමාත්‍යාංශ ලේකම්වරයාගේ තනතුරට සමාන හෝ එයට වඩා උසස් තනතුරු දරන රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් හෝ එවැනි තනතුරක් දැරූ විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසින් ඒ අභියාචනය පිළිබඳව පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර එම පරීක්ෂණයේ වාර්තාව අනුව අමාත්‍යවරයා විසින් 30(අ) හෝ (ආ) ඡේද යටතේ තම තීරණය කොමසාරිස්වරයා වෙත ද පිටපතක් සහිතව අභියාචනය ලැබුණු දින සිට මසක් ඇතුළත දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ලේකම්වරයා වෙත ලිඛිත ව දන්වා යැවිය යුතුය.

අභියාචනා පිළිබඳ අමාත්‍යවරයාගේ තීරණය

V වන කොටස

දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිති නියම කිරීම.

33. දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වා ගෙන යන කාල සීමාව, දිවා සුරැකුම් මධ්‍යස්ථාන පරිශ්‍රයේ භෞතික පහසුකම්, ළමයින්ගේ වැඩ සැලැස්ම, වාර්තා පවත්වා ගැනීම, අවම කාර්යය මණ්ඩලය හා ළමයින්ගේ සුබසාධනය සඳහා අවශ්‍ය යැයි හැඟී යන කරුණු සම්බන්ධයෙන් අදාළ ප්‍රමිතීන් නියම කිරීම සඳහා මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය යුතුය.

මණ්ඩලය විසින් ප්‍රමිතීන් සම්බන්ධව රීති සෑදිය හැකි බව

34. දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ එක් එක් තනතුර සඳහා රීති මගින් නියම කරනු ලබන අවශ්‍ය අවම ප්‍රමිතීන් ඇත්නම් මිස යම් තැනැත්තෙකු දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ එකී තනතුරකට පත් කිරීම සඳහා සුදුස්සෙකු නොවිය යුතුය.

කාර්ය මණ්ඩලය සඳහා සුදුසුකම්

35. මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරන ලද සියලු දිවා සුරැකුම් මධ්‍යස්ථානවල කාර්යය මණ්ඩලයේ නම් හා සුදුසුකම් ඇතුළත් දිවා සුරැකුම් මධ්‍යස්ථාන කාර්යය මණ්ඩලය සඳහා වූ රෙජිස්ටරයක්, කොමසාරිස්වරයා විසින් පවත්වා ගෙන යා යුතුය.

කාර්ය මණ්ඩලය සඳහා රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු බව.

36. කොමසාරිස්වරයා විසින් දිවා සුරැකුම් මධ්‍යස්ථානවල කාර්යය මණ්ඩලය සඳහා පාඨමාලා හෝ පුහුණු වැඩසටහන් පවත්වනු ලබන ආයතනයක් තමා යටතේ පවත්වා ගෙන යනු ලැබිය යුතුය.

කාර්ය මණ්ඩලය සඳහා පුහුණු පාඨමාලා පවත්වනු ලබන ආයතනයක් පවත්වාගෙන යා යුතු බව

37. 36 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ආයතනය මගින් මෙහෙයවනු ලබන පාඨමාලා වෙනුවට හෝ එම පාඨමාලාවන්ට අමතරව දිවා සුරකුම් මධ්‍යස්ථාන කාර්යය මණ්ඩල සාමාජික සාමාජිකාවන් හැදෑරීම සුදුසු බවට මණ්ඩලය විසින් පිළිගනු ලබන පාඨමාලා හෝ පුහුණු වැඩසටහන් මෙහෙයවනු ලබන පෞද්ගලික අධ්‍යාපන ආයතනවල නම් හා පාඨමාලා තොරතුරු ඇතුළත් රෙජිස්ටරයක් කොමසාරිස්වරයා විසින් පවත්වා ගෙන යා යුතුය. කාර්ය මණ්ඩලය සඳහා පුහුණු පාඨමාලා පවත්වනු ලබන පෞද්ගලික අධ්‍යාපන ආයතන පිළිබඳව රෙජිස්ටරයක් පවත්වාගෙන යායුතු බව.

VI වන කොටස

වැරදි සහ දඬුවම්.

38. යම් තැනැත්තෙකු විසින් හෝ පුද්ගල කම්ටුවක් විසින්, වැරදි

(අ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන කඩ කරමින් ක්‍රියා කිරීම, ප්‍රඥප්තියේ පරමාර්ථවලට පටහැනි ලෙසින් මුදල් යෙදවීම මුදල් අයථා පරිහරණය;

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ කරන ලද යම් නියෝගයක් අනුව සැපයිය යුතු යම් තොරතුරක් හෝ වාර්තාවක් සැපයීම පැහැර හැර ඇති අවස්ථාවක දී;

(ඇ) සපයනු ලබන තොරතුරක හෝ වාර්තාවක දැනුවත්වම ව්‍යාජ තොරතුරු ඇතුලත් කර ඇති අවස්ථාවක දී;

(ඉ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ කරන ලද යම් නියෝගයකට හෝ විධානයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇති අවස්ථාවක දී;

ඒ තැනැත්තා හෝ ඒ පුද්ගල කම්ටුවේ එක් එක් සාමාජිකයා මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේය.

39. මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන තැනැත්තෙකු, ඒ වෙනුවෙන් වෙනත් යම් නීතියක් යටතේ විශේෂිත දඬුවමක් පැනවීමට විධිවිධාන සලසා නොමැති නම්, වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් 25,000 කට නොඅඩු දඩයකට හෝ මාස 03 නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට නැතහොත් ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතුය. දණ්ඩන

VII වන කොටස

පොදු විධිවිධාන.

40. (අ) මේ ප්‍රඥප්තියේ විධානයක් ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. — නියෝග සෑදීමට අමාත්‍යවරයාට ඇති බලය.

(ආ) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර ඒ පළකිරීමේ දින හෝ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය.

(ඇ) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, අනුමතය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එම අනුමතයේ දින සිට පරිච්චින්න කරන ලද ලෙස සලකනු ලැබිය මුත්, ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් අගතියක් නොවිය යුතුය.

41. (අ) මේ ප්‍රඥප්තිය යටතේ රීති සෑදීමට නියමිත හෝ බලය දී ඇති යම් කරුණක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකිය. — රීති සෑදීමට කමිටුවට ඇති බලය

(ආ) මණ්ඩලය විසින් සාදනු ලබන රීති අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එසේ පළකරනු ලැබූ දින හෝ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ බලාත්මක විය යුතුය.

42. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයෙක් අවශ්‍ය වන්නේ නම් මිස, — අර්ථ නිරූපන

''ආණ්ඩුකාරවරයා'' යන්නෙන්, දකුණු පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

''අමාත්‍යවරයා'' යන්නෙන් දකුණු පළාත් සභාවේ සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

''අමාත්‍යාංශ ලේකම්වරයා'' යන්නෙන්, දකුණු පළාත් සභාවේ සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ;

''කොමසාරිස්වරයා'' යන්නෙන් දකුණු පළාත් සභාවේ සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා අදහස් වේ.

''දෙපාර්තමේන්තුව'' යන්නෙන්, දකුණු පළාත් සභාවේ සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව අදහස් වේ;

''පළාත'' යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත අදහස් වේ;

''පළාත් සභාව'' යන්නෙන්, 1987 අංක 42 දරන පළාත් සභා පනත යටතේ පිහිටුවන ලද දකුණු පළාත් සභාව අදහස් වේ;

''ළමයා'' යන්නෙන් වයස මාස 4 සිට අවුරුදු 12 දක්වා තැනැත්තෙකු අදහස් වේ;

''විශේෂ අවශ්‍යතා සහිත ළමයා'' යනුවෙන් 1996 අංක 28 අරන ආබාධ සහිත තැනැත්තන් ලියාපදිංචි කිරීමේ පනතේ ''ආබාධ සහිත තැනැත්තා'' යන්නට දී ඇති අර්ථය යටතේ සඳහන් තත්ත්වයට පත් ව සිටින වයස මාස 4 සිට අවුරුදු 12 දක්වා තැනැත්තෙකු අදහස් වේ;

''නියමිත'' යන්නෙන්, මේ ප්‍රඥප්තිය යටතේ සාදන නියෝග මගින් නියම කර ඇති බව අදහස් වේ.

43. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

05- 203